## 3. ගිණුම් විනිශ්චයන් සහ ඇස්තමේන්තු භාවිතය

බැංකුවේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම මත, වාර්තා කරන ලද ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් ප්‍රමාණයන් සහ අනුගාමී හෙළිදරව් කිරීම් මෙන්ම අසම්භාව්‍ය බැරකම්වල හෙළිදරව් කිරීම්වලට බලපාන්නා වූ විනිශ්චයන් ඇස්තමේන්තු හා උපකල්පනයන් සකස් කිරීමට කළමනාකරණයට සිදු වේ. මෙම උපකල්පනයන්, ඇස්තමේන්තු හා සම්බන්ධ අවිනිශ්චිතතාවය, වත්කම් හා බැරකම්හි ධාරණ අගයන්වලට අනාගත කාලපරිච්ඡේදවලදී බලපාන ලෙස ප්‍රමාණාත්මක ගැලපීමක් අවශ්‍ය කරන ප්‍රතිඵලයක් ඇති කළ හැක.

ඇස්තමේන්තු සහ ඒ සඳහා පාදක වූ උපකල්පන යාවත්කාලීන පදනමක් මත සමාලෝචනය කරනු ලැබේ. ඇස්තමේන්තුවල සංශෝධනයන් අනාගතයට බලපාන පරිදි හඳුනාගනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශ වල හඳුනාගෙන ඇති ප්‍රමාණාත්මක බලපෑමක් සහිත අයිතමයන් සඳහා පදනම් කරගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සඳහා වූ විනිශ්චයන් පිළිබඳ තොරතුරු පහත සටහන් මගින් පැහැදිලි කෙරේ.

**3.1 මූල්‍ය වත්කම් වර්ගීකරණය හා හානිකරණය**

බැංකුව විසින් මූල්‍ය වත්කම් වල ව්‍යාපාර ආකෘතිය හා ඒවාහි ගිවිසුම්ගත කොන්දේසි වලින් ඇතිවන මුදල් ප්‍රවාහ, මූලික මුදල හා ඒ මත වන පොලිය පමණක්ද යන්න තක්සේරු කිරීම සඳහා විනිශ්චයන් භාවිතා කරයි. තවද, බැංකුව විසින් මුල් වරට හඳුනාගැනීමෙන් පසු මූල්‍ය වත්කමක ණය අවධානමෙහි සැලකිය යුතු වර්ධනයක් වී ඇත්දැයි යන්න තීරණය කිරීම සඳහා වන නිර්නායකයන් ස්ථාපිත කිරීමේදී හා අපේක්ෂිත ණය අලාභ ගණනය කිරීම සඳහා ඉදිරි දැක්මක් සහිත තොරතුරු ඇතුලත් කිරීමේදී භාවිතා කරන ක්‍රමවේදය හා අපේක්ෂිත ණය අලාභ ගණනය කිරීම සඳහා වූ ආකෘති (Model) තෝරා ගැනීමේ හා අනුමත කිරීමේදී ද විනිශ්චයන් භාවිතා කරයි.

**3.2 විශ්‍රාම වැටුප් සහ අනිකුත් පශ්චාත් සේවා ප්‍රතිලාභ සැලසුම්**

නිශ්චිත ප්‍රතිලාභ සැලසුම්වල පිරිවැය ආයුගණන ඇගයීම් මත තීරණය කරනු ලැබේ. ආයුගණන ඇගයීමක දී වට්ටම් අනුපාත, අනාගත වන්දි ගෙවීම් වැඩිවීම්, මරණ අනුපාතය සහ විශ්‍රාම වැටුප්වල අනාගත වැඩිවීම් පිළිබඳ උපකල්පනයන් සිදුකරනු ලැබේ. මෙම සැලසුම් වල දිගුකාලීන ස්වභාවය හේතුවෙන් එවැනි ඇස්තමේන්තු සැලකිය යුතු ලෙස අවිනිශ්චිතතාවයකට භාජනය වේ. ආයුගණන ඇගයීමේදී භාවිතා කරන ලද උපකල්පන සටහන් අංක 32 හි දැක්වේ.

**3.3 මූල්‍ය උපකරණවල සාධාරණ අගය**

මූල්‍ය වත්කම් හා වගකීම්වල සාධාරණ අගයන් මූල්‍ය තත්ව ප්‍රකාශයේ වාර්තාගත කරන විට එම අගයන් සක්‍රීය වෙළඳපළ තුළින් ලබාගත නොහැකි අවස්ථාවලදී, එම අගයන් ලබා ගැනීම සඳහා විවිධ ආකාරයේ ආගණනය කරනු ලබන ගණිතමය ආකෘතිවලින් යුතු ශිල්පීය ක්‍රම උපයෝගී කරගෙන ඇත. මෙම ආකෘති තුළට යොදාගන්නා යෙදවුම් හැකි සෑම විටම නිරීක්ෂිත වෙළඳපොළ දත්ත මත ලබාගන්නා අතර, එවැනි දත්ත නොමැති අවස්ථාවන්හිදී විනිශ්චයන් මගින් සාධාරණ අගය ලබාගනු ලබයි. විනිශ්චයන්වලට එළඹීමේදී ද්‍රවශීලතාවය සහ දීර්ඝ කාලීන ව්‍යුත්පන්න මූල්‍ය උපකරණවල (longer-dated derivatives) වෙනස්වීම වැනි ආකෘතිවලට යොදාගන්නා යෙදවුම් සැලකිල්ලට ගෙන ඇත.

## 4. වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති වල වෙනස්වීම

මෙම මූල්‍ය වර්ෂය තුළදී ගිණුම්කරණ ප්‍රතිපත්ති නොවෙනස්ව පැවති අතර ඒවා පූර්ව කාලපරිච්ඡේදයේදී භාවිතා කළ ගිණුම්කරණ ප්‍රතිපත්ති හා ස්ථාවරව පවතී.

## 5. වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති

**5.1 විදේශීය මුදල් පරිවර්තනය හා ශේෂයන්**

විදේශීය මුදල්වලින් වන ගනුදෙනු, එකී ගනුදෙනු සිදුවන දිනයේ දී පවතින විනිමය අනුපාතික ප්‍රකාර බැංකුවේ භාවිතා වන මුදල් වටිනාකමට සටහන් කරනු ලැබේ. විදේශීය මුදල්වලින් වූ මූල්‍ය වත්කම් සහ බැරකම්, වාර්තාකරන දිනට පවතින විනිමය අනුපාතිකයන් ප්‍රකාර නැවත පරිවර්තනය කරනු ලැබේ. වෙනස්කම් සියල්ල ආදායම් ප්‍රකාශනයට ගනු ලැබේ. වාර්තා කරන දිනට වටිනාකම් නැවත පරිවර්තනය කිරීමේ දී, ප්‍රධාන ව්‍යවහාර මුදල්වලට වූ පහත දැක්වෙන ශ්‍රී ලංකා රුපියලේ විනිමය අනුපාතයන් භාවිතා කරන ලදී.

| මුදල් වර්ගය | 2023<br>රු. | 2022<br>රු. |
|---|---|---|
| ඕස්ට්‍රේලියානු ඩොලර් 1 | **220.2031** | 247.0237 |
| කැනේඩියානු ඩොලර් 1 | **245.1179** | 268.4335 |
| යුරෝ 1 | **375.4170** | 388.3461 |
| ජපන් යෙන් 1 | **2.2983** | 2.7703 |
| විශේෂ ගැනුම් හිමිකම් (වි.ගැ.හි.) 1 | **437.9894** | 483.3276 |
| ස්ටර්ලින් පවුම් 1 | **412.2896** | 437.4023 |
| ඇමරිකා එක්සත් ජනපද ඩොලර් 1 | **323.9233** | 363.1100 |
| චීන යුවාන් 1 (අක්වෙරළ) | **45.6377** | 52.6513 |

මූල්‍ය නොවන අයිතමයන් ඒවා සිදුවුන දින තිබූ විදේශීය මුදල් පරිවර්තනයට අනුව ඓතිහාසික අගයට පොත්වලට සටහන් කර ඇත.

**5.2 සාධාරණ අගය මිනුම් කිරිම**

බැංකුව විසින් විදේශීය සුරැකුම්පත්, ව්‍යුත්පන්න උපකරණ වැනි මූල්‍ය උපකරණයන් සහ රන් ආදී වූ මූල්‍ය නොවන උපකරණයන් එකී වාර්තාකරණ දිනයන්හි දී සාධාරණ අගයන්ට මිනුම්ගත කර ඇත. මීට අමතරව, ක්‍රමක්ෂය පිරිවැයට මිනුම්ගත කරන ලද මූල්‍ය උපකරණයන්හි සාධාරණ අගයන් අංක 50 සටහනෙහි හෙළිදරව් කර ඇත.

සාධාරණ අගය යනු වෙළෙඳපොළ ගණුදෙනුකරුවන් අතර සිදුවන ක්‍රමවත් ගනුදෙනුවක දී, මිනුම්ගත කරන ලද දිනයට, වත්කමක් විකිණීමෙන් ලැබෙන මුදල හෝ වගකීමක් හුවමාරු කිරීමේ දී ගෙවීමට සිදුවන මුදල ය.

මෙම සාධාරණ අගය මිනුම් කිරීම සඳහා පදනම් වන පූර්ව නිගමනය වනුයේ වත්කමක් විකිණීම හෝ වගකීමක් හුවමාරු කිරීම යන ගනුදෙනුවක්:

- වත්කම හෝ වගකීම අදාළ ප්‍රධාන වෙළෙඳපොළෙහි දී සිදුවීම හෝ,
- එවැනි ප්‍රධාන වෙළෙඳපොළක් නොමැති අවස්ථාවකදී එම වත්කම හෝ වගකීම සඳහා වඩාත් ම වාසි සහගත වෙළෙඳපොළෙහි දී සිදුවීමය.

මෙම ප්‍රධාන වෙළෙඳපොළ හෝ වඩාත් වාසිසහගත වෙළෙඳපොළ බැංකුවට පිවිසිය හැක්කක් විය යුතු ය.

වෙළෙඳපොළ ගණුදෙනුකරුවන්, ඔවුන්ට උපරිම ආර්ථික වාසි සැලසෙන ආකාරයට කටයුතු කිරීමේදී යොදාගනු ලබන උපකල්පනයක් මත පදනම්ව වත්කමක හෝ වගකීමක සාධාරණ අගය මිනුම් ගත කරයි. මූල්‍ය නොවන වත්කමක සාධාරණ අගය මිනුම් කිරීමේදී එම වත්කම වෙළෙඳපොළ ගනුදෙනුකරුවෙක්ට එහි උපරිම හා විශිෂ්ට ලෙස භාවිතා කොට හෝ එම වත්කම් එහි උපරිම හා විශිෂ්ට ලෙස භාවිතා කිරීමට හැකියාව ඇති වෙනත් වෙළෙඳපොළ ගනුදෙනුකරුවෙක්ට විකිණීමෙන් ආර්ථික වාසි ජනනය කිරීමට ඇති හැකියාව සලකා බලනු ලැබේ.

බැංකුව විසින් සාධාරණ අගයන් මිනුම් කිරීමේ ක්‍රියාවලිය උදෙසා අවස්ථාවට ඉතාමත් උචිත සහ සාධාරණ අගයන් මිනුම්ගත කිරීම අදාළ නිරීක්ෂණ යෙදවුම් හි උපරිම භාවිතය සහ නිරීක්ෂණය කළ නොහැකි යෙදවුම් භාවිතය අවම කිරීම යන කාර්යයන් සඳහා ප්‍රමාණවත් දත්ත අගය කිරීමේ ක්‍රමවේදයන් යොදා ගනු ලබයි. මූල්‍ය වාර්තාවන්හි සාධාරණ අගය මිනුම්ගත කළ හෝ හෙළිදරව් කළ සියළු වත්කම් හා වගකීම් සාධාරණ අගයන් ධුරාවලිය තුළ පහත දැක්වෙන පරිදි වර්ගීකරණයට ලක් කර ඇති අතර එය සමස්තයක් වශයෙන් සාධාරණ අගයන් නිශ්චය කිරීම සඳහා වැදගත් වන අවම මට්ටමේ යෙදවුම් මත පදනම් වේ.

පළමුවන මට්ටම - අනන්‍ය වත්කම හා වගකීම සඳහා ක්‍රියාකාරී වෙළෙඳපොළ තුළ හිමි ප්‍රකාශිත (නො සැකසූ) මිළ ගණන්

දෙවන මට්ටම - ඍජුව හෝ වක්‍රාකාරයෙන් නිරීක්ෂණය කළ හැකි, සාධාරණ අගයන් මිනුම් කිරීම සඳහා වැදගත් වන අවම මට්ටමේ යෙදවුම් භාවිතා කරන ඇගයුම් ක්‍රමවේදයන්

තෙවන මට්ටම - නිරීක්ෂණය කළ නොහැකි, සාධාරණ අගයන් මිනුම්ගත කිරීම සඳහා වැදගත්වන අවම මට්ටමේ යෙදවුම් භාවිතා කරන ඇගයුම් ක්‍රමවේදයන්.

පුනරාවර්තන පදනම මත හඳුනාගත් වත්කම් හා වගකීම් වල ඉහත ධුරාවලි මට්ටම් අතර මාරුවීම් සිදු වී ඇත්දැයි, යන්න වර්ගීකරණයේ නැවත තක්සේරු කිරීම් තුළින් (සාධාරණ අගයට මිණුම් කිරීම උදෙසා සමස්තයක් වශයෙන් වැදගත්වන අවම මට්ටමේ යෙදවුම් මත පදනම්ව) සෑම කාලපරිච්ඡේදයක් අවසානයේදීම බැංකුව තහවුරු කරනු ලබයි.

### 5.3 මූල්‍ය වත්කම් සහ බැරකම්

බැංකුව, මූල්‍ය වත්කම් සහ බැරකම් සහ ආශ්‍රිත ආදායම් හා වියදම් මාර්ගයන් ඉදිරිපත් කරනු ලබන්නේ විදේශීය මුදල් සහ දේශීය මුදල් ක්‍රියාකාරකම් වෙන්කොට හඳුනා දැක්වීමෙන්ය. විදේශීය මුදල් ක්‍රියාකාරකම් ප්‍රධාන වශයෙන් උද්ගත වන්නේ බැංකුවේ විදේශීය සංචිත කළමනාකරණ කාර්යයන්ගෙන්ය. මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම, මුදල් නිකුතු සහ බැංකු කටයුතුවලට ආශ්‍රිත වත්කම් සහ බැරකම් දේශීය මූල්‍ය ක්‍රියාකාරකම්වලින් පිළිබිඹු වේ.

මෙම ක්‍රියාකාරකම් වෙන් වෙන්ව වාර්තා කිරීම මගින්, බැංකුවේ මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්ය සාධනය සහ අවදානම් ආකෘතිය වඩා යෝග්‍ය අයුරින් ඉදිරිපත් කිරීම අපේක්ෂා කරනු ලැබේ. විදේශීය සහ දේශීය මුදල් ක්‍රියාකාරකම් ඒකාබද්ධව වාර්තා කිරීමෙන් මූල්‍ය ප්‍රකාශනයන්හි දැනුවත් කිරීමේ අගය දුර්වල වන බව බැංකුව විසින් සලකනු ලැබේ.

#### 5.3.1 හඳුනාගැනීම හා මූලික මිනුම් කිරීම

සියළු මූල්‍ය වත්කම් හා වගකීම් මූලිකව පිරිවැය මත හඳුනාගනු ලබන අතර ආයෝජනයට අදාල අත්පත් කර ගැනීමේ වියදම් ද ඇතුළුව, ඉදිරිපත් වන ප්‍රතිෂ්ඨාවෙහි සාධාරණ වටිනාකම පිරිවැයට ඇතුළත් වේ. සාමාන්‍යයෙන් මිලට ගනු ලබන සහ විකුණනු ලබන සියළු මූල්‍ය වත්කම් හා වගකීම් වෙළෙඳාම් දිනයේ දී හඳුනාගනු ලැබේ. මෙලෙස මිලට ගනු ලබන සහ විකුණන මූල්‍ය වත්කම් වූ කලී සාමාන්‍ය රෙගුලාසි මගින් හෝ වෙළෙඳපොළේ පවත්නා සම්ප්‍රදාය මගින් නියමිත කාල රාමුව තුළ දී භාරදිය යුතු මිලට ගනු ලැබූ හෝ විකුණනු ලැබූ මූල්‍ය වත්කම් වන්නේය.

**5.3.2 වර්ගීකරණය**

**මූල්‍ය වත්කම්**

මූලික මිනුම් හඳුනාගැනීමේදී බැංකුව විසින් මූල්‍ය වත්කම් පහත පරිදි වර්ගීකරණය කරනු ලබයි.

- මූල්‍ය වත්කම් ක්‍රමක්ෂය පිරිවැයට
- විස්තීරණ ආදායම තුළින් සාධාරණ අගයට මිනුම්කරණ මූල්‍ය වත්කම්
- ලාභ අලාභ තුළින් සාධාරණ අගයට මිණුම්කරණ මූල්‍ය වත්කම්

පහත සඳහන් කොන්දේසි වලට අනුකූලව යන ලාභ අලාභ තුළින් සාධාරණ මිලට ඇති සුරැකුම්පත් යටතේ වර්ගීකරණය නොකළ මූල්‍ය වත්කම් ක්‍රමක්ෂය පිරිවැයට අගය කරනු ලැබේ.

- එම මූල්‍ය වත්කම ගිවිසුම්ගත මුදල් ප්‍රවාහයන් රැස්කිරීමේ පරමාර්ථය සහිත ව්‍යාපාර ආකෘතියක පවත්වාගෙන යෑම.
- මූල්‍ය වත්කමේ ගිවිසුම්ගත කොන්දේසි මගින් නිශ්චිත දින වල ඇතිකරන මුදල් ප්‍රවාහ, මුල් මුදල හා මුල් මුදල මත ගෙවන පොළියෙන් පමණක් සමන්විත වීම.

මූල්‍ය වත්කමක් පහත සඳහන් කොන්දේසි වලට අනුකූල නම් සහ ලාභ හෝ පාඩු තුළින් සාධාරණ මිලට ඇති සුරැකුම්පත් යටතේ වර්ග කළ නොහැකි නම් එම මූල්‍ය වත්කම් අනෙකුත් විස්තීරණ ආදායම තුළින් සාධාරණ අගය කළ හැක.

- යම් කිසි මූල්‍ය වත්කමක් ගිවිසුම්ගත මූල්‍ය ප්‍රවාහ රැස්කිරීමේ හා මූල්‍ය වත්කම් විකිණීම යන පරමාර්ථ ද්විත්වයෙන් ව්‍යාපාර ආකෘතියක පවත්වාගෙන යෑම.
- මූල්‍ය වත්කමේ ගිවිසුම්ගත කොන්දේසි මගින් නිශ්චිත දින වල ඇතිකරන මුදල් ප්‍රවාහ මුල් මුදල හා මුල් මුදල මත ගෙවන පොළියෙන් පමණක් සමන්විත වීම.

වෙළඳාම සඳහා තබා නොගත් ස්කන්ධ ආයෝජන වල සාධාරණ අගයෙන් පසුව සිදුවන වෙනස්වීම් විස්තීරණ ආදායම තුළින් හඳුනාගැනීමේ අවලංගු කළ නොහැකි තෝරා ගැනීමක් එම ආයෝජනය මූලික හඳුනාගැනීමේදී බැංකුවට කළ හැකිය. අනෙකුත් සියලු මූල්‍ය වත්කම් ලාභ අලාභ තුළින් සාධාරණ අගයට මිනුම් කිරීම සඳහා වර්ගීකරණය කොට ඇත.

**ව්‍යාපාර ආකෘතිය තක්සේරු කිරීම**

බැංකුව විසින් ව්‍යාපාර ආකෘතියේ අරමුණු තක්සේරු කිරීමේදී මූල්‍ය වත්කම් අන්තර්ගත වන ආයෝජන කළඹ අරමුණු කොට එය සිදු කරනු ලබයි. ව්‍යාපාරය කළමණාකරණය කරන ආකාරය හා කළමණාකාරීත්වයට තොරතුරු ලබාදෙන ආකාරය මෙමගින් හොඳින්ම නිරූපනය වීම එයට හේතුවයි.

එසේ සලකා බලන තොරතුරු වලට පහත ඒවා ඇතුළත් වන නමුත් ඒවාට පමණක් සීමා නොවේ.

- ව්‍යාපාරික ආකෘතියේ කාර්ය සාධනය සහ ව්‍යාපාරික අකෘතිය තුළ රඳවා ඇති මූල්‍ය වත්කම් අගය කිරීම හා ප්‍රධාන කළමණාකාරීත්වයට වාර්ථා කරන ආකාරය
- ව්‍යාපාරික ආකෘතියේ කාර්ය සාධනයට බලපෑ හැකි අවදානම් (සහ එම ව්‍යාපාරික ආකෘතිය තුළ රඳවාගෙන ඇති මූල්‍ය වත්කම්) සහ විශේෂයෙන් අවදානම් කළමණාකරණය කරන ආකාරය.
- පූර්ව කාලපරිච්ඡේදයේ විකුණුම්වල වාර ගණන, වටිනාකම්, එම විකුණුම්වල කාල නිර්ණය විකිණීමට බලපෑ හේතු සාධක සහ අනාගත විකුණුම්වල අපේක්ෂාවන් සලකා බැලීම අවශ්‍ය වේ. කෙසේ වෙතත් විකුණුම් මගින්ම ව්‍යාපාරික ආකෘතිය නිර්ණය නොවන බැවින් එය හුදෙකලාව සැලකිල්ලට ගත නොහැක. ඒ වෙනුවට එය බැංකුවේ මූල්‍ය වත්කම් කළමණාකරණය සඳහා ප්‍රකාශිත අරමුණු සාක්ෂාත් කර ගැනීම හා මුදල් ප්‍රවාහ උපලබ්ධි කරගන්නේ කෙසේද යන සමස්ථ තක්සේරුවේ කොටසක් ලෙස යොදා ගත යුතුවේ.

වෙළඳාම සඳහා තබාගත් හෝ සාධාරණ අගය වෙනස්වීම මත පදනම්ව කාර්ය සාධනය මනිනු ලබන මූල්‍ය වත්කම් ලාභ අලාභ තුළින් සාධාරණ අගයට මනිනු ලැබේ. එයට හේතුව ඒවා ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ රැස්කිරීම හා මූල්‍ය වත්කම් විකිණීමට හෝ රඳවාගෙන නොමැති නිසාය.

**ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ යනු, මූලික මුදල හා ඒ මත වන පොළිය (SPPI) පමණක්දැයි විමසීම පිළිබඳව වන තක්සේරුව.**

බැංකුව විසින් මූලික හා මූලික මුදල මත පොළිය පමණක් යන කොන්දේසිය (SPPI Test) තහවුරු කර ගැනීම සඳහා මූල්‍ය වත්කම් වල ගිවිසුම්ගත කොන්දේසි තක්සේරු කරනු ලැබේ. මේ සඳහා මූල්‍ය වත්කමක් පළමු වරට හඳුනාගැනීමේදී ඇති සාධාරණ අගය "මූලික මුදල" ලෙසද කිසියම් කාලසීමාවක් තුළ ගෙවීමට ඇති මුල් මුදල හා බැඳි ණය අවධානමත්, අනෙකුත් මූලික ණය දීමේ අවධානම හා පිරිවැයත්, මුදලේ කාලීන වටිනාකමෙහි අගයත් "මූලික මුදල මත වන පොළිය" ලෙස අර්ථ දැක්වේ.

මූලික ණය දීමේ එකඟතාවයකදී පොළියේ ඇති වඩාත් වැදගත් මූලිකාංගයන් ලෙස මුදලේ කාලීන අගය හා ණය අවධානම සඳහා ගෙවනු ලබන අගය හැඳින්විය හැකිය.

SPPF තක්සේරුව කිරීම සඳහා බැංකුව විසින් විනිශ්චයන් අදාළ කර ගන්නා අතර මූල්‍ය වත්කම් නිරූපනය කරන මුදල් ඒකකය හා පොළී අනුපාතය නියම කර ඇති කාලපරිච්ඡේදය යනාදිය අදාළ සාධක ලෙස සලකා බලනු ලබයි.

කෙසේ වුවද ණයදීම පිළිබඳ මූලික එකඟතාවයන් හා සම්බන්ධ නැති ගිවිසුම්ගත මුදල් ප්‍රවාහයන්හි අවධානම හෝ විචලනය වන ස්වභාවයට අනාවරණය වීම් හඳුන්වාදෙන ආකාරයේ ගිවිසුම්ගත කොන්දේසි, මූලික මුදල හා ඒ මත වන පොළිය (SPPF) පමණක් වූ මුදල් ප්‍රවාහ වලට හේතු නොවේ. එවන් අවස්ථාවන්හිදී, එකී මූල්‍ය වත්කම ලාභ අලාභ තුළින් සාධාරණ අගයට මිනුම් කරනු ලැබේ.

**ප්‍රතිවර්ගීකරණය**

බැංකුව විසින් මූල්‍ය වත්කම් කළමණාකරණය සඳහා වූ ව්‍යාපාර ආකෘතිය වෙනස් කිරීමේ දී හැර, මූල්‍ය වත්කම් පළමුවරට හඳුනාගත් පසු ප්‍රතිවර්ගීකරණය නොකරයි.

**5.3.3. ඉවත් කිරීම්**

**මූල්‍ය වත්කම්**

බැංකුවට මූල්‍ය වත්කමෙහි මුදල් ප්‍රවාහ සඳහා ඇති ගිවිසුම්ගත අයිතිවාසිකම් අවසන්වීමේදී හෝ මූල්‍ය වත්කමේ සියලු අවදානම් හා ප්‍රතිලාභ සැලකිය යුතු ප්‍රමාණයක් වෙනත් පාර්ශ්වයකට පවරන්නේ නම් හෝ මූල්‍ය වත්කමේ සියලු අවදානම් සහ ප්‍රතිලාභ සැහෙන දුරට පැවරුම් කර හෝ රඳවාගෙන නොමැති විට හා වත්කමේ පාලනය රඳවාගෙන නොමැති විට එය පොත් වලින් ඉවත් කළ යුතුය.

මූල්‍ය වත්කමක් ඉවත් කිරීමේදී,

(i) එහි ධාරණ අගය හා ප්‍රතිශ්ඨාව අතර වෙනස සහ

(ii) විස්තීරණ ආදායම් තුළ කලින් හඳුනා ගන්නා ලද සමුච්චිත ලාභය හෝ අලාභය

යන දෙකම ආදායම ප්‍රකාශය තුළ නිරූපණය විය යුතුය.

අනෙකුත් විස්තීරණ ආදායම තුළින් සාධාරණ අගයට වන ස්කන්ධ ආයෝජන පොත් වලින් ඉවත් කිරීමේදී ඊට අදාළව විස්තීරණ ආදායම තුළ හඳුනාගත් සමුච්චිත ලාභ අලාභ ආදායම් ප්‍රකාශය තුළ ඇතුළත් නොකෙරේ.

පැවරුම කිරීමකින් පොත්වලින් ඉවත් කරන ලද මූල්‍ය වත්කමකට අදාළව ජනනය කරන ලද හෝ රඳවා ගත් පොළිය වෙනම වත්කමක් හෝ බැරකමක් ලෙස හඳුනා ගැනේ.

මූල්‍ය තත්ත්ව ප්‍රකාශය මත හඳුනාගෙන පවරන ලද එහෙත් සියළු අවදානම් හා ප්‍රතිලාභයන් හෝ ඉන් වැඩි ප්‍රමාණයක් රඳවාගත් වත්කම් ඉවත් කරනු නොලබයි. සුරැකුම්පත් ණයට දීම, විකිණීම සහ ප්‍රතිමිලදී ගැනීම් ගණුදෙනු මේ සඳහා උදාහරණයන් වේ. මෙබඳු ගණුදෙනු වලදී බැංකුව අදාළ මූල්‍ය වත්කමෙහි හිමිකාරීත්වයේ අවදානම් හා ප්‍රතිලාභ සම්පූර්ණයෙන් හෝ කොටසක් රඳවා ගැනීම හෝ මාරු කිරීම සිදු කරනු නොලබන අතර වත්කමෙහි පාලනය බැංකුව සතුව රඳවා ගනී. අදාළ වත්කම කෙරෙහි බැංකුව දක්වන අඛණ්ඩ මැදිහත්වීමේ ප්‍රමාණය අනුව එම වත්කම හඳුනා ගැනේ.

**මූල්‍ය බැරකම්**

මූල්‍ය බැරකමක් ඉවත් කරනු ලබනුයේ එහි ගිවිසුම්ගත බැඳීම නිදහස් කිරීම, අවලංගු කිරීම හෝ කල් පිරීම සිදු වූ විටය.

**5.3.4. මූල්‍ය වත්කම් හානිකරණය**

බැංකුව විසින් ලාභ අලාභ තුළින් සාධාරණ අගයට අගය නොකළ පහත මූල්‍ය උපකරණ වෙනුවෙන් අපේක්ෂිත ණය අලාභ සඳහා හානිකරන අලාභ හඳුනා ගනී.

- අනෙකුත් විස්තීරණ ආදායම තුළින් සාධාරණ අගයට නිරූපිත මූල්‍ය වත්කම්
- ක්‍රමක්ෂය පිරිවැයට මූල්‍ය වත්කම්
- ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවේ ණය ඇපකර ගිවිසුම්

ස්කන්ධ ආයෝජන මත හානිකරණ අලාභ හඳුනා නොගැනේ. බැංකුව විසින් ඉහළ ආයෝජන ශ්‍රේණියෙහි පිහිටි (Baa3/BBB- සහ ඉහළ ශ්‍රේණිගත) ආයෝජන සඳහා මාස 12 ක අපේක්ෂිත ණය අලාභවලට සමාන හානිකරණ අලාභයන් හඳුනා ගනී. අනෙකුත් විස්තීරණ ආදායම තුළින් සාධාරණ අගයට හෝ ක්‍රමක්ෂය පිරිවැයට වර්ගීකරණය කරන ලද බැංකුවේ බහුතරයක්

ආයෝජන Baa3/BBB- අගයට ඉහලින් ශ්‍රේණිගතය. මාස 12 ක අපේක්ෂිත ණය අලාභයක් හඳුනාගන්නා මූල්‍ය උපකරණ "පළමු අදියරේ මූල්‍ය උපකරණ" ලෙස හඳුනා ගැනේ.

මුල්වරට හඳුනාගැනීමේදී පහළ ආයෝජන ශ්‍රේණිගත හෝ මුල්වරට හඳුනාගැනීමෙන් පසුව ණය ශ්‍රේණිය පහළ හෙළන ලද (Baa3/BBB- අගයට වඩා පහළ ශ්‍රේණිගත) ආයෝජන උපකරණ සඳහා හෝ මුල්වරට හඳුනා ගැනීමෙන් පසු ගෙවීම් පැහැර හැරීමේ සම්භාවිතාවය දෙගුණයක් දක්වා වර්ධනය වූ ජීවකාලයේ අපේක්ෂිත ණය අලාභවලට සමාන හානිකරණ අලාභයක් ගණනය කරයි. ජීවකාලයේ අපේක්ෂිත ණය අලාභවලට සමාන හානිකරන අලාභයන් හඳුනාගනු ලබන, එහෙත් මුළුමනින්ම ණය හානිකරණය නොකරන ලද ණය උපකරණ "දෙවන අදියරේ මූල්‍ය උපකරණ" ලෙස හඳුනා ගැනේ. ජීව කාලයේ අපේක්ෂිත ණය අලාභවලට සමාන හානිකරණ අලාභයක් ගණනය කරනු ලබන විට ඒවා (මුළුමනින්ම ණය හානිකරණය කරන ලද ණය උපකරණ) "තෙවන අදියරේ මූල්‍ය උපකරණ" ලෙස හැඳින්වේ.

**අපේක්ෂිත ණය අලාභ මැනීම**

අපේක්ෂිත ණය අලාභ ගණනය කිරීමේ යාන්ත්‍රණය පහත ප්‍රධාන මූලිකාංගයන් සමඟ විස්තර කර ඇත.

**ණය පැහැර හැරීමේ සම්භාවිතාව**

පැහැර හැරීමේ සම්භාවිතාව යනු දෙන ලද කාල සීමාවක් තුළ ගෙවීම් පැහැර හැරීමට ඇති නැඹුරුව සම්බන්ධ ඇස්තමේන්තුවයි. අදාළ පහසුකම (ආයෝජනය/ණය) පොත්වලින් ඉවත් කොට නොමැතිනම් හා තවමත් ආයෝජන කළඹෙහි ඇතුළත් නම් පමණක් තක්සේරු කරන කාලපරිච්ඡේදය තුළදී ගෙවීම් පැහැර හැරීම, යම් නිශ්චිත කාලයක් තුළ සිදුවිය හැක.

බැංකුව විසින් සියලු විදේශ ආයෝජන (ක්‍රමක්ෂය පිරිවැයට හා විස්තීරණ ආදායම තුළින් සාධාරණ අගයට මිනුම් කරන වත්කම්) සඳහා නිකුත් කරන්නන්ගේ හා ප්‍රතිපාර්ශ්වයන්ගේ නිශ්චිත ස්කන්ධ කොටස් මත වන පැහැර හැරීමේ සම්භාවිතයන් බ්ලූම්බර්ග් (Bloomberg) තොරතුරු පද්ධතිය තුළින් ලබා ගනී. එවන් නිශ්චිත ස්කන්ධ කොටස් මත වන පැහැර හැරීමේ සම්භාවිතයන් නැතිවිට බැංකුව විසින් අදාළ නිකුත් කරන්නන්ගේ හා ප්‍රතිපාර්ශ්වයන්ගේ ශ්‍රේණිගත කිරීම් සඳහා බ්ලූම්බර්ග් තොරතුරු පද්ධතියේ ඇති පොදු පැහැර හැරීමේ සම්භාවිතා වගුව (Common PD Table) මගින් වාර්තා කරන දිනට ඇති පැහැර හැරීමේ සම්භාවිතාවය ලබා ගනු ලැබේ.

**ගෙවීම් පැහැර හැරීමේදී ඇති නිරාවරණය**

ගෙවීම් පැහැර හැරීමේදී ඇති නිරාවරණය යනු අනාගත ගෙවීම් පැහැර හරින දිනයකදී බැංකුව නිරාවරණය වන මූල්‍ය වත්කමෙහි වටිනාකම පිළිබඳ ඇස්තමේන්තුවයි. එම ඇස්තමේන්තුව මූලික මුදල හා ඒ මත වන පොලිය ආපසු ගෙවීම, කොන්ත්‍රාත්තුවකින් හෝ වෙනත් ආකාරයකින් නියම කරනු ලබන ණය බැඳියාවන්ගේ අනාගත නිකුත් කිරීම හා මඟහැරුණු ගෙවීම් සඳහා වන උපචිත පොලිය ඇතුළත්ව අනාගත නිරාවරණ ප්‍රමාණය මත වන අපේක්ෂිත වෙනස්වීම් සැලකිල්ලට ගනිමින් සිදු කරනු ලබයි.

**පැහැර හැරීමකදී වන අලාභය**

පැහැර හැරීමකදී වන අලාභය යනු දී ඇති දිනයකදී ගෙවීම් පැහැර හැරීම නිසා බැංකුවට සිදුවන අලාභය පිළිබඳ ඇස්තමේන්තුවයි. එය ලැබීමට නියමිත ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ හා බැංකුව ලැබීමට අපේක්ෂා කරන මුදල් ප්‍රවාහය අතර වෙනසට ඇප වශයෙන් තබා ඇති වත්කම් උපලබ්ධි කිරීමෙන් ලැබෙන ප්‍රමාණයද ඇතුළත් කිරීමෙන් ගණනය කෙරේ. බැංකුවට එක් එක් වෙන්වූ මූල්‍ය වත්කමෙන් වන අවදානම් නිරාවරණය මත පදනම්ව යොදාගත යුතු පැහැර හැරීමකදී වන අලාභ ප්‍රතිශතය තීරණය කිරීමට අභ්‍යන්තරව අනුමත කරන ලද ප්‍රතිපත්තියක් ඇත.

**ආර්ථික සාධක ගැලපීම**

යම් කාලපරිච්ඡෙදයක් සඳහා බලපැවැත්වෙන පැහැර හැරිමේ සම්භාවිතාව, යම් මොහොතක පවතින (වාර්තා කරන දිනට) පැහැර හැරීමේ සම්භාවිතාවයකට පරිවර්තනය කිරීම සඳහා බැංකුව විසින් ආර්ථික සාධක ගැලපීම යොදා ගනී. බැංකුව, පැහැර හැරීමේ සම්භාවිතාව වෙනස් කිරීම සඳහා ප්‍රධාන ආර්ථික සාධක ලෙස දළ දේශීය නිෂ්පාදනය, උද්ධමනය හා පොළී අනුපාතය යන දත්ත යොදාගනී.

**ණය අවධානමේ සැලකිය යුතු වැඩිවීමක් ඇත්දැයි ඇගයීම**

මූල්‍ය වත්කම්/ උපකරණ මුල් වරට හඳුනාගැනීමේ දිනට පසු සිදුවන ගෙවීම් පැහැර හැරීමේ සම්භාවිතාවේ දෙගුණයක වර්ධනයක් හෝ අදාළ මූල්‍ය වත්කම/ උපකරණ නිකුත් කරන්නන්ගේ හෝ ප්‍රතිපාර්ශ්වයේ ශ්‍රේණිගත කිරීම BBB - වලට වඩා පහළ යාමක් සිදුවේ නම් එය අදාළ මූල්‍ය උපකරණයේ ණය අවදානමේ සැලකිය යුතු වැඩිවීමක් ලෙස බැංකුව සලකා බලනු ලැබේ.

ඉහත කරුණු ඉහළ ආයෝජන ශ්‍රේණියක සිට පහළ ආයෝජන ශ්‍රේණියක් දක්වා වන සියලු ශ්‍රේණිගත කිරීම්වල පහළ වැටීමත් (Baa3 සිට Ba1 දක්වා වූ සුළු පහත වැටීමක්ද ඇතුළත්ව) ගෙවීම පැහැර හැරීමේ සම්භාවිතාවය දෙගුණයක හෝ ඊට වැඩි අගයකින් වැඩිවීමට තුඩුදෙන බවට වන නිරීක්ෂණය මත පදනම් වේ.

**ණය හානිකරණය වූ මූල්‍ය වත්කම්**

ක්‍රමක්ෂය පිරිවැයට හා විස්තීරණ ආදායම තුළින් සාධාරණ අගයට මිනුම් කළ මූල්‍ය වත්කම් හා ණය ඇපකර යනාදිය ණය හානිකරණය වී ඇත්දැයි (අදියර 3 ලෙස සඳහන් කර ඇති මූල්‍ය වත්කම්) සෑම වාර්තා කරන දිනකදීම බැංකුව විසින් අගයනු ලබයි. මූල්‍ය වත්කම් එහි ඇස්තමේන්තු කළ අනාගත මුදල් ප්‍රවාහ වලට අවාසිදායක බලපෑමක් වී ඇති එකක් හෝ ඊට වැඩි සිද්ධීන් ඇති වූ විට එම මූල්‍ය වත්කම ණය හානිකරණය වී ඇත. මූල්‍ය වත්කම ණය හානිකරණය වී ඇති බවට නිරීක්ෂණය කළ හැකි සාක්ෂි වලට පහත සිද්ධීන් පිළිබඳව දත්ත ඇතුළත් වේ.

- නිකුත් කරන්නාගේ හෝ ණය ගන්නාගේ සැළකිය යුතු අන්දමේ මූල්‍ය දුෂ්කරතා
- ගෙවීම් පැහැර හැරීමක් හෝ කල් ඉකුත් වූ සිද්ධීන් වැනි ගිවිසුම් කඩ කිරීමක්
- ණය ගැණුම්කරුවන් බුන්වත් බවට හෝ වෙනත් මූල්‍ය ප්‍රතිව්‍යුහගත කිරීමකට පත්වීම අපේක්ෂා කළ හැකි බව

**අපේක්ෂිත ණය අලාභ සඳහා වන වෙන්කිරීම් මූල්‍ය තත්ව ප්‍රකාශය තුළ ඉදිරිපත් කිරීම**

අපේක්ෂිත ණය අලාභ සඳහා වන වෙන්කිරීම්, මූල්‍ය තත්ව ප්‍රකාශයේ පහත අයුරින් ඉදිරිපත් කර ඇත.

- ක්‍රමක්ෂය පිරිවැයට මනිනු ලබන මූල්‍ය වත්කම් : අදාළ මූල්‍ය වත්කමේ දළ ධාරණ වටිනාකමෙන් අඩු කොට දැක්වීම.
- විස්තීරණ ආදායම තුළින් සාධාරණ අගයට මනිනු ලබන මූල්‍ය වත්කම් : මූල්‍ය තත්ව ප්‍රකාශය තුළ මෙවැනි දළ ධාරණ වටිනාකම සාධාරණ අගය වන හෙයින් ණය අලාභ වෙන් කිරීම් කිසිවක් මූල්‍ය තත්ව ප්‍රකාශය තුළ හඳුනාගනු නොලබයි. කෙසේ වෙතත් අදාළ ණය අලාභ වෙන් කිරීම් විස්තීරණ ආදායම තුළ හඳුනාගෙන අනාවරණය කර ඇත.
- ණය ඇපකර ගිවිසුම : වෙන්කිරීමක් ලෙස.

**ලියා හැරීම**

ණය දීමක් හෝ ණය සුරැකුම්පතක් නැවත අය කර ගැනීමට (සම්පූර්ණයෙන්ම හෝ අර්ධ වශයෙන්) බැංකුවට සාධාරණ අපේක්ෂාවන් නොමැති විට ඒවා ලියා හරිනු ලබයි. ලියා හැරීමට යටත් ණයගැතියන්ට ණය ආපසු ගෙවීම සඳහා ප්‍රමාණවත් මුදල් ප්‍රවාහ රැස්කර ගැනීමට හැකි වත්කම් හෝ ආදායම් මූලාශ්‍ර නොමැති විට මෙසේ ණය ලියා හරිනු ලබයි. මෙම ඇගයීම එක් එක් වත්කම සම්බන්ධයෙන් සිදුකරන අතර, කලින් ලියා හරින ලද ප්‍රමාණයන් ආපසු අයකර ගැනීමකදී එම මුදල ආදායම් ප්‍රකාශයේ හා විස්තීරණ ආදායම් ප්‍රකාශය තුළ “මූල්‍ය උපකරණ මත වන හානිකරණ අලාභ” යන මැයෙන් ඇතුළත් කරනු ලැබේ.

### 5.4 ලාභය හෝ පාඩුව තුළින් සාධාරණ අගයට ඇති සුරැකුම්පත්

වෙළෙඳාම සඳහා ගැනෙන මූල්‍ය වත්කම්, “ලාභය හෝ පාඩුව තුළින් සාධාරණ අගයට ඇති වත්කම්” යටතේ වර්ග කර ඇතුළත් කර ඇත. මූලික හඳුනාගැනීමේදී ආරෝපණය කළ ගනුදෙනු පිරිවැය ආදායම් ප්‍රකාශය තුළ දරණ ලද ලෙස හඳුනාගනු ලැබේ. මෙම සුරැකුම්පත් අනතුරුව ප්‍රකාශිත වෙළෙඳපොළ මිළ ප්‍රකාර අගය කරනු ලැබේ. වෙළෙඳපොළ අගයෙහි වෙනස්වීම, මූල්‍ය තත්ව ප්‍රකාශනයෙහි සුරැකුම්පත් යටතේ වටිනාකම් වැඩිවීමක් හෝ අඩුවීමක් ලෙස හඳුනා ගන්නා අතර එයින් උද්ගත වන වාසිය/පාඩුව ආදායම් ප්‍රකාශයෙහි හඳුනාගනු ඇත.

සුරැකුම්පත් තවදුරටත් අයිතිව පවතින්නේ නම් අදාල වාසිය/අවාසිය “උපලබ්ධි නොවූ මිල ප්‍රත්‍යාගණනයෙන් වාසිය/(පාඩුව)” ලෙස වාර්තා කරනු ලැබේ. සුරැකුම්පත් විකිණීම මගින් වාසියක් හෝ අවාසියක් උද්ගත වන්නේ නම්, එය “මිල වෙනස්වීමේ උපලබ්ධි වාසිය/(පාඩුව)” ලෙස වාර්තා කරනු ලැබේ.

### 5.5 අනෙකුත් විස්තීරණ ආදායම තුළින් සාධාරණ අගයට ඇති මූල්‍ය වත්කම්

අනෙකුත් විස්තීරණ ආදායම තුළින් සාධාරණ අගයට ඇති මූල්‍ය වත්කම් වනුයේ ව්‍යුත්පන්න නොවන ආයෝජන හා අනෙකුත් මූල්‍ය වත්කම් කාණ්ඩයකට වාර්තා නොකරන ලද ආයෝජනයි. මෙයට ස්කන්ධ සුරැකුම්පත් හා ණය සුරැකුම්පත් ඇතුළත් වේ.

මෙම ආයෝජන පසුව වෙළෙඳපොළ මිල අනුව අගය කරනු ලැබේ. වෙළෙඳපොළ අගයෙහි වෙනස්වීම, මූල්‍ය තත්ව ප්‍රකාශයේ අනෙකුත් විස්තීරණ ආදායම තුළින් සාධාරණ අගයට ඇති සුරැකුම්පත් වල වටිනාකම වැඩිවීම හෝ අඩුවීම වශයෙන් හඳුන්වනු ලැබේ.

අනෙකුත් විස්තීරණ ආදායම තුළින් සාධාරණ අගයට ඇති ස්කන්ධ ආයෝජන, වෙළෙඳපොළ අගයන් නොමැතිවීම හේතුවෙන් ඒ ඒ ආයෝජන පවතින ආයතනයන්ගේ ශුද්ධ වත්කම් මත පදනම්ව අගය කර ඇත.

මෙම වර්ගීකරණයට අදාළ දේශීය හා විදේශීය ණය සුරැකුම්පත් හා ස්කන්ධ ආයෝජන වල වෙළෙඳපොළ අගයෙහි වෙනස්වීම් නිසා උද්ගතවන වාසි හෝ අවාසි එම වත්කම් විකිණීම, ප්‍රතිග්‍රහණය, ඉවත් කිරීම හෝ හානිකරණය වන තෙක් කෙලින්ම බැංකුවේ හිමිකරු ප්‍රාග්ධනය (විස්තීරණ ආදායම) හි ඇති අනෙකුත් සංචිත තුළ පෙන්වන අතර ඉහත සඳහන් ක්‍රමවලින් වත්කම පොත් වලින් ඉවත් කරන විට අදාළ ලාභ හා පාඩු, ආදායම් ප්‍රකාශය තුළ වාර්තා කරනු ලබයි.

කෙසේ වෙතත් ස්කන්ධ ආයෝජන පොත් වලින් ඉවත් කිරීමේදී එයට අදාළ වෙළෙඳපොළ අගයන්ගේ වෙනස්වීමෙන් ලද ලාභ හා පාඩු, ආදායම් ප්‍රකාශනය තුළින් ප්‍රතිචක්‍රණය නොකෙරේ.

මෙම වත්කම් වලට අදාළ පොලී ආදායම සඵල පොලී ක්‍රමය භාවිතා කර ආදායම් ප්‍රකාශනය තුළ හඳුනාගනු ලැබේ.

**5.6 ක්‍රමක්ෂය පිරිවැය යටතේ රඳවාගත් උපකරණ**

ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ ලබාගැනීමේ අරමුණින් යුතු ව්‍යාපාර ආකෘතිය යටතේ රඳවාගත් හා ගිවිසුම්ගත කොන්දේසි අනුව නිශ්චිත දිනයන්හිදී මූලික මුදල හා ඒ මත පොළිය පමණක් ලබාදෙන මූල්‍ය වත්කම්, ක්‍රමක්ෂය පිරිවැය යටතේ රඳවාගත් උපකරණ ලෙස වර්ගීකරණය කරනු ලැබේ. මෙම උපකරණ පසුකාලීනව සඵල පොළී ක්‍රමය භාවිතා කර ක්‍රමක්ෂය පිරිවැය යටතේ මනිනු ලැබේ.

**5.7 ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ**

මුදල් හුවමාරු, ඉදිරි විදේශ විනිමය ගිවිසුම් වැනි ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ බැංකු විසින් භාවිතා කරනු ලබන අතර ඒවා භාවිතා කරනුයේ අවදානම් කළමනාකරණය කිරීමේ අරමුණු සඳහා මිස සමපේක්ෂාත්මක අරමුණු සඳහා නොවේ. ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ එහි සාධාරණ අගයට වාර්තා කරන අතර එහි සාධාරණ අගය ධන අගයක් ගන්නා විට වත්කමක් ලෙසත් එම අගය ඍණ අගයක් ගන්නා විට වගකීමක් ලෙසත් වාර්තා කරයි. ව්‍යුත්පන්න මූල්‍ය උපකරණයන්ගේ සාධාරණ අගයෙහි ඇතිවන චලනයන් "උපලබ්ධි නොවූ මිල ප්‍රත්‍යාගණනයන්ගෙන් වාසිය/(පාඩුව)" යටතේ වාර්තා කරනු ලැබේ.

ගනුදෙණුවක මිල ඒ හා සමාන ගණුදෙණු පවතින්නා වූ නිරීක්ෂණය කළ හැකි වර්ථමාන වෙළෙඳපළක සාධාරණ අගයෙන් වෙනස් වේ නම් හෝ මිල නිරීක්ෂණය කල හැකි වර්ථමාන වෙළෙඳපළෙහි දත්ත පමණක් විචල්‍යන් ලෙස යොදාගත් ඇගයීම් ශිල්ප ක්‍රමයක් භාවිතයෙන් ලබාගත් මිලෙන් වෙනස් වේ නම්, බැංකුව විසින් එම ගණුදෙණුවේ මිල හා සාධාරණ අගය අතර වෙනස (දිනට වෙනස) "උපලබ්ධි නොවූ මිල ප්‍රත්‍යාගණන ලාභ/(පාඩු)" ලෙස හඳුනාගනු ලබයි. ගණුදෙණුවක සාධාරණ අගය නිරීක්ෂණය කළ නොහැකි දත්ත මත පැනවිම තිරණය කළ අවස්ථාවක එම ගණුදෙණුවේ මිල හා අදාල ඇගයීම් රාමුවේ මිල අතර වෙනස, අදාළ යෙදවුම් නිරීක්ෂණය කළ හැකි වූ විට හෝ එම උපකරණ මූල්‍ය ප්‍රකාශ වලින් ඉවත් කල විට පමණක් ආදායම් ප්‍රකාශය තුළ ගලපනු ලබයි.

**5.8 ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ශේෂයන් (IMF)**

බැංකුව විසින් ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (ජා.මූ.අ.) සමග කරනු ලබන ගනුදෙනු ශ්‍රී ලංකා රජයේ නියෝජිතයෙකු ලෙස නොව, තම බලතල ප්‍රකාර සිදුකරනු ලැබේ. බැංකුව විසින් ජා.මූ.අ. සමඟ සිදුකෙරෙන සියළු ගනුදෙනු එම පදනම මත මෙම මූල්‍ය ප්‍රකාශනයන්හි ඇතුළත් කර ඇත.

ජා.මූ.අ. සමඟ වූ පංගුව වත්කමක් වශයෙන් බැංකුව විසින් සටහන් කර ඇති අතර, එම පංගුව සඳහා ජා.මූ.අ. වෙත ගෙවිය යුතු මුදල බැංකුවේ බැරකමක් ලෙස සටහන් කර ඇත. ජා.මූ.අ. විසින් වෙන් කරන ලද සමුච්චිත විශේෂ ගැනුම් හිමිකම් (වි.ගැ.හි.) ප්‍රමාණය බැරකමක් ලෙස සලකනු ලැබේ. ජා.මූ.අ. සමඟ වූ පංගුව ලාභය හෝ පාඩුව තුළින් සාධාරණ අගය ලෙස වර්ගීකරණය කර ඇති අතර අනෙකුත් ජා.මූ.අ. හා අදාල වන සියලුම වත්කම් සහ වගකීම් සඵල පොලී ක්‍රමය මත ක්‍රමක්ෂය පිරිවැයට හඳුනාග නු ලැබේ. ජා.මූ.අ. විසින් වාර්තාකරණ දිනට ප්‍රකාශයට පත්කරන ලද විනිමය අනුපාතිකයන් අනුව ජා.මූ.අ. වත්කම් සහ බැරකම් ප්‍රත්‍යාගණනයෙන් උද්ගත වන විනිමය ලාභ හෝ පාඩු ආදායම් ප්‍රකාශනයෙහි හඳුනාගනු ලැබේ.

ජා.මූ.අ. සමඟ වු ශේෂයන්ට අදාළ සියළුම ගාස්තු සහ පොළිය ආදායම් ප්‍රකාශනයෙහි සටහන් කරනු ලැබේ.

**5.9 මුදල් සහ මුදල් සමානයන්**

විදේශීය බැංකු සහ මූල්‍ය ආයතනයන්හි ඇති මුදල්, කෙටිකාලීන තැන්පතු සහ පරිණත කාලය මාස තුනකට අඩු, සාධාරණ අගය වෙනස්වීමේ සැලකිය යුතු අවදානමක් නොමැති සහ බැංකුව මගින් එහි කෙටිකාලීන බැඳීම් කළමණාකරණය සඳහා යොදා ගන්නා ඉහළ ද්‍රවශීලතාවයකින් යුතු මූල්‍ය වත්කම් මුදල් සහ මුදල් සමානයන්ට අයත් වේ.

මුදල් සහ මුදල් සමානයන් ක්‍රමක්ෂය පිරිවැයට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ ඇතුලත් කරනු ලැබේ.

දේශීය මුදල් ක්‍රියාකාරකම්වල අංගයක් වශයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව ඇතැම් ආදායම් ඉපැයීම් ද ඇතැම් වියදම් දැරීම ද සිදුකරන නමුත්, එමගින් මුදල් චලනයක් සිදු නොවේ. එම ක්‍රියාකාරකම්වලින් ඇතැම් වත්කම් සහ බැරකම් ද උද්ගත වන අතර එයට ප්‍රධාන වශයෙන් ශ්‍රී ලංකා රජය සමග සහ දේශීය බැංකු සහ මූල්‍ය ආයතන සමග ගනුදෙනු අදාළ වේ. ශ්‍රී ලංකා රජය සමග වන ගනුදෙනුවලට මූල්‍ය ප්‍රතිපත්ති කාරකයක් ලෙස රජය විසින් නිකුත් කරනු ලබන භාණ්ඩාගාර බිල්පත්වල ආයක නොවූ කොටසක් සහ රජය විසින් නිකුත් කරනු ලබන බැඳුම්කර අයත් වේ. එවැනි මිලට ගැනීම්, බැහැර කිරීම් හෝ ඒ මත පොළිය හුදෙක් පොත් සටහන් වශයෙන් පමණක් ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාවල සටහන් කරනු ලැබේ. මේවා මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් 45 සහ සටහන් 46 යටතේ වෙන් වෙන්ව හෙළිදරව් කර ඇත.

ශ්‍රී ලංකා මහ බැංකු පනතේ විධිවිධාන ප්‍රකාර, ව්‍යවස්ථාපිත අධිකාරිය වශයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මහජනයා වෙත මුදල් නිකුත් කරනු ලැබේ. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරනු ලබන මුදල්, දරන්නා වෙනුවෙන් බැංකුව මගින් හිමිකමක් පවතී. මෙය බැංකුවට බැරකමක් වන අතර දරන්නාට අතැති මුදල් වේ. සංසරණ මුදල්වල චලනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනයෙන් ඉදිරිපත් කරන අතර, මහ බැංකු අතර පවත්නා පරිචය ප්‍රකාර, මූල්‍ය ක්‍රියාකාරකම්වල කොටසක් ලෙස ඇතුළත් කරනු ලැබේ.

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මුදල්/ගෙවීම් නියෝග ක්‍රියාවලිය මගින් නෝට්ටු සහ කාසි හෝ ශ්‍රී ලංකා මහ බැංකුව මගින් නිකුත් කරන චෙක්පත් මගින් ලබාගන්නා භාණ්ඩ සහ සේවා සඳහා සැපයුම්කරුවන් සහ සේවකයින් වන විවිධ අණ ලද්දන් වෙත මුදල් ගෙවනු ලැබේ. ඒවා සංසරණ මුදල් බැරකමට හෝ වාණිජ බැංකු සහ මූල්‍ය ආයතන සමග වන තැන්පතු ශේෂයන්ට හෝ එකතු කරනු ලැබේ. එවැනි කටයුතු සඳහා වූ මුදල් භාවිතා කිරීම ශ්‍රී ලංකා මහ බැංකුවෙන් පිටතට යන මුදල් ප්‍රවාහයට අයත් වේ.

මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙහි, මුදල් සහ මුදල් සමානයන්ට මුදල්/මුදල් විධානයන්ගේ ශුද්ධ ගලායෑම් හා ඉහත විස්තර කරන ලද මුදල් සහ මුදල් සමානයන් ද අඩංගු වේ.

**5.10 ප්‍රතිමිලදී ගැනුම් සහ ප්‍රතිවිකුණුම් ගනුදෙනු**

ප්‍රතිවිකිණීමේ ගිවිසුම් යටතේ මිලදීගනු ලබන සුරැකුම්පත්, වත්කම් ලෙස අඛණ්ඩව ශේෂ පත්‍රයෙහි සටහන් කරනු ලැබේ. ප්‍රතිමිලදී ගැනීම සඳහා වූ වගකීම් (ප්‍රතිමිලදී ගැනීමේ ගිවිසුම් මත විකුණන ලද සුරැකුම්පත්) බැරකමක් ලෙස හඳුනාගනු ලැබේ. ප්‍රතිමිලදී ගැනීම් ගනුදෙනුවල විකුණුම් සහ ප්‍රතිමිලදී ගැනිමේ මිල සහ ප්‍රතිවර්තන මිලදී ගැනීමේ ගනුදෙනුවල මිලදි ගැනීමේ මිල සහ විකුණුම් මිල අතර වෙනස පිළිවෙලින් වියදමක් සහ ආදායමක් වන අතර, එය ආදායම් ප්‍රකාශනයෙහි හඳුනාගනු ලැබේ.

ප්‍රතිවිකුණුම් ගිවිසුම් මත රඳවාගෙන ඇති සුරැකුම්පත් (නැවත විකිණිම සඳහා වූ ගිවිසුම් මත මිලදීගත් සුරැකුම්) වත්කම් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙහි සටහන් කරනු ලැබේ. ප්‍රතිමිලදී ගැනීමේ සහ ප්‍රතිවිකුණුම් ගනුදෙනු ඒවායේ උපචිත ආදායම් හා වියදම් ද ඇතුළුව ක්‍රමක්ෂය පිරිවැය යටතේ වාර්තා කරනු ලැබේ.

**5.11 නිත්‍ය තැන්පතු සහ ණයදීමේ පහසුකම්**

2014 පෙබරවාරි 01 වන දින සිට බලපැවැත්වෙන පරිදි නිත්‍ය තැන්පතු පහසුකම (පෙර නිත්‍ය ප්‍රතිමිලදී ගැනුම් පහසුකම) සුරැකුම් රහිත තැන්පතු පහසුකමක් බවට පරිවර්තනය කරන ලදී. එබැවින් සහභාගී වන ආයතන තම අතිරේක අරමුදල් නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාත යටතේ දෛනිකව ආයෝජනය කරනු ලබයි.

නිත්‍ය ණය පහසුකම, (පෙර නිත්‍ය ප්‍රතිවිකුණුම් පහසුකම) හා සර්ව සම අතර මෙය මූල්‍ය තත්ව ප්‍රකාශයේ ක්‍රමක්‍ෂය පිරිවැයට හඳුනාගනී.

**5.12 ශ්‍රී ලංකා මහ බැංකු සුරැකුම්පත්**

වෙළෙඳපොළේ අතිරික්ත ද්‍රවශීලතාවය අන්තර්ග්‍රහණය කර ගැනීම සඳහා මුදල් ප්‍රතිපත්ති ක්‍රියාත්මකවීම් යටතේ බැංකුව විසින් කලින් කලට ශ්‍රී ලංකා මහ බැංකු සුරැකුම්පත් නිකුත් කරනු ලබයි. මෙසේ නිකුත් කරනු ලබන සුරැකුම්පත් වගකීමක් ලෙස වාර්තා කරනු ලැබේ.

**5.13 ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත්**

ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත්, ශ්‍රී ලංකා රජයෙන් මිලට ගන්නා ලද භාණ්ඩාගාර බිල්පත්වලින් වලින් සහ බැඳුම්කර වලින් සමන්විත වේ. ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත්හි ආයෝජන මූල්‍ය තත්ව ප්‍රකාශයේ අනෙකුත් විස්තීරණ ආදායම තුළින් සාධාරණ අගය ලෙස වාර්තා කරනු ලැබේ.

**5.14 රජයට දෙන ලද කාලීන අත්තිකාරම්**

2023 අංක 16 දරණ ශ්‍රී ලංකා මහ බැංකු පනතේ 127 වැනි වගන්තිය ප්‍රකාරව මහ බැංකුව විසින් මුදල් වර්ෂයේ පළමු මාසය ඇතුළත ඒකාබද්ධ අරමුදලින් දරණු ලැබීමට බලයලත් වියදම් මූල්‍යනය කිරීම සඳහා අලුත්, ඍජු තාවකාලික අත්තිකාරම් ආණ්ඩුව වෙත ලබාදිය හැකිය. ඒ සෑම අත්තිකාරමක් ම මාස 06කට නොවැඩි කාලසීමාවක් ඇතුළත ආපසු ගෙවනු ලැබිය යුතුය.

**5.15 අනිකුත් ආයතනවලට දෙන ලද ණය**

අනිකුත් ආයතනවලට දෙන ලද ණය ක්‍රමක්ෂය පිරිවැයට හඳුනාගෙන දක්වා ඇත.

**5.16 සුරැකුම්පත් ණයට දීම සහ ණයට ගැනීම**

බැංකුව විසින් එහි මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාකාරිත්ව අවශ්‍යතා සඳහා ප්‍රධාන සංස්ථාපිත ආයෝජකයින් වෙතින් රාජ්‍ය සුරැකුම්පත් ණයට ගැනීම සිදු කරයි. මෙම ණයට ගත් සුරැකුම්පත්, බැංකුව විසින් ප්‍රතිමිලදී ගැනීමේ ක්‍රියාකාරිත්වය මත වෙළෙඳපොළ තුළ පවතින අතිරික්ත ද්‍රවශීලතාවය අවශෝෂණය කර ගැනීමට යොදා ගනී.

අමතර තොරතුරු

පාලනය

අභ්‍යන්තර කළමනාකරණය

මහ බැංකුවේ කාර්යභාරය

මූල්‍ය ප්‍රකාශ

සුරැකුම්පත් ණයට ගැනීම යනු නැවත බාරදීම අතපසු වන විටක දී, සුරැකුම්පත් නැවත භාරදීම, එකඟ වූ ගාස්තු ගෙවීම සහ වෙළෙඳපොළ වටිනාකම මත වන්දි ගෙවීම (බැංකුවේ රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් ප්‍රාථමික වෙළෙඳපොළ සහභාගීවන්නන්ට දැනුම් දී ඇති වෙළෙඳපොළ මිල) සඳහා වන කොන්දේසි විරහිත ඇපවීමකි. ණයට ගත් සුරැකුම්පත් වෙළෙඳපොළ වටිනාකමින් කිසියම් අවස්ථාවක දී ප්‍රතිමිලදී ගැනීමේ ක්‍රියාකාරකම් සඳහා යොදා නොගත් සුරැකුම්පත් අසම්භාව්‍ය වගකීම් ලෙස වාර්තා කරනු ලැබේ. අදාළ ගාස්තු ගෙවීම උපචිත පදනම මත වාර්තාකරණු ලබයි.

ණයට දීමේ ගනුදෙනුවක් යටතේ ප්‍රතිපාර්ශ්වයකට සුරැකුම්පත් මාරු කිරීම මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි පෙන්නුම් කරෙනුයේ හිමිකාරිත්වයේ අවදානම් හා ප්‍රතිලාභයන්ද මාරු වූයේ නම් පමණි.

### 5.17 සේවක ණය

සහනදායී පොළී අනුපාත යටතේ ණය පහසුකම් ලබාගැනීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකු සේවකයන්ට හිමිකම ලැබේ. 2008 වසරේ සිට නිකුත් කල මෙම ණය, ජා.මූ.වා.ප්‍ර. 9 අනුව, වට්ටම් කරන ලද මුදල් ප්‍රවාහ ක්‍රමය භාවිතා කරමින් ඒවායේ සාධාරණ අගයට ගණනය කරනු ලැබේ.

**වට්ටම් අනුපාතය** - ශ්‍රී.ලං.ම. බැංකුවේ ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් සකස්කරනු ලබන, නිශ්චිත කාලයක් සඳහා අදාළ වන දිගු කාලීන උද්ධමන ඉලක්ක හා අපේක්ෂිත මූර්ත පොළී අනුපාතයට බැංකුවේ උපදේශන විගණන කමිටුව මගින් අනුමත කළ පරිදි සියයට 1ක අවදානම් අධිභාරයක් එකතු කළ අනුපාතය, වට්ටම් අනුපාතය ලෙස භාවිතා කරන අතර එය, ණයවල කාලපරිච්ඡේදය සමඟ වෙනස් වේ.

මෙම ණය සහනදායී පොළී අනුපාතයන් යටතේ ලබාදීම නිසා බැංකුව විසින් දරණ ලද වියදම වාර්තා කිරීමට සේවක ණයවල වර්ෂ ආරම්භ දිනට සහ වර්ෂ අවසාන දිනට වර්තමාන අගයන්ගේ වෙනස වාර්ෂිකව ක්‍රමක්ෂය කරන අතර බැංකුව විසින් මෙම ණය, වෙළෙඳපොළ අනුපාතිකයන්ට දෙනු ලැබුවේ නම්, බැංකුව විසින් උපයනු ලබන ආදායම වාර්තා කිරීමට සමාන අගයක්, අනෙකුත් ආදායම් ලෙස වාර්තා කරයි.

**සාධාරණ අගය කිරීම ගණනය සඳහා යොදාගනු ලබන උපකල්පනයන්:**

- සේවක ණය ලබාදුන් දිනය ලෙස ජනවාරි 01 දින සලකන ලදී.
- මෙම ණය සඳහා කිසිදු ආකාරයක ගැලපීමක් හෝ කලින් පියවීමක් සිදුවී නොමැත.

### 5.18 රන්

ශ්‍රී ලංකා මහ බැංකු පනතේ ජාත්‍යන්තර සංචිත කළමණාකරණය පිළිබඳ දැක්වෙන 40 (2) වගන්තිය ප්‍රකාරව, මහ බැංකුවේ ජාත්‍යන්තර සංචිතවලට, රත්‍රන් නියෝජනය කරන බැර ශේෂ ද ඇතුළත් රත්‍රන් ඇතුළත් විය හැකිය.

එසේම එම පනතේ 94 (2) වගන්තිය මගින් මහ බැංකුව විසින් ලාභ බෙදා හැරීමට පෙරාතුව පාලක මණ්ඩලය විසින් අනුමත කරනු ලබන ජාත්‍යන්තරව පිළිගත් මූල්‍ය වාර්තාකරණ රාමුවට අනුකූලව ආදායම් ප්‍රකාශයේ වාර්තා වූ රත්‍රන් සම්බන්ධයෙන් මහ බැංකුවේ තත්ත්වය හේතු කොටගෙන, වෙළෙඳපොළ මිල ප්‍රත්‍යාගණනයෙන් උද්ගත වන උපලබ්ධි නොවූ ලැබීම් පිළිබඳව පැහැදිලි කරනු ලබයි.

### 5.19 මුදල් තොග

බැංකුවේ තොගය තුළ, සංසරණය සඳහා නිකුත් කර නොමැති නව ව්‍යවහාර මුදල් අන්තර්ගත වේ. නව මුදල් නෝට්ටු සහ කාසිවලට අදාල නිෂ්පාදන සහ නිර්මාණ පිරිවැය, මුල්වරට පිරිවැයට හඳුනාගනු ලැබේ. සංසරණය සඳහා නිකුත් කරනු ලබන නව මුදල් නෝට්ටු සහ කාසිවල අදාල පිරිවැය බර තබන ලද සාමාන්‍ය පදනමක් මත තීරණය කරන අතර, නිකුත් කරන අවස්ථාවේදී එය ආදායම් ප්‍රකාශනයට ගලපනු ලැබේ. සෙමෙන් චලනය වන තොගය සඳහා වෙන් කිරීම් සිදු කර ඇත.

### 5.20 අනෙකුත් තොග

අනෙකුත් තොග, පිරිවැය හෝ උපලබ්ධි වටිනාකම් වන දෙකෙන් අඩු ප්‍රමාණය මත දක්වා ඇත. බර තබන ලද සාමාන්‍ය පිරිවැය පදනම්ව පිරිවැය නිශ්චය කරනු ලැබේ.

### 5.21 දේපළ, පිරියත සහ උපකරණ

ඉඩම් සහ ගොඩනැගිලි හැර දේපළ, පිරියත සහ උපකරණ සමුච්චිත ක්ෂයවීම් සහ සමුච්චිත හානිකරණ වටිනාකම අඩුකළ පිරිවැයට දක්වනු ලැබේ. එකී දේපළ, පිරියත සහ උපකරණවල කොටස් ආදේශ කිරීමේ පිරිවැය එය දරන අවස්ථාවේදී හඳුනා ගැනීම සඳහා වූ නිර්නායකයන් සපුරන ලද්දේ නම්, එකී වියදම් ද එවැනි පිරිවැයට ඇතුළත් වනු ඇත.

ඉඩම් සහ ගොඩනැගිලි ප්‍රත්‍යාගණනය කරන දිනට එහි සාධාරණ අගය වන ප්‍රත්‍යාගණන අගයට අගය කර ඉන් අනතුරුව හඳුනාගන්නා සමුච්චිත ක්ෂයවීම් සහ සමුච්චිත හානිකරණ අලාභ අඩුකර දක්වනු ලැබේ.

සින්නක්කර ඉඩම් හැර, වත්කම්වල පහත සඳහන් ඇස්තමේන්තු කළ ජීවකාලය තුළ සරළ මාර්ග ක්‍රමය අනුව ක්ෂය ගණනය කරනු ලැබේ.

| **වත්කම් වර්ගය** | **ජීවකාලය** |
|---|---|
| සින්නක්කර ඉඩම්වල පිහිටි ගොඩනැගිලි | වර්ෂ 50 ක් තුළ |
| කල්බදු ඉඩම්වල පිහිටි ගොඩනැගිලි | කල්බදු කාල පරිච්ඡේදය තුළ හෝ වසර 50 යන දෙකෙන් අවමය |
| පිරියත සහ පිරියත කොටස් | වර්ෂ 20 ක් තුළ |
| ලී බඩු සහ උපකරණ | වර්ෂ 10 ක් තුළ |
| මෝටර් රථ | වර්ෂ 5 ක් තුළ |
| 2014 වර්ෂයේ සිට මිලදී ගත් මෝටර් රථ | වර්ෂ 10 ක් තුළ |
| පරිගණක දෘඩාංග | වර්ෂ 4 ක් තුළ |
| වෙනත් | වර්ෂ 3 ක් තුළ |

ධාරණ අගයක් අයකරගත නොහැකි බවට සිද්ධීන් හෝ අවස්ථානුකූල වෙනස්කම් හෝ මගින් පෙන්නුම් කරන විටක දේපළ, පිරියත හා උපකරණවල සාධාරණ අගය හානිකරණය සඳහා සමාලෝචනය කළ යුතුය.

බැංකුවේ ඉඩම් හා ගොඩනැගිලි ප්‍රත්‍යාගණනය සඳහා වූ ප්‍රතිපත්තිය වන්නේ අවම වශයෙන් වසර 3කට වරක් හෝ සැලකිය යුතු තක්සේරු ගැලපීමක් ඊට අඩු කාලසීමාවක් තුළදී ප්‍රත්‍යක්ෂ වූ විටය.

ප්‍රත්‍යාගණන අතිරික්තය ප්‍රත්‍යාගණන සංචිතයට බැරකර, මූල්‍ය තත්ව ප්‍රකාශයේ හිමිකරු ප්‍රාග්ධනය යටතේ දක්වනු ලැබේ. කෙසේ වුවද මීට පෙර එම වත්කමෙහි හඳුනාගත් ප්‍රත්‍යාගණන අඩුවීමක් ප්‍රතිවර්තනය කරනු ලබන ප්‍රමාණයට එම ප්‍රත්‍යාගණන වැඩිවීම, ආදායමක් ලෙස හඳුනාගෙන ආදායම් ප්‍රකාශනයෙහි දක්වනු ලැබේ. ප්‍රත්‍යාගණන අඩුවීම් ද ආදායම් ප්‍රකාශනයෙහි හඳුනාගනු ලැබේ. කෙසේ වුවද, ප්‍රත්‍යාගණන අඩුවීමක් එම වත්කම සම්බන්ධයෙන්ම වූ පෙර ප්‍රත්‍යාගණන අතිරික්තයක් නිෂ්ප්‍රභා කරන්නේ නම්, එම ප්‍රත්‍යාගණන අඩුවීම්, ප්‍රත්‍යාගණන සංචිතයේ ඇති අතිරික්තය සමග ගලපනු ලැබේ. වත්කමක් බැහැර කිරීමේදී, කිසියම් වත්කමකට සම්බන්ධ ප්‍රත්‍යාගණන අතිරික්තයක් වෙතොත් එය රඳවාගත් ඉපැයීම්වලට මාරු කරනු ලැබේ. කිසියම් වත්කමක් ඉවත් කිරීමෙන් භාවිතා කිරීමෙන් හෝ ඉවත්කිරීමේ අනාගත ප්‍රතිලාභ ලැබීමේ අපේක්ෂාවක් නොමැතිනම් එය දේපළ, පිරියත සහ උපකරණ ලෙස හඳුනා ගනු නොලැබේ. එවැනි අවස්ථාවක උද්ගත වන ලාභ හා අලාභ (ඉවත් කිරීමෙන් ලබන ශුද්ධ මුදල සහ ධාරණ අගය අතර වෙනස) එම වර්ෂයේදීම ආදායම් ප්‍රකාශනයෙහි හඳුනාගනු ලැබේ. වත්කමෙහි අවශේෂ වටිනාකම, ජීවකාලය සහ ක්‍රමයන් සමාලෝචනයට භාජනය කරනු ලබන අතර අවශ්‍ය වේ නම් නිරතුරුව ගැලපීම් කරනු ලැබේ.

ප්‍රාග්ධන නොනිමි වැඩ එහි පිරිවැයට දක්වා ඇත. මෙම වියදම් ප්‍රාග්ධන ස්වභාවයේ වන අතර ගොඩනැගිලි ඉදිකිරීමේ දී ප්‍රධාන පිරියත සහ යන්ත්‍ර සහ පද්ධති සංවර්ධනයේදී සෘජුව දරා ඇති අතර ප්‍රාග්ධනීකරණය කිරීමට සූදානමින් පවතින වියදම් වේ.

**5.22 කල්බදු**

යම් ගිවිසුමක් ආරම්භයේදී එම ගිවිසුම කල්බදු ගිවිසුමක්ද යන්න හෝ ගිවිසුමෙහි කල්බද්දක් අන්තර්ගත වේද යන්න බැංකුව විසින් නිර්ණය කරනු ලැබේ. ප්‍රතිෂ්ඨාව සඳහා හුවමාරුවේදී යම් නිශ්චිත කාලපරිච්ඡේදයක් සඳහා හඳුනාගත් වත්කමක් භාවිතා කිරීමේ අයිතිය ගිවිසුමකින් පවරා දෙන්නේනම් එවන් ගිවිසුමක් කල්බද්දකින් සමන්විත වේ. යම් ගිවිසුමක් මගින් හඳුනාගත් වත්කමක් භාවිතා කිරීමේ අයිතියක් ලබාදේද යන්න නිර්ණය කිරීම සඳහා බැංකුව විසින් ජා.මූ.වා.ප්‍ර. 16 හි ඇතුළත් වන කල්බදු සඳහා වන නිර්වචනය යොදා ගනු ලැබේ.

**බැංකුව කල්බදු ගැණුම්කරුවෙකු ලෙස ක්‍රියා කිරීම.**

බැංකුව විසින් කල්බද්ද ආරම්භ වන දිනයේදී වත්කම භාවිතා කිරීමේ හිමිකමක් හා කල්බදු වගකීමක් හඳුනාගනු ලැබේ. වත්කම භාවිතා කිරීමේ හිමිකම ආරම්භයේදී පිරිවැයට මනිනු ලැබේ. මෙහිදී පිරිවැය ලෙස සලකනුයේ කල්බද්ද ආරම්භ වන දින හෝ ඊට පෙර කරන ලද කල්බදු ගෙවීම් ගලපන ලද ආරම්භක කල්බදු වගකීමට බැංකුව විසින් දරන ලද මූලික සෘජු පිරිවැය හා අදාල කල්බදු ඉඩම් හා කාර්යාල පරිශ්‍රයන් සඳහා කරන ලද නවීකරණයන් ඉවත්කිරීමට අවශ්‍ය වන ඇස්තමේන්තුගත පිරිවැය එකතු කළ විට ලැබෙන අගයයි.

වත්කම භාවිතා කිරීමේ හිමිකම, කල්බද්ද ආරම්භ කළ දිනයේ සිට කල්බදු වාරය අවසන් වන දිනය තෙක් සරල මාර්ග ක්‍රමයට ක්ෂය කරනු ලැබේ. මීට අමතරව වත්කම භාවිතා කිරීමේ හිමිකමෙන් හානිකරන අලාභ අඩුකරන අතර කල්බදු වගකීමේ නැවත මැනීම් ගැළපීමද සිදුකරනු ලැබේ.

කල්බදු වාරය ආරම්භ කළ දිනට, නොගෙවූ කල් බදු ගෙවීම් වල වර්තමාන වටිනාකමට කල්බදු වගකීම මනිනු ලැබේ. මේ සඳහා කල්බද්දේ ව්‍යංග පොළී අනුපාතිකය භාවිතයෙන් කල්බදු ගෙවීම් වට්ටම් කරනු ලබන අතර එම පොළී අනුපාතිකය නිශ්චය කළ නොහැකි විට ඒ සඳහා බැංකුවේ වර්ධක ණය අනුපාතිකය භාවිතා කරනු ලැබේ.

කල්බදු වගකීම් මැනීමේදී පහත සඳහන් කල්බදු ගෙවීම් සලකා බලනු ලැබේ.

- ප්‍රධාන ස්ථාවර ගෙවීම් ඇතුළත් වන ස්ථාවර ගෙවීම්;
- දර්ශකයක් හෝ අනුපාතිකයක් මත රඳා පවතින, කල්බද්ද ආරම්භක දිනට දර්ශකයක් හෝ අනුපාතිකයක් භාවිතයෙන් මනිනු ලැබූ විචල්‍ය කල්බදු ගෙවීම්;
- අවශේෂ වටිනාකම සහතික කිරීම් යටතේ බැංකුව විසින් ගෙවීමට අපේක්ෂා කරන අගය; හා
- බැංකුව විසින් මිලදී ගැනීමේ විකල්පයක් ක්‍රියාත්මක කිරීම සාධාරණ පමණින් නිශ්චිත නම් එම විකල්පය ක්‍රියාත්මක කිරීමේ මිල, බැංකුවට කල්බදු වාරය දීර්ඝ කිරීම සඳහා අවස්ථාවක් ඇති විට, එසේ කල්බදු වාරය දීර්ඝ කිරීම සාධාරණ පමණින් නිශ්චිත නම් එම කාලය තුළදී ගෙවීමට අපේක්ෂිත කල්බදු ගෙවීම් හා කල්බදු වාරය අවසන් වීමට පෙර බැංකුව විසින් කල්බද්ද අවසන් කිරීමට ක්‍රියාත්මක වේ නම් ඒ සඳහා අදාල වන දඩ ගෙවීම්.

කල්බදු වගකීම සඵල පොලී අනුපාත ක්‍රමය භාවිතයෙන් ක්‍රමක්ෂය පිරිවැයට මනිනු ලැබේ. එනමුදු යම් දර්ශකයක හෝ අනුපාතිකයක වෙනස්වීමක් මත වන අනාගත කල්බදු වාරිකවල වන වෙනසක්, අවශේෂ වටිනාකම සහතික කිරීම යටතේ බැංකුව විසින් ගෙවීමට අපේක්ෂිත අගයේ සිදුවන වෙනසක්, කල්බදු වාරය දීර්ඝ කිරීමේ අවස්ථාවක් ක්‍රියාත්මක කිරීම පිළිබඳ බැංකුවේ අදහස වෙනස්වීමක්, කල්බදු වාරය අවසන් වීමට පෙර කල්බද්දක් අවසන් කිරීම වෙනුවෙන් බැංකුව විසින් ගෙවිය යුතු දඩයක් හා ප්‍රධාන ස්ථාවර ගෙවීම්වල සිදුවන වෙනස්වීම් හේතුවෙන් කල් බදු වගකීම් නැවත මැනීමට සිදු වේ.

ඉහත අයුරින් නැවත මනින ලද කල්බදු වගකීමෙහි වන වෙනස්වීම අදාළ වත්කම භාවිතා කිරීමේ හිමිකමෙහි ධාරණ අගයට ගලපනු ලැබේ. අදාල වත්කම භාවිතා කිරීමේ හිමිකමෙහි ධාරණ අගය ශුන්‍ය වේ නම් එම කල්බදු වගකීමෙහි වෙනස් වීම ආදායම් ප්‍රකාශයට ගලපනු ලැබේ.

බැංකුව විසින් වත්කම භාවිතා කිරීමේ හිමිකම හා කල්බදු වගකීම මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙහි පිළිවෙලින් දේපල, පිරියත හා උපකරණ (සටහන 20) හා විවිධ බැරකම් හා උපචිතයන් (සටහන 33) තුළ දක්වා ඇත.

**5.23 අස්පෘශ්‍ය වත්කම්**

පරිගණක දෘඩාංගවල සංරචකයන් නොවන පරිගණක මෘදුකාංග, අස්පෘෂ්‍ය වත්කම් ලෙස දක්වා පිරිවැයට හඳුනාගනු ලැබේ. මූලික හඳුනා ගැනීමෙන් අනතුරුව මෙම අස්පෘෂ්‍ය වත්කම්, සමුච්චිත ක්‍රමක්ෂය සහ සමුච්චිත හානිකරණ අඩුකළ ධාරණ අගයකට පවත්වා ගෙන යනු ලැබේ.

මෘදුකාංග වත්කම් සඳහා පසුකාලීනව ඇතිවන වියදම් ප්‍රාග්ධනීකරණය කරන්නේ එමගින් ඊට අදාල නිශ්චිත වත්කමේ අන්තර්ගත අනාගත ආර්ථික ප්‍රතිලාභ ඉහළ යන්නේ නම් පමණි. අනෙකුත් සියලු වියදම් දරන ලද අවස්ථාවේදී ම වියදමක් ලෙස හඳුනාගනු ලැබේ.

වත්කමෙහි අන්තර්ගත අනාගත ආර්ථික ප්‍රතිලාභයන්ගේ අපේක්ෂිත පරිභෝජන රටාව මැනවින් පිළිබිඹු වන බැවින් අදාල වත්කම පාවිච්චිය සඳහා සූදානම් දිනයේ සිට වසර 4ක එලදායී ජීව කාලයක් තුළ ඍජු පදනමක් යටතේ ක්‍රමයෙන් ආදායම් ප්‍රකාශයේ හඳුනාගනු ලැබේ.

පහත සඳහන් කරුණු සම්පූර්ණ වන්නේ නම් සංවර්ධනය තුළින් (හෝ ආයතන අභ්‍යන්තර ව්‍යාපෘතියක සංවර්ධන අදියරකින්) ඇති වන්නා වූ අඡ්පෘශ්‍යය වත්කම් මූල්‍ය ප්‍රකාශන තුළ හඳුනා ගනු ලැබේ.

(අ) භාවිතයට ගැනීමට හෝ විකිණීමට හැකි වන පරිදි අස්පෘශ්‍ය වත්කම් නිම කිරීමට ඇති තාක්ෂණික ශක්‍යතාව.

(ආ) අස්පෘශ්‍ය වත්කම සම්පූර්ණ කර එය භාවිතා කිරීම හෝ විකිණීමට ඇති අභිප්‍රාය

(ඇ) අස්පෘශ්‍ය වත්කම් භාවිතා කිරීමට හෝ විකිණීමට ඇති හැකියාව

(ඈ) ආයතන තුළ අස්පෘශය වත්කම භාවිතා කිරිමට ඇති හැකියාව සහ අස්පෘශ්‍ය වත්කම් භාවිතයෙන් නිම කරන්නා වූ නිමවුම් සඳහා වෙළෙඳපොළක් පැවතිම

(ඉ) අස්පෘශ්‍ය වත්කම් භාවිතා කිරීමට, විකිණීමට හෝ සංවර්ධනය කිරීමට ප්‍රමාණවත්. තාක්ෂණික, මූල්‍ය සහ වෙනත් සම්පත් පැවතීම.

(ඊ) අස්පෘශ්‍ය වත්කම් සංවර්ධනයට අදාළ වියදම් විශ්වාසදායක ලෙස මැනීමට ඇති හැකියාව.

**5.24 අනෙකුත් වත්කම්**

අනෙකුත් වත්කම් අපේක්ෂිත උපලබ්ධි වටිනාකමට පවත්වාගෙන යනු ලැබේ.

**5.25 මූල්‍ය නොවන වත්කම් හානිකරණය**

එක් එක් වාර්තා කිරීමේ දිනයේදී කිසියම් මූල්‍ය නොවන වත්කමක් හානිකරණයට භාජනය වීමේ සළකුණු දක්වන්නේ ද යන්න නිර්ණය කිරීම සඳහා බැංකුව විසින් එම වත්කම්වල ධාරණ අගය සමාලෝචනය කිරීම සිදු කරනු ලබයි.

වත්කම් හානිකරණ පරීක්ෂාව සඳහා, අනෙකුත් වත්කම්වල මුදල් ගලාඒම් වලින් බොහෝ දුරට ස්වාධීන වූ මුදල් ගලා ඒම් ඇති වත්කම් කුඩා වත්කම් සමූහවලට කාණ්ඩගත කරනු ඇත.

"වත්කමක අයකරගත හැකි වටිනාකම" එම වත්කමෙහි "භාවිතයේ පවතින වටිනාකම" හෝ සාධාරණ අගයෙන් විකිණීමට දරණ පිරිවැය අඩුකොට ගන්නා වටිනාකම යන දෙකෙන් ඉහළ අගය වේ. වත්කමක භාවිතයේ පවතින වටිනාකම වනුයේ එම වත්කමේ ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහ එකී වත්කමේ වර්තමාන වෙළෙඳපොළ තක්සේරුවේ කාල අගය හා එම වත්කමටම විශේෂ වූ අවදානම් පිළිබිඹු කරනා පූර්ව බදු වට්ටම් අනුපාතයකින් වට්ටම් කිරීමෙන් ලැබෙන වර්තමාන අගයයි.

වත්කමක ධාරණ අගය එකී වත්කමේ අයකර ගත හැකි වටිනාකම ඉක්මවා යයි නම් හානිකරණ අලාභයක් හඳුනාගනු ලබයි.

ගලපන ලද හානිකරණ අලාභ නැවත හැරවිය හැක්කේ අදාළ වත්කමේ ධාරණ අගය එම වත්කම මත හානිකරණ අගයක් හඳුනා නොගත් අවස්ථාවක නිර්ණය කළ, ක්ෂය හෝ ක්‍රමක්ෂය ගලපන ලද ශුද්ධ ධාරණ අගය ඉක්මවා නොයන අවස්ථාවක පමණි.

**5.26 ප්‍රතිපාදන**

අතීත සිදුවීමක ප්‍රතිඵලයක් වශයෙන් බැංකුවට වර්තමාන වගකීමක් (නෛතික හෝ සම්මුතියකින්) ඇතිවිටෙක දී වගකීම බේරුම් කිරීම සඳහා ආර්ථික වාසි ඇතුළු සම්පත් ගලායාමක් අවශ්‍යවීමත්, එම වගකීම පිළිබඳ විශ්වසනීය ඇස්තමේන්තුවක් පිළියෙල කිරීමට හැකිවීමත් මත ප්‍රතිපාදන හඳුනාගනු ලැබේ. ප්‍රතිපාදනයක් ප්‍රතිපූර්ණය කිරීමට බැංකුව අපේක්ෂා කරන්නේ නම්, එම ප්‍රතිපූර්ණය නිසැකවම තහවුරු වන්නා වූ අවස්ථාවලදී, එය වෙන ම වත්කමක් ලෙස හඳුන්වනු ලැබේ.

**5.27 සංසරණයේ පවතින මුදල්**

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරනු ලබන මුදල් ඒවා දරන්නන්ට බැංකුව මත හිමිකමක් පවතී. සංසරණයේ පවතින මුදල් සඳහා බැරකම, ඒවායේ මුහුණත වටිනාකම මත මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශයේ සටහන් කරනු ලැබේ.

**5.28 නිශ්චිත ප්‍රතිලාභ සැලසුම්**

නිශ්චිත ප්‍රතිලාභ යෝජනා ක්‍රමයන් යනු නිශ්චිත දායක යෝජනා ක්‍රමයක් නොවන පශ්චාත් සේවා නියුක්ති ප්‍රතිලාභ යෝජනා ක්‍රමයකි.

බැංකුව විසින් විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රම, වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප්, වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප්, විශ්‍රාම පාරිතෝෂික සහ විශ්‍රාම සේවක වෛද්‍ය ප්‍රතිලාභ යන නිශ්චිත ප්‍රතිලාභ යෝජනාක්‍රම පවත්වා ගෙන යනු ලබයි. ඉන් වෙන් වෙන්ව පරිපාලනය කරනු ලබන පළමු යෝජනා ක්‍රම 3 ට බැංකුව සහ සුදුසුකම් ලත් ප්‍රතිලාභීන් විසින් දායක මුදල් ගෙවනු ලැබේ. නිශ්චිත ප්‍රතිලාභ යෝජනාක්‍රම යටතේ ප්‍රතිලාභ ගෙවීමේ පිරිවැය, පුරෝකථනය කළ ඒකීය බැර ආයුගණන ක්‍රමයක් මත එක් එක් යෝජනා ක්‍රමයට වෙන් වෙන් වශයෙන් තීරණය කරනු ලැබේ.

එක් එක් නිශ්චිත ප්‍රතිලාභ යෝජනා ක්‍රම සඳහා බැංකුවේ බැඳීම් වෙන වෙනම ගණනය කරන අතර එහිදී සේවා නියුක්තිකයින්ගේ වර්තමාන හා පෙර කාලසීමාවන් හි සපයන ලද සේවාවන්ට ඉපැයූ ප්‍රතිලාභවල අනාගත ප්‍රතිලාභ වටිනාකම ඇස්තමේන්තු කිරීමේදී ප්‍රතිලාභ වට්ටම් කර එහි වර්තමාන අගය තීරණය කරයි. මෙහිදී හඳුනානොගත් අතීත සේවා පිරිවැය සහ යෝජනා ක්‍රමයේ වත්කම්වල සාධාරණ අගය අඩුකරනු ලැබේ. වට්ටම් අනුපාතය වනුයේ ඉදිරියට ඇති සේවා කාලයේ සාමාන්‍යයට ආසන්න කල්පිරීම් දිනයන් සහිත රජයේ බැඳුම්කරවල තක්සේරු දිනට ඉපැයීම් අනුපාතයයි. සටහන් අංක 32 හි හෙළිදරව් කල සියළුම ප්‍රධාන ආයුගණන උපකල්පන, වාර්ෂිකව සංශෝධනය කරනු ලැබේ.

**5.29 නිශ්චිත දායක සැලසුම්**

අදාල ව්‍යවස්ථා සහ රෙගුලාසි ප්‍රකාර සේවකයින්ට සේවක අර්ථසාධක අරමුදලේ දායකත්වය සහ සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලේ දායකත්වයට හිමිකමක් ලැබේ. බැංකුව විසින් සේවකයින්ගේ දළ පාරිශ්‍රමිකයෙන් සියයට 24 ක් සහ සියයට 3 ක් පිළිවෙලින් සේවක අර්ථසාධක අරමුදලට සහ සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලට දායක වශයෙන් ගෙවනු ලැබේ. මෙම අරමුදලේ නිශ්චිත දායක සැලසුම් වෙන් වෙන්ව පරිපාලනය කරනු ලැබේ.

නිශ්චිත දායක යෝජනා ක්‍රමයේ දායකත්ව වගකීම් ඒවා පැන නගින අවස්ථාවන්හිදී ආදායම් ප්‍රකාශනයේ වියදමක් ලෙස හඳුනාගනී.

**5.30 ප්‍රදානයන්**

සාධාරණ වටිනාකමට හඳුනාගෙන ඇති ප්‍රදානයන්, ඒවා ලබා ගැනීම සඳහා පමුණුවා ඇති කොන්දේසිවලට අනුකූලවීමට ඇති ඉඩකඩ පිළිබඳ සාධාරණ තහවුරුවක් ඇතිවිට ඒවා හිමිකරු ප්‍රාග්ධනය යටතේ දක්වනු ලැබේ. ප්‍රදානයන් වියදම් විෂයකට අදාල වන අවස්ථාවක දී වියදමට සරිලන කාල පරිච්ඡේදයක් තුළ ක්‍රමානුකූල පදනමක් මත එය ආදායම් ප්‍රකාශනයෙහි සටහන් කරනු ලැබේ. ප්‍රදානයක් වත්කමට අදාල වන අවස්ථාවක දී එහි සාධාරණ අගය රජයේ විලම්භිත ප්‍රදාන ගිණුමකට බැරකර, එම වත්කමේ ක්ෂය ප්‍රතිපත්තියට අනුකූල වූ ක්‍රමානුකූල පදනමක් මත එහි අපේක්ෂිත ප්‍රයෝජනවත් ආයුකාලය තුළ ආදායම් ප්‍රකාශයට මුදාහරිනු ලැබේ.

**5.31 අසම්භාව්‍ය වගකීම් සහ බැඳීම්**

නිශ්චිත නොවන අනාගත සිදුවීම් මගින් පවතින බවට තහවුරු කෙරෙන හෝ ආර්ථික ප්‍රතිලාභ මාරුවීම නිශ්චිත නොවන හෝ එහි ප්‍රතිලාභ විශ්වාසනීය ලෙස අගය කළ නොහැකි බැඳීමක් අසම්භාව්‍ය වගකීමක් ලෙස හැඳින්වේ. ණය ගැතිකම් සහතිකවීම්, ඉදිරි විදේශ විනිමය ගනුදෙනු සහ අනිකුත් බැඳීම් සියල්ල මූල්‍ය තත්ව ප්‍රකාශයේ හඳුනා නොගන්නා අතර අදාල ශීර්ෂ යටතේ අසම්භාව්‍ය වගකීම් හා බැඳීම් අයිතම ලෙස හෙළිදරව්කර ඇත. අවශ්‍යවන අවස්ථාවන්හිදී මෙම ප්‍රමාණ වඩාත් උචිත ඇස්තමේන්තු අනුව මිනුම් කර ඇත.

**ආදායම් ප්‍රකාශය සහ විස්තීරණ ආදායම් ප්‍රකාශය**

**5.32 ආදායම සහ වියදම**

බැංකුව වෙත ආර්ථික ප්‍රතිලාභ ගලාඒමේ හැකියාව සහ ආදායම නිසැකව ම මිනුම් කළ හැකි ප්‍රමාණය අනුව ආදායම් ගිණුම්ගත කරනු ලැබේ. දරන ලද පිරිවැය සහ උපයන ලද නිශ්චිත ආදායම අතර ඍජු සම්බන්ධතාවය පදනම් කරගෙන ආදායම් ප්‍රකාශනයෙහි වියදම් සටහන් කරනු ලැබේ. ව්‍යාපාරය පවත්වාගෙන යාම සහ දේපල, පිරියත, උපකරණ කාර්යක්ෂමව පවත්වා ගැනීම සඳහා දරන ලද සියළුම වියදම්, වර්ෂය සඳහා ප්‍රතිඵල ගණනය කිරීම පිණිස ආදායමට එරෙහිව සටහන් කර ඇත.

ආදායම් හා වියදම් හඳුනාගැනීමට පෙර පහත දැක්වෙන ගිණුම්ගත කිරීම් හඳුනාගැනීමේ නිර්ණායකයන් සපුරාලිය යුතුය.

**5.32.1 පොලී ආදායම් සහ වියදම්**

පොළිය ලැබීම පිළිබඳ සැකයක් නොමැති නම්, මිලට ගැනීමේ සත්‍ය මිල පදනම්ව, සඵල ඵලදායිත්ව ක්‍රමයට, උපචිත පදනම මත පොළී ආදායම සහ වියදම, ආදායම් ප්‍රකාශනයෙහි සටහන් කරනු ලැබේ. ස්ථාවර ආදායම් ආයෝජන හා සුරැකුම්පත් මත උපයන කූපන්, භාණ්ඩාගාර බිල්පත් හා අනිකුත් වට්ටම් උපකරණ මත උපචිත වට්ටම් සහ අධිමිල, පොළී ආදායමට ඇතුළත් ය. ණය අයකර ගැනීම සැක සහිත අවස්ථාවල දී පොළී ආදායම අත්හිටුවන අතර, ඒවා ලැබෙනතුරු පොළී ආදායමෙන් බැහැර කරනු ලැබේ.

**5.32.2 ලාභාංශ**

ලාභාංශ ආදායම කොටස්හිමියා වෙත ලැබීමේ අයිතිය තහවුරු වූ විට හඳුනාගනු ලැබේ.

**5.32.3 විවිධ ආදායම් හා වියදම්**

විවිධ ආදායම් සහ වියදම් උපචිත පදනම මත හඳුනාගනු ලැබේ. දේපල, පිරියත සහ උපකරණ බැහැර කිරීමේදී උද්ගතවන ආදායම් ස්වභාවයේ ශුද්ධ ලාභ හෝ පාඩු, (විකුණුම් ප්‍රතිශ්ඨාවෙන් වත්කමේ ධාරණ අගය සහ විකුණුම් වියදම් අඩු කිරීමෙන් ලැබෙන) විකුණුම් වියදම්, ආදායම් ප්‍රකාශයෙහි ගිණුම්ගත කර ඇත.

ප්‍රධාන ලාභ උත්පාදන ක්‍රියාකරකම්වලට අනුෂාංගික ක්‍රියාකාරකම්වලින් උද්ගතවන සහ සමාන ගනුදෙනු සමූහයකින් උද්ගතවන එතරම් වැදගත් නොවන ලාභ සහ පාඩු එකතුකොට ශුද්ධ පදනම මත වාර්තාකර ඉදිරිපත් කරනු ලැබේ.

**5.32.4 සේවක මණ්ඩල වියදම්**

සේවක මණ්ඩල වියදම්වලට, මුළු කාර්ය මණ්ඩල ප්‍රතිලාභවල පූර්ණ පිරිවැය ඇතුළත් ය. වර්ෂය අවසානයේ දී ගෙවිය යුතු වැටුප් සහ සම්බන්ධිත වියදම්, අනිකුත් දේශීයව ගෙවිය යුතු ශේෂයන් යටතේ දක්වනු ලැබේ.

**5.32.5 ආදායම් බදු වියදම**

2023 අංක 16 දරණ ශ්‍රී ලංකා මහ බැංකු පනතේ 116 වගන්තිය, 2017 අංක 24 දරණ දේශීය ආදායම් පනතේ 9 (1) වගන්තිය සහ ඉන්පසුව කරන ලද 2021 අංක 10 දරණ දේශීය ආදායම් (සංශෝධිත) පනත, 2022 අංක 45 දරණ දේශීය ආදායම් (සංශෝධිත) පනත සහ 2023 අංක 04 දරණ දේශීය ආදායම් (සංශෝධිත) පනත ප්‍රකාරව බැංකුවේ ආදායම, ආදායම් බද්දෙන් නිදහස් වේ.

2017 අංක 7 දරණ ආර්ථික සේවා ගාස්තු (සංශෝධිත) පනත අනුව 2017 අප්‍රේල් 1 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි බැංකුව විසින් ආර්ථික සේවා ගාස්තු ගෙවිය යුතු වේ. එහෙත් 2018 අංක 33 දරණ ආර්ථික සේවා ගාස්තු (සංශෝධිත) පනත අනුව 2018 ඔක්තෝබර් මස සිට උපලබ්ධි නොවූ ලාභ සහ විදේශ මූල්‍ය වත්කම්වල මිල වෙනස්වීමෙන් වන උපලබ්ධි නොවූ ලාභ ආර්ථික සේවා ගාස්තුවලින් නිදහස් වේ. තවද 2013 අංක 17 දරණ එකතු කල අගය මත බදු (සංශෝධිත) පනත යටතේ මූල්‍ය සේවා සැපයීම මත එකතු කල අගය මත බද්දෙන් බැංකුව නිදහස් වේ.

2020 ජනවාරි 1 දින සිට බලපැවැත්වෙන පරිදි ආර්ථික සේවා ගාස්තු අහෝසිකරන ලදී.

**5.33 වාර්තාකරණ කාලපරිච්ඡේදයට පසු සිද්ධීන්**

වාර්තාකරණ කාලපරිච්ඡේදයට පසු සිදු වූ සියළුම ප්‍රමාණාත්මක සිදුවීම් සැලකිල්ලට ගෙන අදාල පරිදි, මූල්‍ය ප්‍රකාශයන්හි නියමිත සටහන් තුළ සංශෝධන හෝ හෙළිදරව් කිරීම් ලෙස දක්වා ඇත.

**මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

ජා.ගි.ප්‍ර. 7 - මුදල් ප්‍රවාහ ප්‍රකාශන සමග අනුකූලව, මුදල් ප්‍රවාහ ප්‍රකාශය සැකසීම සඳහා වන “ඍජු ක්‍රමය” භාවිතයෙන් මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිලියෙල කර ඇත. මුදල්/මුදල් විධානයන්ගේ ගලායෑම් ගැලපීමෙන් අනතුරුව ලැබෙන අගය ඉහත නිර්වචනය කළ පරිදි මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙහි මුදල් හා මුදල් සමානයන් ලෙස දක්වා ඇත.

## 6. ප්‍රකාශිත නමුත් වාර්තා කරන දිනට බල සහිත නොවූ ප්‍රමිතීන් මත වූ සංශෝධන සහ නිර්වචනයන්

නව සංශෝධන හා බැඳුනු නව නිර්වචනයන් 2023 ජනවාරි 01 දිනට පසු එළඹෙන වාර්ෂික කාලපරිච්ඡේදවලට බල පැවැත්වෙන අතර ඒවා නියමිත දිනට පෙර යොදා ගැනීමට අවසර ඇත. එසේ වුවද, මෙම මූල්‍ය වාර්තා පිළියෙල කිරීමේ දී බැංකුව විසින් මෙකී සංශෝධිත ප්‍රමිතීන් නියමිත දිනට පෙර අදාළ කර නොගන්නා ලදී. තවද පහත දක්වා ඇති සංශෝධිත ප්‍රමිත බැංකුවේ මූල්‍ය ප්‍රකාශ මත සැලකිය යුතු බලපෑමක් ඇති කරනු ඇතැයි බැංකුව බලාපොරොත්තු නොවන අතර 2023 වසර සඳහා අදාළ වන නව ගිණුම්කරණ ප්‍රමිතීන් නොතිබුණි.

## 7. ක්‍රියාකාරකම්වල ස්වභාවය සහ විෂය පථය

**7.1 විදේශීය මුදල් ක්‍රියාකාරකම්**

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් එහි විදේශීය සංචිත කළමනාකරණය යටතේ පවත්වාගෙන යනු ලබන විදේශීය මුදල් වත්කම්වලින් විදේශීය මුදල් ක්‍රියාකාරකම් ප්‍රධාන වශයෙන් ජනිත වේ. විදේශීය සංචිත කළමනාකරණ කළඹ, විදේශීය මුදල් මැදිහත්වීමේ කාර්යයන් සඳහා වූ විදේශීය මුදල් වත්කම් සහ වෙළෙඳ කටයුතු සඳහා වූ අනිකුත් විදේශීය මුදල් වත්කම්වලින් සමන්විත වේ.

විදේශීය මුදල් වත්කම් විවිධ මුදල් වර්ගවලින් පවත්වා ගනු ලැබේ. එයින් වැඩි ප්‍රමාණයක් ඇමෙරිකා එක්සත් ජනපද ඩොලර්, ඔස්ට්‍රේලියානු ඩොලර්, යුරෝ, බ්‍රිතාන්‍ය පවුම්, ජපන් යෙන් සහ නවසීලන්ත ඩොලර් වලින් පවතී.

මෙම විදේශීය මුදල් කළඹ තුළ වූ මූල්‍ය ලියවිලි ප්‍රධාන වශයෙන් ස්වෛරී සුරැකුම්පත්, ප්‍රතිවිකුණුම් ගනුදෙනු යටතේ රඳවා ගත් සුරැකුම් හෝ අනිකුත් මහ බැංකු, වාණිජ බැංකු හා අනිකුත් භාරකාර ආයතන සමඟ පවත්නා වූ ශේෂයන්ගෙන් සමන්විත වේ.

විදේශීය වෙළෙඳපොළේ මෙහෙයුම්වලින් උද්ගත වන්නා වූ විදේශීය මුදල් වත්කම් සහ බැරකම් ද, කලින් කලට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් දරනු ලැබේ.

**7.2 දේශීය මුදල් ක්‍රියාකාරකම්**

දේශීය මුදල් ක්‍රියාකාරකම් පහත සඳහන් පරිදි උද්ගත වේ.

(i) ද්‍රවශීලතා කළමනාකරණ මෙහෙයුම්: බැංකු පද්ධතියට අරමුදල් අත්තිකාරම් දීමෙන් හෝ බැංකු පද්ධතියෙන් අරමුදල් ආපසු ගැනීමෙන් රජයට හෝ මූල්‍ය වෙළෙඳපොළට දෛනිකව සිදුවන ශුද්ධ ගලායාම්/ගලාඒම් හිලව් කිරීම මඟින් ද්‍රවශීලතා කළමනාකරණය සිදුකරනු ලබයි. මෙම කටයුතු බොහොමයක් දෛනික විවට වෙළෙඳපොළ මෙහෙයුම් මගින් සිදුකරනු ලැබේ.

(ii) විවෘත වෙළෙඳපොළ කටයුතු සඳහා ආධාරකයක් වශයෙන් ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත් වලින් සමන්විත ආයෝජන කළඹක් බැංකුව පවත්වා ගනී. බැංකුවේ ප්‍රතිපත්තිය වන්නේ මෙම ආයෝජන වෙළඳාම සඳහා නොව මුදල් මෙහෙයුම් කටයුතු සඳහා පමණක් පවත්වා ගැනීමය.

**7.3 භාර සහ භාරකාරත්ව ක්‍රියාකාරකම්**

භාරකාරත්ව සහ පරිපාලන විධිවිධාන යටතේ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පරිපාලනය කරනු ලබන අගයන්, බැංකුවේ මූල්‍ය ප්‍රකාශනවල මූලිකාංගයන්ට අයත් කොටසක් නොවන බැවින් මෙම මූල්‍ය ප්‍රකාශයන්හි ඇතුලත් කර නොමැත.

අමතර තොරතුරු
පාලනය
අභ්‍යන්තර කළමනාකරණය
මහ බැංකුවේ කාර්යභාරය
මූල්‍ය ප්‍රකාශ

## 8. මුදල් සහ මුදල් සමානයන්

| | 2023 රු. 000 | 2022 රු. 000 |
|---|---|---|
| බැංකු සමඟ ඇති ශේෂයන් | **239,279,034** | 7,626,592 |
| බැංකු සමඟ ඇති කාලීන තැන්පතු | **486,868,385** | - |
| එක්දින ස්ථාපනය කිරීම් | **16,422,911** | 118,410,171 |
| මුදල් සහ මුදල් සමානයන් සඳහා ලැබිය යුතු පොලී | **897,400** | 28,287 |
| මුදල් ප්‍රවාහ ප්‍රකාශයට අනුව මුදල් සහ මුදල් සමානයන් | **743,467,730** | 126,065,050 |
| සීමාසහිත භාවිතයන් සඳහා පවතින මුදල් සහ මුදල් සමානයන් (සටහන 8.1) | **456,377,841** | 526,467,646 |
| අඩුකළා: මුදල් සහ මුදල් සමානයන් මත අපේක්ෂිත ණය අලාභ (සටහන 8.2) | **(866,001)** | (844,832) |
| **එකතුව** | **1,198,979,570** | 651,687,864 |

**8.1** 25.5 සටහනෙහි දක්වා ඇති ආකාරයට ශ්‍රී.ලං.ම.බැ. හා පීපල්ස් බැන්ක් ඔෆ් චයිනා අතර ඇති වූ ද්වීපාර්ශවික මුදල් හුවමාරු පහසුකම යටතේ ලැබුනු චීන යුආන් බිලියන 10ක මුදල සීමාසහිත භාවිතයන් සඳහා පවතින මුදල් සහ මුදල් සමානයන් ලෙස දක්වා ඇත.

මෙම පහසුකම යටතේ ලැබුණු මුදල්, රටවල් දෙක අතර වෙළඳ කටයුතුවලදී, සෘජු ආයෝජනවලදී සහ දෙපාර්ශවය මගින් එකඟවන වෙනත් කාරණයක් සඳහා යොදාගත හැකිය.

### 8.2 මුදල් සහ මුදල් සමානයන් මත අපේක්ෂිත ණය අලාභයන්ගේ චලනය

| | 2023 | | | 2022 | | |
|---|---|---|---|---|---|---|
| | අදියර I රු. 000 | අදියර II රු. 000 | එකතුව රු. 000 | අදියර I රු. 000 | අදියර II රු. 000 | එකතුව රු. 000 |
| ජනවාරි 1 දිනට ශේෂය | **841,441** | **3,392** | **844,833** | 52,009 | 33,359 | 85,368 |
| වර්ෂය තුල අය කිරීම් / (ආපසු හැරවුම්) | **(206,032)** | **227,200** | **21,168** | 789,432 | (29,967) | 759,465 |
| දෙසැම්බර් 31 දිනට ශේෂය | **635,409** | **230,592** | **866,001** | 841,441 | 3,392 | 844,833 |

## 9. විදේශීය සුරැකුම්පත්වල ආයෝජනයන්

| | 2023 රු. 000 | 2022 රු. 000 |
|---|---|---|
| අනෙකුත් විස්තීරණ ආදායම තුළින් සාධාරණ අගයට ඇති සුරැකුම්පත් - විදේශීය සුරැකුම්පත්වල ආයෝජනයන් | **223,406,791** | 10,867,425 |
| විදේශ සුරැකුම්පත් ආයෝජනවල එකතුව | **223,406,791** | 10,867,425 |
| අනෙකුත් විස්තීරණ ආදායම තුළින් සාධාරණ අගයට ඇති සුරැකුම්පත් මත අපේක්ෂිත ණය අලාභ (සටහන 9.1) | **70,273** | 4,744 |

### 9.1 අනෙකුත් විස්තීරණ ආදායම් තුළින් සාධාරණ අගයට වූ සුරැකුම්පත් මත අපේක්ෂිත ණය අලාභවල චලනය

| | 2023 | | | 2022 | | |
|---|---|---|---|---|---|---|
| | අදියර I රු. 000 | අදියර II රු. 000 | එකතුව රු. 000 | අදියර I රු. 000 | අදියර II රු. 000 | එකතුව රු. 000 |
| ජනවාරි 1 දිනට ශේෂය | **4,744** | **-** | **4,744** | 995 | - | 995 |
| වර්ෂය තුළ අය කිරීම්/(ආපසු හැරවුම්) | **65,529** | **-** | **65,529** | 3,749 | - | 3,749 |
| දෙසැම්බර් 31 දිනට ශේෂය | **70,273** | **-** | **70,273** | 4,744 | - | 4,744 |

## 10. ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ

**10.1** පහත දක්වා ඇති වගුව මගින් ව්‍යුත්පන්න මූල්‍ය උපකරණයන්හි සාධාරණ අගයන් එහි කාල්පනික අගයන් සමග වත්කම් හෝ බැරකම් වශයෙන් වාර්තා කර ඇත. දළ අගයන් වශයෙන් වාර්තා කර ඇති කාල්පනික අගයන් ලෙස හඳුනා ගනුයේ ව්‍යුත්පන්නයට පාදක වූ වත්කමෙහි නිර්දේශ අනුපාතයෙහි හෝ දර්ශකයෙහි අගය වන අතර ව්‍යුත්පන්න උපකරණයන්ගේ අගයන්හි සිදුවන වෙනස්වීම් මිනුම් කිරීමේ පදනම ද වේ. කාලපරිච්ඡේදයේ අවසාන දිනට හිඟව පවතින ගනුදෙනුවල පරිමාව කාල්පනික අගයන්ගෙන් නිරූපණය වන අතර එමගින් වෙළඳපල අවදානම හෝ ණය අවදානම නොහැඟවේ.

| | 2023 | | | 2022 | | |
|---|---|---|---|---|---|---|
| | වත්කම් රු. 000 | වගකීම් රු. 000 | කාල්පනික අගය රු. 000 | වත්කම් රු. 000 | වගකීම් රු. 000 | කාල්පනික අගය රු. 000 |
| මුදල් හුවමාරු (Currency SWAPS) | **5,775,226** | **46,740,483** | **396,845,081** | 401,580 | 71,669,551 | 208,591,719 |
| ඉදිරියෙහි වූ හුවමාරු (Forex Forward) | **-** | **2,207,417** | **72,882,743** | - | 28,443 | 1,724,773 |
| එකතුව | **5,775,226** | **48,947,900** | **469,727,824** | 401,580 | 71,697,994 | 210,316,492 |

**10.2** ඉහත සඳහන් ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ සමන්විත වනුයේ මුදල් හුවමාරු සහ ඉදිරි විදේශ විනිමය ගිවිසුම් වලිනි. මෙවැනි උපකරණ යොදා ගනුයේ බැංකුවේ ව්‍යවස්ථාපිත අරමුණක් වන ජාත්‍යන්තර අරමුදල් පවත්වා ගැනීමේ දී පැන නගින්නා වූ වෙළෙඳපොළ සහ ද්‍රවශීලතා අවදානම් කළමනාකරණය කිරීම සඳහාය. මීට අමතරව මහ බැංකුව විසින් බලපත්‍රලාභී වාණිජ බැංකු, බලපත්‍රලාභී විශේෂිත බැංකු සහ විදේශ මහ බැංකු සමග හුවමාරු ගිවිසුම් සහ ඉදිරි විදේශ විනිමය ගිවිසුම්වලට එළඹීම මගින් ශ්‍රී ලංකා රුපියල අන්තර්ජාතිකව ස්ථාවරව පවත්වා ගැනීමත්, දේශීය මූල්‍ය පද්ධතිය ශක්තිමත් කිරීමත්, විදේශ මුදල් රට තුළට ගෙන ඒමට එම බැංකු දිරිමත් කිරීමත් අපේක්ෂා කෙරේ.

**10.3** ව්‍යුත්පන්නයන් යනු පොලී අනුපාත, මූල්‍ය උපකරණවල වටිනාකම, භාණ්ඩ මිල ගණන්, විදේශ විනිමය අනුපාත, ණය අවදානම් සහ දර්ශක වෙනස්වීම්වලට අනුව අගය තීරණය වන මූල්‍ය ගිවිසුම්ය.

**10.4** විනිමය අනුපාත අවදානම සහ කෙටිකාලීන ද්‍රවශීලතාවය පාලනය කිරීම සඳහා වූ උපායමාර්ගයක් ලෙස එළඹුණු මුදල් හුවමාරු (Currency SWAP) බැංකුවේ ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ කළඹයෙහි වැදගත් කොටසක් වශයෙන් අඩංගු වී ඇත. මුදල් හුවමාරුවකදී බැංකුව, නියමිත දින දෙකකදී එක් මුදල් වර්ගයකින් නිශ්චිත ප්‍රමාණයක් තවත් මුදල් වර්ගයක් සමග එකඟ වූ අනුපාතයන් යටතේ හුවමාරු කර ගනී.

**10.5** ඉදිරි විදේශ විනිමය ගිවිසුම් මගින් බැංකුව, එකඟ වූ අනුපාතයකට, එකඟ වූ ඉදිරි දිනයකදී නිශ්චිත විදේශ මුදල් ප්‍රමාණයක් මිලදී ගැනීමට හෝ විකිණීමට බැඳී සිටී.

**10.6** සමස්ථ අවදානම් කළමනාකරණයෙහි කොටසක් ලෙස ව්‍යුත්පන්න මූල්‍ය උපකරණවලින් අපේක්ෂිත ප්‍රතිලාභ බැංකුව වෙත ලැබීම තහවුරු කිරීමට, බැංකුව විසින් ව්‍යුත්පන්න ගිවිසුම් වෙත නිරාවරණය වීම සමීප වශයෙන් අධීක්ෂණය කරනු ලබයි.

**10.7 දිගු කාලීන ඇ.එ.ජ. ඩොලර්/රුපියල් විකුණුම් මිලදී ගැනීම් හුවමාරු පහසුකම් (USD/LKR Buy-Sell Swap Agreements) යටතේ ලංකා බැංකුවට, මහජන බැංකුවට, DFCC බැංකුවට, කොමර්ෂල් බැංකුවට හා ජාතික සංවර්ධන බැංකුවට ගෙවිය යුතු මුදල්**

විදේශ සංචිත ඉහළ නැංවීමේ අරමුණින් බැංකුව විසින් බලපත්‍රලාභී වාණිජ බැංකු සමග දිගුකාලීන ඇ.එ.ජ. ඩොලර්/රුපියල් විකුණුම් මිලදී ගැනීම් හුවමාරු පහසුකම් වලට එළඹෙන ලදි. 2023 දෙසැම්බර් 31 දිනට එක් එක් වාණිජ බැංකුව සමග පවතින දිගුකාලීන හුවමාරු පහසුකම් සඳහා ගෙවිය යුතු මුදල් පහත පරිදි වේ.

| බැංකුව | ගිවිසුම්ගත දිනය | කාල්පනික ගෙවිය යුතු මුදල ඇ.එ.ජ. ඩොලර් මිලියන | අවසාන වාරිකය කල් පිරෙන දිනය | කාලසීමාව/ කොන්දේසි | ගනුදෙණුවේ අදාළත්වය |
|---|---|---|---|---|---|
| ලංකා බැංකුව | 2023 අගෝස්තු 15 | 225.00 | 2025 අගෝස්තු 12 | • මෙම හුවමාරු පහසුකමේ ඉදිරි පියවීමේ දිනය හා ඉදිරි පියවීමේ දිනයේ පවතින විනිමය අනුපාතිකය සමග සමපාත වන පරිදි, බැඳුම්කර හුවමාරු කරන දිනයට (2023 අගෝස්තු 15) ලංකා බැංකුවෙන් ඇ.එ.ජ. ඩොලර් මිලියන 225ක් මිලදීගැනීම සඳහා අවුරුදු 02ක ස්ථිර පදනම මත ඇතිකරගනු ලබන ඉදිරි ගණුදෙනුවේ (forward transaction) ඉදිරි පියවීමේ දිනය හා ඉදිරි පියවීමේ දිනයේ පවතින විනිමය අනුපාතිකය සකස්කර, එම ඉදිරි පියවීම්වලදී අදාළ ඇ.එ.ජ. ඩොලර් ප්‍රමාණය සහ ශ්‍රී ලංකා රුපියල් ප්‍රමාණය එකිනෙකට පියවී යන ලෙසට සැකසිය යුතුය. | දේශීය ණය ප්‍රශස්තකරණය වැඩසටහන යටතේ ලංකා බැංකුවට අයත් ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කරවල පැවති ආයෝජන ශ්‍රී ලංකා රුපියල්වලින් පවතින රජයේ බැඳුම්කරවලට හුවමාරු කිරීමට අවස්ථාව සලසාදෙන ලදී. |
| ලංකා බැංකුව | 2021 අප්‍රේල් 22 | 35.00 | 2027 දෙසැම්බර් 15 | • අවුරුදු 6ක් සඳහා ශූන්‍ය පිරිවැය ලෙස<br>• ආසන්න වශයෙන් ඇ.එ.ජ. ඩොලර් මි. 10 ක් සෑම මාස 6ක දීම පියවෙන පරිදි අදියර 5 කදී පියවීම කළ යුතුය. | Asian Infrastructure Investment Bank මගින් කොවිඩ්-19 හදිසි හා ආපදා සහන ලබාදීමේ ව්‍යාපෘතිය සඳහා ලබාදුන් ණය |
| ලංකා බැංකුව | 2021 ජුනි 29 | 44.78 | | | |
| මහජන බැංකුව | 2021 අප්‍රේල් 23 | 35.00 | | | |
| මහජන බැංකුව | 2021 සැප්තැම්බර් 30 | 44.78 | | | |
| DFCC බැංකුව | 2021 නෙවැම්බර් 15 | 118.75 | 2028 අගෝස්තු 15 | • අවුරුදු 7ක් සඳහා ශූන්‍ය පිරිවැය ලෙස<br>• ඇ.එ.ජ. ඩොලර් මි. 6.25 ක් සෑම මාස 3කට වරක්ම පියවෙන පරිදි අදියර 20කදී පියවීම කළ යුතුය. | United States International Development Finance Corporation මගින් ලබාදුන් ණය. |
| කොමර්ෂල් බැංකුව | 2021 නොවැම්බර් 17 | 35.00 | 2026 නොවැම්බර් 23 | • වසර 05 ක කාලසීමාවක් සහිත මෙම ගිවිසුම පළමු මාස 18 සඳහා ශූන්‍ය පිරිවැය යටතේත්, ඉතිරි කාලසීමාව සඳහා ඇ.එ.ජ. ඩොලර් 01 කට ශ්‍රී ලංකා රුපියල් 1ක් බැගින් අර්ධ වාර්ෂිකවත් පියවිය යුතුය.<br>• කල් පිරෙන දිනයේදී සම්පූර්ණ මුදලම පියවිය යුතුය. | එක්සත් රාජධානියේ CDC PLC වෙතින් ලැබුණු ණය. |
| ජාතික සංවර්ධන බැංකුව (NDB) | 2022 මාර්තු 18 | 33.00 | 2029 මාර්තු 19 | • සම්පූර්ණ කාලසීමාව අවුරුදු 7කි. ඉන් පළමු මාස 18 තුළදී ඇ.එ.ජ ඩොලර් 01 කට ශ්‍රී ලංකා රුපියල් 1ක් බැගිනුත් ඉතිරි කාලසීමාව සඳහා ඇ.එ.ජ ඩොලර් 01 කට ශ්‍රී ලංකා රුපියල් 1ක් බැගින් අර්ධ වාර්ෂිකවත් පියවිය යුතුය.<br>• ඇ.එ.ජ. ඩොලර් මිලියන 3ක් අර්ධ වාර්ෂිකව පියවෙන පරිදි අදියර 12 ක් යටතේ පියවිය යුතුය. | United States International Development Finance Corporation මගින් ලබාදුන් ණය. |

## 11. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (ජා.මූ.අ.) සම්බන්ධ වත්කම්

| | 2023 රු. 000 | 2022 රු. 000 |
|---|---|---|
| ලාභ/අලාභ මත සාධාරණ අගයට මිනුම් කළ | | |
| ජා.මූ.අ. පංගුව (සටහන 11.1) | **253,508,295** | 279,779,554 |
| විශේෂ ගැනුම් හිමිකමේ දැරීම (සටහන 11.2) | **10,991,665** | 626,461 |
| | **264,499,960** | 280,406,015 |
| **ක්‍රමක්ෂය පිරිවැය යටතේ මිනුම් කළ** | | |
| ජා.මූ.අ. තැන්පතු (සටහන 11.3) | **345,479** | 377,081 |
| කලින් ගෙවීම් - ජා.මූ.අ. ණය | **493,765** | 637,986 |
| අඩුකළා: ජා.මූ.අ. සම්බන්ධිත වත්කම් මත අපේක්ෂිත ණය අලාභ (සටහන 11.4) | **(7)** | (8) |
| | **839,237** | 1,015,059 |
| | **265,339,197** | 281,421,074 |

### 11.1 ජා.මූ.අ. පංගුව (IMF quota)

ජා.මූ.අ. හි වත්කම් වල ප්‍රාථමික මූලාශ්‍රය වන්නේ එහි සාමාජික රටවලින් ලබා ගන්නා ලද ජාත්‍යන්තර මූල්‍ය අරමුදල් පංගුව හෙවත් ප්‍රග්ධන දායකත්වයයි. එක් එක් රටවල පංගුව, පුළුල් වශයෙන්, එම රටෙහි සාපේක්ෂ ආර්ථික වටිනාකම පදනම් කර ගනිමින් තිරණය කරනු ලබයි. ජා.මූ.අරමුදලෙහි සාමාජිකත්වය ලබාගැනීමෙන් පසු තම පංගුවෙන් 25%ක ප්‍රමාණයක් පුළුල්ව පිළිගත් විදේශ මුදලකින් හෝ විශේෂ ගැනුම් හිමිකම මගින්ද ඉතිරි 75%ක මුදල එම රටෙහි දේශිය මුදලින්ද ගෙවිය යුතුය. ජා.මූ. අරමුදලේ කොන්දේසිවලට අනුව රජය වෙනුවෙන් බැංකුව සිය ගිණුමෙන්ම ගනුදෙනු සිදුකරනු ලබන හෙයින් ජා.මූ.අ. පංගුව බැංකුවේ වත්කමක් ලෙස නියෝජනය වේ.

ජා.මූ අරමුදලේ පොදු පංගු සමාලෝචන ගිවිසුම යටතේ, 2016 ජනවාරි මස දී 189ක් වූ ජා.මූ.අ සාමාජිකයන්ගේ පංගුව වැඩි කිරීමට තීරණය කරන ලදී. (වර්තමානයේ ජා.මූ.අ. සාමාජිකයින් ගණන 190 කි.)

එහි ප්‍රතිඵලයක් වශයෙන් ශ්‍රී ලංකා ජා.මූ.අ. පංගුව වි.ගැ.හි. මිලියන 413.40 ක් වූ පෙර පංගු ප්‍රමාණයේ සිට 2016 පෙබරවාරි 17 වන දිනට වි.ගැ.හි. මිලියන 578.80 දක්වා වර්ධනය විය.

ජා.මූ.අ. පංගුව සඳහා ගෙවිය යුතු මුදල 24 වන සටහනේ පංගු බැරකම ශීර්ෂය යටතේ දක්වා ඇත. සාමාජික පංගුව මගින් ජා.මූ.අ. සමඟ රටක පවතින මූල්‍යමය සහ සංවිධානාත්මක සම්බන්ධතාවය තහවුරුකරනු ලබන අතර පහත පහසුකම් ද මේ සඳහා ඇතුළත් වේ.

සාමාජිකයෙකු ජා.මූ.අ. වෙතින් ඉවත්වුවහොත්, එහි පංගු දායකත්වය ජා.මූ.අ. වෙත ශුද්ධ බැඳීම් පියවීමට අවශ්‍ය නොවන ප්‍රමාණය දක්වා ආපසු ගෙවනු ලැබේ. කෙසේ වෙතත්, සාමාජිකයන්ට ජා.මූ.අ. පංගුව සඳහා පොළියක් හිමි නොවන අතර එම නිසා මුදල් වල කාල වටිනාකම සඳහා වන්දි මුදලක් හිමි නොවේ. එම නිසා, ජා.මූ.වා.ප්‍ර. 9 යටතේ මෙය ලාභ හෝ අලාභ තුළින් සාධාරණ මිලට පවතින අගයක් ලෙස වර්ගීකරණය කරනු ලැබේ. සාධාරණ අගය ගණනය කිරීමට කල්පිරීමේ කාලයක් නොමැති බැවින් සාධාරණ අගය ක්‍රමක්ෂය පිරිවැය අගයට සමාන වේ.

i) **දායකය** - ජා.මූ.අ. වෙත සාමාජිකයකුගේ දායකය සාමාජිකයාගේ පංගුවට සමාන වේ. එමගින් සාමාජිකයා විසින් ජා.මූ.අ. වෙත ලබාදීමට බැඳී ඇති උපරිම මූල්‍ය සම්පත් ප්‍රමාණය නිශ්චය කරනු ලැබේ. සාමාජිකයකු විසින් දායකය සම්පූර්ණයෙන් ම ගෙවිය යුතු අතර, සියයට 25 ක් ජා.මූ.අ. විසින් නියම කරනු ලබන සංචිත වත්කම්වලින් (වි.ගැ.හි. හෝ පාවිච්චි කළ හැකි මුදල්) ගෙවිය යුතුය. ඉතිරි ප්‍රමාණය සාමාජිකයාගේ ව්‍යවහාර මුදලින් ගෙවිය යුතුය.

ii) **ඡන්දය දීමේ බලතල** - ජා.මූ.අ. තීරණවලදී සාමාජිකයාගේ ඡන්දය දීමේ බලතල පංගුව මගින් නිර්වචනය වේ. එක් එක් ජා.මූ.අ. සාමාජිකයාට මූලික ඡන්දයක් ද පංගුවෙහි සෑම වි.ගැ.හි. 100,000 ක් සඳහා එක් අතිරේක ඡන්දයක් ද බැගින් හිමි වේ. 2008 ප්‍රතිසංස්කරණ මගින් මූලික ඡන්ද සංඛ්‍යාව මුළු ඡන්ද සංඛ්‍යාවෙන් සියයට 5.50 ක් ලෙස ස්ථාවර කරන ලදී.

iii) **මූල්‍යකරණයට පිවිසීම** - ජා.මූ.අ. මගින් සාමාජිකයෙකුට ලබාගත හැකි මූල්‍ය පහසුකම් ප්‍රමාණය (එහි පිවිසීමේ සීමා) සාමාජිකයාගේ පංගුව මත තීරණය වේ. සම්පස්ථ සහ ව්‍යාප්ත කළ සැලසුම් ප්‍රකාර සාමාජිකයෙකුට වාර්ෂිකව පංගුවෙන් සියයට 145 ක් ද (ජා.මූ.අ කොවිඩ් -19 තත්වයට ප්‍රතිචාර වශයෙන් තාවකාලිකව මෙය පංගුවෙන් සියයට 245ක් දක්වා 2021 වර්ෂය අවසාන තෙක් වැඩි කරන ලදී.) සමුච්චිත වශයෙන් සියයට 435 ක් ද දක්වා ණය ලබාගත හැකිය. අසාමාන්‍ය අවස්ථාවකදී ප්‍රවේශය මීට වැඩිවිය හැකිය.

**iv)** **වි.ගැ.හි. වෙන්කිරීම්** - සාමාජිකයන්ගේ පංගුවලට සමානුපාතිකව ඔවුන්ගේ වි.ගැ.හි. වෙන්කිරීම් ප්‍රමාණය නියම කරනු ලැබේ. ඇ.එ.ජ. ඩොලර් බිලියන 650 කට සමාන, සාමාන්‍ය වි.ගැ.හි. වෙන්කිරීමක් ජා.මූ.අ සාමාජිකයන් මෙන්ම වි.ගැ.හි. දෙපාර්තමේන්තුවේ සහභාගීවන්නන්හට ඔවුන්ගේ පවතින පංගුවට සමානුපාතිකව 2021 අගෝස්තු 23 වන දින සිට බලපැවැත්වෙන පරිදි ලබාදෙන ලදී. මෙම සාමාන්‍ය වි.ගැ.හි වෙන් කිරීමෙන් ශ්‍රී ලංකාව ලද කොටස වි.ගැ.හි මිලියන 554.80 ක් විය.

**11.2 විශේෂ ගැනුම් හිමිකම් දැරීම**

විශේෂ ගැනුම් හිමිකම් (වි.ගැ.හි.) දැරීම වූ කලී ජා.මූ.අ. සාමාජිකයන් හට බාධාවකින් තොරව පාවිච්චි කළ හැකි මුදල් වර්ග සඳහා පවතින විභව්‍ය හිමිකමකි. එනම්, වි.ගැ.හි. දරන්නන් විසින් එම මුදල් සඳහා අනෙකුත් සංචිත මුදල් හුවමාරු කරගත හැකිවීමය. වි.ගැ.හි සංචිත වත්කමක් ලෙස සලකනුයේ ජා.මූ.අ. සාමාජිකයින් වි.ගැ.හි දැරීමට සහ පිළිගැනීමට බැඳී සිටීම සහ වි.ගැ.හි. පද්ධතියේ මෙහෙයුම්වලට අදාළ විවිධ වගකීම්වලට ගරු කිරීමට බැඳී සිටීම තුළිනි. අබාධව පාවිච්චි කළ හැකි මුදල් මත වි.ගැ.හි. වල පවතින හිමිකම දෙයාකාරයකින් ගරු කිරීම ජා.මූ.අ. විසින් තහවුරු කරනු ලැබේ. එනම්, දුර්වල විදේශීය තත්ත්වයන්හි පවතින සාමාජිකයන්ගෙන් වි.හැ.ගි. මිලට ගැනීම සඳහා බලවත් විදේශීය තත්ත්වයන් පවත්නා සාමාජිකයන් නම් කිරීම මගින් සහ කළමනාකරණය කළ වෙළෙඳපොළක් තුළ සාමාජිකයන් අතර, ස්වෙච්ඡා හුවමාරු කිරීම මගින් ය. අදාළ වාර්තාකරණ දිනයේ දී බැංකුව විසින් දරන ලද මුළු ප්‍රමාණය ඉහත සංඛ්‍යාවන්ගෙන් දැක්වේ.

විශේෂ ගැණුම් හිමිකම් දැරීම සතුව මුදල් වලට සමාන ලක්ෂණ පවතී. එමනිසා, ජා.මූ.වා.ප්‍ර. 9 යටතේ මෙය ලාභ හෝ අලාභ තුළින් සාධාරණ මිලට පවතින අගයක් ලෙස වර්ගීකරණය කරනු ලැබේ. සාධාරණ අගය ගණනය කිරීමට කල්පිරීමේ කාලයක් නොමැති බැවින් සාධාරණ අගය ක්‍රමක්ෂය පිරිවැය අගයට සමාන වේ.

**11.3 ජා.මූ. අරමුදලේ තැන්පතු - දිළිඳුකම පිටුදැකීමේ සහ වර්ධන පහසුකම - (PRGF - HIPC) භාර තැන්පතුව**

දැඩි ණයගැති භාවයට පත්වී සිටින රටවල් වෙනුවෙන් දිළිඳුකම පිටුදැකීමේ සහ වර්ධන පහසුකම (PRGF - HIPC) වෙනුවෙන්, 2000 අප්‍රේල් 21 වන දින, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ ශ්‍රී ලංකාව පවත්වාගෙන යනු ලබන (පරිපාලිත -Administered) වි.ගැ.හි. 788,783 ක ශේෂයකින් යුත් විශේෂ විලම්භිත ගිණුම (SCA 2) පැවරීමෙන් අරඹන ලදී. මෙම ගිණුම අරඹන ලද්දේ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි මග පෙන්වීම මත SCA 2 ගිණුම වසා දැමීමට තීරණය කිරීමේ දී SCA 2 ගිණුමෙහි පැවැති ශේෂය මාරු කිරීමෙනි.

මෙම ගිණුමෙහි ශේෂයන් ඇති රටවලින් ජා.මූ.අ. පහත දැක්වෙන ඉල්ලීම් කරන ලදී. උක්ත ගිණුමෙහි සඳහන් ශේෂයන් (PRGF-HIPC) භාර ගිණුම වෙත ප්‍රතිපාදන කිරීම කළ යුත්තේ එකවර දෙනු ලබන පැවැරුමක් ලෙසින් හෝ සහනාධාරයක් ලෙසිනි. මෙය PRGF-HIPC ණය වෙනුවෙන් සපයා දිය යුතුය. ඒ අනුව SCA 2 ගිණුමේ ශේෂය PRGF-HIPC භාර ගිණුම වෙත පවරා දීමට ශ්‍රී ලංකා රජය එකඟ විය. මෙය පවරා දෙනු ලබන්නේ එකවර මුදාහරිනු ලබන සහනාධාරයක් ලෙසින් නොව 2018 වසර දක්වා බල පැවැත්වෙන පොළී රහිත තැන්පතුවක් වශයෙනි. පසුව මෙය 2024 දක්වා දීර්ඝ කරන ලදී.

**11.4 ජා.මූ.අ. සම්බන්ධිත වත්කම් මත අපේක්ෂිත ණය අලාභවල චලනය**

| | 2023<br>රු. 000 | 2022<br>රු. 000 |
|---|---|---|
| අදියර 1 | | |
| ජනවාරි 1 දිනට ශේෂය | **8** | 3 |
| වර්ෂය තුළ දී අයකිරීම්/(ආපසු හැරවුම්) | **(1)** | 5 |
| දෙසැම්බර් 31 දිනට ශේෂය | **7** | 8 |

## 12. ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත්

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 2023 අංක 16 දරණ ශ්‍රී.ලං.ම. බැංකු පනතේ 86 (4) වගන්තිය ප්‍රකාරව ප්‍රාථමික වෙළෙඳපොළෙන් හා 86 (5) වගන්තිය ප්‍රකාරව ද්විතීක වෙළෙඳපොළෙන් රජයේ සුරැකුම්පත් මිලදී ගැනීම සිදුකරයි.

| | 2023<br>රු. 000 | 2022<br>රු. 000 |
|---|---|---|
| භාණ්ඩාගාර බිල්පත් | **208,344,310** | 2,480,822,291 |
| භාණ්ඩාගාර බැඳුම්කර | **1,804,175,760** | 17,708,352 |
| ලැබිය යුතු පොළී | **31,827,522** | 464,372 |
| | **2,044,347,592** | 2,498,995,015 |

ශ්‍රී ලංකා මහ බැංකුවේ දේශීය රජයේ සුරැකුම්පත් කළඹ අනෙකුත් විස්තීර්ණ ආදායම් තුළින් සාධාරණ මිලට ඇති සුරැකුම්පත් ලෙස වර්ගීකරණය කෙරෙන අතර මෙම කළඹ 2023 සැප්තැම්බර් මස 21 වැනි දින දේශීය ණය ප්‍රශස්තකරණ වැඩසටහනට යටත් විය. මූලික හඳුනාගැනීමේදී, නව මූල්‍ය උපකරණ සාධාරණ අගයට ගණනය කළ අතර එහිදී සිදුවූ රු.බි. 766.4 ක 'එක්දින පාඩුව' ආදායම් ප්‍රකාශයේ වාර්තා කරන ලදී.සාධාරණ අගය ගණනය කිරීමේදී වෙළෙඳපොළ අවදානම හා ණය අවදානම යන කරුණු පිලිබඳව සළකා බැලූ බැවින් රජයේ සුරැකුම්පත් කළඹ හා සම්බන්ධ ඕනෑම පාඩුවක් 'එක්දින පාඩුව' ඔස්සේ සළකා බැලූ අතර 2023 ගිණුම්කරණ වර්ෂයේ ආදායම් ප්‍රකාශයේ එම පාඩු ගිණුම්ගත කර ඇත.

**12.1 ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත් කෙරෙහි දේශීය ණය ප්‍රශස්තකරණයේ බලපෑම**

දේශීය ණය ප්‍රශස්තකරණයේ කොටසක් ලෙස රු.බි. 345ක් වූ ශ්‍රී.ලං.ම. බැංකුව විසින් රජයට දෙන ලද නොපියවූ තාවකාලික අත්තිකාරම් හා රු.බි. 2,368ක් වූ රජයෙන් මිලදීගත් භාණ්ඩාගාර බිල්පත්, ක්‍රමයෙන් අඩුවන ස්ථාවර කූපන් පොළියක් ලැබෙන නව භාණ්ඩාගාර බැඳුම්කර හා භාණ්ඩාගාර බිල්පත් බවට ප්‍රතිව්‍යුහගත කර පරිවර්තනය කිරීම 2023 සැප්තැම්බර් මස 21 වැනි දින සිදු විය.

පරිවර්තනය කිරීමේදී, 2024 වර්ෂයේ පෙබරවාරි මස සිට සැප්තැම්බර් මාසය දක්වා වන කාලසීමාවේදී කල්පිරෙන භාණ්ඩාගාර බිල්පත් සහ වසර 6 සිට 15 දක්වා කාලසීමාවකදී කල්පිරීමට නියමිත, 2024 වසර තෙක් 12.4% ක් (2024 ද ඇතුළත්ව), 2026 වසර තෙක් 6%ක් (2026 ද ඇතුළත්ව) හා ඉන්පසුව කල්පිරෙන දිනය තෙක් 5%ක් වශයෙන් ක්‍රමයෙන් අඩුවන ස්ථාවර කූපන් පොළියක් ලැබෙන භාණ්ඩාගාර බැඳුම්කර ලැබී ඇත.

නව භාණ්ඩාගාර බැඳුම්කර හා භාණ්ඩාගාර බිල්පත්වල සාධාරණ අගය සහ ගණුදෙනු අගය අතර වෙනස හේතුවෙන් ඉහත ප්‍රතිව්‍යුහගතකරණයේදී රු.බි. 766.4ක 'එක්දින පාඩුවක්' (Day one loss) නිර්මාණය විය. ජා.මූ.වා.ප්‍ර. 9 හි මූල්‍ය උපකරණ සටහන් කිරීමේ අවශ්‍යතාවය අනුව මෙම 'එක්දින පාඩුව' ආදායම් ප්‍රකාශයෙහි දක්වා ඇත.

නව මූල්‍ය උපකරණවල සාධාරණ අගය විනිශ්චය කිරීම සඳහා ජා.මූ.වා.ප්‍ර. 13 හි සඳහන් සාධාරණ අගය මිනුම්කරණ රීතියට අනුව දෙවන මට්ටමේ යෙදවුමක් යොදා ගන්නා ලදී. 2 වන මට්ටමේ යෙදවුම් යනු පළමුවන මට්ටමේ යෙදුම්වලට අයත් නොවන සෘජුව හෝ වක්‍රාකාරයෙන් නිරීක්ෂණය කළ හැකි, සාධාරණ අගයන් මිනුම් කිරීම සඳහා වැදගත්වන අවම මට්ටමේ යෙදවුම් භාවිතා කරමින් කරනු ලබන ඇගයුම් ක්‍රමවේදයයි. භාණ්ඩාගාර බැඳුම්කරවල, කල්පිරෙන දිනය සලකා නිරීක්ෂණ යෙදවුමක් ලෙස පොළී අනුපාතික ඵලදා වක්‍රය යොදාගෙන ඇත. එහිදී එම යෙදවුම්වලට ගැලපුම් ලෙස ක්‍රමයෙන් අඩුවන ස්ථාවර කූපන් පොළිය අතර හා ස්ථාවර කූපන් පොළිය අතර පොළී අනුපාත පැතිකඩ භාවිත කර ඇත.

එක්දින පාඩුව ගණනය කරන දිනයේදී අනෙකුත් සියළුම විචල්‍යයන් ස්ථාවරව පවතින බවට සැලකූ අවස්ථාවක ප්‍රධාන උපකල්පනවල වඩා සාධාරණ හා විය හැකි වෙනස්වීම පහතින් දක්වා ඇත.

වට්ටම් අනුපාතවල උපකල්පනය කළ වෙනස්කම්වල බලපෑම ආදායම් ප්‍රකාශයේ සංවේදීතාවය වන අතර එය පහත පරිදි දැක්විය හැකිය.

එක්දින පාඩුව වන අවස්ථාවේදී 1% දී සංවේදීතා විශ්ලේෂණය

"-" වට්ටම් අනුපාතිකය වෙනස්වීමේ බලපෑම - රු.බි. 652.8

"+" වට්ටම් අනුපාතිකය වෙනස්වීමේ බලපෑම - රු.බි. 869.7

## 13. ප්‍රතිවිකුණුම් ගිවිසුම් මත මිලදීගත් සුරැකුම්පත්

| | 2023<br>රු. 000 | 2022<br>රු. 000 |
|---|---|---|
| ප්‍රතිවිකුණුම් ගිවිසුම් මත මිලදීගත් සුරැකුම්පත් | **332,862,000** | 691,637,000 |
| ප්‍රතිවිකුණුම් ගිවිසුම් මත මිලදීගත් සුරැකුම්පත් මත ලැබිය යුතු පොළී | **1,089,940** | 6,432,219 |
| | **333,951,940** | 698,069,219 |

## 14. රජයට දෙන ලද කාලීන අත්තිකාරම්

2023 අංක 16 දරණ ශ්‍රී.ලං.ම. බැංකු පනතේ 127 වැනි වගන්තිය ප්‍රකාරව මහ බැංකුව විසින්, මුදල් වර්ෂයේ පළමු මාසය ඇතුළත ඒකාබද්ධ අරමුදලින් දරණු ලැබීමට බලයලත් වියදම් මූල්‍යනය කිරීම සඳහා අලුත් ඍජු තාවකාලික අත්තිකාරම් ආණ්ඩුව වෙත ලබාදිය හැකිය. ඒ සෑම අලුත් අත්තිකාරමක් ම මාස 06කට නොවැඩි කාලසීමාවක් ඇතුළත ආපසු ගෙවනු ලැබිය යුතු අතර, ගෙවීමට පවතින ඒ මුළු අත්තිකාරම් මුදල, අදාළ කාලසීමාව සඳහා 2003 අංක 3 දරණ මූල්‍ය කළමණාකරණ (වගකීම) පනත යටතේ අමාත්‍යවරයාගේ අමාත්‍යාංශය විසින් පළ කරන ලද අර්ධ වාර්ෂික වාර්තාවේ වාර්තා කරන ලද පූර්ව මුදල් වර්ෂයේ පළමු මාස හතරෙහි ආදායමෙන් 10%ක් නොඉක්මවිය යුතුය. ඒ අලුත් අත්තිකාරම් සඳහා, මහ බැංකුව විසින් තීරණය කරනු ලබන, පවතින වෙළෙඳපොළ ආශ්‍රිත අනුපාතික අනුව වූ පොළියක් අයකරනු ලැබිය යුතුය.

## 15. මූල්‍ය සහ අනිකුත් ආයතන වල හිමිකරු ප්‍රාග්ධන ආයෝජන

ශ්‍රී ලංකා මහ බැංකු පනත් 114 (2) (අ) වගන්තිය යටතේ මෙම ආයෝජන සිදු කරනු ලබයි. මෙය යටතේ පාලක මණ්ඩලයේ අභිමතය පරිදි බැංකු සහ මූල්‍ය අංශයේ මානව සම්පත් සහ තාක්ෂණික සංවර්ධනය, දියුණුව සහ ප්‍රවර්ධනය සඳහා හෝ ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වාණිජ බැංකුවල ගනුදෙනු නිශ්කාෂණය කිරීම පහසු කිරීම සඳහා පිහිටුවන ලද සමාගමක කොටස් අත්පත්කර ගැනීමට බැංකුව වෙත බලතල පවරා තිබේ.

### 15.1 ආයෝජන තත්ත්වය

| ආයතනය | ව්‍යාපාර කටයුතුවල ස්වභාවය | 2023 කොටස් ගණන | 2023 සාධාරණ අගය රු.000 | 2023 කොටසක සාධාරණ අගය රු. | 2022 කොටස් ගණන | 2022 සාධාරණ අගය රු.000 | 2022 කොටසක සාධාරණ අගය රු. |
|---|---|---|---|---|---|---|---|
| සීමාසහිත ලංකා පේ (පුද්ගලික) සමාගම | ස්වයංක්‍රීය චෙක්පත් නිශ්කාෂණය | **2,986,824** | **938,965** | **314.37** | 2,986,824 | 769,866 | 257.75 |
| ලංකා ෆයිනෑන්ෂල් සර්විසස් බියුරෝ ලිමිටඩ් | ස්වයංක්‍රීය අරමුදල් හුවමාරුව | **500,000** | **-** | **(0.81)** | 500,000 | - | (4.60) |
| සීමාසහිත ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය | ණය තොරතුරු සම්පාදනය | **48,244** | **1,230,576** | **25,507.33** | 48,244 | 1,047,266 | 21,707.69 |
| | | | **2,169,541** | | | 1,817,132 | |

ශ්‍රී ලංකා මහ බැංකුවේ ස්කන්ධ ආයෝජන 2023 දෙසැම්බර් 31 දිනට පැවති සාධාරණ අගයට වාර්තා කර ඇත.

## 16. බැංකු සඳහා දෙන ලද ණය

| | 2023 රු. 000 | 2022 රු. 000 |
|---|---|---|
| බැංකු සඳහා දෙන ලද ණය (සටහන 16.1) | **47,931,158** | 28,601,832 |
| අඩු කළා: බැංකු සඳහා දෙන ලද ණය මත අපේක්ෂිත ණය අලාභ (සටහන 16.2) | **(135,471)** | (343,930) |
| | **47,795,687** | 28,257,902 |

### 16.1 බැංකු සඳහා දෙන ලද ණය

මුදල් නීති පනතේ 5 වන පරිච්ඡේදයේ III (අ) කොටසට අනුව ඵලදායීතා කටයුතු සඳහා ලබාදෙනු ලබන ණය වේ. 2023 අංක 16 දරණ නව ශ්‍රී ලංකා මහ බැංකු පනත හඳුන්වාදීමත් සමඟ, එම පනතේ 134 වන වගන්තිය යටතේ මෙම ණය පාලනය වීමට යටත් වේ.

| | 2023 රු. 000 | 2022 රු. 000 |
|---|---|---|
| **මධ්‍යම සහ දිගුකාලීන ණය යෝජනා ක්‍රමය** | | |
| - සම්බන්ධිත පාර්ශ්වයන් | **16,039** | 18,173 |
| **උතුරු හා නැගෙනහිර හානි වූ නිවාස ප්‍රතිසංස්කරණය** | | |
| - සම්බන්ධිත පාර්ශ්වයන් | **8,448** | 42,260 |
| **සෞභාග්‍යා කොවිඩ් 19 පුනරුද සහන ණය පහසුකම (සටහන 16.1.1)** | | |
| - සම්බන්ධිත පාර්ශ්වයන් | **34,612** | 1,337,217 |
| - අනෙකුත් | **38,215** | 484,532 |
| **සෞභාග්‍යා කොවිඩ් 19 පුනරුද ප්‍රතිමූල්‍ය ණය පහසුකම (සටහන 16.1.2)** | | |

| | | |
|---|---|---|
| - සම්බන්ධිත පාර්ශ්වයන් | **576,334** | 11,207,691 |
| - අනෙකුත් | **212,185** | 2,570,533 |
| **සෞභාග්‍යා ණය පහසුකම (සටහන 16.1.3)** | | |
| - සම්බන්ධිත පාර්ශ්වයන් | **12,356,860** | 10,469,090 |
| - අනෙකුත් | **1,455,216** | 2,087,594 |
| **ශ්‍රී.ලං.ම.බැංකුවේ ණය ඇපකර පහසුකම යටතේ ලබාදුන් ණය** | | |
| - සම්බන්ධිත පාර්ශ්වයන් | **101,226** | 86,307 |
| - අනෙකුත් | **9,091** | - |
| **දේශීය කෘෂිකර්මාන්තය නගාසිටුවීමේ ණය යෝජනා ක්‍රමය (නියමු ව්‍යාපෘතිය) (සටහන 16.1.4)** | | |
| - සම්බන්ධිත පාර්ශ්වයන් | **508,007** | 227,305 |
| - අනෙකුත් | **114,925** | 71,130 |
| **බැංකු සඳහා ලබාදුන් ද්‍රවශීලතා ආධාරක පහසුකම (සටහන 16.1.5)** | **32,500,000** | - |
| | **47,931,158** | 28,601,832 |

16.1.1 **සෞභාග්‍යා කොවිඩ්-19 පුනරුද සහන ණය පහසුකම:** කොවිඩ්-19 පැතිරයාම හේතුවෙන් බලපෑමට ලක් වූ ආර්ථිකය පුනර්ජීවනය කිරීමට පහසුකම් සැපයීමක් ලෙස 1949 අංක 58 දරණ මුදල් නීති පනතේ 83 කොටස ප්‍රකාරව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බලපත්‍රලාභී වාණිජ බැංකු වෙත කොවිඩ්-19 පැතිර යාමෙන් අහිතකර බලපෑමට ලක් වූ ව්‍යාපාර වෙත ණය ලබාදීම යන කොන්දේසියට යටත්ව ලබා දෙන ලදී.

16.1.2 **සෞභාග්‍යා කොවිඩ්-19 පුනරුද ප්‍රතිමූල්‍ය ණය පහසුකම:** කොවිඩ්-19 පැතිර යාම හේතුවෙන් අහිතකර බලපෑමට ලක් වූ ක්ෂුද්‍ර කුඩා හා මධ්‍යම අංශයේ ව්‍යාපාර පුනර්ජීවනය කිරීම සහ රටේ ආර්ථික ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය කිරීම උදෙසා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මෙම නව ප්‍රතිමූල්‍ය ණය පහසුකම සෞභාග්‍යා ණය යෝජනා ක්‍රමය යටතේ 2020 වසරේදී දියත් කරන ලදී.

16.1.3 **සෞභාග්‍යා ණය පහසුකම:** මුදල් නීති පනතේ 88(අ) වගන්තිය ප්‍රකාරව, ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් කෘෂිකාර්මික, පශු සම්පත්, ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සහ ආපදාවන්ගෙන් හානිවූ ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා ණය පහසුකම් සැපයීම අරමුණු කරගනිමින් සෞභාග්‍යා ණය යෝජනා ක්‍රමය 2010 වසරේදී හඳුන්වා දෙන ලදී.

16.1.4 **දේශීය කෘෂිකර්මාන්තය නගාසිටුවීමේ ණය යෝජනා ක්‍රමය - (නියමු ව්‍යාපෘතිය) (DAD-PP):** මුදල් නීති පනතේ 88(අ) වගන්තිය ප්‍රකාරව, ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් සැමට ප්‍රතිලාභ බෙදී යන කෘෂිකාර්මික සංවර්ධනයන් ප්‍රවර්ධනය කිරීම සඳහා කුඩා පරිමාණ ගොවි ප්‍රජාව වෙත දැරිය හැකි මූල්‍ය පහසුකම් ලබාදීම ඇතුළුව වඩාත් හොඳ වෙළෙඳපොළ අවස්ථා උදාකිරීම හා තාක්ෂණික සහය ලබාදීම සඳහා මෙම ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කරන ලදී.

16.1.5 **බැංකු සඳහා ලබාදුන් ද්‍රවශීලතා ආධාරක පහසුකම:** මුදල් නීති පනතේ 83 (1) වගන්තිය ප්‍රකාරව 2022.12.20 දින පැවති මුදල් මණ්ඩලයේ තීරණයක් අනුව සියළුම බලපත්‍රලාභී වාණිජ බැංකු සහ ජාතික ඉතිරි කිරීමේ බැංකුවට අවස්ථානුකූලව ද්‍රවශීලතා පහසුකම් සැපයීම අනුමත කරන ලදී. මෙම ස්ථාවරය නව ශ්‍රී ලංකා මහ බැංකු පනතේ 36 වන වගන්තිය යටතේ ද දක්වා ඇත.

### 16.2 බැංකුවලට ලබා දුන් ණය මත අපේක්ෂිත ණය අලාභවල චලනය

| | 2023 | | | | 2022 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | අදියර 1 | අදියර 2 | අදියර 3 | එකතුව | අදියර 1 | අදියර 2 | අදියර 3 | එකතුව |
| | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 |
| ජනවාරි 1 දිනට ශේෂය | **6,057** | **251,565** | **86,307** | **343,929** | 14,435 | 21,477 | 13,016 | 48,928 |
| වර්ෂය තුළදී අය කිරීම් / (ආපසු හැරවුම්) | **8,639** | **(241,108)** | **24,011** | **(208,458)** | (8,378) | 230,088 | 73,291 | 295,001 |
| දෙසැම්බර් 31 දිනට ශේෂය | **14,696** | **10,457** | **110,318** | **135,471** | 6,057 | 251,565 | 86,307 | 343,929 |

## 17. අනිකුත් වත්කම්

| | 2023<br>රු. 000 | 2022<br>රු. 000 |
|---|---|---|
| මූල්‍ය වත්කම් | | |
| අභ්‍යන්තර අරමුදල්හි ආයෝජන | **21,441,883** | 18,557,124 |
| අඩුකළා: අභ්‍යන්තර අරමුදලෙහි ආයෝජන මත අපේක්ෂිත ණය අලාභ (සටහන 17.1) | **(236)** | (405) |
| ශුද්ධ අභ්‍යන්තර අරමුදල්හි ආයෝජන | **21,441,647** | 18,556,719 |
| ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් මෙහෙයවන ආයෝජන | **-** | - |
| අඩුකළා: ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවේ ආයෝජන මත අපේක්ෂිත ණය අලාභ (සටහන 17.2) | **-** | - |
| | **-** | - |
| ක්‍රමක්ෂය පිරිවැයට කාර්ය මණ්ඩල ණය | **5,778,336** | 5,355,855 |
| භාණ්ඩාගාර සහ අනෙකුත් අමාත්‍යංශ වලින් ලැබිය යුතු දෑ | **8,698,715** | 3,540,585 |
| අනෙකුත් ලැබිය යුතු දෑ | **5,487,471** | 2,258,723 |
| අඩුකළා: අනෙකුත් ලැබීම් මත අපේක්ෂිත ණය අලාභ (සටහන 17.3) | **(2,226,887)** | (2,226,887) |
| | **17,737,635** | 8,928,276 |
| | **39,179,282** | 27,484,994 |
| මූල්‍ය නොවන වත්කම් | | |
| කාර්ය මණ්ඩල ණය මත වූ විලම්භිත වත්කම් | **3,005,439** | 2,697,566 |
| | **42,184,721** | 30,182,560 |

### 17.1 අභ්‍යන්තර අරමුදල්හි ආයෝජන මත අපේක්ෂිත ණය අලාභවල චලනය

| | 2023 | | | 2022 | | |
|---|---|---|---|---|---|---|
| | අදියර 1<br>රු. 000 | අදියර 2<br>රු. 000 | එකතුව<br>රු. 000 | අදියර 1<br>රු. 000 | අදියර 2<br>රු. 000 | එකතුව<br>රු. 000 |
| ජනවාරි 1 දිනට ශේෂය | **86** | **319** | **405** | 39 | 241 | 280 |
| වර්ෂය තුළ අයකිරීම්/(ආපසු හැරවුම්) | **(23)** | **(146)** | **(170)** | 47 | 78 | 125 |
| දෙසැම්බර් 31 දිනට ශේෂය | **63** | **173** | **235** | 86 | 319 | 405 |

### 17.2 ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවෙන් මෙහෙයවන ආයෝජන මත අපේක්ෂිත ණය අලාභවල චලනයන්

| | 2023<br>අදියර 01<br>රු. 000 | 2022<br>අදියර 01<br>රු. 000 |
|---|---|---|
| ජනවාරි 1 දිනට ශේෂය | - | 150 |
| වර්ෂය තුළදී අය කිරීම් | - | (150) |
| දෙසැම්බර් 31 දිනට ශේෂය | - | - |

### 17.3 අනෙකුත් ලැබීම් මත අපේක්ෂිත ණය අලාභවල චලනය

| | 2023<br>අදියර 03<br>රු. 000 | 2022<br>අදියර 03<br>රු. 000 |
|---|---|---|
| ජනවාරි 1 දිනට ශේෂය | **2,226,887** | 2,226,887 |
| වර්ෂය තුළදී අය කිරීම් | **-** | - |
| ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් පවත්වාගෙන ගිය ශේෂයන් මාරු කිරීම් | **-** | - |
| දෙසැම්බර් 31 දිනට ශේෂය | **2,226,887** | 2,226,887 |

## 18. රන්

ශ්‍රී ලංකා මහ බැංකු පනතේ ජාත්‍යන්තර සංචිත කළමණාකරණය පිළිබඳ දැක්වෙන 40 (2) වගන්තිය ප්‍රකාරව මහ බැංකුවේ ජාත්‍යන්තර සංචිතවලට, රත්‍රන් නියෝජනය කරන බැර ශේෂද ඇතුළු රත්‍රන් ඇතුළත් විය හැකිය.

## 19. තොග

| | 2023<br>රු. 000 | 2022<br>රු. 000 |
|---|---|---|
| සංසරණය සඳහා ඇති නෝට්ටු | **3,433,564** | 2,485,880 |
| සංසරණය සඳහා ඇති කාසි | **1,657,594** | 2,074,163 |
| මාර්ගස්ථ නෝට්ටු | **239,803** | 144,188 |
| පිරිවැය ගැළපීම | **3,344** | - |
| | **5,334,305** | 4,704,231 |
| අඩුකළා :<br>සෙමින් චලනය වන අයිතමයන් සඳහා වෙන්කිරීම් | **(415)** | (2,446) |
| | **5,333,890** | 4,701,785 |
| ලිපි ද්‍රව්‍ය සහ විවිධ තොග | **99,948** | 86,622 |
| මුළු තොගය | **5,433,838** | 4,788,407 |

2023 දී තොගයන්හි වටිනාකමින් රුපියල් මිලියන 2,108.58 (2022 - රු.මිලියන 2,339.65) තොග පිරිවැය (නව මුදල් නිකුතු පිරිවැය) ලෙස ආදායම් ප්‍රකාශයේ සටහන් කර ඇත.

## 20. දේපළ පිරියත සහ උපකරණ

| පිරිවැය/තක්සේරු වටිනාකම | ඉඩම් සහ ගොඩනැගිලි | පිරියත සහ පිරියත උපකරණ | ලී බඩු සහ උපකරණ | මෝටර් වාහන | පරිගණක | වත්කම් භාවිතා කිරීමේ හිමිකම | අනිකුත් | නොනිමි ඉදිකිරීම් | එකතුව 2023 | එකතුව 2022 |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| ජනවාරි 01 දිනට ශේෂය | **18,176,536** | **1,629,425** | **1,611,293** | **611,793** | **1,149,356** | **69,049** | **57,703** | **193,083** | **23,498,238** | 23,218,062 |
| එකතු කිරීම් | **-** | **9,119** | **141,422** | **-** | **351,755** | **9,378** | **33** | **237,369** | **749,076** | 465,348 |
| බැහැර කිරීම් | **-** | **-** | **(3,523)** | **-** | **(39,043)** | **-** | **-** | **-** | **(42,566)** | (7,477) |
| මාරු කිරීම් | **-** | **-** | **-** | **-** | **-** | **-** | **-** | **(327,335)** | **(327,335)** | (177,699) |
| ප්‍රත්‍යාගණනය කළ වත්කම් මත සමුච්චිත ක්ෂය මාරු කිරීම | **(657,379)** | **-** | **-** | **-** | **-** | **-** | **-** | **-** | **(657,379)** | - |
| වසර තුළදී ලැබුනු ප්‍රත්‍යාගණන ලාභ | **4,760,946** | **-** | **-** | **-** | **-** | **-** | **-** | **-** | **4,760,946** | - |
| වත්කම් භාවිතා කිරීමේ අයිතිය නැවත මිනුම් කිරීම | **-** | **-** | **-** | **-** | **-** | **(21,728)** | **-** | **-** | **(21,728)** | - |
| දෙසැම්බර් 31 දිනට අගය | **22,280,103** | **1,638,544** | **1,749,192** | **611,793** | **1,462,068** | **56,699** | **57,736** | **103,117** | **27,959,252** | 23,498,234 |

| සමුච්චිත ක්ෂය | ඉඩම් සහ ගොඩනැගිලි | පිරියත සහ පිරියත උපකරණ | ලී බඩු සහ උපකරණ | මෝටර් වාහන | පරිගණක | වත්කම් භාවිතා කිරීමේ හිමිකම | අනිකුත් | නොනිමි ඉදිකිරීම් | එකතුව 2023 | එකතුව 2022 |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| ජනවාරි 01 දිනට අගය | **438,228** | **1,219,435** | **1,210,502** | **494,359** | **1,045,251** | **15,355** | **39,826** | **-** | **4,462,956** | 3,982,068 |
| වර්ෂය සඳහා ක්ෂය | **219,150** | **30,062** | **99,115** | **30,973** | **86,184** | **7,172** | **191** | **-** | **472,847** | 488,051 |
| බැහැර කිරීම් | **-** | **-** | **(3,487)** | **-** | **(38,942)** | **-** | **-** | **-** | **(42,429)** | (7,163) |
| ප්‍රත්‍යාගණනය කළ වත්කම් මත සමුච්චිත ක්ෂය මාරු කිරීම | **(657,378)** | **-** | **-** | **-** | **-** | **-** | **-** | **-** | **(657,378)** | - |
| දෙසැම්බර් 31 දිනට අගය | **-** | **1,249,497** | **1,306,130** | **525,332** | **1,092,493** | **22,527** | **40,017** | **-** | **4,235,997** | 4,462,956 |
| ශුද්ධ පොත් අගය | **22,280,103** | **389,047** | **443,062** | **86,461** | **369,575** | **34,172** | **17,719** | **103,117** | **23,723,255** | 19,035,278 |

ඉඩම් සහ ගොඩනැගිලිවල ධාරණ වටිනාකම, සාධාරණ වටිනාකම අනුව සටහන් කරනු ලැබේ. ඉතා ආසන්නම ස්වාධීන තක්සේරුව 2023 දෙසැම්බර් 31 දිනට වරලත් තක්සේරුකරු ඒ.ඒ.එම්. ෆාතිහු මහතා විසින් සිදු කරන ලද අතර 2023 දෙසැම්බර් 31 දිනට එය වාර්තා කර තිබුණි.

මෙම මූල්‍ය වර්ෂය තුළදී බැංකුව විසින් මුදල් ගෙවීම මගින් රු. මිලියන 412.36 (2022 - රු.මිලියන 617.28) මුළු වටිනාකමින් යුත් දේපල, පිරියත සහ උපකරණ අත්පත් කරගන්නා ලදී.

2023 දෙසැම්බර් 31 දිනට මුළුමනින්ම ක්ෂය කරන ලද නමුත් භාවිතයේ ඇති වත්කම්වල වටිනාකම රු. මිලියන 3,399.34 ක් වේ (2022 - රු. මිලියන 2,939.00).

**තක්සේරුකරණ ප්‍රවේශය සහ සින්නක්කර ඉඩම්, ගොඩනැගිලි සහ කල්බදු ක්‍රමය යටතේ ලබාගත් ඉඩම්වල ඇති ගොඩනැගිලි තක්සේරු කිරීමේදී යොදාගත් සැලකිය යුතු නිරීක්ෂණය කළ නොහැකි යෙදවුම්**

| දේපළ | වරලත් තක්සේරුකරුවන්ගේ නම් | තක්සේරු ප්‍රවේශය | පර්චස් එකක ඇස්තමේන්තුගත මිල (රු.) | වර්ග අඩියක ඇස්තමේන්තුගත මිල (රු.) | ඇස්තමේන්තුගත මාසික කුලිය (රු.) | පිටතට යන වියදම් | වසර මිලදී ගැනීම් | දෙසැම්බර් 31 දිනට සාධාරණ අගය (රු.000) |
|---|---|---|---|---|---|---|---|---|
| **ඉඩම් හා ගොඩනැගිලි** | | | | | | | | |
| ප්‍රධාන කාර්යාලය - කොළඹ 01 | ඒ.ඒ.එම්. ෆාතිහු | වෙළෙඳපොළ ප්‍රවේශය හා පිරිවැය ප්‍රවේශය | 21,000,000 | 14,000-23,500 | - | - | - | 12,914,256 |
| වයිට්(අ)වේස් ගොඩනැගිල්ල -කොළඹ - 01 | - එම - | වෙළෙඳපොළ ප්‍රවේශය හා ආදායම් ප්‍රවේශය | 18,500,000 | - | 7,596,000 | 40% | 16.66 | 876,986 |
| සෙන්ට්‍රල් පොයින්ට් ගොඩනැගිල්ල කොළඹ - 01 | - එම - | වෙළෙඳපොළ ප්‍රවේශය හා ආදායම් ප්‍රවේශය | 21,000,000 | - | 10,800,000 | 40% | 16.66 | 1,196,644 |
| බැංකු විද්‍යු පියස - රාජගිරිය | - එම - | වෙළෙඳපොල ප්‍රවේශය හා පිරිවැය ප්‍රවේශය | 5,000,000 | 4,000 - 15,000 | - | - | - | 3,507,578 |
| අධිපති නිල නිවස - කොළඹ 07 | - එම - | වෙළෙඳපොළ ප්‍රවේශය හා පිරිවැය ප්‍රවේශය | 12,000,000 | 5,000 - 13,500 | - | - | - | 2,047,831 |
| ප්‍රාදේශීය කාර්යාලය - මාතර | - එම - | වෙළෙඳපොළ ප්‍රවේශය හා පිරිවැය ප්‍රවේශය | 2,250,000 - 4,500,000 | 5,000 - 12,000 | - | - | - | 445,062 |
| ප්‍රාදේශීය කාර්යාලය - මාතලේ | - එම - | වෙළෙඳපොළ ප්‍රවේශය හා පිරිවැය ප්‍රවේශය | 200,000 - 1,000,000 | 4,000 - 12,000 | - | - | - | 308,500 |
| නිවාඩු නිකේතනය - නුවරඑළිය | - එම - | වෙළෙඳපොළ ප්‍රවේශය හා පිරිවැය ප්‍රවේශය | 2,000,000 | 6,000 - 18,000 | - | - | - | 446,400 |
| නිවාඩු නිකේතනය - කතරගම | - එම - | වෙළෙඳපොළ ප්‍රවේශය හා පිරිවැය ප්‍රවේශය | 400,000 | 5,000 - 15,500 | - | - | - | 272,891 |
| **කල්බදු ඉඩම්වල ඇති ගොඩනැගිලි** | | | | | | | | |
| ප්‍රාදේශීය කාර්යාලය - අනුරාධපුරය | - එම - | පිරිවැය ප්‍රවේශය | - | 5,800 - 12,500 | - | - | - | 53,625 |
| නිවාඩු නිකේතනය - අනුරාධපුරය | - එම - | පිරිවැය ප්‍රවේශය | - | 9,050 | - | - | - | 18,953 |
| ප්‍රාදේශීය කාර්යාලය - කිලිනොච්චි | - එම - | පිරිවැය ප්‍රවේශය | - | 2,500 - 10,500 | - | - | - | 135,850 |
| නිවාඩු නිකේතනය - සෝමාවතිය | - එම - | පිරිවැය ප්‍රවේශය | - | 15,900 - 16,000 | - | - | - | 55,529 |

**ඉඩම් සහ ගොඩනැගිලිවල සංයුතිය**

| | ධාරණ අගය 2023 රු. 000 | ධාරණ අගය 2022 රු. 000 |
|---|---|---|
| සින්නක්කර ඉඩම් | **14,197,619** | 10,855,725 |
| සින්නක්කර ඉඩම්වල ගොඩනැගිලි | **7,874,058** | 6,593,850 |
| කල්බදු ඉඩම්වල ගොඩනැගිලි | **208,429** | 288,733 |
| | **22,280,105** | 17,738,308 |

ප්‍රත්‍යාගණනය කළ ඉඩම් සහ ගොඩනැගිලි, මූල්‍ය ප්‍රකාශනයන්හි ක්ෂය අඩුකළ පිරිවැයට දැක්වූයේ නම් ඒවායේ ධාරණ වටිනාකම රු.මි. 6,991.47 ක් වේ (2022 - රු.මි. 7,133.73).

## 21. අස්පෘෂ්‍ය වත්කම්

| | 2023 අස්පෘෂ්‍ය වත්කම් රු. 000 | 2023 නොනිමි අස්පෘෂ්‍ය වත්කම් රු. 000 | 2023 එකතුව රු. 000 | 2022 රු. 000 |
|---|---|---|---|---|
| **පරිගණක මෘදුකාංග : පිරිවැය:** | | | | |
| ජනවාරි 01 දිනට අගය | **1,962,918** | **197,500** | **2,160,418** | 1,564,916 |
| වර්ෂය තුළදී එකතු කිරීම් | **6,557** | **23,434** | **29,991** | 1,209,009 |
| වර්ෂය තුළදී මාරු කිරීම් | **-** | **(6,000)** | **(6,000)** | (613,507) |
| දෙසැම්බර් 31 දිනට අගය | **1,969,475** | **214,934** | **2,184,409** | 2,160,418 |
| **ක්‍රමක්ෂය:** | | | | |
| ජනවාරි 01 දිනට අගය | **1,252,281** | **-** | **1,252,281** | 1,003,284 |
| වර්ෂය සඳහා ක්‍රමක්ෂය ගාස්තුව | **242,245** | **-** | **242,245** | 248,997 |
| දෙසැම්බර් 31 දිනට අගය | **1,494,526** | **-** | **1,494,526** | 1,252,281 |
| **ශුද්ධ පොත් අගය:** | | | | |
| දෙසැම්බර් 31 දිනට අගය | **474,949** | **214,934** | **689,883** | 908,137 |

වර්ෂය තුළ දී බැංකුව විසින් මුදල් ගෙවීම මගින් රු.මි. 23.99 (2022 - රු.මි. 879.38) මුළු වටිනාකමකින් යුතු අස්පෘෂ්‍ය වත්කම් අත්පත් කර ගන්නා ලදී.

2023 දෙසැම්බර් 31 දිනට සම්පූර්ණයෙන් ක්‍රමක්ෂය කරන ලද එහෙත් තවදුරටත් ප්‍රයෝජනයට ගන්නා අස්පෘෂ්‍ය වත්කම්වල ප්‍රමාණය රු. මි. 1,004.92 (2022 රු. මි. 982.69)ක් වේ.

**22. බැංකු සහ මූල්‍ය ආයතන**

| | 2023<br>රු. 000 | 2022<br>රු. 000 |
|---|---|---|
| විදේශීය බැංකුවලට ගෙවිය යුතු මුදල් | **53,459,271** | 146,381,827 |
| අනිකුත් විදේශීය මූල්‍ය ආයතනයන්ට ගෙවිය යුතු මුදල් | **654,521** | 26,201 |
| | **54,113,792** | 146,408,028 |

**23. ආසියානු නිශ්කාෂණ සංගමය**

| | 2023<br>රු. 000 | 2022<br>රු. 000 |
|---|---|---|
| ආසියානු නිශ්කාෂණ සංගමය වෙත ඇති බැඳීම් | - | 731,375,677 |
| උපචිත පොළිය | - | 4,882,452 |
| | - | 736,258,129 |

සහභාගිවන රටවල මහ බැංකු අතර ගෙවීම් බේරුම් කිරීමේ ආයතනයක් වශයෙන් එක්සත් ජාතීන්ගේ ආසියානු සහ පැසිෆික් කලාපයේ ආර්ථික සහ සාමාජික කටයුතු කොමිසමේ මූලිකත්වය යටතේ ආසියානු නිශ්කාෂණ සංගමය 1974 වර්ෂයේ දී පිහිටුවන ලදී. ශ්‍රී ලංකාව, බංගලාදේශය, භූතානය, ඉන්දියාව, ඉරානය, මාලදිවයින, මියන්මාරය, නේපාලය සහ පකිස්ථානය එහි සහභාගි රටවල් වේ. මෙය සහභාගි වන රටවල් අතර ජාත්‍යන්තර ගනුදෙනු බහුපාර්ශ්වීය පදනමක් මත බේරුම් කිරීම සඳහා වූ නිශ්කාෂණ ක්‍රමයකි. එක් එක් සහභාගීවන රටවල ශුද්ධ පියවුම් තත්ත්වය (හිඟ පොළිය ද ඇතුළත්ව) මාස 02ක ණය කාල පරිච්ඡේදය අවසානයේදී පියවනු ලැබේ. දෛනික හිඟ ශේෂය මත ගණනය කරනු ලබන පොළිය සෑම පියවීම් කාලසීමාවක් අවසානයේදීම සහභාගීවන්නන්ගේ ගිණුමට හර/බැර කරනු ලබයි. අදාළ පියවීම් ඊලඟ මාසයේ වැඩ කරන දින 4ක් තුළ සිදුකරනු ඇත. මෙයට අදාළ පොළී අනුපාතිකය 2023 වර්ෂය තුළ 4.32%ත් 5.35% (2022 වර්ෂය තුළදී 0.10% සහ 4.09%) ත් අතර පරාසයක් තුළ පැවතිනි.

දකුණු ආසියානු කලාපීය සහයෝගීතා මූල්‍ය සංවිධානයේ ද්විපාර්ශ්වික මුදල් හුවමාරු රාමුව යටතේ ගෙවිය යුතුව පැවති ඇ.එ.ජ. ඩොලර් බිලියන 0.4ක මුදල සහ ආසියානු නිෂ්කාෂණ සංගමයට ගෙවීම කල්දමන ලද ඇ.එ.ජ. ඩොලර් බිලියන 2.2ක මුදල එකතුකර ශ්‍රී.ලං.ම. බැංකුව සහ ඉන්දියානු මහ බැංකුව අතර 2023 ඔක්තෝබර් මාසයේදී ඇ.එ.ජ. ඩොලර් බිලියන 2.6ක විශේෂ මුදල් හුවමාරු පහසුකමක් සඳහා එකගතාවයක් ඇතිකර ගන්නා ලදී.

2023.12.31 දිනට මෙම හුවමාරු පහසුකමේ තත්ත්වය 25 සහ 25.6 යන සටහන් ඔස්සේ දක්වා ඇත.

**24.ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (ජා.මූ.අ.)**

| | සටහන | 2023<br>රු. 000 | 2022<br>රු. 000 |
|---|---|---|---|
| පොළිය දරන ණය | 24.1 | **292,928,957** | 385,639,212 |
| වි.ගැ.හි. වෙන්කිරීම් | 24.2 | **416,183,699** | 459,264,653 |
| පංගු බැරකම් | 24.3 | **117,593,131** | 129,765,698 |
| ජා.මූ.අ. වෙත ගෙවිය යුතු අනිකුත් මුදල් | 24.4 | **140,619,425** | 153,255,529 |
| | | **967,325,212** | 1,127,925,092 |

**24.1** පොළී දරණ ණය, ජා.මූ. අරමුදලෙන් ලබාගන්නා විස්තිර්ණ ණය පහසුකම් (EFF) වලින් සමන්විත වේ.

විස්තිර්ණ ණය පහසුකම යනු රජයේ ආර්ථික ප්‍රතිසංස්කරණ න්‍යායාය පත්‍රයට සහය දීමට හා ශේෂය පියවීම සඳහා සහය දීමට ජා.මූ.අ. විසින් දෙන ලද තුන් අවුරුදු පහසුකමකි. ජා.මූ.අ. 2016 ජූනි හිදි විස්තිර්ණ ණය පහසුකම් වි.ගැ.හි බිලියන 1.10 ක් (ආසන්න වශයෙන් ඇ.ඩො.බිලියන 1.50 ක්) ලබා දීමට අනුමැතිය දී තිබේ. මෙම මුදල ජා.මූ. අරමුදලේ රටවල්වල

වර්තමාන පංගුවෙන් සියයට 185 කට සමාන වේ. 2016 ජූනි මස විස්තීර්ණ ණය පහසුකම යටතේ පළමුවැනි වාරිකය ලෙස වි.ගැ.හි මිලියන 119.89 ක් (ආසන්න වශයෙන් ඇ.ඩො.මිලියන 168.10) ලබා දෙන ලදී. විස්තීර්ණ ණය පහසුකම යටතේ දෙවන වාරිකය ලෙස වි.ගැ.හි. මිලියන 119.89 (ආසන්න වශයෙන් ඇ.ඩො. මිලියන 162.56), තෙවන වාරිකය ලෙස වි.ගැ.හි. මිලියන 119.89 ක් (ආසන්න වශයෙන් ඇ.ඩො. මිලියන 167.20), හතරවන වාරිකය ලෙස වි.ගැ.හි. මිලියන 177.77 ක් (ආසන්න වශයෙන් ඇ.ඩො. මිලියන 251.40), පස්වන වාරිකය ලෙස වි.ගැ.හි මිලියන 177.77 ක් (ආසන්න වශයෙන් ඇ.ඩො. මිලියන 252.00) හයවන වාරිකය ලෙස වි.ගැ.හි. මිලියන 118.50 ක් (ආසන්න වශයෙන් ඇ.ඩො. මිලියන 164.10) සහ හත්වන වාරිකය ලෙස වි.ගැ.හි. මිලියන 118.50 ක් (ආසන්න වශයෙන් ඇ.ඩො. මිලියන 164.00) පිළිවෙලින් 2016 නොවැම්බර්, 2017 ජූලි, 2017 දෙසැම්බර්, 2018 ජූනි, 2019 මැයි සහ නොවැම්බර් 2019 යන මාස වලදී ලබාදී ඇත. හත්වන වාරිකය නිදහස් කිරීමත් සමඟ විස්තීරණ ණය පහසුකම යටතේ ඇ.ඩො. බිලියන 1.31 ක් ශ්‍රී ලංකාව වෙත ලැබී ඇත. විස්තීරණ ණය පහසුකම සඳහා අදාල වන පොලී අනුපාතය භාර මූලික අනුපාතය වේ. මෙය වි.ගැ.හි. පොලී අනුපාතයට (2023 දෙසැම්බර් 31 දිනට වාර්ෂිකව 4.103%) පදනම් අංක 100 ක එකතුවට සමාන වේ.

ශ්‍රී ලංකාවේ අය වැය හිඟය මූල්‍යනය කිරීම සඳහා 2023 මාර්තු 20 වැනි දින ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විධායක මණ්ඩලය විසින් වි.ගැ.හි. බිලියන 2.3 ක (ඇ.එ.ජ. ඩොලර් බි. 3.0) විස්තීර්ණ ණය පහසුකමක් ලබාදීමට අනුමත කරන ලදී. ශ්‍රී.ලං.ම.බැ. සහ මුදල් අමාත්‍යාංශය අතර අත්සන් කරන ලද අවබෝධතා ගිවිසුම ප්‍රකාරව අය වැය හිඟය මූල්‍යනය කිරීමේ කටයුතු සම්බන්ධයෙන් ජා.මූ.අ. වෙත සිදුකරන බැඳීම් පියවීම් ශ්‍රී.ලං.ම. බැංකුවට මූල්‍ය බරක් සිදු නොවන අයුරින් සිදුකළ යුතු අතර එමනිසා එම කටයුතු මහ බැංකුවේ ශේෂ පත්‍රයේ වාර්තා නොවේ. මෙම විස්තීර්ණ ණය පහසුකම ලබාගැනීම සම්බන්ධව උද්ගත වූ සියළුම වියදම් දැරීම ශ්‍රී ලංකා රජයේ වගකීමක් වන අතර රජය වෙනුවෙන් මුදල් අමාත්‍යාංශය විසින් එම වියදම් දරණු ලබයි.

මෙම විස්තීර්ණ ණය පහසුකම යටතේ ජා.මූ.අ. වෙතින් ණය වාරික දෙකක් ලැබී ඇත. ඉන් පළමුවැන්න ලෙස 2023 මාර්තු 22 දින වි.ගැ.හි. මිලියන 254ක් ලැබුණු අතර එහිදී එයට සමාන ඇ.එ.ජ. ඩොලර් 331,626,865.25ක මුදලක් භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ DST විශේෂ ඩොලර් ගිණුම වෙත මාරුකරන ලදී. දෙවැනි වාරිකය ලෙස 2023 දෙසැම්බර් මස 14 වැනි දින තවත් වි.ගැ.හි. මිලියන 254ක් ලැබුණු අතර එහිදී එයට සමාන ඇ.එ.ජ. ඩොලර් 337,800,661.18ක මුදලක් DST විශේෂ ඩොලර් ගිණුම වෙත මාරුකරන ලදී.

ජා.මූ.අ. විසින් ඉහත එක් එක් ණය වාරිකය ලැබෙන අවස්ථාවේදී මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් ජා.මූ.අ. වෙනුවෙන් පොරොන්දු නෝට්ටු (Promissory Notes) නිකුත් කරනු ලබන අතර එලෙස 2023 මාර්තු හා 2023 දෙසැම්බර් මාස වලදී ලැබුණු පළමු වාරික දෙක වෙනුවෙන් නිකුත් කළ පොරොන්දු නෝට්ටු ඉහත සඳහන් කළ අවබෝධතා ගිවිසුම ප්‍රකාරව ශ්‍රී.ලං.ම.බැ. භාරයේ ආරක්ෂිතව තබා ඇත.

| | 2023.12.31 ට වි.ගැ.හි. සඵල පොලී අනුපාතිකය % | පරිණත වර්ෂය | 2023 රු. 000 | 2022 රු. 000 |
|---|---|---|---|---|
| විස්තීර්ණ ණය පහසුකම (EFF) | **5.103** | **2029** | **292,928,957** | 385,639,212 |
| පොලී දරණ මුළු ණය මුදල | | | **292,928,957** | 385,639,212 |

**24.2** **විශේෂ ගැණුම් හිමිකම (වි.ගැ.හි.)** යනු පවත්නා සංචිත වත්කම්වලට පරිපූරණයන් වශයෙන් දිගුකාලීන ගෝලීය අවශ්‍යතාවයන් සපුරාලීම සඳහා ජා.මූ.අ. විසින් පිහිටුවන ලද සංචිත වත්කමකි. සාමාජික රටවලට ඒවායේ ජා.මූ.අ. පංගු ප්‍රකාර වි.ගැ.හි. වෙන්කිරීම් සිදු කරයි. ජා.මූ.අරමුදලෙහි වි.ගැ.හි. දෙපාර්තමේන්තුවට (ජා.මූ.අ. තුළ පිහිටි ගිණුම් ඒකකයකි), සහභාගී වන රටවලට පමණක් වි.ගැ.හි. වෙන් කළ හැකිය. ජා.මූ.අ. සතු රන්, විදේශ විනිමය සහ සංචිත තත්වයන් ආදී වූ නිල සංචිත වත්කම්වලට පරිපූරක වශයෙන් ජා.මූ.අ. විසින් වි.ගැ.හි. බිහි කරන ලදී. බැංකුව විසින් ශ්‍රී ලංකා රජය වෙනුවෙන් අත්සන් කරන ලද ගිවිසුමේ සඳහන් ඇතැම් කොන්දේසි ප්‍රකාර, ජා.මූ.අ. විසින් සාමාජිකයන්ට ඔවුන්ගේ ජා.මූ.අ. පංගු ප්‍රමාණය අනුව වි.ගැ.හි. වෙන් කළ හැකි වන්නේය. ජා.මූ.අ. විසින් වි.ගැ.හි. වෙන්කිරීම මගින් එක් එක් සාමාජිකයාට පිරිවැය රහිත වත්කමක් උද්ගත වන අතර ඒ සඳහා පොළී ඉපැයීමක් හෝ ගෙවීමක් සිදු නොවේ. වි.ගැ.හි. අවලංගු කිරීමට ද ගිවිසුමේ කොන්දේසිවලින් විධිවිධාන සලසා තිබෙන නමුත් මෙතෙක් එම විධිවිධාන ක්‍රියාත්මක කර නොමැත. වි.ගැ.හි. වෙන් කිරීම් වැඩි වීමෙන් 11 වැනි සටහනේ විස්තර කර ඇති පරිදි වි.ගැ.හි. දැරීම වැඩි වේ. ජා.මූ.අරමුදලෙහි වි.ගැ.හි. දෙපාර්තමේන්තුව අවසන් කරන හෝ ඇවර කරන අවස්ථාවක දී සාමාජිකයන් විසින් ශුද්ධ සමුච්චිත වෙන්කිරීම්වලට සමාන මුදලක් සහ වි.ගැ.හි. දෙපාර්තමේන්තුවේ කටයුතුවලට සහභාගී වීම හේතුවෙන් ගෙවිය යුතු අනෙකුත් යම් මුදලක් වෙතොත් එය ද ජා.මූ.අ. වෙත ගෙවීමට බැඳී සිටී.

**24.3** **පංගු බැරකම**: අංක 11.1 දරණ සටහනේ විස්තර කර ඇති ජා.මූ.අ. පංගුව සඳහා ගෙවිය යුතු මුදල පංගු බැරකම ශීර්ෂය යටතේ දක්වා ඇත.

**24.4 ජා.මූ.අ. වෙත ගෙවිය යුතු අනිකුත් මුදල්:** මෙහෙයුම් සහ පරිපාලන ගනුදෙනු වෙනුවෙන් බැංකුව ජා.මූ.අ. වෙත ගෙවිය යුතු ප්‍රමාණය මෙයින් දැක්වේ.

## 25. අනෙකුත්

| | 2023<br>රු. 000 | 2022<br>රු. 000 |
|---|---|---|
| DST එස්ක්‍රෝ ගිවිසුම (Escrow Agreement) යටතේ ක්‍රියාත්මක වන ප්‍රමුඛතා මාර්ග ව්‍යාපෘතිය III (සටහන 25.1) | - | 179 |
| DST - එස්ක්‍රෝ ගිවිසුම (Escrow Agreement) යටතේ ක්‍රියාත්මක වන ප්‍රමුඛතා මාර්ග ව්‍යාපෘතිය III අදියර II (සටහන 25.2) | - | 30,071 |
| DST විශේෂ ඩොලර් ගිණුම 2 (සටහන 25.3) | **248,714,938** | 991,218 |
| මුදල් හුවමාරු පහසුකම යටතේ බංගලාදේශ මහබැංකුවට (Bangladesh Bank) වෙත ගෙවීමට ඇති මුදල (සටහන 25.4) | - | 73,060,873 |
| මුදල් හුවමාරු පහසුකම යටතේ පීපල්ස් බැන්ක් ඔෆ් චයිනා වෙත ගෙවීමට ඇති මුදල (සටහන 25.5) | **459,955,000** | 520,231,000 |
| විශේෂ මුදල් හුවමාරු පහසුකම යටතේ ඉන්දියානු මහ බැංකුවට (RBI) වෙත ගෙවීමට ඇති මුදල (සටහන 25.6) | **800,490,754** | - |
| අනෙකුත් විදේශීය බැරකම් | **95,080** | 70,110 |
| | **1,509,255,772** | 594,383,451 |

### 25.1 එස්ක්‍රෝ ගිවිසුම යටතේ ක්‍රියාත්මක වන ප්‍රමුඛතා මාර්ග ව්‍යාපෘතිය III

ඇ.එ.ජ. ඩොලර් මිලියන 300 ක් සඳහා වූ මෙම පහසුකම් ගිවිසුම චීන සංවර්ධන බැංකුව සහ ශ්‍රී ලංකා රජය අතර 2014 මාර්තු 11 වන දින අත්සන් කර ඇත. ප්‍රමුඛතා මාර්ග III වන ව්‍යාපෘතියේ I වන අදියර තවදුරටත් දියුණු කිරීම සහ යළි නගා සිටුවීම සඳහා වන වියදම් මූල්‍යනය කිරීම මෙම ණය මුදලේ අරමුණ වේ. ණය පහසුකම් ගිවිසුමට අනුව රජයේ බැංකුව ලෙස ශ්‍රී ලංකා මහ බැංකුව පත් කරගන්නා ලදී. ඒ අනුව, හුදෙක් ණය මුදල් තැන්පත් කිරීම සහ එවැනි ලැබුනු මුදල් මාර්ග ව්‍යාපෘති වෙත බෙදා හැරීම සඳහා පමණක් පොදු ලෙජරයේ ගිණුමක් විවෘත කෙරිණි. 2019 වර්ෂය තුළදී ඇ.එ.ජ. ඩොලර් මිලියන 19.13 ක් බෙදාහරින ලදී. 2020 වර්ෂය තුළදී සිදුකල බෙදාහැරීම් වලින් අනතුරුව 2020 දෙසැම්බර් 31 දිනට මෙහි ශේෂය ඇ.එ.ජ. ඩොලර් මිලියන 0.0004කි. 2021 සහ 2022 වර්ෂ තුළදී කිසිදු ගණුදෙනුවක් සිදුනොවූ බැවින් 2022 දෙසැම්බර් 31 දිනටද මෙහි ශේෂය ඇ.එ.ජ. ඩොලර් මිලියන 0.0004 කි. 2023 මාර්තු මාසයේදී ශේෂය ලෙස පැවති ඇ.එ.ජ. ඩොලර් මිලියන 0.0004ක මුදල, චීන සංවර්ධන බැංකුව වෙත ආපසු ගෙවන ලද බැවින් 2023 දෙසැම්බර් 31 දිනට ශේෂයක් නොමැත.

### 25.2 එස්ක්‍රෝ ගිවිසුම යටතේ ක්‍රියාත්මක වන ප්‍රමුඛතා මාර්ග ව්‍යාපෘතිය III අදියර II

එස්ක්‍රෝ ගිවිසුම යටතේ ක්‍රියාත්මක වන II වන අදියර සඳහා වන ඇ.එ.ජ. ඩොලර් මිලියන 100 ක් 2014 නොවැම්බර් 24 වන දින හිමි විය. 2019 වසරේදී ඇ.එ.ජ. ඩොලර් මිලියන 20.24 ක් බෙදාහරින ලදී. 2020 වර්ෂය තුළදී ඇ.එ.ජ. ඩොලර් මිලියන 13.83ක් බෙදාහරින ලද අතර 2021 සහ 2022 වර්ෂ තුළදී කිසිදු බෙදාහැරීමක් සිදු නොකළ බැවින් 2022 දෙසැම්බර් 31 දිනට ඉතිරි වූ ශේෂය ඇ.එ.ජ. ඩොලර් මිලියන 0.082 කි. 2023 මාර්තු මාසයේදී, ශේෂය ලෙස පැවති ඇ.එ.ජ. ඩොලර් මිලියන 0.082ක මුදල, චීන සංවර්ධන බැංකුව වෙත ආපසු ගෙවන ලද බැවින්, 2023 දෙසැම්බර් 31 දිනට ශේෂයක් නොමැත.

### 25.3 DST විශේෂ ඩොලර් ගිණුම 2

මෙම ඩොලර් ගිණුම, භාණ්ඩාගාරය වෙනුවෙන් ඇ.එ.ජ. ඩොලර් වලින් දැක්වෙන ලැබීම් සටහන් කිරීම සඳහා භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව වෙනුවෙන් පවත්වාගෙන යනු ලබයි.

2023 වර්ෂය තුළදී, අයවැය මූල්‍යනය සඳහා ජාත්‍යන්තර මූල්‍ය අරමුදල්වලින් ලබාදුන් ඇ.එ.ජ. ඩොලර් මි. 331.63ක පළමු වාරිකය හා ඇ.එ.ජ. ඩොලර් මි. 337.80 ක දෙවන වාරිකය මෙම ගිණුමට බැරකරන ලදී. ඊට අමතරව, 2023 වර්ෂය තුළදී, දේශීය හා විදේශීය ආයතනවලින් භාණ්ඩාගාරයට ලැබුණු විවිධ ඇ.එ.ජ. ඩොලර් ලැබීම් හා එම අරමුදල් මත කළ ආයෝජන සඳහා ලැබුණු පොලී ආදායම් මෙම ගිණුමට බැර කරන ලද අතර ඒවා භාවිතයෙන් සිදුකළ ණය පියවීම් සහ රජය වෙනුවෙන් සිදුකළ වෙනත් ගෙවීම් සටහන් කර ඇත. 2023 දෙසැම්බර් 31 දිනට ශේෂය ඇ.එ.ජ. ඩොලර් මි. 767.82ක් ලෙස දැක්වේ.

### 25.4 බංගලාදේශ මහ බැංකුව (Bangladesh Bank) සහ ශ්‍රී.ලං.ම.බැ. අත්සන් කරන ලද මුදල් හුවමාරු පහසුකම යටතේ බංගලාදේශ මහ බැංකුවට ගෙවීමට ඇති මුදල

ශ්‍රී.ලං.ම. බැංකු සහ බංගලාදේශ මහ බැංකුව ද්විපාර්ශ්වික මුදල් හුවමාරු පහසුකමට එළඹුණු අතර 2021 අගෝස්තු මාසයේදී, 2022 මැයි මාසයේදී සහ 2023 පෙබරවාරි මාසයේදී මෙම ගිවිසුමට අතිරේක ගිවිසුම් එකතු විය. මෙම ගිවිසුම් පරිදි එකඟ වූ ඇ.එ.ජ. ඩොලර් මිලියන 200ක මුදල, ඒ හා සමාන ශ්‍රී ලංකා රුපියල්වලින් අදියර 03ක් යටතේ 2021 අගෝස්තු සහ සැප්තැම්බර් මාසවලදී ලැබුණු අතර එය එක සමාන මාස 03 කාලසීමාවන් සඳහා අවස්ථා හතකදී නැවත ලබාගන්නා ලදී (rolled over).

ඒ අනුව, මෙම හුවමාරු පහසුකම 2023 අගෝස්තු සහ සැප්තැම්බර් මාසවලදී කල්පිරුණු අතර, එය ගෙවාදැමීම සඳහා අවශ්‍ය කටයුතු ශ්‍රී.ලං.ම. බැංකුව විසින් සම්පාදනය කරන ලදී.

**25.5 පීපල්ස් බෑන්ක් ඔෆ් චයිනා (People's Bank of China) සහ ශ්‍රී.ලං.ම.බැ. අත්සන් කරන ලද මුදල් හුවමාරු පහසුකම යටතේ පීපල්ස් බෑන්ක් ඔෆ් චයිනා වෙත ගෙවීමට ඇති මුදල**

ශ්‍රී.ලං.ම.බැ. සහ පීපල්ස් බෑන්ක් ඔෆ් චයිනා 2021 මාර්තු 19 වැනි දින මුදල් හුවමාරු ගිවිසුමකට එළඹෙන ලදී. මෙම ගිවිසුම ප්‍රකාරව, 2021 දෙසැම්බර් මාසයේදී සීමා සහිත භාවිතයක් සඳහා (සටහන 8.1) චීන යුආන් බිලියන 10ක මුදලක් (ඇ.එ.ජ. ඩොලර් බිලියන 1.4කට සමාන මුදලක්) ඒ හා සමාන ශ්‍රී ලංකා රුපියල් අගයකට, වසරක කාලයක් සඳහා හුවමාරු කරගන්නා ලදී. 2023 දෙසැම්බර් 31 දිනට ඉතිරි ශේෂය ලෙස 2023 දෙසැම්බර් මාසයේදී වසරක කාලයක් සඳහා දෙවැනි වරටත් ලබාගත් චීන යුආන් බිලියන 10 ක මුදල දැක්වෙන අතර, මෙම ගිවිසුම 2024 දෙසැම්බර් මාසයේදී කල් ඉකුත්වීමට නියමිතය.

**25.6 ඉන්දියානු මහ බැංකුව (Reserve Bank of India) සහ ශ්‍රී.ලං.ම. බැංකුව අත්සන් කරන ලද විශේෂ මුදල් හුවමාරු පහසුකම යටතේ ඉන්දියානු මහ බැංකුවට ගෙවීමට ඇති මුදල**

ඉහත 23 වන සටහනේ දක්වූ පරිදි 2023 ඔක්තෝබර් මාසයේදී ශ්‍රී.ලං.ම. බැංකුව සහ ඉන්දියානු මහ බැංකුව ඇ.එ.ජ. ඩොලර් බිලියන 2.6ක විශේෂ මුදල් හුවමාරු පහසුකමක් සඳහා එකඟතාවයක් ඇතිකරගන්නා ලදී.

ඒ යටතේ ශ්‍රී.ලං.ම. බැංකුව විසින් 2023 අගභාගයේ සිට අදාළ පොළිය ද සමඟ වන මාසික වාරිකය නැවත ගෙවීම ආරම්භ කරන ලද අතර සම්පූර්ණ ණය මුදල වසර 03කදී පියවීමට අපේක්ෂා කරනු ලබයි.

**26. බැංකු සහ මූල්‍ය ආයතනයන් විසින් තැන්පතු**

ශ්‍රී ලංකා මහ බැංකු පනත් 32 වන වගන්තිය ප්‍රකාරව ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතා සපුරාලීම පිණිස බලපත්‍රලාභී වාණිජ බැංකු පවත්වාගෙන යන තැන්පතු සහ ශ්‍රී ලංකා මහ බැංකු පනතේ විධිවිධාන යටතේ තත්කාලීන දළ පියවුම් ක්‍රමය යටතේ (RTGS) සහභාගීවන්නන් වන බලපත්‍රලාභී වාණිජ බැංකු රජයේ සුරැකුම්පත්වල ප්‍රාථමික වෙළෙඳුන් සහ සේවක අර්ථසාධක අරමුදල් යන ආයතනවල තැන්පතු මේ යටතේ වේ. මෙම ක්‍රමය යටතේ, පියවුම් පද්ධතියේ සුමට ක්‍රියාකාරීත්වය සඳහා සහභාගී පාර්ශ්වයන්ට අදාල ගෙවීම් අවශ්‍යතාවයන් දිනක් තුළදී සපුරාලීමට රජය විසින් සම්පූර්ණයෙන්ම සුරැකුම් සහිත, පොලී රහිත එක් දින ද්‍රවශීලතා පහසුකම ලබා ගැනීමේ හැකියාව ඇත. ගිණුම්කරණ හෙළිදරව් කිරීමේ අවශ්‍යතාවයන් මත මෙම තැන්පතු, සම්බන්ධිත පාර්ශ්ව සහ අනෙකුත් ලෙස වර්ග කළද, එය බැංකුව හා සඳහන් කළ ආයතන අතර වූ විශේෂ ව්‍යාපාර සම්බන්ධතා නිසා හටගන්නක් නොවේ.

| | 2023<br>රු. 000 | 2022<br>රු. 000 |
|---|---|---|
| බැංකුව විසින් තැන්පත් කිරීම්: | | |
| - සම්බන්ධිත පාර්ශ්වයන් | **93,734,580** | 240,719,873 |
| - අනිකුත් | **36,014,842** | 70,817,929 |
| | **129,749,422** | 311,537,802 |
| මූල්‍ය ආයතන විසින් තැන්පත් කිරීම්: | | |
| - සම්බන්ධිත පාර්ශ්වයන් | **233** | 216 |
| - අනිකුත් | **12,722,927** | 11,508,163 |
| | **12,723,160** | 11,508,379 |
| බැංකු සහ අනිකුත් මූල්‍ය ආයතන විසින් කරන ලද මුළු තැන්පතු | **142,472,582** | 323,046,181 |

**27. රජය සහ රජයේ ආයතන විසින් තැන්පතු**

| | 2023<br>රු. 000 | 2022<br>රු. 000 |
|---|---|---|
| රජයේ තැන්පතු | **1,694,698** | 160,513 |
| රජයේ නියෝජිතයන් සහ අරමුදල් | **378,592** | 60,898 |
| | **2,073,290** | 221,411 |

රජයේ සහ/හෝ රජයේ නියෝජිතයන්ගේ හෝ ආයතනවල නිල තැන්පතුධාරී වශයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ශ්‍රී ලංකා මහ බැංකු පනතේ 81 හා 82 යන වගන්තිවලට යටත්ව මෙම තැන්පතු පවත්වාගෙන යනු ලබයි.

**28. ප්‍රති මිලදී ගැනීමේ එකඟතාවය මත අලෙවි කළ සුරැකුම්පත් සහ නිත්‍ය තැන්පතු පහසුකම**

| | 2023<br>රු. 000 | 2022<br>රු. 000 |
|---|---|---|
| නිත්‍ය තැන්පතු පහසුකම | **227,035,873** | 330,637,059 |
| | **227,035,873** | 330,637,059 |

මූල්‍ය ප්‍රතිපත්තිය හැසිරවීමේ අංගයක් ලෙස ශ්‍රී ලංකා මහ බැංකු පනතේ 31 වන වගන්තිය යටතේ මුදල් වෙළෙඳපොළ ද්‍රවශීලතාවය කළමණාකරණය කිරීමට විවෘත වෙළෙඳපොළ මෙහෙයුම් ක්‍රියාත්මක කිරීම සඳහා බැංකුව විසින් ප්‍රති මිලදී ගැනීමේ එකඟතාවන් නිර්මාණය කරනු ලබයි. මෙම ප්‍රතිමිලදී ගැනීමේ එකඟතාවයන් බැංකුව විසින් කලින් කලට තීරණය කරනු ලබන වෙළෙඳපළ ද්‍රවශීලතා උපක්‍රම මත රඳා පවතිමින් එක් දිනක් සඳහා වන පදනම මත හෝ කාලීන පදනම මත රජයේ සුරැකුම්පත් පමණක් යොදා ගනිමින් ක්‍රියාත්මක කරනු ලැබේ. 2023 දෙසැම්බර් 31 දිනට ප්‍රතිමිලදී ගැනීම් යටතේ වන ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත් ශේෂයක් නොමැත. (2022-ශේෂයක් නොමැත)

මුදල් වෙළෙඳපොළ ද්‍රවශීලතා කළමණාකරණයට විවෘත වෙළෙඳපොළ මෙහෙයුම් ක්‍රියාත්මක කිරීම සඳහා ද නිත්‍ය තැන්පතු පහසුකම යොදාගනී. මෙම පහසුකම, සහභාගීවන ආයතනවල පවතින අතිරික්ත ද්‍රවශීලතාවය එක්දින පදනම යටතේ තැන්පතු කිරීම සඳහා අදාළ වේ. මෙය එක්දින පදනම යටතේ පමණක් සිදුවන සුරැකුම් රහිතව පවතින පහසුකමක් වේ.

## 29. සංසරණයේ ඇති මුදල්

ශ්‍රී ලංකාවේ මුදල් නිකුත් කිරීමේ එකම බලධාරියා වශයෙන් බැංකුව විසින් අඛණ්ඩව නීතියෙන් වලංගු මුදල් නිකුත් කිරීම සිදු කරනු ලැබේ. වාර්තාකරණ දිනට නිකුත්කර සංසරණයේ තිබූ මුදල් ප්‍රමාණයන් පහත සඳහන් පරිදි විය.

| මුහුණත වටිනාකම | 2023<br>රු. 000 | 2022<br>රු. 000 |
|---|---|---|
| **කාසි** | | |
| සත 1 | **3,631** | 3,631 |
| සත 2 | **5,709** | 5,709 |
| සත 5 | **23,267** | 23,267 |
| සත 10 | **39,236** | 39,236 |
| සත 25 | **122,475** | 122,475 |
| සත 50 | **185,093** | 185,097 |
| රුපියල් 1 | **1,073,741** | 1,054,291 |
| රුපියල් 2 | **1,657,217** | 1,633,948 |
| රුපියල් 5 | **5,477,594** | 5,373,467 |
| රුපියල් 10 | **8,709,257** | 8,278,530 |
| රුපියල් 20 | **149,841** | 149,777 |
| සමරු කාසි | **609,633** | 604,099 |
| | **18,056,694** | 17,473,527 |
| **නෝට්ටු** | | |
| රුපියල් 1 | **4,981** | 4,981 |
| රුපියල් 2 | **26,694** | 26,694 |
| රුපියල් 5 | **37,190** | 37,191 |
| රුපියල් 10 | **1,245,351** | 1,247,314 |
| රුපියල් 20 | **7,818,764** | 7,714,028 |
| රුපියල් 50 | **7,491,942** | 7,672,840 |
| රුපියල් 100 | **28,520,217** | 27,890,398 |
| රුපියල් 200 | **126,164** | 126,206 |
| රුපියල් 500 | **57,752,961** | 52,838,832 |
| රුපියල් 1,000 | **160,871,342** | 154,427,683 |
සාමාන්‍ය ව්‍යාපාර කටයුතුවලදී, මූලිකව දේශීය හා විදේශීය යන දෙවර්ගයෙන්ම පවත්නා ණය සුරැකුම්පත් සම්බන්ධයෙන් බැංකුව විසින් ගණුදෙනු වලට එළඹීමේ ප්‍රතිඵලයක් ලෙස මූල්‍ය වත්කම් මාරුවීමක් සිදු විය හැක. සටහන් 5.3.3. හි දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති අනුව, එසේ මාරුකරන ලද මූල්‍ය වත්කම් පෙර හඳුනාගත් ලෙසම පවත්වාගැනීම හෝ බැංකුවේ අඛණ්ඩ මැදිහත්වීමේ ප්‍රමාණයට පවත්වාගැනීම හෝ සම්පූර්ණයෙන් හඳුනා නොගෙන සිටීමට සිදුවිය හැක.

සම්පූර්ණයෙන් ඉවත් නොකරන ලද හෝ පහත ගණුදෙනු තුළින් මූලිකව බැංකුවේ අඛණ්ඩ මැදිහත්වීමක් පවතී නම් මූල්‍ය වත්කම් මාරුකිරීමක් සිදු කරයි.

- ප්‍රති මිලදී ගැනුම් ගිවිසුම් යටතේ විකුණූ සුරැකුම්පත්
- සුරැකුම්පත් ණයට දීම
- සුරැකුම්පත් ඔඩපන කිරීම

**55.1 සම්පූර්ණයෙන් ඉවත් නොකල නමුත් මාරුකල මූල්‍ය වත්කම්**

**(අ) ප්‍රතිමිලදී ගැනීමේ ගිවිසුම් යටතේ විකුණූ සුරැකුම්පත්**

බැංකුවේ මුදල් ප්‍රතිපත්ති මෙහෙයුම් වල කොටසක් ලෙස ප්‍රතිමිලදී ගැනීමේ ගිවිසුම් යටතේ විකුණූ සුරැකුම්පත් ගණුදෙනුවල නිරතවන අතර හිමිකාරීත්වයේ අවදානම් හා ප්‍රතිලාභ සම්පූර්ණයෙන්ම පාහේ බැංකුව සතුව පැවතීම හේතුවෙන්, මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ "ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත්" යටතේ එම ප්‍රමාණය සම්පූර්ණයෙන් හඳුනාගෙන තවදුරටත් පවත්වාගෙන යනු ලැබේ. ඒ අනුව ඒ මත ගෙවිය යුතු මුදල් ප්‍රතිෂ්ඨාව සහ උපචිත පොළිය, මූල්‍ය තත්ව ප්‍රකාශයේ දේශීය මූල්‍ය වගකීම්හි ප්‍රතිමිලදී ගැනීමේ ගිවිසුම් යටතේ විකුණූ සුරැකුම්පත් ලෙස හඳුනාගෙන ඇත.

**(ආ) සුරැකුම්පත් ණයට දීම**

සුරැකුම්පත් ණය, ස්ථාපිත වෙළෙඳපොළ පුරුදු විස්තර කරන අතර එමගින්, ගාස්තුවකට යටත්ව, සුරැකුම්පත් එක් පාර්ශවයකගෙන් (ණය දීමනාකරු - ශ්‍රී ලංකා මහ බැංකුව), තවත් පාර්ශ්වයකට (ණය ගන්නා) තාවකාලිකව හුවමාරු වීම සිදුවේ. ණයගන්නා ඉල්ලූ විටදී හෝ යම් එකඟ වූ කාලසීමාව අවසානයේදී ඒවා නැවත ලබා දීමට බැඳේ. මේ වන විට අධිජාතික බැඳුම්කර සහ විවිධ නිකුත්කරන්නන් විසින් නිකුත් කරන ලද බැඳුම්කර සඳහා භාරකරු ලෙස තෝරාගත් නිශ්කාශණ ආයතනයක් කටයුතු කරයි.

නිශ්කාශණ ආයතනයේ කැමැත්ත පරිදි එම බැඳුම්කර සඳහා වන ඉල්ලුම මත පදනම්ව ණය දීමට බලය පැවරෙන පරිදි ගිවිසුමක් අත්සන් කර ඇත. ශ්‍රී ලංකා මහ බැංකුව මෙම ණය දීමට සම්බන්ධ නොවන බැවින් හා නිශ්කාශන ආයතන, ණයකරුවන්ට සෘජුවම ණයදෙන බැවින්, මෙම ක්‍රියාවලිය "ස්වයං බැඳුම්කර ණය දීම" ලෙස හඳුන්වයි. ස්වයං බැඳුම්කර ණය දීමේ වැඩසටහන යටතේ බැඳුම්කර සඳහා යම් ණයදීමක් සිදුකර ඇත්නම්, එක් එක් මාසය අවසානයේ භාරකරු විසින් ස්වයං බැඳුම්කර ණයදීම සඳහා ගාස්තු ශ්‍රී ලංකා මහ බැංකුවට එවනු ලබයි. හිමිකාරීත්වයේ අවදානම් සහ ප්‍රතිලාභ සම්පූර්ණයෙන්ම පාහේ බැංකුව සතු වීම හේතුවෙන් බැංකුව විසින් එම සුරැකුම්පත් සම්පූර්ණයෙන්ම මූල්‍ය තත්ව ප්‍රකාශයේ හඳුනාගැනීම තවදුරටත් සිදු කරයි. මෙම සුරැකුම්පත් මූල්‍ය තත්ව ප්‍රකාශයේ "අනෙකුත් විස්තීරණ ආදායම මගින් සාධාරණ අගයට වූ සුරැකුම්පත්" ලෙස ඉදිරිපත් කරයි.

**(ඇ) සුරැකුම්පත් ඔඩපන කිරීම්**

2017 ජනවාරි මාසය දක්වා සුරැකුම්පත් බේරුම් ක්‍රියාවලියට පහසුකම් සැපයීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ඕස්ට්‍රේලියානු ඩොලර් මිලියන 35.0 ක සුරැකුම්පත් යූරෝ ක්ලියර් බැංකුවට ඔඩපන කොට ඇ.එ.ජ ඩොලර් මිලියන 30.0 ක ණය පහසුකම් ලබාගන්නා ලදී. වර්තමානයේදී යූරෝ ක්ලියර් බැංකුවට ඔඩපන කරන ලද සුරැකුම්පත්වල වටිනාකම ඇ.එ.ජ. ඩොලර් මිලියන 3.0 කි. ඔඩපන කරන ලද සුරැකුම්පත් යූරෝ ක්ලියර්හි වෙනම ගිණුමක රඳවා ඇත.

| | 2023 | 2022 |
|---|---|---|
| | අනෙකුත් විස්තීරණ ආදායම් මත සාධාරණ අගයට වූ මූල්‍ය වත්කම් | අනෙකුත් විස්තීරණ ආදායම් මත සාධාරණ අගයට වූ මූල්‍ය වත්කම් |
| | රු. 000 | රු. 000 |
| **වත්කම්** | | |
| යූරෝ ක්ලියර් බැංකුව වෙත ඔඩපන කරන ලද සුරැකුම්පත් | **3,749,003** | 1,090,124 |
| වත්කම් වල ධාරණ අගය | **3,749,003** | 1,090,124 |

## 56. භාර සහ භාරකාරත්ව ක්‍රියාකාරකම්

බැංකුව, සාමාන්‍යයෙන් භාරකරුවකු ලෙස හා අනෙකුත් විශ්වාසනා තත්ත්වයන්හි ක්‍රියාකිරීමේ ප්‍රතිඵලයක් ලෙස රජය, භාරයන්, විශ්‍රාම ප්‍රතිලාභ සැලසුම් සහ අනිකුත් ආයතන වෙනුවෙන් වත්කම් සහ බැරකම් දැරීම හෝ ස්ථාපනය කිරීම සිදු කරනු ලැබේ. බැංකුව විසින් ඉටු කරනු ලබන සැලකිය යුතු භාර ක්‍රියාකාරකම් පහත සඳහන් පරිදි වේ.

**56.1** විවිධ විදේශීය ණය සහ විදේශ අරමුදල් යොදන සංවර්ධන ව්‍යාපෘති සහ ණය යෝජනා ක්‍රම සඳහා වන ප්‍රදානයන්හි ණය මුදාහැරීම සහ ආපසු ගෙවීම් බැංකුව විසින් ශ්‍රී ලංකා රජය වෙනුවෙන් සිදු කරනු ලැබේ. තවද ශ්‍රී ලංකා රජය වෙනුවෙන් විවිධ විදේශීය ණය සහ ප්‍රදානයන් යටතේ ප්‍රතිපාර්ශ්වීය අරමුදල් රැස්කර ප්‍රදානය කරන නියෝජිත ආයතනයන්ගේ ඉල්ලීම පරිදි එම අරමුදල් භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනය කරනු ලැබේ.

**56.2** බැංකුව සේවක අර්ථසාධක අරමුදලේ (සේ.අ.අ) මුදල් සම්බන්ධයෙන් භාරකාරත්වය උසුලයි. ඒ අනුව, පනතේ විධි විධාන ප්‍රකාර දායක මුදල් ලබා ගැනීම, අධිභාර ලබාගැනීම, ආයෝජනවලින් ආදායම ලබා ගැනීම, සේ.අ.අ. අරමුදලේ ලියාපදිංචි සාමාජිකයන්ගේ ගිණුම් පවත්වාගෙන යාම, අතිරික්ත මුදල් ආයෝජනය සහ සාමාජිකයින්ට ප්‍රතිලාභ ගෙවීම පාලක මණ්ඩලයේ කාර්යයන්ට ඇතුළත් වන්නේය.

**56.3** ශ්‍රී ලංකා මහ බැංකුවෙහි බලපත්‍රලාභී බැංකු ආයතන සහ 1972 අංක 5 දරන සමුපකාර සමිති පනත යටතේ ලියාපදිංචි, බැංකු ව්‍යාපාරයෙහි යෙදී සිටින සමුපකාර සමිති සඳහා විවෘතව ඇති ස්වෙච්ඡා තැන්පත් රක්ෂණ යෝජනා ක්‍රමයක් වන "තැන්පතු රක්‍ෂණ යෝජනා ක්‍රමය" බැංකුව විසින් පරිපාලනය කර ඇත. 2010 ඔක්තෝබර් 01 දා සිට එම යෝජනා ක්‍රමයෙහි ඇති අරමුදල්, 2010 සැප්තැම්බර් 28 දා තම, ගැසට් අංක 1673/11 යටතේ පිහිට වූ "ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමය" වෙත පවරා ඇත.

**56.4** 2010 සැප්තැම්බර් 28 දිනැති වූ 1673/11 අංක දරණ (සංශෝධිත) ගැසට් පත්‍රය අනුව 2010 ඔක්තෝබර් 01 දා සිට බැංකුව විසින් "ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමය" නමින් අනිවාර්ය තැන්පතු රක්ෂණ ක්‍රමයක් ජාතික අවශ්‍යතාවයක් ලෙස තැන්පත්කරුවන්ගේ අරමුදල් ආරක්ෂාව වෙනුවෙන් පිහිටුවා ඇත.

මෙම යෝජනා ක්‍රමය සහ අරමුදල 2013 නොවැම්බර් 22 වන දින සිට පිළිවෙලින් "ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ හා ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමය" සහ "ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ හා ද්‍රවශීලතා ආධාරක අරමුදල" ලෙස නම් කරන ලදී.

තවද අංක 2239/52 දරණ ගැසට් පත්‍රය අනුව 2010 සැප්තැම්බර් 28 දිනැති අංක 01 දරණ ආරම්භ රෙගුලාසිය අවලංගු කරමින් 2021 අගෝස්තු 06 දිනැති 2021 අංක 02 දරණ නව රෙගුලාසිය ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ හා ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමය ලෙස නිකුත්කොට ඇත.

2023 නොවැම්බර් 15 දින සිට 2023 අංක 17 දරණ බැංකු (විශේෂ විධි විධාන) පනත ක්‍රියාත්මක වීමත් සමග, ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ හා ද්‍රවශීලිතා ආධාරක යෝජනා ක්‍රමයට අදාළ 2021 අංක 02 දරණ රෙගුලාසි වෙනුවට ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමයේ 2023 අංක 01 දරණ රෙගුලාසි බලපැවැත්වේ.

සියලුම බලපත්‍රලාභී වාණිජ බැංකු, බලපත්‍රලාභී විශේෂිත බැංකු හා ලියාපදිංචි මූල්‍ය සමාගම් මෙම යෝජනා ක්‍රමයේ සාමාජිකයන් වේ. ඒ අනුව, 2023 දෙසැම්බර් 31 දිනට මෙහි සමස්ථ සාමාජිකයන් ගණන 63 කි. 2023 අංක 17 දරණ බැංකු (විශේෂ විධි විධාන) පනතේ 43(2) වගන්තිය ප්‍රකාරව මෙම යෝජනා ක්‍රමය යටතේ රක්ෂණය කළ හැකි තැන්පතු ලෙස සාමාජික ආයතනවල ඉල්ලුම්, කාලීන හා ඉතුරුම් තැන්පතු වගකීම් දැක්විය හැකි අතර එසේ රක්ෂණය කළ නොහැකි තැන්පතු ලෙස 43(3) වගන්තියේ දක්වා ඇති තැන්පතු වගකීම් සහ යම් පොරොන්දු නෝට්ටු, දෙමුහුන් හිමිකම් සහ මහ බැංකුව විසින් නිශ්චය කරනු ලැබිය හැකි වෙනත් ණය සාධන පත්‍ර ඇතුළත් වේ.

රු.මි. 350.20 ක් වූ ස්වෙච්ඡා තැන්පත් රක්ෂණ යෝජනා ක්‍රමයෙහි ආයෝජන හා රු.මි. 1,168.31 ක් වූ වාණිජ බැංකුවල අත්හල දේපළ තුළින් කරන ලද ආයෝජන පැවරීමෙන් මෙම තැන්පතු රක්ෂණ අරමුදල පිහිටුවා ඇත. අනෙකුත් විස්තීරණ ආදායම තුළින් සාධාරණ මිලට ඇති මූල්‍ය උපකරණ වල සංචිත අගය වන රු.මි. 2,528.25 ක අගය සළකා බැලීමට පෙර 2023 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ අරමුදලේ ප්‍රමාණය රු.මි. 110,117.96 ක් (විගණනය නොකළ / තාවකාලික) ලෙස දැක්වේ. ඒ අනුව, 2023 දෙසැම්බර් 31 දිනට මෙම අරමුදලේ මුළු ස්කන්ධ ශේෂය රු.මි. 112,646.21 ක් (විගණනය නොකළ / තාවකාලික) වේ. දැනට මෙම අරමුදලෙන් තැන්පතු හිමියෙකුට ගෙවන වන්දි මුදල් ප්‍රමාණය එක් මූල්‍ය ආයතනයක් සඳහා රු. ලක්ෂ 11 ක් හෝ විදේශ විනිමය තැන්පතු සඳහා ඊට සමාන මුදලකි. වන්දි ගෙවීම බැංකුවේ හෝ පාලක මණ්ඩලයේ වගකීමක් නොවන අතර අරමුදලේ බැරට ඇති මුදල් ප්‍රමාණය ඉක්මවා යන කිසිදු වගකීමකට ශ්‍රී.ලං.ම.බැ. වගකියනු නොලැබේ.

යෝජනා ක්‍රමයේ මෙහෙයුම් හා කළමණාකරණ කටයුතු තැන්පතු රක්ෂණ හා නිරාකරණ දෙපාර්තමේන්තුවේ පිහිටා ඇති තැන්පතු රක්‍ෂණ ඒකකය මගින් පාලක මණ්ඩලය මගින් අනුමත වූ රෙගුලාසි හා ප්‍රතිපත්තීන් වලට අනුව තැන්පතු රක්ෂණ හා නිරාකරණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්‍ෂකවරයාගේ අධීක්‍ෂණය හා උපදෙස් අනුව සිදු කෙරෙන අතර බැංකුවේ මූල්‍ය ප්‍රකාශවලින් වෙන් වූ පොත් හා ගිණුම් පවත්වාගෙන යනු ලැබේ. විගණනය භාරව විගණකාධිපති කටයුතු කරයි.

**56.5** ශ්‍රී.ලං.ම.බැ. පාලක මණ්ඩලය වෙනුවෙන් රජය හෝ විදේශ අනුග්‍රාහකයෙකු විසින් මූල්‍යනය කරන ලද ව්‍යාපෘති සම්බන්ධයෙන් රජයේ අති විශේෂ නියෝජිතයා ලෙස ප්‍රාදේශිය සංවර්ධන දෙපාර්තමේන්තුව කටයුතු කරයි. මේ පිළිබඳව ශ්‍රී.ලං.ම.බැ. පනතේ 87(1) වගන්තිය යටතේ දක්වා ඇත. 2023 දෙසැම්බර් 31 මේ ආකාරයට සහභාගී වන මූල්‍ය ආයතනවලට ලබාදුන් ප්‍රතිමූල්‍ය ණය ප්‍රමාණය රු.මි.17,091.78ක් ලෙස දැක්වේ.

# දේශීය මිල ස්ථායීතාව පවත්වා ගැනීම

2023 වසරේ සැප්තැම්බර් මස බලාත්මක කරන ලද 2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනතට අනුව, මහ බැංකුවේ මූලික අරමුණ වන්නේ දේශීය මිල ස්ථායීතාව සාක්ෂාත් කර ගැනීම සහ පවත්වා ගැනීමයි. ඒ අනුව, මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය, නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ රාමුවට අනුකූලව මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සහ නම්‍යශීලී විනිමය අනුපාත ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් වගකීම දරයි. ආර්ථික වර්ධනය එහි විභව නිමැවුම් මට්ටම කරා ළඟා වීමට සහාය වන අතරම, මුදල් ප්‍රතිපත්ති රාමුව පිළිබඳ රජය සමඟ වන ගිවිසුමේ දක්වා ඇති පරිදි ඉලක්කගත මට්ටමේ උද්ධමනය පවත්වා ගැනීම නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ රාමුවෙහි අරමුණ වේ. 2023 වසරේ ඔක්තෝම්බර් මස 05වැනි දින රජයේ ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කරන ලද රජය සහ ශ්‍රී ලංකා මහ බැංකුව අතර වන වත්මන් මුදල් ප්‍රතිපත්ති රාමුව පිළිබඳ ගිවිසුමට අනුව, මහ බැංකුව උද්ධමනය සියයට 5ක මට්ටමක පවත්වා ගැනීම අවශ්‍ය වේ. මෙම රාමුව තුළ, උද්ධමන ඉලක්කය සපුරා ගැනීම පිණිස ප්‍රතිපත්ති ස්ථාවරයට අනුකූල වීම සඳහා කෙටි කාලීන පොලී අනුපාතික, විශේෂයෙන්ම බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය මෙහෙය වීමට මහ බැංකුව සිය ප්‍රතිපත්ති උපකරණ භාවිත කරයි.

## මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම

මහ බැංකුව විසින් 2023 වසරේ ජූනි මාසය දක්වා දැඩි මුදල් ප්‍රතිපත්ති ස්ථාවරයක් අනුගමනය කරන ලදි. කෙසේ වෙතත්, උද්ධමනය බලාපොරොත්තු වූවාට වඩා වේගයෙන් අඩු වීමත් සමඟ 2023 වසරේ ජූනි මාසයේ දී මහ බැංකුව මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය ලිහිල් කිරීම ආරම්භ කළ අතර, ඉල්ලුම මත පදනම් වූ උද්ධමන පීඩන අඩු මට්ටමක පවතින බවට පැහැදිලි සලකුණු පෙන්නුම් කළ බැවින් 2023 වසරේ අවසන් භාගයේ දී මුදල් ප්‍රතිපත්තිය තව දුරටත් ලිහිල් කිරීමට කටයුතු කළේය. මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සහ එහි බලපෑම් පිළිබඳව ශ්‍රී ලංකා මහ බැංකුවේ 2023 වසරට අදාළ වාර්ෂික ආර්ථික විවරණයේ සවිස්තරාත්මක ව දක්වා ඇත.

මහ බැංකුව විසින් ආර්ථිකයේ මුදල්, විදේශීය, මූර්ත සහ රාජ්‍ය මූල්‍ය අංශයේ මෙන්ම ගෝලීය ආර්ථිකය ප්‍රවණතා

### මුදල් ප්‍රතිපත්ති තීරණ ගැනීමේ ක්‍රියාවලිය



සම්පාදනය කිරීම, අධීක්ෂණය කිරීම සහ විශ්ලේෂණය කිරීම අඛණ්ඩව සිදු කරන ලද අතර පූර්වෝපායී මුදල් ප්‍රතිපත්ති තීරණ සඳහා පහසුකම් සැලසීමට පුරෝකථන සිදු කරන ලදි. දත්ත මත පදනම්ව තීරණ ගන්නා බව තහවුරු කිරීම සඳහා සාම්ප්‍රදායික හා සාම්ප්‍රදායික නොවන ක්‍රමවේද මගින් රැස් කරන ලද දත්ත සහ තොරතුරු භාවිතයෙන් උද්ධමනය සහ දළ දේශීය නිෂ්පාදිතය සඳහා ඉදිරි දැක්මක් සහිත විශ්ලේෂණයන් සහිත නුදුරු කාලීන පුරෝකථන භාවිතා කරයි. එමෙන්ම විවිධ මූලාශ්‍රවලින් ලබා ගන්නා යෙදවුම් භාවිතයෙන් ආකෘති මත පදනම් වූ සහ දර්ශක මත පදනම් වූ පුරෝකථනයන් කරන ලදි. මෙම පුරෝකථනයන් මුදල් ප්‍රතිපත්ති විවරණවල දී, එනම් පළමු ව කාර්ය මණ්ඩල මට්ටමේ සාකච්ඡා වට කිහිපයක දී ද ඉන් අනතුරු ව මුදල් ප්‍රතිපත්ති මණ්ඩලයට (මීට පෙර පැවති මුදල් මණ්ඩලයට) මුදල් ප්‍රතිපත්ති තීරණ ගැනීමට පහසුකම් සලසමින් සුදුසු මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කරනු ලබන මුදල් ප්‍රතිපත්ති කමිටු රැස්වීම්වල දී ද සවිස්තරාත්මකව සාකච්ඡා කරන ලදි.

2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනතේ 83වැනි වගන්තියට අනුව, රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති සහ මහ බැංකුවේ මුදල් හා මූල්‍ය පද්ධති ස්ථායීතා ප්‍රතිපත්ති සම්බන්ධීකරණය කිරීම සඳහා සම්බන්ධීකරණ සභාවක් පිහිටුවීමට නියමිතය. මෙම සභාවේ සභාපතිවරයා ලෙස ද කටයුතු කරන මහ බැංකු අධිපතිවරයා සහ භාණ්ඩාගාර ලේකම්වරයා සහ ආර්ථික ප්‍රතිපත්ති විෂය පැවරී ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශ ලේකම්වරයා (එම විෂය මුදල් අමාත්‍යවරයාට හැර වෙනත් අමාත්‍යවරයෙකුට පැවරෙන්නේ නම්) සම්බන්ධීකරණ සභාවේ සාමාජිකයින් ලෙස කටයුතු කරති. මෑත කාලීන සාර්ව ආර්ථික ප්‍රවණතා, ඉදිරි දැක්ම සහ අවදානම් පිළිබඳ අදහස් හුවමාරු කර ගැනීම සඳහා සම්බන්ධීකරණ සභාව කාර්තුමය වශයෙන් රැස්වීම අවශ්‍ය වේ. ඒ අනුව සම්බන්ධීකරණ සභාවේ මංගල රැස්වීම 2023 වසරේ නොවැම්බර් 07වැනි දින පැවැත්විණි.

මේ අතර, ආර්ථිකයේ ප්‍රධාන පාර්ශ්වකරුවන් මුදල් ප්‍රතිපත්ති සම්පාදන ක්‍රියාවලියට සම්බන්ධ වීම ඉහළ නැංවීම සඳහා මහ බැංකුව විසින් වෘත්තිකයින්, විද්වතුන් සහ පෞද්ගලික අංශයේ පිරිස් ඇතුළු අයගෙන් සමන්විත කාර්තුමය පාර්ශ්වකරුවන්ගේ සහභාගීත්ව කමිටු රැස්වීම් පවත්වන ලදි.

## මුදල් ප්‍රතිපත්ති සන්නිවේදනය

2023 වසරේ දී මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්ති සන්නිවේදන උපායමාර්ගය, මුදල් ප්‍රතිපත්තිය සම්පාදනය හා ක්‍රියාත්මක කිරීම සම්බන්ධ කරුණු පිළිබඳව මහජනතාව සහ අනෙකුත් පාර්ශ්වකරුවන්ගේ අවබෝධය වැඩිදියුණු කිරීම සඳහා මෙන්ම එමගින් මහ බැංකුවේ මූලික අරමුණ වන දේශීය මිල ස්ථායීතාව සාක්ෂාත් කරගැනීම සහ පවත්වාගෙන යෑම කෙරෙහි බලපාන තීරණ ගැනීමට හැකියාව ලබා දෙන පැහැදිලි සහ සංක්ෂිප්ත සන්නිවේදනයක් කෙරෙහි අවධානය යොමු කළේය. ඒ අනුව, මුදල් ප්‍රතිපත්ති සන්නිවේදනය, මහ බැංකුවේ නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ මුදල් ප්‍රතිපත්ති රාමුවේ තීරණාත්මක අංගයක් වන අතර, ඉහළ විනිවිදභාවය සහ විශ්වසනීයත්වය තුළින් උද්ධමන අපේක්ෂා පාලනය කිරීමට එය උපකාරී වේ. ප්‍රතිපත්තිමය අරමුණු සහ තීරණ පිළිබඳ පැහැදිලි සන්නිවේදනය, අපේක්ෂා, ඉදිරි මගපෙන්වීම සහ පාර්ශ්වකරුවන් හා සමග නිරන්තරයෙන් සම්බන්ධ වීම යන ඒවා ඉහළ අවිනිශ්චිතතා සහිත ඉතා දුෂ්කර කාලයක් වූ 2023 වසර තුළ දී අපේක්ෂා පාලනය කිරීමට උපකාරී විය.

ව්‍යවස්ථාපිත අවශ්‍යතාවයට අනුව, මහ බැංකුව විසින් 2022 වසර සඳහා වූ මහ බැංකුවේ වාර්ෂික වාර්තාව 2023 වසරේ අප්‍රේල් මාසයේ දී භාෂා ත්‍රිත්වයෙන්ම ප්‍රකාශයට පත් කරන ලදි. තවද, මහ බැංකුව විසින් දෛනික, සතිපතා සහ මාසික දර්ශක සහ විවරණිකා මගින් ආර්ථික හා මූල්‍ය තොරතුරු ප්‍රකාශයට පත් කිරීම අඛණ්ඩව සිදු කරන ලද අතර, මහ බැංකු නිල වෙබ් අඩවියේ මංගත දත්ත පද්ධතිය මගින් ද තොරතුරු ප්‍රකාශයට පත් කෙරේ. උද්ධමනයේ මෑත කාලීන ප්‍රවණතා, උද්ධමනය සඳහා හේතු වූ සාධක සහ උද්ධමනයේ මැදි කාලීන පුරෝකථන හා එවැනි පුරෝකථන සඳහා ඇති ප්‍රධාන අවදානම් දක්වමින් සහ ඒවා පැහැදිලි කරමින් මහ බැංකුව 2023 වසරේ ජූලි මාසයේ දී ප්‍රථම වරට මුදල් ප්‍රතිපත්ති වාර්තාව ප්‍රකාශයට පත් කළේය. 2023 වසරේ සැප්තැම්බර් මාසයේ දී ශ්‍රී ලංකා මහ බැංකු පනත බලාත්මක කිරීමෙන් පසුව මෙම අර්ධ වාර්ෂික වාර්තාව ප්‍රකාශයට පත් කිරීම අනිවාර්ය විය.

මුදල් ප්‍රතිපත්ති විවරණ පිළිබඳ මාධ්‍ය නිවේදන 8ක් 2023 වසර තුළ දී නිකුත් කරන ලද අතර, මුදල් ප්‍රතිපත්ති

ස්ථාවරය පිළිබඳව මහජනතාවට දැනුම් දෙන අතරම, මුදල් ප්‍රතිපත්ති සන්නිවේදනය පුළුල් ලෙස ව්‍යාප්ත කරමින් මුදල් ප්‍රතිපත්ති විවරණ පිළිබඳ මාධ්‍ය සාකච්ඡා පැවැත්වීම සහ ඒවායෙහි සජීවී විකාශයන් දියත් කිරීම සිදු කරන ලදි. සන්නිවේදනයේ පැහැදිලි බව වැඩිදියුණු කිරීම සහ උද්ධමනය සඳහා ඉදිරි දැක්මක් ලබා දීම සඳහා මහ බැංකුව උද්ධමන ව්‍යාප්ති සටහන් සිය මුදල් ප්‍රතිපත්ති වාර්තාවන්වල, මුදල් ප්‍රතිපත්ති විවරණ මාධ්‍ය නිවේදනවල සහ උද්ධමනය පිළිබඳ මාධ්‍ය නිවේදනවල ඇතුලත් කොට ඒවා ප්‍රකාශයට පත් කිරීම අඛණ්ඩව සිදු කළේය. උද්ධමන පිළිබඳ ඉදිරි දැක්ම ප්‍රකාශයට පත් කිරීමෙන් මහජනතාවගේ උද්ධමන අපේක්ෂා සඳහා මග පෙන්වීමක් ලබා දීමට අපේක්ෂා කරන අතර එමගින් මැදි කාලීනව උද්ධමන ඉලක්කය සපුරා ගැනීමට සහාය වනු ඇත.

මුදල් ප්‍රතිපත්ති නිවේදනවලින් අනතුරුව එම ප්‍රතිපත්ති තීරණ මහජනතාව අතර වැඩි වශයෙන් ව්‍යාප්ත කිරීම සඳහා මහ බැංකුව එහි සම්පත් දායකයින් සමග එක් ව, මහ බැංකුවේ ප්‍රාදේශීය කාර්යාල මගින් සම්බන්ධීකරණය කරන ලද අන්තර්ජාලය ඔස්සේ පවත්වනු ලබන සම්මන්ත්‍රණ සඳහා පහසුකම් සලසා දුන් අතර, වසර පුරා ආර්ථික ප්‍රවණතා, මුදල් ප්‍රතිපත්තිය සහ අනෙකුත් මහ බැංකු කාර්යයන් පිළිබඳව දැනුම්වත් කිරීමේ වැඩසටහන් පවත්වන ලදි.

තවද, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විශේෂ දත්ත ප්‍රකාශන සම්මතය (SDDS) සඳහා දත්ත සැපයීම මගින් ප්‍රකාශිත ඉදිරි දින දර්ශනයට අනුව ආර්ථිකයේ සියලුම අංශවලට අදාළ දත්ත බෙදා හැරීම සහතික කළේය. මීට අමතරව, ජාත්‍යන්තර නියෝජිතායතන වෙත කාලෝචිත ලෙස දත්ත සහ තොරතුරු බෙදා හැරීම මහ බැංකුව විසින් සහතික කරන ලදි.

## මුදල් මෙහෙයුම්

ශ්‍රී ලංකා මහ බැංකු පනතේ 31 වන වගන්තියේ දක්වා ඇති පරිදි පවත්නා මුදල් ප්‍රතිපත්ති ස්ථාවරයට අනුකූලව, දේශීය මිල ස්ථායීතා අරමුණු ළඟා කර ගැනීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විවට වෙළෙඳපොළ කටයුතු සිදු කරනු ලබයි. මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ දී, 2023 වසරේ අප්‍රේල් මස මැද භාගයේ සිට ද්‍රවශීලතාව තහවුරු කිරීම සඳහා විවට වෙළෙඳපොළ කටයුතු යටතේ එක් දින සහ කාලීන ප්‍රතිවිකුණුම් වෙන්දේසි අවශ්‍යතාව අනුව නිරතුරුවම පවත්වන ලදි. තවද, ද්‍රවශීලතාව සැපයීම සඳහා මහ බැංකුව භාණ්ඩාගාර බැඳුම්කර ස්ථිර පදනම මත මිල දී ගැනීම සිදු කළේය. සාමාන්‍ය විවට වෙළෙඳපොළ

**නිත්‍ය පහසුකම් මත සීමා පැනවීම**



කටයුතුවලට අමතරව ඇතැම් බලපත්‍රලාභී බැංකුවලට ඔවුන්ගේ ද්‍රවශීලතා තත්ත්වයන් ශක්තිමත් කරගැනීම සඳහා විශේෂ ද්‍රවශීලතා පහසුකම් ද සපයන ලදි. දෛනික විවට වෙළෙඳපොළ වෙන්දේසි සහ මුදල් වෙළෙඳපොළ ගනුදෙනු හරහා තම කෙටි කාලීන ද්‍රවශීලතා අවශ්‍යතා සපුරා ගත නොහැකි වූ සහභාගිත්ව ආයතන වෙත නිත්‍ය පහසුකම යටතේ අරමුදල් සපයන ලදි.

2023 ජනවාරි මාසයේ දී නිත්‍ය පහසුකම මත සීමා පනවන ලදි. ඒ අනුව, නිත්‍ය තැන්පතු පහසුකම ලබා ගත හැකි උපරිම වාර ගණන ලිත් මාසයක් තුළ වාර 5 කට සීමා කරන ලද අතර, නිත්‍ය ණය පහසුකම ලබා ගැනීම ඕනෑම දිනක් තුළ එම බැංකුවේ පවත්නා ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතාවෙන් සියයට 90ක් දක්වා සීමා කරන ලදි. ද්‍රවශීලතා තත්ත්වය සහ දේශීය මුදල් වෙළෙඳපොළ කටයුතුවල වර්ධනයන් සැලකිල්ලට ගනිමින් 2024 අප්‍රේල් 1 දින සිට බලපැවැත්වෙන පරිදි මහ බැංකුව විසින් ඉහතින් සඳහන් කරන ලද නිත්‍ය තැන්පතු පහසුකම භාවිතය මත පනවන ලද සීමාව ඉවත්කරන ලදි.

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මහ බැංකු පනතේ 32 වැනි වගන්තිය ප්‍රකාරව සෑම බලපත්‍රලාභී වාණිජ බැංකුවක් විසින් ම සිය මුළු තැන්පතු වගකීම්වලට අනුපාතික වශයෙන් සංචිත පවත්වාගෙන යායුතු අතර එම ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතා අනුපාතය සමග වාණිජ බැංකුවල අනුකූලතාව මහ බැංකුව විසින් අඛණ්ඩව අධීක්ෂණය කිරීම සහ පරිපාලනය කිරීම සිදුකරන ලදි.

## දේශීය විදේශ විනිමය වෙළෙඳපොළ මෙහෙයුම්

රටේ විනිමය අනුපාතික ප්‍රතිපත්තිය තීරණය කිරීමේ සහ ක්‍රියාත්මක කිරීමේ බලතල මෙන්ම, බලපත්‍රලාභී බැංකු සහ වෙනත් විවිධ දේශීය හා විදේශීය ප්‍රතිපාර්ශ්ව සමඟ විදේශ විනිමය මෙහෙයුම්වල නිරත වීමේ වගකීම ද ශ්‍රී ලංකා මහ බැංකුව වෙත පැවරී ඇත.

ශ්‍රී ලංකා මහ බැංකුව විසින්, වෙළෙඳපොළෙහි විදේශ විනිමය ද්‍රවශීලතාවයේ සිදු වූ වර්ධනය සැලකිල්ලට ගැනීමෙන් අනතුරුව, 2023 මාර්තු 07 දින සිට වෙළෙඳපොළ වෙත දෛනික මාර්ගෝපදේශ ලබා දීම අත්හිටවනු ලද අතර, "විනිමය අනුපාතිකයේ දිනක් තුළ සිදුවිය හැකි උච්චාවචන කළමනාකරණය" පිළිබඳව බලපත්‍රලාභී බැංකු වෙත 2022 මැයි 12 දින නිකුත් කරන ලද මෙහෙයුම් උපදෙස් ද අවලංගු කරන ලදි. මෙම ක්‍රියාමාර්ගය ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම් වැඩපිළිවෙළෙහි අවශ්‍යතාවන්ට ද සහය විය. තවද, 2023 මාර්තු මාසයේ දී, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බලපත්‍රලාභී බැංකු වෙත නිකුත් කරන ලද ශ්‍රී ලංකා මහ බැංකුවට විදේශ විනිමය අනිවාර්යයෙන් විකිණීම සම්බන්ධයෙන් වූ මෙහෙයුම් උපදෙස් අත්හිටුවීමට කටයුතු කළ අතර, ගල් අඟුරු සහ ඉන්ධන ආනයනය සඳහා පහසුකම් සැලසීමට බලපත්‍රලාභී බැංකු විසින් ස්වේච්ඡාවෙන් ශ්‍රී ලංකා මහ බැංකුවට ලබා දුන් විදේශ විනිමය අත්පත් කර ගැනීම ද අත්හිටුවන ලදි. එතැන් සිට, 2023 වසරේ ප්‍රථම භාගය තුළ විටින් විට ඇති වූ විදේශ විනිමය අනුපාතිකයේ විචලන සහිතව, විනිමය අනුපාතිකයේ සැලකිය යුතු අතිප්‍රමාණය වීමේ ප්‍රවණතාවක් නිරීක්ෂණය කළ හැකි විය. මෙම තත්ත්වය හමුවේ විනිමය අනුපාතිකයේ අධික උච්චාවචනය සමනය කිරීම සඳහා දළ නිල සංචිත ද ඉහළ නංවමින් ශ්‍රී ලංකා මහ බැංකුව දේශීය විදේශ විනිමය වෙළෙඳපොළ අධීක්ෂණය හා මග පෙන්වීම් කටයුතුවල සක්‍රීයව නිරත විය.

2023 වසරේ දෙවන භාගයේ දී දේශීය ණය ප්‍රශස්තකරණ වැඩසටහන යටතේ ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර රුපියල්වලින් පියවීම හේතුවෙන් ඇති වූ විදේශ මුදල් හිඟය පියවා ගැනීම සඳහා බලපත්‍රලාභී බැංකු විසින් විදේශ විනිමය ඉල්ලුම ඉහළ නැංවීමත් සමඟ ඇති වූ විනිමය අනුපාතිකය අවප්‍රමාණය වීමේ පීඩනයක් නිරීක්ෂණය කළ හැකි විය. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බලපත්‍රලාභී බැංකු සහ අනෙකුත් පාර්ශ්වකරුවන් සමඟ ඵලදායි ලෙස සන්නිවේදනය කිරීමත්, ඇති වූ අනිසි පීඩනය මැඩ පැවැත්වීම සඳහා අවශ්‍යතාව අනුව විදේශ විනිමය සැපයීම තුළින් සිදු කරන ලද කඩිනම් මැදිහත්වීමත් සමඟ විනිමය අනුපාතිකයේ කැපී පෙනෙන ස්ථාවරභාවයක් නිරීක්ෂණය කළ හැකි විය. මේ අතර, දේශීය ණය ප්‍රශස්තකරණයට අනුව ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර ශ්‍රී ලංකා රුපියල්වලින් නාමනය කළ බැඳුම්කරවලට හුවමාරු කර ගැනීම සඳහා පහසුකම් සැලසීමට, 2023 වසරේ දී අදාළ බලපත්‍රලාභී බැංකුවලට අදාළ වන ශුද්ධ විදේශ විනිමය අනාවරණ තත්ත්ව සීමාවන් අවස්ථානුකූලව, තාවකාලිකව සංශෝධනය කිරීමට අවශ්‍ය පියවර ගැනුණි.

විනිමය අනුපාතිකයේ ප්‍රවණතා පිළිබඳ තොරතුරු බෙදා හැරීම සම්බන්ධයෙන් සැලකීමේ දී, ශ්‍රී ලංකා මහ බැංකුව, මීට පෙර දී ප්‍රකාශයට පත් කරන ලද ස්ථාපිත විචලා ආන්තිකයක් සහිත මධ්‍ය විනිමය අනුපාතිකය වෙනුවට 2023 මාර්තු මාසයේ සිට එක්සත් ජනපද ඩොලරය සහ තෝරාගත් ජාත්‍යන්තර ව්‍යවහාර මුදල් ඒකක සඳහා නිරූපිත විනිමය අනුපාතිකය ප්‍රකාශයට පත් කිරීමට නිර්දේශ කරන ලදි. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ප්‍රධාන මුදල් ඒකක නවයක් සඳහා ශ්‍රී ලංකා රුපියලට සාපේක්ෂව බලපත්‍රලාභී බැංකුවල සාමාන්‍ය විදුලි පණිවුඩ පැවරුම් මිල දී ගැනීමේ සහ විකිණීමේ විනිමය අනුපාතික ද දෛනික පදනම මත ප්‍රකාශයට පත් කරන ලදි.

2023 සැප්තැම්බර් මාසයේ දී මහ බැංකු පනත බලාත්මක කිරීම, ශ්‍රී ලංකා මහ බැංකුවේ නම්‍යශීලී විනිමය අනුපාතික ප්‍රතිපත්තිය පවත්වාගෙන යෑමේ කාර්යභාරය තහවුරු කර සිටියි. නම්‍යශීලී විනිමය අනුපාතික ප්‍රතිපත්තිය, වෙළෙඳපොළ ඉල්ලුම සහ සැපයුම් තත්ත්ව මත විනිමය අනුපාතිකය තීරණය කිරීමට ඉඩ සලසයි. දේශීය විදේශ විනිමය වෙළෙඳපොළ තුළ මහ බැංකුවේ මැදිහත්වීම, විනිමය අනුපාතිකයේ අධික අස්ථාවරත්වය සමනය කිරීමට සහ සුදුසු පරිදි දළ නිල සංචිත ගොඩනැඟීමට සීමා වේ.

## විදේශ සංචිත කළමනාකරණය

2023 වසරේ දී ශ්‍රී ලංකා මහ බැංකු පනතේ විධිවිධාන ප්‍රකාරව, ප්‍රාග්ධන සංරක්ෂණය, ද්‍රවශීලතා අවශ්‍යතා සහ ආදායම් උත්පාදනය යන අරමුණු සම්බන්ධයෙන් පාලක මණ්ඩලය විසින් අනුමත කරන ලද නීති රීති සහ ජාත්‍යන්තරව පිළිගත් හොඳම පරිචයන්වලට අනුකූලව, නිල විදේශ විනිමය සංචිත විචක්ෂණශීලීව සහ ඵලදායී ලෙස කළමනාකරණය කිරීමේ කාර්යභාර්ය ශ්‍රී ලංකා මහ බැංකුව වෙත පැවරී ඇත. 2023 වසරේ දී විදේශ සංචිත කළමනාකරණය, වත්කම් හා වගකීම් ව්‍යුහයට අනුකූලව ගොඩනැගූ විද්‍යාත්මක රාමුවක් මත පදනම්ව, ආයෝජන ප්‍රතිපත්ති ප්‍රකාශය (Investment Policy Statement), උපායමාර්ගික වත්කම් ප්‍රතිපාදන සැලැස්ම (Strategic Asset Allocation) සහ ආයෝජන මාර්ගෝපදේශයන්ට (Investment Guideline) අනුකූලව සිදු කරන ලදි. මේ අතර, සංචිත කළමනාකරණ කාර්යසාධන ඇගයීම, මූල්‍ය අවදානම සැලකිල්ලට ගත් පූර්ණ ප්‍රතිලාභ ප්‍රවේශයක් මත තක්සේරු කරන ලදි.

2023 වසර තුළ ජාත්‍යන්තර සංචිතවල ස්ථාවර වර්ධනය සැලකිල්ලට ගනිමින් ශ්‍රී ලංකා මහ බැංකුව, පසුගිය දෙවසර තුළ සීමිත විදේශ විනිමය ද්‍රවශීලතා තත්ත්වයන් හේතු කොට ගෙන සීමා කර තිබූ ජාත්‍යන්තර සංචිත ආයෝජන කටයුතු නැවත ආරම්භ කරන ලදි. එමෙන් ම, ශ්‍රී ලංකා මහ බැංකුවට, සංචිත කළමනාකරණ කටයුතු සඳහා ජාත්‍යන්තර මූල්‍ය වෙළෙඳපොළ සමඟ ගනුදෙනු කිරීමේ දී ශ්‍රී ලංකාවේ අහිතකර ස්වෛරීත්ව ශ්‍රේණිගත කිරීමේ තත්ත්වය හේතුවෙන් බොහෝ අභියෝගවලට මුහුණ දීමට සිදු විය. මෙම තත්ත්වය යටතේ බොහෝ විදෙස් ආයෝජන පාර්ශ්ව ශ්‍රී ලංකා මහ බැංකුව සමග ගනුදෙනු කිරීම අත් හිටවනු ලැබිණි. මෙම දුෂ්කරතා මධ්‍යයේ වුව ද, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල යටතේ ක්‍රියාත්මක වන වැඩසටහනේ සහාය ඇතිව ආර්ථිකයේ ඇති වෙමින් තිබෙන සාර්ව ආර්ථික ස්ථාවරත්වය අවධාරණය කරමින් සහ ගෝලීය වශයෙන් පවතින ඉහළ පොලී අනුපාත පසුබිමෙන් හැකි ප්‍රතිලාභ ලබා ගැනීමේ අරමුණින් ශ්‍රී ලංකා මහ බැංකුව, සංචිත කළමනාකරණ කාර්යය පූර්ණ ලෙස ප්‍රතිෂ්ඨාපනය කිරීමට පුළුල් උත්සාහයක් දැරීය. මෙහි දී, ද්‍රවශීලතාව සහ ප්‍රාග්ධන සංරක්ෂණය යන අරමුණු ද විශේෂයෙන් සලකා බලන ලදි. ඒ අනුව, ආයෝජන ක්‍රියාකාරකම් ප්‍රධාන වශයෙන් ස්ථාවර ආදායම් සුරැකුම්පත් සහ මුදල් වෙළෙඳපොළ උපකරණ වෙත ව්‍යාප්ත කරන ලද අතර, ජාත්‍යන්තර ප්‍රාග්ධන වෙළෙඳපොළෙහි වත්මන් ගම්‍යතාවට හැඩ ගැසෙමින් තිරසාර ආයෝජන සඳහා ද අවධානයක් යොමු කෙරිණි.

## මුදල් ප්‍රතිපත්ති තීරණ ගැනීම සඳහා දත්ත සම්පාදනය කිරීම

ශ්‍රී ලංකා මහ බැංකුවේ තීරණ ගැනීමේ ක්‍රියාවලිය දත්ත මත පදනම් ව සිදු කරන අතර ඒ සඳහා අවශ්‍ය කාලීන තොරතුරු සැපයීම සඳහා ආර්ථික දර්ශක සම්පාදනය කිරීමට අනාගතය පිළිබඳ පුරෝකථන කළ හැකි දත්ත ප්‍රාථමික සහ ද්විතීයික මූලාශ්‍ර හරහා රැස් කරනු ලබයි. ව්‍යුහගත සමීක්ෂණ ප්‍රාථමික දත්ත ලබා ගැනීමේ ප්‍රධාන මූලාශ්‍රය වන අතර බාහිර ආයතනවලින් ද්විතීයික දත්ත ලබා ගැනේ. 2023 වසරේ දී ද ව්‍යාපාර අංශය ඉලක්ක කරමින් සිදු කරනු ලබන ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක සමීක්ෂණ, ව්‍යාපාර අපේක්ෂා පිළිබඳ සමීක්ෂණය, සහාධිපත්‍ය වෙළෙඳපොළ සමීක්ෂණය, ණය සැපයුම

පිළිබඳ සමීක්ෂණය, ණය ඉල්ලුම පිළිබඳ සමීක්ෂණය වැනි සමීක්ෂණ මෙන්ම උද්ධමන අපේක්ෂා පිළිබඳ සමීක්ෂණය සහ වාර්ෂිකව සිදු කරනු ලබන රාජ්‍ය අංශයේ රැකියා සමීක්ෂණය ඇතුළු අනෙකුත් සමීක්ෂණ හරහා රැස් කරන ලද ප්‍රාථමික දත්ත භාවිතා කරමින් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පුළුල් ඉදිරි දැක්මක් සහිත දර්ශක රාශියක් අඛණ්ඩව සම්පාදනය කරන ලදි. මීට අමතරව, ගුරු සමීක්ෂකවරු සම්බන්ධ කර ගනිමින් 2023 දී ද දීප ව්‍යාප්ත දත්ත රැස් කිරීමේ වැඩපිළිවෙල අඛණ්ඩව ක්‍රියාත්මක කළ අතර ඒ හරහා පාරිභෝගික භාණ්ඩවල සිල්ලර මිල, කෘෂිකාර්මික භාණ්ඩ සහ ගොඩනැගිලි ද්‍රව්‍යවල නිෂ්පාදක මිල ගණන්, අවිධිමත් අංශයේ සේවකයන්ගේ දෛනික වැටුප්, උද්ධමන අපේක්ෂා සහ තෝරාගත් භාණ්ඩ වර්ගවල සිල්ලර විකුණුම් පරිමා පිළිබඳ දත්ත රැස් කරමින් ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රතිපත්ති සම්පාදන ක්‍රියාවලිය සඳහා කාලීන තොරතුරු ලබා දීමට දායක විය. තවද, දේපළ හා රථ වාහන පිළිබඳ අන්තර්ජාලය හරහා ලබාගන්නා තොරතුරු මත සම්පාදිත මිල දර්ශක, සහ විධිමත් හා අවිධිමත් අංශවල වැටුප් අනුපාත දර්ශක මෙන්ම පළාත් දළ දේශීය නිෂ්පාදිතය වැනි ප්‍රාදේශීය සංඛ්‍යාලේඛන සම්පාදනය කිරීම ද සිදු කරන ලදි.

2023 වසර තුළ දී, මහ බැංකුව විසින් බරිත සාමාන්‍ය පොලී අනුපාතික කිහිපයක් සම්පාදනය කිරීම ස්වයංක්‍රීය කරමින් මූල්‍ය දත්ත සම්පාදනය සඳහා ගත වන කාලය අඩු කරන ලද අතර, එමගින් මුදල් ප්‍රතිපත්ති තීරණ ගැනීම සඳහා දත්ත ලබා ගැනීමේ හැකියාව සහ කාලානුරූපී බව වැඩිදියුණු විය. එසේම, මුදල් ප්‍රතිපත්ති සම්ප්‍රේෂණය තක්සේරු කිරීම සහ සහතික කිරීම සඳහා ණය පොලී අනුපාතික පිළිබඳ බැංකු දත්ත නිරන්තරයෙන් සමීපව නිරීක්ෂණය කළ අතර, මහ බැංකුවේ අපේක්ෂාවන්ට වඩා අවශ්‍ය වෙළෙඳපොළ ගැලපීම් අඩු වූ සෑම අවස්ථාවකම, මුදල් ප්‍රතිපත්ති සම්ප්‍රේෂණය සහ බැංකුවල අනුකූලතාව වැඩි දියුණු කිරීමට සුදුසු ක්‍රියාමාර්ග ගන්නා ලදි. ඉහත කරුණුවලට අමතරව, මූල්‍ය වෙළෙඳපොළ සහ මූර්ත ආර්ථිකය වෙත මුදල් ප්‍රතිපත්ති සම්ප්‍රේෂණය කිරීම තක්සේරු කිරීම සඳහා මහ බැංකුව විසින් මාසික පදනමින් පෞද්ගලික අංශයට ලබා දුන් ණය පිළිබඳ ගැඹුරු විශ්ලේෂණයක් අඛණ්ඩව සිදුකළේ ය. ණය භාවිත කරන ආකාරය අවබෝධ කර ගැනීම සඳහා ණය බෙදා හැරීමේ ආංශික විශ්ලේෂණයන් කාර්තුමය පදනමින් සිදු කළ අතර, තීරණ ගැනීමේ අරමුණු සඳහා ප්‍රයෝජනවත් තොරතුරු සපයන ලදි. තවද, මහ බැංකුව විසින් මුදල් ප්‍රතිපත්ති තීරණ ගැනීමේ ක්‍රියාවලියට සහාය වූ මෑත කාලයේ සිට මැදි කාලීනව ආර්ථික ක්‍රියාකාරකම්වල වේගය සහ ගමන් මඟ මැන බැලීම සඳහා බලශක්තිය, කෘෂිකර්මය, නිෂ්පාදන, වරාය සහ විදුලි සංදේශ ඇතුළු ආර්ථිකයේ ප්‍රධාන අංශ කිහිපයක් ආවරණය වන පරිදි ඉහළ සංඛ්‍යාත දර්ශක මාලාවක් අඛණ්ඩව සම්පාදනය කරන ලදි. වසර තුළ දී, බැංකු අංශය හරහා සිදු වන රටවල් අතර විදේශ ව්‍යවහාර මුදල් ගනුදෙනු පිළිබඳ සවිස්තරාත්මක දත්ත රැස් කිරීම සහ සම්පාදනය කිරීම සඳහා ජාත්‍යන්තර ගනුදෙනු වාර්තාකරණ පද්ධතිය ක්‍රියාත්මක කිරීමේ දී මහ බැංකුව සැලකිය යුතු ප්‍රගතියක් ලබා ඇත. ජාත්‍යන්තර ගනුදෙනු වාර්තාකරණ පද්ධතියෙහි වර්තමාන මට්ටමත් සමඟ, ප්‍රතිපත්ති සම්පාදනය සඳහා වඩාත් විස්තරාත්මක වාර්තා දැන් ලබා ගත හැකිය. සේවා අංශය පිළිබඳ ලැබීම් සහ ගෙවීම් පිළිබඳ වඩාත් සවිස්තරාත්මක සහ නිවැරදි දත්ත ලබා දෙමින් ජාත්‍යන්තර ගනුදෙනු වාර්තාකරණ පද්ධතිය ගෙවුම් තුලන සංඛ්‍යාලේඛනවලින් සමන්විත වන අතර, එමගින් දත්ත ලබා ගැනීමේ හැකියාව සහ කාලානුරූපී බව වැඩි දියුණු කරයි.

2023 වසර තුළ දී මහ බැංකුව විසින් බරිත සාමාන්‍ය පොලී අනුපාතික කිහිපයක් ස්වයංක්‍රීයව ගණනය වීමට පියවර ගන්නා ලද අතර එගින් මුදල් පිළිබඳ දත්ත සම්පාදනය සඳහා ගතවන කාලය අඩු විය. මෙමගින් මුදල් ප්‍රතිපත්ති තීරණ ගැනීම සඳහා දත්ත ලබා ගැනීම සහ ඒවා ලබා ගැනීමේ කාලය වැඩි දියුණු විය. එසේම, මුදල් ප්‍රතිපත්ති සම්ප්‍රේෂණය ඇගයීමට සහ සහතික කිරීමට ණය පොලී අනුපාතික පිළිබඳ බැංකු දත්ත නිරන්තරයෙන් සමීපව නිරීක්ෂණය කළ අතර, මහ බැංකුවේ අපේක්ෂාවන්ට වඩා සිදු විය යුතු වෙළෙඳපොළ ගැළපීම් අඩු වූ සෑම අවස්ථාවකම, මුදල් ප්‍රතිපත්ති සම්ප්‍රේෂණය සහ බැංකුවල අනුකූලතාව වැඩි දියුණු කිරීමට සුදුසු ක්‍රියාමාර්ග ගන්නා ලදි. ඉහත කරුණුවලට අමතරව, මූල්‍ය වෙළෙඳපොළ සහ මූර්ත ආර්ථිකය වෙත මුදල් ප්‍රතිපත්තිය සම්ප්‍රේෂණය කිරීම ඇගයීම සඳහා මහ බැංකුව විසින් මාසිකව පෞද්ගලික අංශයට ලබා දුන් ණය පිළිබඳ අඛණ්ඩව විශ්ලේෂණ කරන ලදි. ණය භාවිත කරන ආකාරය පිළිබඳ අවබෝධයක් ලබා ගැනීම සඳහා ණය ලබා දීමේ අංශ පිළිබඳ විශ්ලේෂණ කාර්තුමය පදනමින් සිදු කළ අතර, එමගින් අවශ්‍ය තීරණ ගැනීමේ තොරතුරු සපයන ලදි. තවද, මුදල් ප්‍රතිපත්ති තීරණ ගැනීමේ ක්‍රියාවලියට සහාය වූ

නුදුරු කාලයේ සිට මැදි කාලීන ආර්ථික ක්‍රියාකාරකම්වල ප්‍රවණතා සහ දිශානතිය මැන බැලීම සඳහා බලශක්තිය, කෘෂිකාර්මික, නිෂ්පාදන, වරාය සහ විදුලි සංදේශ ඇතුළු ආර්ථිකයේ ප්‍රධාන අංශ කිහිපයක් ආවරණය වන පරිදි නිරන්තරයෙන් යාවත්කාලීන වන ප්‍රධාන ආර්ථික දර්ශක මාලාවක් අඛණ්ඩව පිළියෙළ කරන ලදි. 2023 වසර තුළ දී, බැංකු අංශය හරහා සිදු වන රටවල් අතර විදේශ ව්‍යවහාර මුදල් ගනුදෙනු පිළිබඳ සවිස්තරාත්මක දත්ත රැස් කිරීම සහ ඒවා පිළියෙළ කිරීම සඳහා ජාත්‍යන්තර ගනුදෙනු වාර්තාකරණ පද්ධතිය ක්‍රියාත්මක කළ අතර මහ බැංකුව එහි සැලකිය යුතු ප්‍රගතියක් ලබා ගෙන ඇත. ජාත්‍යන්තර ගනුදෙනු වාර්තාකරණ පද්ධතියෙහි වර්තමාන ප්‍රගතියට අනුව, එමගින් ප්‍රතිපත්ති සම්පාදනය සඳහා වඩාත් විස්තරාත්මක වාර්තා ලබා ගත හැකිය. ජාත්‍යන්තර ගනුදෙනු වාර්තාකරණ පද්ධතිය මගින් සේවා අංශයේ ලැබීම් සහ ගෙවීම් පිළිබඳව වඩාත් සවිස්තරාත්මක සහ නිවැරදි දත්ත ලබා දීමෙන් ගෙවුම් තුලන සංඛ්‍යාලේඛන වැඩි දියුණු කෙරෙන අතර, එමගින් දත්ත ලබා ගැනීම සහ දත්ත ලබා ගැනීමේ කාලයෙහි ප්‍රගතිය වැඩි වනු ඇත.

## ඉදිරි දැක්ම

2023 වසරේ ජූනි මාසයේ මුදල් ප්‍රතිපත්තිය ලිහිල් කිරීම ආරම්භ කිරීමෙන් පසුව, ඉල්ලුම මත පදනම් වූ අඩු උද්ධමන පීඩන සහ පාලනය වූ උද්ධමන අපේක්ෂා මධ්‍යයේ මහ බැංකුව සිය මුදල් ප්‍රතිපත්තිය ලිහිල් කිරීමේ ක්‍රියාවලිය අඛණ්ඩව සිදු කළේය. ආර්ථිකය විභව නිමැවුම් මට්ටමට වඩා අඩුවෙන් ක්‍රියාත්මක වන බැවින් ලිහිල් මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය අඛණ්ඩව ක්‍රියාත්මක විය හැකිය. කෙසේ වෙතත්, මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය අඛණ්ඩව දත්ත මත පදනම්ව සිදු වන අතර නව දත්ත ලැබීමත් සමග ම ප්‍රතිපත්ති සුදුසු පරිදි වෙනස් වනු ඇත.

මුදල් ප්‍රතිපත්තිය සම්ප්‍රේෂණය වීම වැඩිදියුණු කිරීම සහ මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය පිළිබඳ දැනුම් දීම සඳහා වර්තමානයේ ක්‍රියාත්මක වන ද්විත්ව පොලී අනුපාතික යාන්ත්‍රණය වෙනුවට, තනි ප්‍රතිපත්ති පොලී අනුපාතිකයක් හඳුන්වා දීම කෙරෙහි මහ බැංකුව අවධානය යොමු කරයි. ජාත්‍යන්තරව පිළිගත් ක්‍රමවේදයන් අනුගමනය කරමින් ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතා රාමුවේ සඵලතාව ඉහළ නැංවීමට ද මහ බැංකුව අපේක්ෂා කරයි. තවද, විවට වෙළෙඳපොළ කටයුතුවල සුමට ක්‍රියාකාරිත්වය සඳහා උසස් පරිශීලක හිතකාමී යටිතල පහසුකම් සංවර්ධනය කිරීමට මහ බැංකුව අපේක්ෂා කරයි. එමෙන්ම, ආකෘති මත පදනම් වූ පුරෝකථනය සහ ප්‍රතිපත්ති විශ්ලේෂණ පද්ධතිය විධිමත් කිරීම මගින් ශ්‍රී ලංකා මහ බැංකුව සිය අභ්‍යන්තර ආකෘතීකරණ සහ පුරෝකථන හැකියාව අඛණ්ඩව වැඩි දියුණු කරනු ඇත.

නම්‍යශීලී විනිමය අනුපාතික ප්‍රතිපත්තිය අඛණ්ඩව පවත්වාගෙන යෑමෙන්, ඉදිරි වසරවල දී වෙළෙඳපොළ තරගකාරිත්වයට සහ විදේශීය අංශයේ ස්ථාවරත්වයට මෙන්ම මැදිකාලීන ආර්ථික ස්ථාවරතාව සඳහා ද සහාය වනු ඇතැයි අපේක්ෂා කෙරේ. තව ද ශ්‍රී ලංකා විදේශ විනිමය සංගමය (Sri Lanka Forex Association), ACI මූල්‍ය වෙළෙඳපොළ සංගමය සහ වෙළෙඳපොළ සහභාගිවන්නන් සමඟ කරන ලද සාකච්ඡා තුළින් 2024 අවසන් වන විට, ගෝලීය විදේශ විනිමය පිළිබඳ ප්‍රශස්ත භාවිත සංග්‍රහය (FX Global Code) දේශීය විදේශ විනිමය වෙළෙඳපොළ තුළ ක්‍රියාත්මක කිරීමට මහ බැංකුවට හැකි වනු ඇතැයි අපේක්ෂා කෙරේ. පවත්නා වෙළෙඳපොළ තොරතුරු පිළිබිඹු කරන තරගකාරී මිල ගණන් යටතේ, විශ්වාසයෙන් හා ඵලදායී ලෙස වෙළෙඳපොළ සහභාගිවන්නන්හට ගනුදෙනු කිරීමට හැකි වන ශක්තිමත් හා සාධාරණ මෙන්ම ද්‍රවශීල, විවෘත සහ යෝග්‍ය විනිවිදභාවයක් සහිත වෙළෙඳපොළක් ප්‍රවර්ධනය කිරීම සඳහා පොදු මාර්ගෝපදේශ මාලාවක් සැපයීම අරමුණු කරගනිමින් දේශීය විදේශ විනිමය වෙළෙඳපොළ තුළ එය ක්‍රියාත්මක කෙරෙනු ඇත.

# මූල්‍ය පද්ධති ස්ථායීතාව සහතික කිරීම

මහ බැංකු පනත මගින් නියම කර ඇති පරිදි මූල්‍ය පද්ධති ස්ථායීතාව සහතික කිරීමේ තීරණාත්මක අරමුණ මහ බැංකුව වෙත පැවරී ඇත. සමස්ත ඉතුරුම් ඵලදායී ලෙස ආයෝජනය කිරීම, ඵලදායී ලෙස අවදානම් කළමනාකරණය කිරීම සහ බාධාවකින් තොරව ගෙවීම් සහ පියවීම් කටයුතු සිදු කිරීම සඳහා පහසුකම් සැලසීම යනාදියට ශක්තිමත් මූල්‍ය පද්ධතියක් පැවතීම අවශ්‍ය වේ. විශේෂයෙන්ම, ආර්ථික වර්ධනයට සහ ජනතා සුබසාධනයට සැලකිය යුතු බලපෑමක් ඇති නොවන අයුරින් ආර්ථික කම්පන සහ ආතතිමය තත්ත්වයන්ට ඔරොත්තු දීමට මූල්‍ය පද්ධතිය සමත් විය යුතුය. මූල්‍ය පද්ධතියේ මෙම වැදගත් භූමිකාව, කාර්යක්ෂම මූල්‍ය අතරමැදිකරණය සඳහා අවශ්‍ය පරිසරය සැකසීමටත්, එමගින් ආයෝජන තව දුරටත් දිරිමත් කිරීමටත්, ආර්ථික වර්ධනය වැඩි දියුණු කිරීමටත් දායක වේ.

## 2023 වසර තුළදී මූල්‍ය පද්ධති ස්ථායීතාව අඛණ්ඩව පවත්වා ගැනීම

පසුගිය වසර තුළදී ශ්‍රී ලංකාව මුහුණ දුන් විවිධ සාර්ව ආර්ථික ගැටලු, විදේශ ණය ගෙවීම තාවකාලිකව අත්හිටුවීම සහ දේශීය ණය ප්‍රශස්තකරණය වැනි බහුවිධ අභියෝගාත්මක තත්ත්වයන් මධ්‍යයේ, රටෙහි මූල්‍ය පද්ධතිය සැලකිය යුතු පීඩනයකට ලක් විය. කෙසේ වෙතත්, අර්බුද වලට පෙර සූදානම් වීම සහ අර්බුද කළමනාකරණය යනාදිය වැඩි දියුණු කිරීම තුළින් රටෙහි මූල්‍ය ස්ථායීතාව අඛණ්ඩව පවත්වා ගැනීමට මහ බැංකුව විසින් ප්‍රමුඛස්ථානය ලබා දෙන ලදි. මූල්‍ය පද්ධතිය සතු ඔරොත්තු දීමේ හැකියාව තව දුරටත් ශක්තිමත් කිරීම, සුපරීක්ෂාකාරී අධීක්ෂණය පවත්වා ගැනීම සහ මූල්‍ය ආයතන නියාමනය කිරීම සඳහා ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම තුළින් මූල්‍ය පද්ධතිය ඵලදායී ලෙස මෙහෙයවීමට මහ බැංකුව සමත් විය. මහ බැංකුව විසින් අනුගමනය කළ මෙම දූරදර්ශී පියවර, 2023 වසර තුළදී මුහුණ දීමට සිදුවූ අභියෝග රාශිය මධ්‍යයේ මූල්‍ය පද්ධති ස්ථායීතාව අඛණ්ඩව පවත්වා ගෙන යෑමට උපකාරී විය.

## ආර්ථික අර්බුදය හේතුවෙන් ඇති වන අවදානම් අවම කිරීම සහ අර්බුදවලට පෙර සූදානම් වීම වැඩි දියුණු කිරීම

මූල්‍ය පද්ධති ස්ථායීතාව සහතික කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිසංස්කරණ ක්‍රියාවට නැංවීම සම්බන්ධයෙන් මහ බැංකුව, ලෝක බැංකුව, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සහ ආසියානු සංවර්ධන බැංකුව වැනි අනෙකුත් බහුපාර්ශ්වික ආයතන සමඟ ක්‍රියාකාරීව සම්බන්ධ විය.

**2023 වසරේ දී මූල්‍ය පද්ධති ස්ථායීතාව ආරක්ෂා කිරීම**



ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම සඳහා වූ වැඩසටහන යටතේ ණය තිරසර ඉලක්ක සපුරාලීම සඳහා මුදල් අමාත්‍යාංශය විසින් 2023 වසරේ දී ප්‍රකාශයට පත් කරන ලද දේශීය ණය ප්‍රශස්තකරණ වැඩසටහන සඳහා මහ බැංකුව විසින් සැලකිය යුතු දායකත්වයක් ලබා දෙන ලදි. මෙම ක්‍රියාවලියේ දී, මූල්‍ය පද්ධති ස්ථායිතාව අඛණ්ඩව පවත්වා ගැනීම සඳහා මහ බැංකුව විසින් ප්‍රමුඛත්වය ලබා දුන් අතර, මූල්‍ය පද්ධතිය කෙරෙහි මහජන විශ්වාසය ඇති කිරීම සඳහා කාලෝචිත හා ඵලදායී සන්නිවේදන ක්‍රමවේදයන් සහාය විය. තවද, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම සඳහා වූ වැඩසටහන යටතේ ව්‍යුහාත්මක මිනුම් දඬු ලෙස, දේශීය බැංකු වත්කම්වලින් සියයට 90කට වඩා වැඩි ප්‍රමාණයක් නියෝජනය කරන දේශීය බැංකු 9ක් සඳහා පසුගිය වසරේ දී වත්කම්වල ගුණාත්මකභාවය පිළිබඳ සමාලෝචන පවත්වන ලදි. මෙම වත්කම්වල ගුණාත්මකභාවය පිළිබඳ සමාලෝචනවල ප්‍රතිඵල විචක්ෂණශීලීව අධ්‍යයනය කිරීම, සාර්ව මූල්‍ය තත්ත්වයන් මත පදනම්ව ආතති පරීක්ෂාවන් සිදු කිරීම සහ ප්‍රාග්ධන හිඟයන් පියවා ගැනීමේ අරමුණින් දේශීය හා විදේශීය ණය ප්‍රතිව්‍යුහගතකරණයේ බලපෑම ප්‍රතිප්‍රාග්ධනීකරණය කිරීම යනාදිය ක්‍රියාවට නැංවීම තුළින් තෝරාගත් බැංකු ප්‍රතිව්‍යුහගත කිරීම සහ ප්‍රාග්ධනය ඉහළ නැංවීම සඳහා වන පෙර දැක්ම ද මහ බැංකුව විසින් සකස් කරන ලදි. වත්කම්වල ගුණාත්මකභාවය පිළිබඳ සමාලෝචනය සහ ප්‍රතිප්‍රාග්ධනීකරණය සඳහා වූ එම පෙර දැක්ම සාර්ථකව නිම කිරීම මගින්, මූල්‍ය පද්ධති ස්ථායිතාව පවත්වා ගැනීමෙහිලා මනා ලෙස ප්‍රාග්ධනීකරණය වූ බැංකු පද්ධතියක් ඇති බවට සහතික කෙරේ. මීට අමතරව, 1988 අංක 30 දරන දැනට පවතින බැංකු පනතේ විධිවිධාන තවදුරටත් ශක්තිමත් හා විධිමත් කිරීමට සහ එහි අඩංගු විධිවිධාන ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූල වීම සහතික කිරීමට, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම සඳහා වූ වැඩසටහන යටතේ තවත් එක් ව්‍යුහාත්මක මිණුම් දණ්ඩක් වන බැංකු පනත සංශෝධනය කිරීමෙහි අවසන් අදියර මේ වන විට මහ බැංකුව විසින් ක්‍රියාත්මක කරනු ලබයි. මේ සම්බන්ධයෙන්, බැංකු පනතේ ප්‍රධාන සංශෝධන සඳහා ප්‍රතිපත්තිමය අනුමැතිය 2023 ජූනි මාසයේදී අමාත්‍ය මණ්ඩලයෙන් ලබා ගන්නා ලදි. තවද, බැංකු පනතේ සංශෝධන පිළිබඳ උපදේශන පත්‍රිකාව අදාළ පාර්ශ්වකරුවන්ගේ නිරීක්ෂණ සහ අදහස් සඳහා 2023 දෙවන භාගයේදී නිකුත් කරන ලද අතර අදාළ ඇල්මැති පාර්ශ්වකරුවන්ගේ අදහස් සුදුසු පරිදි ඇතුළත් කරමින්, බැංකු පනතට සංශෝධන 2023 අවසන් භාගයේදී කෙටුම්පත් කරන ලදි.

මූල්‍ය අංශයේ අර්බුද වලට පෙර සූදානම් වීමේ රාමුව ශක්තිමත් කිරීම සඳහා මහ බැංකුවේ සහ මුදල් අමාත්‍යාංශයේ නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් මූල්‍ය අංශයේ අර්බුද කළමනාකරණ කමිටුව (FCMC) සහ මූල්‍ය අංශයේ අර්බුද කළමනාකරණය පිළිබඳ තාක්ෂණික කමිටුව (TCMC) පිහිටුවන ලදි. මෙම කමිටුවල අරමුණු ලෙස මූල්‍ය අංශයේ ඇති විය හැකි පද්ධතිමය අර්බුද හඳුනා ගනිමින් ඉන් මූර්ත ආර්ථිකය කෙරෙහි ඇති වන බලපෑම් හඳුනා ගැනීම, එමගින් ඇති වන ගැටලු විසඳීම සහ මූල්‍ය අංශයට සිදුවිය හැකි හානි අවම කිරීම යනාදිය දැක්විය හැක. මීට අමතරව, මෙම කමිටු මගින් අන්තර් ආයතන මෙන්ම සම්බන්ධතා සම්බන්ධීකරණය සහ සන්නිවේදනය තුළින් ද සිය සහාය ලබා දේ.

## මූල්‍ය ආයතන අඛණ්ඩව අධීක්ෂණය කිරීම සහ නියාමනය

පවතින සාර්ව ආර්ථික අභියෝග මධ්‍යයේ මූල්‍ය පද්ධති ස්ථායිතාව සහතික කිරීම සඳහා මහ බැංකුව විසින් එමගින් නියාමනය සහ අධීක්ෂණය වන මූල්‍ය ආයතනවල (බලපත්‍රලාභී බැංකු, බලපත්‍රලාභී මුදල් සමාගම්, විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම්, බලපත්‍රලාභී ක්ෂුද්‍ර මූල්‍ය සමාගම් සහ ප්‍රාථමික අලෙවිකාර සමාගම්) ඔරොත්තු දීමේ හැකියාව පිළිබඳව සුපරීක්ෂාකාරී විය. 2023 වසරේ දී මහ බැංකුව විසින් විචක්ෂණතා සහ නියාමන අවශ්‍යතා පිළිබඳ විධාන, නීර්ණ සහ චක්‍රලේඛ නිකුත් කරන ලදි.

මහ බැංකුව විසින් බලපත්‍රලාභී බැංකු සඳහා වන ව්‍යවස්ථාපිත පරීක්ෂණ 2023 වසරේ දී අවදානම් මත පදනම් වූ ඒකාබද්ධ රාමුව යටතේ පවත්වන ලදි. තවද, පාරිභෝගික පැමිණිලි, ආයතනික පාලනය, රුපියල් ද්‍රවශීලතා තත්ත්වයන් සහ විනිමය ආයතනවල විදේශ විනිමය ගනුදෙනු පිළිබඳ සැලකිලිමත් වීම සම්බන්ධ කරුණු සත්‍යාපනය කිරීම සඳහා බලපත්‍රලාභී බැංකු කිහිපයක ස්ථානීය පරීක්ෂණ පවත්වන ලදි. තවද, මහ බැංකුව විසින් 2023 වසරේ දී බලපත්‍රලාභී මුදල් සමාගම් සහ ප්‍රාථමික අලෙවිකාර සමාගම් සඳහා ව්‍යවස්ථාපිත

පරීක්ෂණ පවත්වන ලද අතර, අධීක්ෂණ තුළින් හඳුනාගත් ප්‍රධාන ගැටලු පිළිබඳ නිර්දේශ සහ එවැනි ගැටලු නිවැරැදි කර ගැනීම සඳහා කාලානුරූපී ක්‍රියාකාරී සැලසුම්, අවශ්‍ය නිවැරදි කිරීම් සඳහා අදාළ සමාගම් වෙත දැනුම් දෙන ලදි. FinNet පද්ධතිය හරහා නියාමන තොරතුරු ඉදිරිපත් කිරීමේ ක්‍රියාවලිය නිවැරදි දැයි තහවුරු කර ගැනීමේ අරමුණින් බලපත්‍රලාභී මුදල් සමාගම් සඳහා ස්ථානීය පරීක්ෂණ ද පවත්වන ලදි. පූර්ව අනතුරු ඇඟවීමේ දර්ශක සමීපව නිරීක්ෂණය කිරීම සහ සුරක්ෂිත හා ශක්තිමත්භාවය සහතික කිරීම සඳහා මහ බැංකුව 2023 වසරේ දී සිය විෂය පථය යටතේ ඇති මූල්‍ය ආයතන අඛණ්ඩව අධීක්ෂණය කළේය.

කාර්යක්ෂමව මිල සොයාගැනීමේ ක්‍රියාවලියේ දී මුදල් වෙළෙඳපොළ, දේශීය විදේශ විනිමය වෙළෙඳපොළ සහ රාජ්‍ය සුරැකුම්පත් වෙළෙඳපොළ තුළ අතරමැදි භූමිකාවක් ඉටු කරන බලයලත් මුදල් තැරැව්කරුවන්ගේ ආචාර්ය ධර්ම අනුව හැසිරීම සහතික කිරීම සඳහා එම මෙහෙයුම් කටයුතු මහ බැංකුව විසින් අධීක්ෂණය කරන ලදි. තවද, මහ බැංකුව විසින් ගෙවීම් කාඩ්පත් සහ ජංගම ගෙවීම් පද්ධතිවල සේවාවන් සුමටව ක්‍රියාත්මක වීම සහතික කිරීම සඳහා එතැන් පරීක්ෂණ සහ දුරස්ථ අවේක්ෂණ කටයුතු සිදු කරන ලදි. තවද, ජංගම ගෙවීම් යෙදුම් භාවිතා කිරීමේ අවදානම අවම කිරීම සඳහා නිශ්චිත ආරක්ෂක අවශ්‍යතා සපුරාලීම සහතික කරන ගෙවීම් හා බැංකු යෙදුම් සඳහා අවම අනුකූලතා ප්‍රමිතීන් පිළිබඳ නිකුත් කරන ලද මාර්ගෝපදේශ සමඟ ජංගම ගෙවීම් යෙදුම් සැපයුම්කරුවන්ගේ අනුකූලතාව අඛණ්ඩව අධීක්ෂණය කරන ලදි.

## බැංකු නොවන මූල්‍ය ආයතන ඒකාබද්ධ කිරීම සඳහා වන සැලැස්ම

මැදි කාලීනව ශක්තිමත් සහ ඔරොත්තු දීමේ හැකියාව සහිත බලපත්‍රලාභී මුදල් සමාගම්/විශේෂිත කල්බදු මුල්‍යකරණ සමාගම් ඇති කිරීමේ අරමුණ ඇතිව බැංකු නොවන මූල්‍ය ආයතන සඳහා වූ ඒකාබද්ධකරණ වැඩසටහන මහ බැංකුව විසින් 2020 වසරේ දී ක්‍රියාත්මක කරන ලදි. තැන්පත්කරුවන්ගේ අවශ්‍යතා සුරක්ෂිත කිරීම සහ මූල්‍ය පද්ධතියේ සමස්ත ස්ථායීතාව සහතික කිරීමේ අරමුණින් මෙම වැඩසටහන මෙහෙයවනු ලැබේ. මෙම සැලැස්මෙහි පළමු අදියර යටතේ, 2023 වසර තුළ දී ගනුදෙනු දෙකක් සම්පූර්ණයෙන්ම අවසන් කරන ලදි.

## සාර්ව විචක්ෂණ අධිකාරිය පිහිටුවීම

මූල්‍ය පද්ධති ස්ථායිතාව සුරක්ෂිත කිරීම සඳහා මහ බැංකුවේ බලතල හා විෂය පථය පුළුල් කරමින් මහ බැංකු පනත මගින් මහ බැංකුව ශ්‍රී ලංකාවේ සාර්ව විචක්ෂණ අධිකාරිය ලෙස නම් කරනු ලැබීය. පද්ධතිමය අවදානම අවම කිරීම මගින් සාර්ව විචක්ෂණ ප්‍රතිපත්ති ක්‍රියා මාර්ග මූල්‍ය පද්ධතියේ ඔරොත්තු දීමේ හැකියාව ඉහල නංවනු ලබන අතර, එමගින් උග්‍ර ආර්ථික අර්බුදයක් සඳහා මග පාදමින් සැලකිය යුතු අලාභ ඇති කළ හැකි මූල්‍ය අර්බුදයක් ඇති වීමේ හැකියාව අවම කෙරේ.

මහ බැංකු පනත බලාත්මක වීමත් සමඟ මහ බැංකුව විසින් සිය සාර්ව විචක්ෂණ බලතල ක්‍රියාත්මක කිරීම සඳහා පියවර ගන්නා ලදි.  ජාත්‍යන්තර යහභාවිතාවන්ට අනුකූලවෙමින් දේශීය තත්ත්වයන්ට ගැළපෙන පරිදි සාර්ව විචක්ෂණ බලතල ක්‍රියාත්මක කිරීමේ රාමුව පිහිටුවීම මීට අතුළත් වේ. ඒ අනුව, වත්මන් සාර්ව විචක්ෂණ ප්‍රවේශයන් පිළිබඳ දැඩි විවරණයක් සිදු කළ අතර මහ බැංකු පනතට අනුකූලව යාවත්කාලීන වූ බලතල සමඟින් මූල්‍ය පද්ධති අධීක්ෂණ කමිටුව, මූල්‍ය පද්ධති ස්ථායීතා කමිටුව සහ සාර්ව විචක්ෂණතා අධ්‍යයන දෙපාර්තමේන්තුව යළි පිහිටුවනු ලැබීය.

අභියෝගාත්මක සාර්ව මූල්‍ය තත්ත්වයන් මගින් ඇති වූ හෝ ඇතිවිය හැකි බලපෑම් ඇගයීම සඳහා ආතති පරීක්ෂණ ක්‍රියාවලි භාවිත කරමින් සහ ආවේක්ෂණ වපසරිය පුළුල් කරමින් පද්ධතිමය අවදානම් අධීක්ෂණ ක්‍රියාවලිය මහ බැංකුව විසින් අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලදි.

මූල්‍ය පද්ධතියෙහි ඔරොත්තු දීමේ හැකියාව පවත්වා ගැනීමේ සාර්ව විචක්ෂණ අරමුණු ළඟා කර ගැනීම සඳහා භාවිතා කළ හැකි මෙවලම් සහ බලතල මහ බැංකු පනත මගින් මහ බැංකුව වෙත ලබා දී ඇත. එබැවින්, චක්‍රයට ප්‍රතිවිරුද්ධව ගොඩ නැගිය යුතු ප්‍රාග්ධන ස්වාරක්ෂකය (Countercyclical Capital Buffer - CCyB), නිවාස ණය සඳහා වූ වටිනාකම මත ණය අනුපාතය (LTV) සහ ණය සේවාකරණයට ආදායම් අනුපාතය (Debt Service to Income Ratio) වැනි සාර්ව විචක්ෂණ මෙවලම් දියත් කිරීම සඳහා ක්‍රමවේදයන් මහ බැංකුව විසින් වැඩි දියුණු කරන ලදි.

මෙම මෙවලම් හඳුන්වා දීම සඳහා සුදුසු පරිදි සාර්ව මූල්‍ය තත්ත්වයන් යහපත් වූ විට හෝ එවැනි මෙවලම් දියත් කිරීම සඳහා මූල්‍ය පද්ධතිය තුළ අදාළ තත්ත්වයන් අනාගතයේ දී ඇති වූ විට හෝ මහ බැංකුව විසින් එවැනි ප්‍රතිපත්ති ක්‍රියාත්මක කෙරේ.

මූල්‍ය ස්ථායීතා ප්‍රතිපත්තිවල මූලික අරමුණු සහ ඒවායේ ප්‍රධාන අංග ඉස්මතු කරමින් සහ එම ප්‍රතිපත්ති තුළ කලින් කලට සිදු කරනු ලබන වෙනස්කම් ඵලදායී ලෙස සන්නිවේදනය කිරීම වැදගත් වේ. තවද, ස්ථායීතාව සම්බන්ධ විවිධ පැතිකඩ පිළිබඳ පැහැදිලි ලෙස සන්නිවේදනය කිරීම මගින් වෙළෙඳපොළ සහභාගිවන්නන්හට විශ්වාසනීය තොරතුරු සමඟින් වෙළෙඳපොළ අවදානම ඇගයීම සඳහා පහසුකම් සපයනු ලබයි. එමගින්, මූල්‍ය ස්ථායීතාව සඳහා සහාය වන චර්යාත්මක වෙනස්කම් සඳහා මග පාදමින් මූල්‍ය අංශයේ වර්ධනයන් පිළිබඳ අවබෝධය ඉහළ නංවනු ලැබේ. එබැවින්, සාර්ව විචක්ෂණ ප්‍රතිපත්ති සහ මූල්‍ය ස්ථායීතාවයේ අනෙකුත් පැතිකඩ සන්නිවේදනය කිරීම සඳහා මහ බැංකුව විසින් ඵලදායී උපායමාර්ග සකස් කරන ලදි. ඒ අනුව, 2023 වසරේ දී මහ බැංකුව විසින් මූල්‍ය ස්ථායීතා විවරණය ප්‍රකාශයට පත් කළ අතර, එම මූල්‍ය ස්ථායීතා විවරණය සහ මූල්‍ය සාධනීය දර්ශක දියත් කිරීම සඳහා මාධ්‍ය හමුවක් ද පැවැත්විය.

## ගෙවීම් සහ පියවීම් පද්ධති සුමටව සහ කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීම

2023 වසර තුළ දී රට තුළ පවතින ගෙවීම් සහ පියවීම් පද්ධති සුමටව සහ කාර්යක්ෂමව ක්‍රියාත්මක විය. මහ බැංකුව විසින් තත්කාලීන දළ පියවීම් පද්ධතිය වැනි විශාල වටිනාකමින් යුත් ගෙවීම් පද්ධති මෙන්ම ක්ෂණික අන්තර් බැංකු හුවමාරු සඳහා භාවිතා වන විද්‍යුත් අරමුදල් පැවරීම සඳහා වූ පොදු යාන්ත්‍රණය (Common Electronic Fund Transfer Switch - CEFTS), පාරිභෝගිකයන්ට සෘජුවම සිය බැංකු ගිණුම් හරහා රජයේ ආයතනවලට ගෙවීම සිදුකිරීම සඳහා ඉඩ ලබා දෙන LankaPay මංගත වේදිකාව, (LPOPP) LANKAQR සහ JustPay සක්‍රීය කරන ලද ඕනෑම ජංගම යෙදුමකට බැංකු ගිණුම් කිහිපයක් සම්බන්ධ කරමින් ගෙවීම් කිරීමට හැකියාව ලබා දෙන JustPay ඇතුළු සුළු පරිමාණ ගෙවීම් පද්ධති ද කාර්යක්ෂමව ක්‍රියාත්මක කරන ලදි.

රාජ්‍ය ආයතන සහ සංස්ථාවලට මහජනාව විසින් සිදු කරනු ලබන ගෙවීම් ක්ෂණිකව සහ පහසුවෙන් සිය ගිණුම් වලට ලබා ගැනීම වර්ධනය කිරීම සඳහා මහ බැංකුව ප්‍රමුඛතාවය ලබා දුන්නේය. පළාත් පාලන මට්ටමේ රාජ්‍ය ආයතනද ඇතුළුව බොහෝ රාජ්‍ය ආයතන සඳහා අභ්‍යන්තර තොරතුරු තාක්ෂණ පද්ධති නොමැති වීම හේතුවෙන්, මහ බැංකුවේ මග පෙන්වීම යටතේ LankaPay පුද්ගලික සමාගම විසින් එම ආයතන සඳහා මහජනාවගෙන් ඩිජිටල් ගෙවීම් ලබා ගැනීම සඳහා රාජ්‍ය ඩිජිටල් ගෙවීම් වේදිකාව (Government Digital Payment Platform-GDPP) දියත් කරන ලදි. ඩිජිටල් ගනුදෙනු මාර්ග භාවිතය තව දුරටත් ඉහළ නැංවීම සඳහා මහ බැංකුව විසින් බලපත්‍රලාභී බැංකු LankaPay මංගත වේදිකාව, සෘජු හර පහසුකම්, ගනුදෙණුකරු හඳුනාගැනීමේ හවුල් යාන්ත්‍රණය (Shared KYC) සහ රාජ්‍ය ඩිජිටල් ගෙවීම් වේදිකාව වැනි පද්ධති හා සම්බන්ධ වීම අනිවාර්ය කරන ලදි.

## නිරාකරණ රාමුව වැඩි දියුණු කිරීම සහ ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණය

ශක්තිමත් නිරාකරණ රාමුවක් සහ තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමයක් මගින් මූල්‍ය පද්ධතියෙහි විශ්වාසනීයත්වය වැඩි දියුණු කරනු ලබන අතර එය මූල්‍ය පද්ධති ස්ථායීතාව සහතික කිරීමෙහිලා තීරණාත්මක වේ. එබැවින්, මහ බැංකුවේ නිරාකරණ අධිකාරිය සහ බලතල පැහැදිලි කරන 2023 අංක 17 දරන බැංකු (විශේෂ විධිවිධාන) පනත 2023 වසර තුළ දී බලාත්මක කරන ලදි. මෙම පනත මගින් මූල්‍ය ආරක්ෂණ ජාල, රජයේ උපදෙස් සහිතව ක්‍රියාත්මක කළ හැකි නව නිරාකරණ ක්‍රියාමාර්ග හඳුන්වා දෙනු ලැබූ අතර සිය නිරාකරණ අධිකාරිය ක්‍රියාවට නැංවීම සඳහා වූ වෙනම දෙපාර්තමේන්තුවක් ස්ථාපිත කිරීම සඳහා ද ප්‍රතිපාදන ඇතුළත් විය. බලපත්‍රලාභී බැංකු සඳහා අදාළ වන නිරාකරණ ක්‍රියාමාර්ග අවශ්‍ය විට දී බලපත්‍රලාභී මුදල් සමාගම් සඳහා ද යොදා ගැනීමට බැංකු (විශේෂ විධි විධාන) පනත තුළින් බලය ලබා දී ඇත.

මූල්‍ය පද්ධතිය පිළිබඳ වූ මහජන විශ්වාසය ගොඩනැගීම සඳහා මෙන්ම මූල්‍ය පද්ධතියෙහි ස්ථායීතාව සඳහා දායක වීමට සහ ප්‍රවර්ධනය කිරීමට බැංකු (විශේෂ විධිවිධාන පනත) මගින් ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමය

නෛතිකව පිහිටුවනු ලැබීය. 2023 වසර අවසන් වන විට ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමය සාමාජිකයින් 67කින් සමන්විත විය.

මහ බැංකුව විසින් "ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමය" නමින් නිතර අසන ප්‍රශ්න (FAQs) ද ඇතුළත්ව තැන්පතු රක්ෂණය පිළිබඳ මහජන දැනුම්වත්භාවය ඉහළ නැංවීම සඳහා වෙබ් පිටුවක් දියත් කරන ලදි. තවද, ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමයෙහි ආයතනික ව්‍යුහය ශක්තිමත් කිරීම සඳහා අවශ්‍ය ක්‍රියා මාර්ග ගන්නා අතරම හදිසි ආරක්ෂණ අරමුදලක් පිහිටුවීම සඳහා මුදල් අමාත්‍යාංශය සමඟ කටයුතු ආරම්භ කිරීමට පියවර ගන්නා ලදි. සමස්තයක් වශයෙන් බලපත්‍ර අවලංගු කරන ලද බලපත්‍රලාභී මුදල් සමාගම්වල තැන්පතුකරුවන් 73,650ක් සඳහා රුපියල් බිලියන 31ක් ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමය විසින් 2023 වසර අවසන් වන විට ගෙවා නිම කරන ලදි. ගෙවා නිම කරන ලද වන්දි ප්‍රමාණය රක්ෂිත මුළු අගය වන රුපියල් බිලියන 35.3න් සියයට 87.9ක් වේ.

## මූල්‍ය පාරිභෝගික ආරක්ෂණය වැඩි දියුණු කිරීම

2023 වසරේ දී, මහ බැංකුව මූල්‍ය පාරිභෝගිකයින් ආරක්ෂා කිරීමේ සහ මූල්‍ය සේවා සපයන්නන් අතර සාධාරණ සහ සදාචාරාත්මක පිළිවෙත් ඇති කිරීමේ අරමුණින් පියවර රාශියක් ගනු ලැබීය. විශේෂයෙන්, 2023 වසරේ අගෝස්තු මාසයේ දී මහ බැංකුව විසින් මූල්‍ය ආරක්ෂණ රාමුව පිළිබඳ විස්තරාත්මක රෙගුලාසි මාලාවක් නිකුත් කරන ලදි. තවද, එම රෙගුලාසි මගින් මූල්‍ය පාරිභෝගිකයින්ගේ ලැදියාවන් සුරක්ෂිත කිරීම සඳහා වූ ඵලදායී යාන්ත්‍රනයක් වන වෙළෙඳපොළ හැසිරීම් අධීක්ෂණය සිදු කිරීම සඳහා මහ බැංකුවට අවශ්‍ය බලතල ලබා දෙනු ඇත.

මූල්‍ය ආයතන සහ අගතියට පත් වූ පාර්ශවයන්ට සමතයකට පත් වීම සඳහා පහසුකම් සැලසීමේ අරමුණින් ආරවුල් නිරාකරණය කිරීම සඳහා විකල්ප මාවතක් සපයමින් මහ බැංකුව විසින් මූල්‍ය පාරිභෝගිකයින් විසින් ඉදිරිපත් කළ පැමිණිලි සහ දුක් ගැනවිලි සම්බන්ධයෙන්

### 2023 වසරේ දී මහ බැංකුව වෙත ලැබුණු පැමිණිලි සහ තොරතුරු විමසීම් පිළිබඳ කටයුතු කිරීම

2023 වසරේ දී ලැබුණු පැමිණිලි

**5,179**




ලැබුණු පැමිණිලිවලින් 84%ක් මාස දෙකක් ඇතුළත අවසන් කර/විසඳා ඇත

**ලැබුණු ප්‍රධාන පැමිණිලි/දුක්ගැනවිලි**

- මූල්‍ය පහසුකම් සඳහා සහන ඉල්ලීම්
- ඉහළ පොලී අනුපාත අය කිරීම
- ණය සහන කාලයන් පිළිබඳ ගැටලු
- පාරිභෝගික ඉල්ලීම් මත මූල්‍ය ආයතන මගින් තොරතුරු/ලේඛන ලබා නොදීම
- ඉහළ ගාස්තු හා කොමිස් මුදල් අය කිරීම

මහජනතාවගෙන් ලැබෙන දුරකථන ඇමතුම් සඳහා භාෂා ත්‍රිත්වයෙන්ම පිළිතුරු ලබා දීමට හැකියාව ඇති විශේෂ දුරකථන පහසුකමක් සහිත සම්බන්ධතා මධ්‍යස්ථානයක් මහ බැංකුව විසින් පවත්වාගෙන යනු ලබයි

**1935**

**57,498** | දුරකථනය හරහා තොරතුරු විමසීම් සඳහා ප්‍රතිචාර දැක්වීමේ ඉහළ අනුපාතයක් සහිතව පිළිතුරු ලබා දීමට සමත් විය

2023 වසර පුරාවටම කටයුතු කරන ලදි. මෙම වසර තුළ දී, මහ බැංකුව විසින් දුක්ගැනවිලි සහ පැමිණිලි 5,179 ක් පිළිබඳ සොයා බලන ලදි. තවද, මහජනතාවගෙන් ලැබෙන දුරකථන ඇමතුම් සඳහා භාෂා ත්‍රිත්වයෙන්ම පිළිතුරු ලබා දීමට හැකියාව ඇති විශේෂ දුරකථන පහසුකමක් සහිත සම්බන්ධතා මධ්‍යස්ථානයක් මහ බැංකුව විසින් පවත්වාගෙන යනු ලබයි. 2023 වසරේ දී සම්බන්ධතා මධ්‍යස්ථානය මගින් දුරකථනය හරහා තොරතුරු විමසීම් 57,000 කට අධික ප්‍රමාණයක් සඳහා ප්‍රතිචාර දැක්වීමේ ඉහළ අනුපාතයක් සහිතව පිළිතුරු ලබා දීමට සමත් විය.

## අනවසර මුදල් ව්‍යාපාර සහ තහනම් යෝජනා ක්‍රම පිළිබඳ විමර්ශනය කිරීම

අනවසර මුදල් ව්‍යාපාර සහ තහනම් යෝජනා ක්‍රම මගින් මූල්‍ය පද්ධතිය පිළිබඳ මහජන විශ්වාසය කෙරෙහි දැඩි බලපෑමක් සිදු කෙරේ. එබැවින්, මහ බැංකුව විසින් එවැනි තත්ත්වයන් පිළිබඳ අඛණ්ඩව අධීක්ෂණ කරන අතර එවැනි යෝජනා ක්‍රමවලට එරෙහිව ඉක්මන් පියවර ගනු ලැබේ. 2023 වසර තුළ දී, ලැබුනු පැමිණිලි සහ තොරතුරු මත පදනම්ව මහ බැංකුව විසින් අනවසර තැන්පතු ලබා ගැනීම සහ අනවසර මුදල් ව්‍යාපාර පිළිබඳව විමර්ශන 143ක් සිදු කරන ලදි. තවද, විමර්ශන 4ක් සම්බන්ධයෙන් මහ බැංකුව විසින් මුදල් ව්‍යාපාර පනතේ 44වැනි වගන්තිය යටතේ පනවා තිබූ ගනුදෙනු අත් හිටුවීමේ නියෝග සඳහා දීර්ඝ කිරීම් කොළඹ මහා අධිකරණය වෙතින් ලබා ගැනීමට කටයුතු කරන ලදි. තවද, විමර්ශන යටතේ පවතින ඒකක 8 කට අදාළ පාර්ශවයන් සඳහා විදෙස් ගමන් තහනම් අදාළ මහේස්ත්‍රාත් අධිකරණ වෙතින් ලබා ගැනීමට ද මහ බැංකුව විසින් කටයුතු කරන ලදි. මීට අමතරව, තහනම් යෝජනා ක්‍රම 8 කට අදාළව සිදු කළ විමර්ශන 2023 වසරේ දී නිමාවට පත් කළ අතර ඒවායේ වාර්තා ඉදිරි නීතිමය පියවර ලබා ගැනීම සඳහා නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කරනු ලැබීය. තවද, මහජනතාවගේ දැනුම්වත්භාවය ඉහළ නැංවීමේ සහ අගතියට පත්වීම වැළැක්වීමේ අරමුණින් මහ බැංකුව විසින් අවශ්‍ය විට දී මාධ්‍ය නිවේදන නිකුත් කළ අතර පාසල් ළමුන්, නීතිය බලාත්මක කිරීමේ ආයතන මෙන්ම මහජනතාව සඳහා ද දැනුම්වත් කිරීමේ වැඩසටහන් රට පුරා පවත්වන ලදි.

## මහ බැංකුවේ තිරසර මූල්‍ය ක්‍රියාකාරකම්

2023 වසර තුළදී, මහ බැංකුව ශ්‍රී ලංකාවේ තිරසර මූල්‍ය පෙර දැක්ම ක්‍රියාවට නැංවීම සඳහා කටයුතු රාශියක නිරත විය. 2022 වසරේ ශ්‍රී ලංකා හරිත මූල්‍ය වර්ගීකරණය නිකුත් කිරීමෙන් පසුව මූල්‍ය අංශයේ මේ පිළිබඳ හැකියාවන් වර්ධනය කිරීම සඳහා කාලීන අවශ්‍යතාව මතු විය. එබැවින්, එක්සත් ජාතීන්ගේ ආසියා පැසිෆික් කලාපීය ආර්ථික හා සමාජ කොමිසම (UNESCAP), ජාත්‍යන්තර මූල්‍ය සහයෝගීතාව (IFC) සහ තිරසර මූල්‍ය සහ බැංකු ජාලය (SBFN) වැනි බහුපාර්ශවීය ආයතනවල සහයෝගීත්වය ඇතිව වැඩසටහන් ගණනාවක් 2023 වසරේ දී පවත්වන ලදි. තවද, හරිත මූල්‍ය වර්ගීකරණය සම්බන්ධයෙන් මූල්‍ය ආයතනවලට ඇති තාක්ෂණික ගැටලු පැහැදිලි කර දීමේ අවශ්‍යතාවයට පිළියම් යෙදීමක් වශයෙන් මහ බැංකුව හරිත මූල්‍ය වර්ගීකරණය මගින් හඳුනාගත් අංශ පිළිබඳ තාක්ෂණික දැනුම සහිත විද්වත් කමිටුවක් පත් කරනු ලැබීය. තිරසර මූල්‍ය සඳහා වන ජාත්‍යන්තර වේදිකාවෙහි (IPSF) 20 වෙනි සාමාජික රට බවට ශ්‍රී ලංකාව පත්විය. මෙම වේදිකාව, මෙම අංශයට අදාළව හැකියාවන් සංවර්ධනය කිරීම සඳහා මෙන්ම එමගින් සංවිධානය කරන විවිධ සාකච්ඡා මණ්ඩප වලදි විවිධ රටවල අත්දැකීම් අනුසාරයෙන් දැනුම ලබා ගැනීම සඳහා ද පවතින වේදිකාවක් වන අතර එහි දී මහ බැංකුව විසින් ශ්‍රී ලංකාව නියෝජනය කෙරේ. තවද, මහ බැංකුව විසින් රට තුළ තිරසර මූල්‍ය කටයුතු ප්‍රවර්ධනය කිරීම සඳහා ජාත්‍යන්තර නියෝජිතායතන මෙන්ම දේශීය සහ ගෝලීය පාර්ශවකරුවන් සමග ද සමීපව කටයුතු කරන ලදි.

මූල්‍ය අංශයේ සිදු වන සංවර්ධනයන් 2023 වාර්ෂික ආර්ථික විවරණයෙහි මූල්‍ය අංශයෙහි සංවර්ධනයන් යන පරිච්ඡේදයෙහි සඳහන්ව ඇත.

## ඉදිරි දැක්ම

රටෙහි ආර්ථිකය යථා තත්ත්වයට පත් කිරීම සඳහා අඛණ්ඩව දායක වෙමින් මහ බැංකුව මූල්‍ය පද්ධති ස්ථායිතාව සහතික කිරීමට කටයුතු කරනු ඇත. දේශීය හා ජාත්‍යන්තර නියාමන සහ වෙළෙඳපොළ වර්ධනයන් සහ විශිෂ්ට පරිචයන්ට අනුකූලව විචක්ෂණ රෙගුලාසි නිකුත් කිරීම, සමාලෝචනය කිරීම සහ සංශෝධනය කිරීම

තුළින් මහ බැංකුව විසින් මූල්‍ය ආයතන අධීක්ෂණය සහ නියාමනය තවදුරටත් ශක්තිමත් කරනු ඇත. තවද, මහ බැංකුවේ පූර්ව අනතුරු ඇඟවීම් සහ අධීක්ෂණ රාමුව තීව්‍ර කිරීම මගින් අඛණ්ඩ ආවේක්ෂණය සහ බැංකු තිරසර ශ්‍රේණිගත කිරීමේ දර්ශකය තුළින් අවදානම් මත පදනම් වූ අධීක්ෂණය ශක්තිමත් කිරීමට ද අපේක්ෂා කෙරේ.

මීට අමතරව, අවදානමට ලක්විය හැකි සහ කුඩා හා මධ්‍යම පරිමාණ බලපත්‍රලාභී මූල්‍ය සමාගම්වල දිගුකාලීන තිරසරභාවය සහතික කිරීම සඳහා මහ බැංකුව විසින් මැදි කාලීනව ක්‍රියාත්මක කරනු ලබන බැංකු නොවන මූල්‍ය ආයතන සඳහා වන ඒකාබද්ධකරණ වැඩසටහනෙහි දෙවැනි අදියර ක්‍රියාත්මක කරනු ඇත.

මුදල් භාවිතයෙන් ගනුදෙනුකරුවන් ක්‍රමාණුකූලව ඉවත් කිරීම සඳහා රට තුළ ඩිජිටල් මූල්‍ය සාක්ෂරතාව අඩු වීම ප්‍රධාන අභියෝගයක් වී ඇත. එබැවින්, 2024 වර්ෂය තුළ ඩිජිටල් ගෙවීම් කාර්යක්ෂම, ආරක්ෂිත සහ ස්ථාවර ආකාරයකින් ව්‍යාප්ත කිරීමට සහ ඩිජිටල් ගෙවීම් පද්ධති/ක්‍රම පිළිබඳව මහජනතාව දැනුම්වත් කිරීමේ සැසි පවත්වා ගෙන යාමට මහ බැංකුව මූල්‍ය ආයතන සමඟ සමීපව කටයුතු කරනු ඇත.

තවද, සියලු පාර්ශවකරුවන් සඳහා සංක්‍රාන්තියක් සහතික කරමින් රෙගුලාසි සහ වෙළෙඳපොළ හැසිරීම් අධීක්ෂණය ක්‍රමානුකූලව ක්‍රියාත්මක කිරීමට ද මහ බැංකුව අපේක්ෂා කරයි. තවද, ශ්‍රී ලාංකික පාරිභෝගිකයන් වෙත අවශ්‍ය තොරතුරු පුළුල් ලෙස බෙදා හැරීම සහතික කරමින්, 2024 වසරේදී ජනමාධ්‍ය නාලිකා හරහා මූල්‍ය පාරිභෝගික දැනුම්වත් කිරීමේ වැඩසටහන් පුළුල් කිරීමට ද සැලසුම් කර ඇත.

මූල්‍ය පද්ධතියේ ඔරොත්තු දීමේ හැකියාව වැඩිදියුණු වන පරිදි, පද්ධතිමය අවදානම් ගොඩ නැගීම අවම කිරීම සඳහා අවශ්‍ය විට දී මහ බැංකුව විසින් සුදුසු සාර්ව විචක්ෂණ උපකරණ හඳුන්වා දෙනු ඇත. සාර්ව විචක්ෂණතා ආවේක්ෂණය සහ ප්‍රතිපත්ති සම්පාදනය හා සම්බන්ධ ජාත්‍යන්තර යහභාවිතාවන් අනුව අනුගත වීම සඳහා මහ බැංකුව සාර්ව විචක්ෂණ ප්‍රවේශය යාවත්කාලීන කිරීම අඛණ්ඩව සිදු කරනු ඇත.

මෙම අංශයේ ඉදිරි දැක්ම පිළිබඳ වැඩිදුර විස්තර 2023 වාර්ෂික ආර්ථික විවරණයෙහි දේශීය ආර්ථික ඉදිරි දැක්ම යන පරිච්ඡේදයෙහි ඇතුළත් ය.

# සියලු දෙනාටම ප්‍රතිලාභ හිමි දියුණු මූල්‍ය පද්ධතියක් ප්‍රවර්ධනය කිරීම

හුදෙක් මූල්‍ය නිෂ්පාදන සහ සේවා සඳහා ප්‍රවේශයක් සැපයීමට වඩා පුළුල් අරුතක් මූල්‍ය අන්තර්ගතභාවයෙහි වත්මන් ප්‍රතිපත්ති තුළ අවධාරණය කෙරේ. එය මූල්‍ය සඳහා ප්‍රවේශය වැඩි කිරීමේ සම්ප්‍රදායික දෘෂ්ටි කෝණයෙන් බැහැර වෙමින් මූල්‍ය සේවාවන්හි නිසි භාවිතය සහ ඒවායෙහි ගුණාත්මකභාවය ඉහළ නැංවීම කෙරෙහි අවධානය යොමු වූ වඩාත් පරිපූර්ණ ප්‍රවේශයකට නැඹුරු වී ඇත. මූල්‍ය අන්තර්ගතභාවය ප්‍රවර්ධනය කිරීම සඳහා වූ රටේ ප්‍රථම ජාතික මට්ටමේ ප්‍රතිපත්ති රාමුව විසින් මෙම ප්‍රතිපත්තිමය වෙනස රටට හඳුන්වා දෙන ලදි. මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ ජාතික උපාය මාර්ගය (NFIS 2021) ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මෙහෙයවනු ලබන බහු පාර්ශ්වීය ප්‍රයත්නයක් වන අතර එය ජාතික මට්ටමේ පාර්ශ්වකරුවන් රැසක් සමඟ සහයෝගිතාවයෙන් ක්‍රියාත්මකව පවතී.

## 2023 වසර තුළ මූල්‍ය අන්තර්ගතභාවය ප්‍රවර්ධනය කිරීම

වඩාත් ඉහළ ජීවන තත්ත්වයක් උදෙසා වඩාත් ගුණාත්මක, සියලුදෙනාටම ප්‍රතිලාභ හිමිවන අන්තර්ගතභාවයක් යන දැක්ම ඇතිව 2021 වසරේ දී දියත් කරන ලද මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ උපාය මාර්ග ක්‍රියාත්මක කිරීමේ තුන් වැනි වර්ෂය 2023 වසරේ දී සනිටුහන් කරන ලදි. එය ශ්‍රී ලංකාවේ සියලුම පුද්ගලයන් හා ව්‍යවසායන් හොඳින් දැනුම්වත් වූ, උසස් තත්ත්වයේ සුදුසු ආරක්ෂාකාරී සහ දැරිය හැකි මූල්‍ය නිෂ්පාදන සහ සේවා පරාසයක් සඳහා ප්‍රවේශයක් හරහා රටේ ආර්ථික වර්ධනයට සහ ජීවන තත්ත්වය වැඩි දියුණු කිරීමට දායක වේ.

ප්‍රධාන ක්ෂේත්‍ර හතරක් කෙරෙහි අවධානය යොමු කර ඇති මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ ජාතික උපාය මාර්ගයෙහි ක්‍රියාකාරි සැලැස්ම ක්‍රියාත්මක කිරීම සඳහා

### ශ්‍රී ලංකාවේ මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ ජාතික උපාය මාර්ගයෙහි අවධානය යොමු කරන ක්ෂේත්‍ර සහ සක්‍රිය කාරකයන්

**අවධානය යොමු කරන ක්ෂේත්‍ර**

- 01 ඩිජිටල් මූල්‍ය සහ ගෙවීම්
- 02 ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායී මූල්‍ය
- 03 පාරිභෝගික ආරක්ෂණය
- 04 මූල්‍ය සාක්ෂරතාවය සහ ධාරිතා ගොඩනැංවීම

**සක්‍රීය කාරකයන්**

- 01 දත්ත
- 02 යටිතල පහසුකම්
- 03 ප්‍රතිපත්ති සහ නියාමන පරිසරය සක්‍රිය කිරීම

ශ්‍රී ලංකා මහ බැංකුව ජාතික මට්ටමේ පාර්ශ්වකරුවන් 20 දෙනෙකු සමඟ සහයෝගයෙන් කටයුතු කරන ලදි. මෙම ක්‍රියාකාරී සැලැස්ම, පුළුල් අරමුණු 26ක් සාක්ෂාත් කර ගැනීමට අවශ්‍ය ක්‍රියාවන් 80කින් සමන්විත වේ. 2023 වසර අවසාන වන විට ක්‍රියාකාරී සැලැස්මේ කාර්ය සාධන මට්ටම සියයට 75.9ක් ලෙස හඳුනාගෙන ඇත.

2023 වසරේ දී වඩාත් ඩිජිටල්කරණය වූත්, විවිධාංගීකරණය වූත්, සියලු දෙනාටම ප්‍රතිලාභ හිමිවන සහ මූල්‍යමය වශයෙන් ඔරොත්තු දෙන ආර්ථිකයකට සහය වීම අරමුණු කර ගනිමින් මූල්‍ය පද්ධතිය ප්‍රවර්ධනය කිරීම සඳහා මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ ජාතික උපායමාර්ගය විසින් මෙහෙයවන ලද උපායමාර්ගික දිශානතිය ශ්‍රී ලංකා මහ බැංකුව විසින් තව දුරටත් වැඩි දියුණු කරන ලදි. මෙම දිගුකාලීන කර්තව්‍ය ශක්තිමත් කරමින් මූල්‍ය අන්තර්ගතභාවය ප්‍රවර්ධනය කිරීම ශ්‍රී ලංකා මහ බැංකු පනත මඟින් ශ්‍රී ලංකා මහ බැංකුවේ ව්‍යවස්ථාපිත වගකීමක් ලෙස පිළිගෙන ඇත.

## මූල්‍ය සේවාවන්හි ඩිජිටල්කරණයේ ප්‍රවර්ධනය

ගෙවීම් සහ පියවීම් පද්ධතිවල ආරක්ෂාව, කාර්යක්ෂමතාව සහ විශ්වාසනීයත්වය සහතික කිරීම ශ්‍රී ලංකා මහ බැංකුව වෙත පැවරී ඇති වගකීමකි. අඛණ්ඩව දියුණු වන මූල්‍ය පද්ධතියක් ඇති කිරීම සඳහා දායක වීමට රටේ ඩිජිටල්කරණ වැඩපිළිවෙල බොහෝ මුලපිරීම් ක්‍රියාත්මක කරන ලදි. මෙම මුලපිරීම් මගින් පැහැදිලිවම ඩිජිටල් ගනුදෙනු පිළිබඳ මහජන විශ්වාසය සහ ඉලෙක්ට්‍රොනික, සුළු පරිමාණ ගෙවීම් පද්ධති සහ උපකරණවල භාවිතය ඉහළ යන ලදි.

රජයේ ඩිජිටල් ආර්ථික න්‍යාය පත්‍රයට අනුකූලව ගෙන ඇති මුලපිරීම්වලට අමතරව 2023 වසරේ දී තත් කාලීන ගනුදෙනු දැනුම් දීම් සක්‍රීය කිරීම, දුරස්ථ ප්‍රදේශවල ඩිජිටල් ගනුදෙනු සඳහා පහසුකම් සැලසීම, ඩිජිටල් නාලිකා හරහා ණයපත් පියවීම් ක්ෂණිකව යාවත්කාලීන කිරීම සහ ඩිජිටල් ගනුදෙනු සඳහා අනිවාර්ය යොමු බලාත්මක කිරීමට බලපත්‍රලාභී වාණිජ බැංකු යොමු කරන ලදි. එපමණක් නොව බලපත්‍රලාභී බැංකුවලට වෙළෙඳ වට්ටම් අනුපාත පාරිභෝගිකයන් වෙත නොපවරන ලෙසට උපදෙස් ලබා දෙන ලදි. එමගින් ඩිජිටල් ගනුදෙනු වලදි පාරිභෝගික පහසුව සහ දැරිය හැකි බව අවධාරණය කරමින් ගෙවීම් කාඩ්පත් භාවිතය ප්‍රවර්ධනය කරන ලදි.

## LankaPay හි ජාත්‍යන්තර සහයෝගිතා

අදාළ රට හෝ අධිකාරිය විසින් බලය පවරනු ලබන සහ නියාමනය කරනු ලබන කලාපීය සහ රටේ ගෙවීම් ජාල කිහිපයක් සමඟ සම්බන්ධ වීමට LankaPay සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව අනුමැතිය ලබා දෙන ලදි. මෙම ක්‍රියාවලියට පහසුකම් සපයමින් ජාත්‍යන්තර ගෙවීම් ජාලයට සම්බන්ධ ව ජංගම යෙදුම්වලින් ගෙවීම් භාරගැනීමට LankaPay වෙළෙඳුන්ව සක්‍රීය කරන ලෙස ශ්‍රී ලංකා මහ බැංකුව සියලුම බලපත්‍රලාභී බැංකු වෙත දැනුම් දෙන ලදි.

ඩිජිටල් ගෙවීම් පද්ධතිවල ව්‍යාප්තිය වැඩි කරන අතරම, ගෙවීම් පද්ධතිවල ආරක්ෂාව සහ ඔරොත්තු දීමේ හැකියාව සහතික කිරීම කෙරෙහි ශ්‍රී ලංකා මහ බැංකුව තව දුරටත් අවධානය යොමු කරන ලදි. ඒ අනුව ඩිජිටල් ගනුදෙනු ආශ්‍රිතව පැන නගින ගැටලු සඳහා විසඳුම් සෙවීමට ශ්‍රී ලංකා මහ බැංකුව පියවර ගන්නා ලදි. විනිවිදභාවය සහ වගවීම් ඉස්මතු කරමින් ගෙවීම් සේවාවල ඇතිවිය හැකි අවදානම් පිළිබඳ ප්‍රතිචාර රැස් කිරීම් සඳහා ත්‍රෛභාෂා වෙබ් පෝරමයක් හඳුන්වා දීම මෙහි එක් අංගයකි. පාරිභෝගික විශ්වාසය සහ ආරක්ෂාව තහවුරු කිරීම අරමුණු කර ගනිමින්, ජංගම යෙදුම් ගනුදෙනුවල වංචා අවදානම් නිරාකරණය කිරීම සඳහා අතිරේක ආරක්ෂණ පියවරක් ලෙස JustPay හරහා සිදු කරනු ලබන රුපියල් 10,000ට ඉහළ වටිනාකමකින් යුත් ජංගම ගෙවීම්වලදි එක් වරක් වලංගු මුරපද (OTP) වැනි අමතර ආරක්ෂක පියවර අනුගමනය කරන ලෙස බලපත්‍රලාභී බැංකු වෙත මහ බැංකුව නියම කරන ලදි.

පවතින මෙන්ම ඉදිරියේ දී හඳුන්වා දෙනු ලබන මූල්‍ය අන්තර්ගතභාවයට අදාළ නිෂ්පාදන සහ සේවාවන් තුළින් පැන නගින මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදී මූල්‍යකරණ අවදානම් තක්සේරු කිරීමේ අරමුණින්, 2023 වසරේ ශ්‍රී ලංකා මහ බැංකුව ජාතික අවදානම් තක්සේරුවේ කොටසක් ලෙස මූල්‍ය අන්තර්ගතභාවයට අදාළ නිෂ්පාදන සහ සේවාවන්වල අවදානම් තක්සේරුව සිදු කරන ලදි.

2023 වසර තුළ දී, මූල්‍ය අන්තර්ගතභාවය ප්‍රවර්ධනය කිරීම සඳහා e-KYC මාර්ගෝපදේශ නිකුත් කරන ලදි. තවද,

අඩු අවදානම් සහිත පාරිභෝගිකයන්/ නිෂ්පාදකයින් ට සරල කළ යුතු නිසි උද්යෝගි පිරික්සුම් (Due Diligence) විධිවිධාන ඇතුළුව මූල්‍ය ගනුදෙනු මාර්ගගත කිරීමේ පනතට අවශ්‍ය සංශෝධන ඇතුළත් කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුව කටයුතු කරනු ලබයි.

## මූල්‍ය නිෂ්පාදන සහ සේවා සඳහා ප්‍රවේශය වැඩි දියුණු කිරීම

විධිමත් ආයතන විසින් සපයනු ලබන මූල්‍ය සේවාවන් සඳහා කාර්යක්ෂම සහ ඵලදායී ප්‍රවේශයක් ඇති කිරීම සියලු දෙනාටම ප්‍රතිලාභ හිමි මූල්‍ය පද්ධතියක් සඳහා පූර්ව අවශ්‍යතාවකි.

මූල්‍යමය වශයෙන් බැහැරවී සිටින සහ අඩු පහසුකම් සහිත ජන කණ්ඩායම් වල අවශ්‍යතාවට ප්‍රතිචාර වශයෙන් නව බැංකු ශාඛා, ශිෂ්‍ය ඉතුරුම් ඒකක, ස්වයං ටෙලර් යන්ත්‍ර, මුදල් තැන්පත් කිරීමේ සහ ලබා ගැනීමේ යන්ත්‍ර වැනි ස්වයං සේවා පහසුකම් ග්‍රාමීය සහ බැංකු ශාඛා රහිත ප්‍රදේශවල විවෘත කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව ලියාපදිංචි මූල්‍ය ආයතන සඳහා අඛණ්ඩව පහසුකම් සපයන ලදී.

පැවැති පසුගාමී සාර්ව ආර්ථික තත්ත්වයන් නිසා දැඩි පීඩාවට පත් වූ පුද්ගලයන්ට සහ ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්ට සහය වීම සඳහා අවස්ථානුකූලව වඩා සුදුසු මූල්‍ය සහන ලබා දෙන ලෙස බලපත්‍රලාභී මූල්‍ය සමාගම් සහ විශේෂිත ලීසිං සමාගම් වෙතින් ඉල්ලා සිටින ලදී. 2023 වසරේ අගෝස්තු මාසයේ දී බලපත්‍රලාභී බැංකුවල තෝරා ගත් මූල්‍ය උපකරණ මත අය කළ හැකි උපරිම පොලී අනුපාත සීමාවන් පනවන ලදී.

## ඉහළ මූල්‍ය සාක්ෂරතා මට්ටමක් හරහා ශ්‍රී ලාංකිකයන් සවිබල ගැන්වීම

2023 වසර තුළ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මහජනතාවගේ මූල්‍ය සාක්ෂරතාව ඉහළ නැංවීම සඳහා වැඩසටහන් රැසක් පවත්වන ලදී. අයවැයකරණය, ආයෝජනය, හර

**මූල්‍ය සාක්ෂරතා මාර්ගෝපදේශ රාමුව**



සහ බැර, ඉතුරුම් සහ විශ්‍රාම සැලසුම්, ඩිජිටල් ගෙවීම් ක්‍රම, මූල්‍ය ආයතන සහ නිෂ්පාදන යාන්ත්‍රණය සහ මූල්‍ය ක්ෂේත්‍රයේ පාරිභෝගික අයිතිවාසිකම් සහ වගකීම් පිළිබඳව මහජනතාව දැනුම්වත් කිරීම සඳහා සකසන ලද පුළුල් මාධ්‍ය ප්‍රචාරණ මෙයට ඇතුළත් වේ. තවද, ලියාපදිංචි මූල්‍ය ආයතන ඇතුළුව අදාළ පාර්ශ්වකරුවන් ඉලක්ක කර ගත් ධාරිතා සංවර්ධන වැඩසටහන් සහ තාක්ෂණික උපකාරක වැඩසටහන් කිහිපයක් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පවත්වන ලදි. විවිධ පාර්ශ්වකරුවන් විසින් සිදු කරනු ලබන මූල්‍ය සාක්ෂරතා ප්‍රවේශයන් විධිමත් කිරීම සඳහා මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ ජාතික උපයමාර්ගයෙහි කොටසක් ලෙස ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බහුපාර්ශ්වකරුවන් සමග එක්ව ශ්‍රී ලංකාවේ මූල්‍ය සාක්ෂරතා මාර්ගෝපදේශය සකස් කරන ලදි. ශ්‍රී ලාංකිකයන්ට වඩාත් දැනුම්වත් මූල්‍ය තීරණ ගැනීමේ හැකියාව ඇති කරමින් ඔවුන්ගේ මූල්‍ය හැසිරීම් සහ හැකියාවන් ඉහළ නැංවීම, මෙහි අරමුණ වේ. මූල්‍ය සාක්ෂරතාවයෙන් හෙබි ශ්‍රී ලංකාවක් යන දැක්ම සමඟින් ශ්‍රී ලංකාවේ මූල්‍ය සාක්ෂරතා මාර්ගෝපදේශය 2024 වසරේ පළමු භාගයේ දී දියත් කෙරෙනු ඇත. මෙම මාර්ගෝපදේශය ක්‍රියාත්මක කිරීම සඳහා, වසර 5ක කාලයක් (2024-2028) සඳහා වූ පුළුල් ක්‍රියාකාරී සැලැස්මක් පාර්ශ්වකරුවන් විසින් සකස් කරනු ලැබ ඇත.

ශ්‍රී ලංකා මහ බැංකුව එහි සන්නිවේදන උපාය මාර්ග යටතේ, විවිධ විද්‍යුත් හා ඩිජිටල් මාධ්‍ය හරහා මූල්‍ය සාක්ෂරතාව සහ සවිබල ගැන්වීමේ වැඩසටහන් රට පුරා ප්‍රවර්ධනය කරන ලදි. තත්කාලීන ප්‍රතිචාර වල වැදගත්කම සහ එහි බලපෑම හඳුනාගෙන, ශ්‍රී ලංකා මහ බැංකුවේ මහජන ප්‍රවේශය වැඩි දියුණු කිරීම සහ විවිධ මහජන කණ්ඩායම් වෙත නිශ්චිත තොරතුරු වඩාත් ඵලදායී අයුරින් ලබා දීම සඳහා මහ බැංකුව සමාජ මාධ්‍ය වඩාත් පුළුල් ලෙස භාවිතා කරන ලදි.

## ශ්‍රී ලංකාවේ මූල්‍ය සාක්ෂරතා මට්ටම වැඩි දියුණු කිරීම සඳහා වන ශ්‍රී ලංකා මහ බැංකුවේ සන්නිවේදන උපායමාර්ගය



## ඉදිරි දැක්ම

මහ බැංකු පනත යටතේ මූල්‍ය අන්තර්ගතභාවය ප්‍රවර්ධනය කිරීමේ ව්‍යවස්ථාපිත වගකීමක් ශ්‍රී ලංකා මහ බැංකුව වෙත පැවරී ඇති පසුබිමක, මූල්‍ය අංශයේ සැපයුම සහ ඉල්ලුම යන දෙඅංශයම ආවරණය වන පරිදි ජාතික මට්ටමින් මූල්‍ය අන්තර්ගතභාවයෙහි මුලපිරීම් වෙනුවෙන් පෙනී සිටීම සඳහා ඇති අවශ්‍යතාව වඩාත් පැහැදිලි වේ. ජාතික සංවර්ධන ප්‍රතිපත්ති අරමුණු සමඟ අඛණ්ඩව ඒකාබද්ධ වෙමින් වෙනස් වන මූල්‍ය පරිසරයට සහ මූල්‍ය අවශ්‍යතාවලට අනුගතවෙමින්, හවුල්කාරිත්වය ශක්තිමත් කිරීම, අධීක්ෂණය සහ ඇගයීම සඳහා ශක්තිමත් යාන්ත්‍රණයක් අඛණ්ඩව සැපයීම ශ්‍රී ලංකා මහ බැංකුවේ අපේක්ෂාවන් වේ.

මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ ජාතික උපාය මාර්ගයෙහි I වන අදියර ක්‍රියාත්මක කිරීම 2024 වන විට අවසන් වනු ඇත. සමස්ත ප්‍රගතිය සහ ප්‍රතිපත්තිමය බලපෑම ඇගයීමෙන් අනතුරුව ශ්‍රී ලංකා මහ බැංකුවෙහි මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ ජාතික උපාය මාර්ගය II වන අදියර ක්‍රියාත්මක කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුව අපේක්ෂා කරයි. ඒ යටතේ දේශගුණික විපර්යාසවල සෘණාත්මක බලපෑම අවම කිරීමට සහ ඒවාට ඔරොත්තු දීමේ හැකියාව ගොඩනැංවීමට ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්ට සහය වීම සඳහා "හරිත මූල්‍යකරණය" ප්‍රවර්ධනය සඳහා විශේෂ අවධානයක් යොමු කෙරෙනු ඇත. 2024 වසරේ මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ ජාතික උපාය මාර්ගය II වන අදියර ක්‍රියාත්මක කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුව අපේක්ෂා කරනු ලබයි.

දැනුම්වත් මූල්‍ය තීරණ ගැනීමට සහ මූල්‍යමය වශයෙන් ඔරොත්තු දීමේ හැකියාව වැඩි දියුණු කිරීම මඟින් ශ්‍රී ලාංකිකයන් අතර මූල්‍ය හැසිරීමේ වෙනසක් ඇතිකරලීමේ තිරසාර අවශ්‍යතාව සපුරාලීමේ අදහසින් මූල්‍ය සාක්ෂරතා මාර්ගෝපදේශය 2024 වසරේ මැද භාගයේ සිට ක්‍රියාත්මක කෙරෙනු ඇත.

# ව්‍යවහාර මුදල් මෙහෙයුම් කළමනාකරණය

ශ්‍රී ලංකා මහ බැංකු පනත ප්‍රකාරව ශ්‍රී ලංකාවේ ව්‍යවහාර මුදල් නිකුත් කිරීම සහ කළමනාකරණය කිරීමේ පරම අධිකාරිය ශ්‍රී ලංකා මහ බැංකුව වෙත පැවරී ඇත. ව්‍යවහාර මුදල් නිකුත් කිරීමට සැලසුම් කරනු ලබන අදියරේ සිට බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් තැන්පත් කරනු ලබන ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසි හැසිරවීම දක්වා ව්‍යවහාර මුදලේ සමස්ත ජීවන චක්‍රය කළමනාකරණය කිරීමේ ක්‍රියාවලිය හෙවත් ව්‍යවහාර මුදල් කළමනාකරණය කිරීමේ වගකීම මහ බැංකුවේ ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇත. මෙම වගකීම සමඟින්, සංසරණයේ පවතින ව්‍යවහාර මුදල් නෝට්ටු සුදුසු ප්‍රමිතියකින් පවත්වා ගෙන යාම සඳහා ව්‍යවහාර මුදල් නෝට්ටු සැකසීම සහ සුදුසු ප්‍රමිතිය නොමැති මුදල් නෝට්ටු සංසරණයෙන් ඉවත් කිරීමේ වගකීම ද පැවරී ඇත. අධිකරණ සහ නීති ක්‍රියාත්මක කිරීමේ අංශ හරහා ව්‍යාජ මුදල් නෝට්ටු නිෂ්පාදනය වැළැක්වීම සඳහා ද මහ බැංකුව විසින් සිය සහාය සපයනු ලැබේ. ඒ අනුව ව්‍යවහාර මුදල් කළමනාකරණ ක්‍රියාවලියේ සුමට ක්‍රියාකාරීත්වය සඳහා බලපත්‍රලාභී වාණිජ බැංකු සහ අදාළ අධිකාරීන් සමඟ මහ බැංකුව සමීපව කටයුතු කරනු ලැබේ.

## ව්‍යවහාර මුදල් මෙහෙයුම් කටයුතු

ව්‍යවහාර මුදල් නිකුත් කිරීමේ පරම අධිකාරිය ලෙස ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මහජන ඉල්ලුම සපුරාලීම සඳහා ප්‍රමාණවත් ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසි සැපයීම තහවුරු කළ යුතු වේ. ඒ අනුව, 2023 වසරේ දී නව ව්‍යවහාර මුදල් නෝට්ටු මිලියන 250 ක් ඇණවුම් කරන ලදි. මහ බැංකුව විසින් බලපත්‍රලාභී වාණිජ බැංකු වෙත ඔවුන්ගේ ඉල්ලීම මත සෘජුව හෝ මුදල් ප්‍රවාහන (Cash-In-Transit) සමාගම් හරහා ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසි තොග නිකුත් කරනු ලැබේ. 2023 වසර තුළ මහ බැංකුව විසින් රුපියල් බිලියන 469.28 ක වටිනාකමින් යුත් ව්‍යවහාර මුදල් නෝට්ටු සහ රුපියල් මිලියන 571.95 ක වටිනාකමින් යුත් කාසි මුදල් සංසරණය වෙත නිකුත් කරන ලදි. ප්‍රමාණවත් පරිදි ව්‍යවහාර මුදල් තොග පවත්වා ගැනීම තහවුරු කිරීම සඳහා සහ හදිසි අවස්ථා සඳහා මුහුණ දීමේ පියවරක් ලෙස සුරක්ෂිතාගාරවල නිසි ප්‍රමාණයෙන් ව්‍යවහාර මුදල් තොග පවත්වා ගැනීම අඛණ්ඩව සිදු කරන ලදි.

2023 වසරේ දී මහ බැංකුව රුපියල් බිලියන 311.49 ක වටිනාකමින් යුත් සේවා නිසි (සුදුසු) ව්‍යවහාර මුදල් නෝට්ටු සහ සේවා අනිසි (නුසුදුසු) ව්‍යවහාර මුදල් නෝට්ටු ඇපකර තැන්පතු ලෙස බලපත්‍රලාභී වාණිජ බැංකු වෙතින් භාර ගන්නා ලදි. මෙම ඇපකර තැන්පතු භාර ගනු ලබන්නේ අදාළ බලපත්‍රලාභී වාණිජ බැංකුවේ නිලධාරින් ඉදිරිපිට ගණන් කරනු ලබන අවස්ථාවේ දී යම් විෂමතාවයක් පවතින්නේ නම් එය නිවැරදි කිරීමේ එකඟතාව පළ කළ ඇපකර ලිපියක් සමඟිනි.

මහ බැංකුව ව්‍යවහාර මුදල් නෝට්ටු තැන්පතු සකස් කිරීම මුදල් සැකසුම් යන්ත්‍ර කිහිපයක් භාවිතා කරමින් සිදු කරයි.



| වාර්ෂික මෙහෙයුම් දත්ත - ව්‍යවහාර මුදල් නෝට්ටු | රු. 5000 | රු. 1000 | රු. 500 | රු. 100 | රු. 50 | රු. 20 | එකතුව |
|---|---|---|---|---|---|---|---|
| නිකුතු (රුපියල් බිලියන) | 375.23 | 66.51 | 20.17 | 6.08 | 0.71 | 0.58 | **469.28** |
| තැන්පතු (රුපියල් බිලියන) | 229.28 | 60.14 | 15.26 | 5.45 | 0.89 | 0.47 | **311.49** |
| සේවා අනිසි මුදල් නෝට්ටු විනාශ කිරීම (රුපියල් බිලියන) | 28.15 | 34.55 | 10.24 | 5.44 | 0.91 | 0.47 | **79.76** |

| වාර්ෂික නිකුතු දත්ත - කාසි | | | | | |
|---|---|---|---|---|---|
| වටිනාකම | රු. 10 | රු. 5 | රු. 2 | රු. 1 | එකතුව |
| නිකුතු (රු. මිලියන) | 425.44 | 104.33 | 22.88 | 19.30 | **571.95** |

මෙම ක්‍රියාවලිය අතරතුර, ව්‍යවහාර මුදල් නෝට්ටුවල අව්‍යාජත්වය සහතිකකර මහ බැංකුව විසින් නියම කර ඇති යෝග්‍යතා ප්‍රමිතීන්ට අනුව වර්ග කරනු ලැබේ. වර්ග කිරීමේ ප්‍රමිතීන්ට අනුකූල නොවූ මුදල් නෝට්ටු නුසුදුසු ලෙස සලකනු ලබන අතර ඒවා මුදල් සංසරණයෙන් ඉවත් කරනු ලැබේ. 2023 වසරේ දී මහ බැංකුව විසින් රුපියල් බිලියන 79.82ක වටිනාකමින් යුත් මුදල් සංසරණය සඳහා නුසුදුසු ව්‍යවහාර මුදල් නෝට්ටු විනාශ කිරීමට කටයුතු කරන ලදි.

## සංසරණයේ පවතින මුදල් නෝට්ටු

ශ්‍රී ලංකාවේ මුදල් සංසරණය 2022 වසරේ දී පැවති සියයට 2.1 ක වර්ධනයට සාපේක්ෂව 2023 වසරේ දී රුපියල් බිලියන 1,186.5 ක් දක්වා සියයට 15.6 කින් වර්ධනය වී ඇත.

**මුදල් සංසරණයේ වාර්ෂික වර්ධනය**




අප්‍රේල් සහ දෙසැම්බර් මාසවල සාමාන්‍ය කාලබද්ධ විචලනයන්ට අමතරව, 2023 වර්ෂයේ ජූලි මාසයේ දී ශ්‍රී ලංකා රජයේ දේශීය ණය ප්‍රශස්තකරණ වැඩසටහන හේතුවෙන් ව්‍යවහාර මුදල් සංසරණයේ සැලකිය යුතු හදිසි ඉහළ යාමක් වාර්තා වී ඇත.

**2019 සිට 2023 දක්වා මුදල් සංසරණයේ විචලනයන්**




## ව්‍යාජ මුදල් නෝට්ටු සැකසීමට එරෙහිව කටයුතු කිරීම

රට තුළ ව්‍යාජ මුදල් නෝට්ටු ව්‍යාප්ත වීම අවම කිරීමට සහ ශ්‍රී ලංකා රුපියල පිළිබඳ මහජන විශ්වාසය ආරක්ෂා කිරීමට මහ බැංකුව අදාළ අධිකාරීන් සමඟ, විශේෂයෙන්ම අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ ව්‍යාජ මුදල් නෝට්ටු කාර්යාංශය සමඟ කටයුතු කරයි.

2023 වසරේ දී ව්‍යාජ මුදල් නෝට්ටු 1,769ක් අනාවරණය විය. ව්‍යාජ මුදල් නෝට්ටු හඳුනා ගැනීමේ වර්තමාන අනුපාතය සංසරණයේ පවතින නෝට්ටු මිලියනයකට ව්‍යාජ මුදල් නෝට්ටු 1.4ක් වන අතර, එය ගෝලීය සාමාන්‍ය අනුපාතය වන නෝට්ටු මිලියනයකට ව්‍යාජ මුදල් නෝට්ටු 15ට සාපේක්ෂව සැලකිය යුතු අඩු මට්ටමක් පෙන්නුම් කරයි.

ශ්‍රී ලංකා මහ බැංකු පනතේ 57 වැනි වගන්තිය අනුව අධිකරණමය නඩු විභාග සඳහා පහසුකම් සලසමින් ව්‍යවහාර මුදල් නෝට්ටු අනුකරණය සම්බන්ධ තීරණාත්මක සාක්ෂි වශයෙන් මහ බැංකුව සහතික 97 ක් නිකුත් කර ඇති අතර වසර තුළ දී ව්‍යාජ මුදල් නෝට්ටු සම්බන්ධයෙන් අධිකරණ නඩු කටයුතු 11කට සහභාගී වී ඇත.

මීට අමතරව, සංසරණයේ පවතින මුදල්වල ගුණාත්මක තත්ත්වය පවත්වා ගැනීමට ව්‍යාජ මුදල් නෝට්ටු හඳුනා ගැනීම පිළිබඳ දැනුම වැඩි දියුණු කිරීම සහ මුදල් හැසිරවීමේ හොඳ පුරුදු ප්‍රවර්ධනය කිරීම සඳහා මහ බැංකුව විසින් මහජනතාව, පාසල් සිසුන් සහ නීතිය ක්‍රියාත්මක කරන නිලධාරීන් දැනුම්වත් කිරීමේ වැඩසටහන් ද වරින් වර පවත්වනු ලබයි.

## සමරු කාසි නිකුත් කිරීම

මුදල් අමාත්‍යවරයාගේ අනුමැතිය ඇතිව සුවිශේෂී අවස්ථා සහ/හෝ රටේ අභිවෘද්ධියට දායක වූ පුද්ගලයන් සනිටුහන් කිරීම සඳහා සමරු කාසි සහ නෝට්ටු නිකුත් කිරීමට ශ්‍රී ලංකා මහ බැංකු පනත මගින් මහ බැංකුව වෙත බලය ලබා දී ඇත.




### ■ ශ්‍රී ලංකාවේ 75 වන නිදහස් සැමරුම

2023 වසරේ දී ශ්‍රී ලංකාවේ 75 වන නිදහස් සැමරුම නිමිත්තෙන් මහ බැංකුව විසින් සමරු කාසියක් නිකුත් කරන ලදී. මෙම කාසිය නෙදර්ලන්තයේ රාජකීය ලන්දේසි ටංකන (Royal Dutch Mint) සමාගම විසින් ටංකනය කරන ලද රුපියල් 1000ක මුහුණත වටිනාකමින් යුත් සංසරණය සඳහා නොයෙදූ සමරු කාසියක් වේ. මෙම කාසි 2023 මාර්තු 09 දින සිට මහ බැංකුවේ මුදල් කවුළුව, ආර්ථික ඉතිහාස කෞතුකාගාරය සහ මහ බැංකු ප්‍රාදේශීය කාර්යාල හරහා එක් කාසියක් රුපියල් 6,000 ක මිලකට අලෙවි කරන ලදී.

## ඉදිරි දැක්ම

මහ බැංකුවේ වත්මන් මුදල් මෙහෙයුම් කටයුතු නවීකරණය කිරීමට සැලසුම්කර ඇති අතර එමගින් මෙහෙයුම් දුර්වලතා කිහිපයක් නිම වනු ඇත. මෙම නවීකරණ ව්‍යාපෘතියට නව උපකරණ ලබා ගැනීම මගින් මුදල් නෝට්ටු සැකසීමේ ධාරිතාව වැඩි කිරීම, ක්‍රියාවලි විධිමත් කිරීම මගින් මෙහෙයුම් කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම, නව මෘදුකාංග පද්ධති හඳුන්වාදීම සහ මෙහෙයුම් ප්‍රදේශවල ආරක්ෂාව සහ ආරක්ෂක ප්‍රමිතීන් ඉහළ නැංවීම ඇතුළත් වේ. මෙම ව්‍යාපෘතිය 2025 වසර වන විට අවසන් කිරීමට බලාපොරොත්තු වේ.

# ජාත්‍යන්තර කටයුතු

මූල්‍ය අංශයේ ස්ථාවරත්වය සහ ප්‍රතිසංස්කරණ සිදු කිරීම, මූල්‍ය අංශයේ ආරක්ෂිත ජාලය ශක්තිමත් කිරීම, තාක්ෂණික සහාය ලබා ගැනීම සහ දැනුම හුවමාරු කර ගැනීම යන අංශ මූලික කරගනිමින් 2023 වසරේ දී මහ බැංකුව සිය විදේශ කටයුතු කෙරෙහි අවධානය යොමු කරන ලදි.

## මූල්‍ය අංශයේ ස්ථාවරත්වය සහ ප්‍රතිසංස්කරණ සඳහා වූ වැඩසටහන

ඇමරිකානු ඩොලර් මිලියන 200 බැගින් වූ උප වැඩසටහන් දෙකක් සහිත ප්‍රතිපත්ති පාදක ණය ආකෘතියක් අනුගමනය කරනු ලබන මූල්‍ය අංශයේ ස්ථායිතාව සහ ප්‍රතිසංස්කරණ වැඩසටහන යටතේ, අවශ්‍ය නම්‍යශීලී බව සහතික කිරීමට සහ අර්බුදකාරී තත්වයක් තුළ වුව ද බහු වාර්ෂික ප්‍රතිපත්තිමය ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කරමින් ප්‍රතිසංස්කරණ නිසි ලෙස අනුපිළිවෙලට සිදු කිරීමට මහ බැංකුව සහ ආසියානු සංවර්ධන බැංකුව සහයෝග යෙන් කටයුතු කරන ලදි. මීට අමතරව, විභේදන ව්‍යුහය ශක්තිමත් කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවට තාක්ෂණික සහාය ලබා දීමට ආසියානු සංවර්ධන බැංකුව කැමැත්ත පළ කර ඇත.

## මූල්‍ය අංශය සඳහා ආරක්ෂිත ජාලය ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතිය

ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ පද්ධතිය (SLDIS) පිළිබඳව අවධාරණය කරමින්, ලෝක බැංකුව, මහ බැංකුව සහ ශ්‍රී ලංකා රජය එක්ව මූල්‍ය අංශයේ ආරක්ෂිත ජාලය ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතිය සඳහා එක්ව කටයුතු කරයි. 2024 වර්ෂයේ ජනවාරි මාසයේ දී මෙම ව්‍යාපෘතිය මූල්‍යනය කිරීම සඳහා ඩොලර් මිලියන 150 ක ණය ගිවිසුමක් අත්සන් කරන ලදි. ව්‍යාපෘතියේ ඉලක්කය වන්නේ සඵලදායී තැන්පතු රක්ෂණ පද්ධති සඳහා වන ගෝලීය භාවිතාවන්ට අනුකූල වන පරිදි ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ පද්ධතියේ ආයතනික සහ මූල්‍ය ධාරිතාව ඉහළ නැංවීමයි.

## මහ බැංකු සමග මුදල් හුවමාරු (SWAP) ගිවිසුම්

චීන මහජන බැංකුව සමඟ ඇති හුවමාරු ගිවිසුමට අමතරව, ඉන්දියානු සංචිත බැංකුව සමඟ එක්සත් ජනපද ඩොලර් බිලියන 2.6 සඳහා විශේෂ හුවමාරු ගිවිසුමක් 2023 ඔක්තෝබර් මාසයේ දී අත්සන් කරන ලදි.

## මූල්‍ය ස්ථායිතා මණ්ඩලයෙහි (FSB) ආසියාව සඳහා කලාපීය උපදේශක කණ්ඩායම (RCG Asia)

මහ බැංකු අධිපතිවරයා සහ හොංකොං මූල්‍ය අධිකාරියේ (HKMA) ප්‍රධාන විධායක නිලධාරියා 2023 නොවැම්බර් 29 වැනි දින හොංකොං SAR හිදී රැස් වූ ආසියාව සඳහා කලාපීය උපදේශක කණ්ඩායම (RCG Asia) සඳහා වන මූල්‍ය ස්ථායිතා මණ්ඩලයෙහි (FSB) කලාපීය උපදේශක කණ්ඩායමේ රැස්වීමේ සම සභාපතිත්වය දැරූහ. බැංකු නොවන මූල්‍ය මැදිහත්වීම් හේතුවෙන් පැන නගින අවදානම්, ඇතැම් නැඟී එන වෙළෙඳපොළ සහ සංවර්ධනය වෙමින් පවතින ආර්ථිකයන්හි ස්වෛරී රාජ්‍යයන් සහ බැංකු අතර වර්ධනය වන සම්බන්ධය සහ අතථ්‍ය වත්කම් සම්බන්ධ අවදානම් ඵලදායී ලෙස නියාමනය සහ අධීක්ෂණය කිරීමේ උපාය මාර්ග පිළිබඳව මෙම රැස්වීමේ දී පුළුල් ලෙස සාකච්ඡා කරන ලදි. මෙම අවදානම් හඳුනා ගැනීම, අධීක්ෂණය කිරීම සහ අවම කිරීම පිළිබඳව සාමාජිකයින් සිය දැනුම හුවමාරු කර ගත් අතර, මූල්‍ය පද්ධතියේ ඔරොත්තු දීමේ හැකියාව ඉහළ නැංවීම සඳහා මූල්‍ය ස්ථායී මණ්ඩලයෙහි අඛණ්ඩව උත්සාහයන් අගය කළහ.

## ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි විකල්ප විධායක අධ්‍යක්ෂක

මහ බැංකු නිලධාරින් සාර්ව ආර්ථික ප්‍රතිපත්ති සහ ජාත්‍යන්තර ආර්ථික කටයුතු පිළිබඳ ඔවුන්ගේ පුළුල් විශේෂඥතාව විදහා දක්වමින් ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විකල්ප විධායක අධ්‍යක්ෂවරයා ලෙස නොකඩවා සේවය කරයි. මහ බැංකු ක්ෂේත්‍රයේ ඇති සංකීර්ණතා පිළිබඳ ගැඹුරු අවබෝධයක් සහ ඵලදායි නායකත්වය මැනවින් ප්‍රකට කළ මහ බැංකු නිලධාරින් ගෝලීය තලයේ දී ශ්‍රී ලංකාව, ඉන්දියාව, බංගලාදේශය සහ භූතානය ඇතුළත් කලාපයේ අවශ්‍යතා නියෝජනය කිරීමට වඩාත් හොඳින් සන්නද්ධව සිටී. මෙම පත් කිරීම් තුළින් ගෝලීය ආර්ථික හා මූල්‍ය ප්‍රතිපත්ති පිළිබඳ සාකච්ඡා සඳහා සිය වටිනා තීක්ෂණ බුද්ධිය සහ ඉදිරි දැක්ම යොදා ගැනීමට මහ බැංකු නිලධාරින්ට ඇති හැකියාව පිළිබඳ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි විශ්වාසය මැනවින් පිළිබිඹු වේ.

## තිරසාර මූල්‍ය පිළිබඳ ජාත්‍යන්තර සහයෝගීතාව

තිරසාර මූල්‍ය පිළිබඳ මාර්ග සිතියම ක්‍රියාත්මක කිරීම සඳහා වන ලේකම් කාර්යාලය ලෙස, මහ බැංකුවේ සාර්ව විචක්ෂණ අධ්‍යනතා දෙපාර්තමේන්තුව, 2023 වසර තුළ ජාත්‍යාන්තර ආයතන ගණනාවක් සහ තිරසාර මූල්‍ය සඳහා ජාත්‍යන්තර මූල්‍ය වේදිකාව සමඟ ද්විපාර්ශ්වික, බහුපාර්ශ්වික කටයුතු මාලාවක නිරත විය. රට තුළ තිරසාර මූල්‍යකරණය සඳහා ප්‍රතිපත්ති රාමු සකස් කර ක්‍රියාත්මක කිරීම සහ ඔවුන්ගේ අදාළ මූල්‍ය ආයතනවල තිරසාර මූල්‍ය ක්‍රියාකාරකම් සිදු කිරීම සඳහා මූල්‍ය අංශයේ තාක්ෂණික හා නියාමන හැකියාවන් ගොඩනැගීම මෙම කටයුතුවල ඉලක්ක විය. තවද, තිරසාර මූල්‍ය පිළිබඳ දැනුම බෙදා ගැනීම සඳහා තිරසාර මූල්‍ය සඳහා ජාත්‍යන්තර වේදිකාවේ (IPSF) හි 20 වැනි සාමාජිකයා බවට ශ්‍රී ලංකාව පත් විය. තිරසාර මූල්‍ය හා බැංකු ජාලය (SBFN) විසින් නැගී එන වෙළෙඳපොළ හොඳම ප්‍රායෝගික සිද්ධි අධ්‍යයනය ලෙස ශ්‍රී ලංකාව නම් කරන ලද අතර, ශ්‍රී ලාංකීය අත්දැකීම් බෙදාහදා ගැනීම සඳහා 2023 ජූනි මස මොංගෝලියාවේ පැවති තිරසාර මූල්‍ය සතියට මහ බැංකු නිලධාරියෙක් ද සහභාගී විය.

## ජාත්‍යන්තර ණය ශ්‍රේණිගත කිරීමේ ආයතන සමඟ සම්බන්ධ වීම

මහ බැංකුව ජාත්‍යන්තර ශ්‍රේණිගත කිරීමේ ආයතන, එනම් Moody's, S&P සහ Fitch Ratings සමඟ සම්බන්ධ වී ඔවුන්ගේ සමාලෝචන සඳහා අවශ්‍ය විස්තීරණ ආර්ථික දත්ත සහ ප්‍රතිපත්ති යාවත්කාලීනවීම් පිළිබඳ තොරතුරු ඔවුන්ට ලබා දීමට කටයුතු කළේය. ශ්‍රී ලංකාවේ ණය සුදුසුකම් සහ අවදානම් පැතිකඩ නිවැරදිව තක්සේරු කිරීමට එවැනි ශ්‍රේණිගත කිරීමේ ආයතනවලට ඉඩ ලබා දීමෙන් ගෝලීය ප්‍රාග්ධන වෙළෙඳපොළ වෙත ශ්‍රී ලංකාවේ ප්‍රවේශය නැවත ලබා ගැනීම සඳහා මෙම කාර්යය අත්‍යවශ්‍ය වේ. විදේශ ආයෝජන ආකර්ශනය කර ගැනීමට සහ ශ්‍රී ලංකාවේ ආර්ථිකය කෙරෙහි ආයෝජක විශ්වාසය පවත්වා ගැනීමට මෙම ප්‍රයත්නයන් තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරයි.

## අධිපතිතුමන් විසින් ගෝලීය කටයුතුවලට දක්වන ලද ඉහළ දායකත්වය

2023 වසරේ අප්‍රේල් සහ ඔක්තෝබර් මාසවල පැවැති ජාත්‍යන්තර අරමුදල් සහ ලෝක බැංකු වාර්ෂික රැස්වීම් අතරතුර, මහ බැංකු අධිපතිවරයා සහ නියෝජිත පිරිස ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, ලෝක බැංකුව සහ අනෙකුත් ජාත්‍යන්තර ප්‍රජාව සමඟ ද්විපාර්ශ්වික සහ බහුපාර්ශ්වික පදනමින් ඵලදායී සාකච්ඡා පැවැත් වූහ.

මහ බැංකු අධිපතිවරයා ආසියා මූල්‍ය ස්ථාවරත්ව මණ්ඩලයේ (FSB) කලාපීය උපදේශක කණ්ඩායමේ (RCG) සම සභාපතිවරයා ලෙස කටයුතු කරමින් 2023 නොවැම්බර් මස හොංකොං හි පැවති රැස්වීමට සහභාගී විය.

බංගලාදේශයේ පැවති 14 වැනි දකුණු ආසියානු ආර්ථික සමුළුව, මොරොක්කෝවේ ගෝලීය දකුණු ස්වෛරී ණය අර්බුදය පිළිබඳ මාරකේෂ් ආර්ථික උත්සවය, ඉන්දියා කෞටිල්‍ය ආර්ථික උත්සවය, ජර්මනියේ ආර්ථික සංවාදය සහ තායිලන්තයේ "දේශගුණික ගැටලු" පිළිබඳ ඉහළ මට්ටමේ සම්මන්ත්‍රණය ඇතුළු ජාත්‍යන්තර වේදිකාවන් කිහිපයකදීම මහ බැංකු අධිපතිවරයා විසින් අර්බුදකාරී අවස්ථාවේ දී ශ්‍රී ලංකා ආර්ථිකය කළමනාකරණය කිරීමේ සිය අත්දැකීම් මෙන්ම ආර්ථිකයේ ඉදිරි දැක්ම පිළිබඳ මහ බැංකුවේ අදහස් ද බෙදා ගන්නා ලදි. තවද, ඉන්දියානු වාණිජ හා කර්මාන්ත මණ්ඩල සම්මේලනය, හොංකොං සහ ෂැංහයි බැංකුව සහ Oxford ගෝලීය සමාජය විසින් සංවිධානය කරන ලද අතථ්‍ය හමුවීම්වල දී ප්‍රධාන දේශන මහ බැංකු අධිපතිවරයා විසින් පවත්වන ලදි.

ආර්ථික අර්බුද සම්බන්ධයෙන් රටේ අත්දැකීම් පිළිබඳව සාකච්ඡා කිරීම, ආර්ථිකය යථා තත්ත්වයට පත්වීමේ ප්‍රමාණය ඇගයීම සහ ජාත්‍යන්තර සබඳතා ශක්තිමත් කිරීම සඳහා අධිපතිවරයා විසින් විවිධ රාජ්‍ය තාන්ත්‍රිකයින් සමඟ නිරන්තරව සම්බන්ධ විය.

ජාතික සම්බන්ධීකරණ කමිටුවෙහි සභාපතිවරයා ලෙස මහ බැංකු අධිපතිවරයාගේ ප්‍රධානත්වයෙන් යුත් ශ්‍රී ලංකා නියෝජිත පිරිසක් සහ ශ්‍රී ලංකා මූල්‍ය බුද්ධි ඒකකයෙහි ජ්‍යෙෂ්ඨ නිලධාරීන් තිදෙනෙකු 2023 වර්ෂයේ ජූලි මාසයේ දී කැනඩාවේ වැන්කුවර් හි පැවති 2023 ආසියා ශාන්තිකර කණ්ඩායමේ වාර්ෂික සම්මන්ත්‍රණයට සහභාගී

වූහ. ශ්‍රී ලංකාව තුළ තාක්ෂණික සහයෝගිතාව තවදුරටත් ඉහළ නැංවීම සම්බන්ධයෙන්, මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ සහ ත්‍රස්තවාදයට අරමුදල් සැපයීම මැඩපැවැත්වීම සම්බන්ධයෙන් බහුපාර්ශ්වික තාක්ෂණික සහාය (TA) සපයන්නන් කිහිප දෙනෙකු සමඟ මහ බැංකු අධිපතිවරයා එහි දී සාකච්ඡා පැවැත්වීය.

## තාක්ෂණික දැනුම වැඩි දියුණු කිරීම සහ අත්දැකීම් ලබා ගැනීම

"ශ්‍රී ලංකාවේ මුදල් වෙළෙඳපොළ සංවර්ධනය" පිළිබඳ අධ්‍යයනයක් හරහා මහ බැංකුව 2023 දී කොරියානු මහ බැංකුව සමඟ දැනුම් හවුල්කාරිත්ව වැඩසටහනක් ඇති කර ගත්තේය. ප්‍රායෝගික අත්දැකීම් ලබා ගැනීම සහ මුදල් වෙළෙඳපොළ මෙහෙයුම්වල ජාත්‍යන්තර නිසි භාවිතයන් පිළිබඳ තාක්ෂණික දැනුම වැඩිදියුණු කිරීම මෙම පර්යේෂණ ව්‍යාපෘතිය මඟින් සිදු විය.

ද්‍රවශීලතාව පිළිබඳ තාක්ෂණික දැනුම ඉහළ නැංවීමේ අරමුණ ඇතිව ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි දකුණු ආසියානු පර්යේෂණ සහ තාක්ෂණික ආධාර මධ්‍යස්ථානය (SARTTAC) 2023 දී 'ශ්‍රී ලංකා මහ බැංකුවේ ද්‍රවශීලතා පුරෝකථන රාමුවට වැඩි දියුණු කිරීම් හඳුන්වා දීම' පිළිබඳ තාක්ෂණික සහාය සපයන ලදි. මෙමගින් ශ්‍රී ලංකාවේ මුදල් ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලිය ශක්තිමත් කිරීමට දායකත්වය ලැබෙනු ඇත.

මහ බැංකු පනතට අනුව මහ බැංකුවේ සාර්ව විචක්ෂණ බලය ක්‍රියාත්මක කිරීම සහ සාර්ව විචක්ෂණ මෙවලම් සංවර්ධනය කිරීම සහ ක්‍රමාංකනය කිරීම සම්බන්ධයෙන් මහ බැංකුවට ජාත්‍යන්තර මූල්‍ය අරමුදල වෙතින් තාක්ෂණික ආධාර මාලාවක් ලැබුණි.

මෙම මුලපිරීම්වලට අමතරව තවත් තාක්ෂණික ආධාර වැඩසටහන් රාශියකින් මහ බැංකුව ප්‍රතිලාභ ලබා ඇත.

## ජාත්‍යන්තර සම්මන්ත්‍රණ, වැඩමුළු සහ පුහුණු සැසි

ශ්‍රී ලංකා මහා බැංකුවේ බැංකු අධ්‍යයන මධ්‍යස්ථානය විසින් 2023 වර්ෂයේ ජූනි මස කොළඹ දී "අධීක්ෂණ සහ විභාගය සම්බන්ධ නව මෙවලම්" පිළිබඳ SEACEN පාඨමාලාවක් පවත්වන ලදි.

2023 වර්ෂයේ ඔක්තෝම්බර් මාසයේ දී සාර්ව ආර්ථික ස්ථායීතාවය සඳහා නැගී එන ගැටලු පිළිබඳව අවධානය යොමු කරමින්, ආසියානු සංවර්ධන බැංකු ආයතනය සහ ආසියා පැසිෆික් ව්‍යවහාරික ආර්ථික සංගමය (APAEA) සමඟ එක්ව අඛණ්ඩව සිව්වන වරටත් මහ බැංකුව ඒකාබද්ධ වාර්ෂික ජාත්‍යන්තර පර්යේෂණ වැඩමුළුවක් සංවිධානය කළේය. මෙම වැඩමුළුවේ දී, APAEA හි පර්යේෂකයන් සමඟ එක්ව සකස් කරන ලද පර්යේෂණ පත්‍රිකා තුනක් මහ බැංකු කාර්ය මණ්ඩලය විසින් ඉදිරිපත් කරන ලදි.

මහ බැංකුව, බැංකු අධ්‍යයන මධ්‍යස්ථානය හරහා සහ Bank of International Settlement ට අනුබද්ධිත මූල්‍ය ස්ථායිතා ආයතනය (FSI) සහ යුරෝපීය සුපරීක්ෂක අධ්‍යාපන මුලපිරීම (ESE) සමඟ එක්ව එහි නිලධාරින් සඳහා "ස්ථම්භ 2 සහ ආතති පරීක්ෂණ" පිළිබඳ අතථ්‍ය සම්මන්ත්‍රණයක් සංවිධානය කළේය.

Deutsche Bundesbank සමග සහයෝගීතාවයෙන් බැංකු අධ්‍යයන මධ්‍යස්ථානය විසින් "මුදල් කළමනාකරණය සම්බන්ධයෙන් ස්වයංක්‍රීයකරණය, ඩිජිටල්කරණය සහ තිරසාරත්වය" යන මැයෙන් අථත්‍ය පුහුණුවක් පවත්වන ලදි.

නේපාලයේ KFA ව්‍යාපාරික පාසල සඳහා "ශාඛා කළමනාකරණයේ විශිෂ්ටත්වය අත්කර ගැනීම" පිළිබඳ විශේෂ වැඩසටහන් දෙකක් සහ නේපාල රාෂ්ට්‍ර බැංකුවේ නිලධාරින් සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ ක්‍රියාකාරිත්වය පිළිබඳ දළ විශ්ලේෂණයක් පවත්වන ලදි.

මීට අමතරව, ලාඕසය, නේපාලය, බෲනායි සහ ටිමෝරය යන රටවල් සඳහා අන්‍යෝන්‍ය ඇගයීම් තක්සේරුකරුවන් ලෙස ශ්‍රී ලංකා මූල්‍ය බුද්ධි ඒකකයේ ජ්‍යෙෂ්ඨ නිලධාරින් හතර දෙනෙක් සහභාගී වූහ. තවත් ශ්‍රී ලංකා මූල්‍ය බුද්ධි ඒකක නිලධාරින් දෙදෙනෙකු දැනට නාවුරු සහ මාෂල් දූපත් ජනරජයේ තක්සේරු කිරීම්වල නියැලී සිටින අතර මෙම රටවල අන්‍යෝන්‍ය ඇගයීම් සඳහා බාහිර සමාලෝචකයින් ලෙස නම් කර ඇත.

# විදේශ විනිමය ගනුදෙනු නියාමනය සහ අධීක්ෂණය



ශ්‍රී ලංකාව තුළ විදේශ විනිමය නිසි ලෙස ප්‍රවර්ධනය කිරීම සහ නියාමනය කිරීම සඳහා 2017 නොවැම්බර් 20 දින සිට බලාත්මක වූ 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ වගකීම රජයේ නියෝජිතයා ලෙස මහ බැංකුවට පැවරේ. ඒ අනුව, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් විදේශ විනිමය පනත ප්‍රකාරව විනිමය ගනුදෙනු සිදු කිරීමට අදාළ සාමාන්‍ය මහජනතාව වෙත නියෝග සහ නියම නිකුත් කිරීමේ දී විෂයභාර අමාත්‍යවරයාට සහය දීම, බලයලත් වෙළෙන්ඳන්ට (බලපත්‍රලාභී බැංකු) විධානයන් නිකුත් කිරීම, අනුකූලතාවන් අධීක්ෂණය කිරීම සහ අනනුකූල අවස්ථා සම්බන්ධයෙන් පරීක්ෂණ පැවැත්වීම සිදු කරයි. තවද, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් විදේශ විනිමය ගනුදෙනුවල නිරත වන පරිසීමිත වෙළෙඳුන් (මූලිකව, බලයලත් මුදල් හුවමාරු කරන්නන්) සහ වෙනත් පුද්ගලයින් පත් කිරීම සහ අධීක්ෂණය කිරීම සිදු කරනු ලබයි. තවද, විදේශ විනිමය පනත යටතේ සාමාන්‍ය අවසරයක් ප්‍රදානය කර නොමැති ගනුදෙනු සිදු කිරීම සඳහා කරනු ලබන ඉල්ලීම්වල දී, එම ඉල්ලීම්වල ප්‍රතිලාභ සහ අදාළ ප්‍රතිඵල සලකා බලා ඒ සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විශේෂ අවසර ලබා දෙන අතර නිශ්චිත අවශ්‍යතා සපුරාලන බාහිර ප්‍රාග්ධන ගනුදෙනු සඳහා නිශ්කාශන ලිපි නිකුත් කිරීම සිදු කරනු ලබයි.

මීට අමතරව, ශ්‍රී ලංකා මහ බැංකු පනතේ විධිවිධාන යටතේ අඛණ්ඩව ක්‍රියාත්මක වන 1949 අංක 59 දරන අවලංගු කරන ලද මුදල් නීති පනත යටතේ නිකුත් කරන ලද අපනයන ඉපැයීම් රීති ප්‍රකාරව අපනයන ඉපැයීම් ශ්‍රී ලංකාවට ගෙන ඒම සහ අවසරලත් ගෙවීම් සිදුකිරීමෙන් පසු ශේෂය ශ්‍රී ලංකා රුපියල්වලට පරිවර්තනය අනිවාර්යය කිරීම සම්බන්ධව, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අධීක්ෂණය කරනු ලබයි.

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 2023 ජූනි 28 සහ 2023 දෙසැම්බර් 20 යන දිනයන්හිදී ප්‍රාග්ධන සහ ජංගම ගනුදෙනු සම්බන්ධයෙන් වූ අත්හිටුවීම් / සීමා කිරීම් ක්‍රමානුකූලව ලිහිල් කිරීම සඳහා විදේශ විනිමය පනතේ 22 වැනි වගන්තිය ප්‍රකාරව නියෝගයන් දෙකක් (02) නිකුත් කරන ලදි. තවද, අනේවාසික ආයෝජකයන් වෙතින් සමාගමක කොටස් ප්‍රාග්ධනයෙහි ආයෝජනයක් වශයෙන් ලැබෙන මුදලින්, "විශේෂ විදේශ ව්‍යාවහාර මුදල් ගිණුම්-ආයෝජිත" විවෘත කර පවත්වා ගෙන යාමේ අවසරය ප්‍රදානය කරමින් අදාල විධානයන් බලයලත් වෙළෙඳුන් වෙත නිකුත් කරන ලදි. සමුද්‍රීය ඉන්ධන ගබඩාකරණය, ප්‍රවාහනය සහ සැපයුම් කටයුතුවල නිරත වන ව්‍යාපාරික ආයතන අතර සිදුවන විදේශීය මුදල් ගනුදෙනු සඳහා පහසුකම් සැලසීමේ අරමුණින් ව්‍යාපාර විදේශ ව්‍යාවහාර මුදල් ගිණුම් සහ එම ගිණුම් හිමියන්ට ණය පහසුකම් සැලසීම සම්බන්ධයෙන් වන විධිවිධානයන් නිකුත් කරන ලදි.

## ඉදිරි දැක්ම

අනවසර විදේශ විනිමය ගනුදෙනු මැඩලීම සඳහා නියාමන බලතල ශක්තිමත් කිරීම ඇතුළු විදේශ විනිමය පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් හඳුනා ගෙන ඇති ගැටලු කිහිපයක් නිවැරදි කිරීමේ අරමුණින්, විදේශ විනිමය පනතට සංශෝධනයන් සිදු කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුව අපේක්ෂා කරයි. ඒ අනුව, විදේශ විනිමය පනතට යෝජිත එම සංශෝධන සඳහා දැනටමත් අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා ගෙන ඇත.

**වාර්ෂික අපනයන ඉපැයීම් ශ්‍රී ලංකාවට ගෙන ඒමේ සහ පරිවර්තනය කිරීමේ දත්ත සැසඳීම: වෙළෙඳ භාණ්ඩ සහ සේවා (2022 සහ 2023)**



# රාජ්‍ය ණය කළමනාකරණය

ශ්‍රී ලංකා මහ බැංකු පනතේ 132 වැනි වගන්තිය ප්‍රකාරව, රාජ්‍ය ණය කළමනාකරණ ආයතනය පිහිටුවීමට අදාළ පනත බලාත්මක වන තෙක්, රජය වෙනුවෙන් රාජ්‍ය සුරැකුම්පත් නිකුත් කිරීම සහ රාජ්‍ය ණය කළමනාකරණය කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව රජයේ නියෝජිතයා වශයෙන් කටයුතු කරනු ලබයි. ඒ අනුව, ශ්‍රී ලංකා මහ බැංකුව විචක්ෂණශීලී අවදානම් මට්ටමක් පවත්වා ගනිමින් අවම පිරිවැයක් යටතේ ප්‍රශස්ත ප්‍රමිතීන්ට හා පරිචයන්ට අනුකූලව රාජ්‍ය මූල්‍ය අවශ්‍යතා සපුරාලීම, කාර්යක්ෂම රාජ්‍ය සුරැකුම්පත් වෙළෙඳපොළක් සංවර්ධනය කිරීම සහ පවත්වාගෙන යෑම, වෙළෙඳපොළ සහභාගීකරුවන් හා මහජනතාව සඳහා අවශ්‍ය තොරතුරු ලබා දීම සහතික කිරීම, රජය විසින් නිකුත් කරන ලද රාජ්‍ය සුරැකුම්පත් සඳහා වන හිමිකම් ලේඛනය පවත්වාගෙන යෑම හා පවත්නා ප්‍රතිපත්තීන්ට අනුකූලව නියමිත කාලයට රාජ්‍ය ණය සේවාකරණය සිදු කිරීම යන සිය ප්‍රධාන වගකීම් අඛණ්ඩව ඉටු කරන ලදී.

## රජයේ දළ ණය අවශ්‍යතා සපුරාලීම සඳහා අරමුදල් රැස් කිරීම

(අ) අඛණ්ඩව පැන නඟින අභියෝගාත්මක සාර්ව ආර්ථික හා වෙළෙඳපොළ තත්ත්වයන් මධ්‍යයේ වුවද, විචක්ෂණශීලී ණය කළමනාකරණ ක්‍රියාමාර්ගවලට අනුකූල වෙමින් සහ ක්‍රමවත් වෙළෙඳපොළ තත්ත්වයන් පවත්වා ගෙන යමින් මහා භාණ්ඩාගාරයේ මූල්‍ය අවශ්‍යතා ප්‍රධාන වශයෙන් දේශීය මූලාශ්‍ර මගින් මූල්‍යනය කරන ලදී. 2023 වසර තුළ දී, විදේශීය වාණිජ අරමුදල් සඳහා ප්‍රවේශය තවදුරටත් සීමා වී තිබුණි.

(ආ) දේශීය අංශය ගත් කල, ණය ප්‍රතිව්‍යුහගතකරණයේ පරාමිතීන් පිළිබඳව පැවති අවිනිශ්චිතතා හේතුවෙන් දේශීය ණය ප්‍රශස්තකරණ වැඩසටහන නිවේදනය කිරීමට පෙරාතුව දිගු කාලීන ආයෝජන සඳහා පැවති අඩු නැඹුරුව, දේශීය වශයෙන් මූල්‍ය අවශ්‍යතා සපුරාලීමේ දී කෙටි කාලීන භාණ්ඩාගාර බිල්පත් හා භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කිරීම සඳහා යොමු වීමට හේතු විය. දේශීය ණය ප්‍රශස්තකරණ වැඩසටහන අවසන් වීමත් සමගම ඇති වූ රාජ්‍ය මූල්‍ය කාර්ය සාධනයේ වර්ධනයන්, දේශීය ආර්ථික ක්‍රියාකාරකම් ක්‍රමිකව යථා තත්වයට පත්වීම, ස්ථායී උද්ධමන අපේක්ෂාවන් හා මුදල් අමාත්‍යාංශයේ එකඟතාව මත මුදල් ස්වාරක්ෂකයක් ගොඩනැඟීම ඇතුළුව අනුගමනය කරන ලද විචක්ෂණශීලී ණය කළමනාකරණ ක්‍රියාමාර්ග, වෙළෙඳපොළ තුළ ධනාත්මක අපේක්ෂාවන්ට මං පෑදූ අතර ඒ තුළින් රාජ්‍ය සුරැකුම්පත්වල සැලකිය යුතු මට්ටමක පැවති අවදානම් අධිමිල ක්‍රමයෙන් පහව ගියේය.

(ඇ) ඉහත වර්ධනයන් හේතුවෙන් 2023 වසරේ අග භාගය වන විට රාජ්‍ය සුරැකුම්පත් ඵලදා අනුපාතිකයන්ගේ සැලකිය යුතු පහළ යෑමක් වාර්තා වූ අතර, එය 2024 වසරේදී ද දැක ගත හැකි වූ අතර, ඒ තුළින් වඩාත් හිතකර වෙළෙඳපොළ තත්ත්වයක් යටතේ රජයේ මූල්‍ය අවශ්‍යතාවන් සපුරාලීමට අවස්ථාව සැලසිනි.

**භාණ්ඩාගාර බිල්පත් හා භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කිරීම - 2022 සහ 2023**

| | 2022 | | | | 2023 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| උපකරණය | නිකුත් කිරීම් (රු.බිලියන) | බර තබන ලද සාමාන්‍ය ඵලදා අනුපාතිකය (%) | සාමාන්‍ය පරිණත කාලය (වර්ෂ) | වෙන්දේසි ගණන | නිකුත් කිරීම් (රු.බිලියන) | බර තබන ලද සාමාන්‍ය ඵලදා අනුපාතිකය (%) | සාමාන්‍ය පරිණත කාලය (වර්ෂ) | වෙන්දේසි ගණන |
| භාණ්ඩාගාර බිල්පත් (අ) | 9,942.8 | 25.21 | 0.33 | 52 | 15,446.3 | 22.36 | 0.34 | 52 |
| භාණ්ඩාගාර බැඳුම්කර | 2,373.0 | 21.24 | 5.15 | 24 | 7,614.52 | 21.00 (ආ) | 8.56 | 14 |

(අ) මහ බැංකුවට නිකුත් කරන ලද භාණ්ඩාගාර බිල්පත් ඇතුළුව දළ භාණ්ඩාගාර බිල්පත් නිකුත් කිරීම.

(ආ) දේශීය ණය ප්‍රශස්තකරණ වැඩසටහන යටතේ නිකුත් කළ භාණ්ඩාගාර බැඳුම්කර ඇතුළත් නොවේ.

(ඇ) මේ අතර, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීරණ ණය පහසුකම යටතේ ශ්‍රී ලංකා මහ බැංකුවට අදාළ වන රජයට ලබා දුන් ශුද්ධ ණය ඉලක්ක ළඟා කර ගැනීම සහතික කර ගැනීම වෙනුවෙන්, ශ්‍රී ලංකා මහ බැංකුව සතුව තිබූ භාණ්ඩාගාර බිල්පත්, වෙළෙඳපොළ වෙත බැහැර කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලදි.

(ඉ) එක් එක් අරමුදල් ප්‍රභවය යටතේ සිදුකළ ක්‍රියාකාරකම් ඉහත සංක්ෂිප්ත සංඛ්‍යා සටහනෙහි දැක්වේ.

## දේශීය ණය ප්‍රශස්තකරණ වැඩසටහන

2023 මාර්තු 20 දින අනුමත කරන ලද ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීරණ ණය පහසුකම යටතේ හඳුනාගෙන ඇති ප්‍රධාන අරමුණුවලින් එකක් වන ශ්‍රී ලංකාවේ රාජ්‍ය ණය තිරසාරභාවය යථා තත්ත්වයට පත් කිරීමේ අදහසින් මුදල් අමාත්‍යාංශය විසින් 2023 ජූලි 04 දින දේශීය ණය ප්‍රශස්තකරණ වැඩසටහන පිළිබඳ සිය ප්‍රතිපත්තිය ප්‍රකාශයට පත් කරන ලදි. එහිදී, සුදුසුකම් ලත් භාණ්ඩාගාර බැඳුම්කර හිමිකරුවන් සතු සුදුසුකම් ලත් භාණ්ඩාගාර බැඳුම්කර, මහ බැංකුව වෙත නිකුත් කර ඇති භාණ්ඩාගාර බිල්පත්, මහ බැංකුව විසින් ශ්‍රී ලංකා රජයට ලබා දී ඇති තාවකාලික අත්තිකාරම්, තනි පුද්ගල ආයෝජකයන් හැර අනෙකුත් ආයෝජකයන් සතු ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර සහ දේශීය නීතිය යටතේ නිකුත් කර ඇති රජයේ විදේශ විනිමය බැංකු ණය යෝග්‍ය පරිදි දිගුකාලීන භාණ්ඩාගාර බැඳුම්කර බවට පරිවර්තනය/හුවමාරු කිරීමට අපේක්ෂා කෙරිණි.

ශ්‍රී ලංකා රජයේ සහයෝගය ද සහිතව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් දේශීය ණය ප්‍රශස්තකරණ වැඩසටහන අදියර කිහිපයක් යටතේ ක්‍රියාත්මක කරන ලදි. සුදුසුකම්ලත් එක්සත් ජනපද ඩොලර් වලින් නාමනය කරන ලද ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර, 2023 අගෝස්තු 15 දින රුපියල් බිලියන 252.2ක වටිනාකමකින් යුතු ශ්‍රී ලංකා රුපියල්වලින් නාමනය කරන ලද නව භාණ්ඩාගාර බැඳුම්කර බවට පරිවර්තනය කරන ලද අතර, එම ආයෝජකයන්ට අදාළ උපචිත සහ හිඟ පොලිය ශ්‍රී ලංකා රුපියල්වලින් පියවන ලදි. තවද, ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර හුවමාරු යෝජනාව යටතේ සිදු කරන ලද පියවීම්වලට අමතරව, මුදල් අමාත්‍යාංශය විසින් මහ බැංකුව සමඟ එක්ව තව දුරටත් පියවීමට ඇති ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර හිමිකරුවන් සඳහා විකල්ප පියවීම් ක්‍රමයක් ක්‍රියාත්මක කරන ලදි. ඒ අනුව, 2023 වසරේ නොවැම්බර් මස අවසානය වන විට, ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර සියල්ල පියවා තිබුණි.

භාණ්ඩාගාර බැඳුම්කර හුවමාරුව 2023 සැප්තැම්බර් 14 දින ක්‍රියාත්මක කරන ලද අතර, එහිදී සුදුසුකම් ලත් භාණ්ඩාගාර බැඳුම්කර 49ක් රුපියල් බිලියන 3204.5ක් වටිනා නව භාණ්ඩාගාර බැඳුම්කර 12කට හුවමාරු කිරීම සිදු විය. මෙහි දී තනි පුද්ගල ආයෝජකයන් සුදුසුකම් ලත් ආයෝජකයින්ගෙන් ඉවත් කරන ලද අතර, රජය විසින් හඳුන්වා දුන් බදු දිරිගැන්වීම හරහා විශ්‍රාම අරමුදල් මෙම හුවමාරුවට සහභාගී වීම දිරිමත් කරන ලදි. ශ්‍රී ලංකා මහ බැංකු පනතේ 129(2) වගන්තිය ප්‍රකාරව, එම පනත බලාත්මක වූ 2023 සැප්තැම්බර් 15 දිනට පැවති රුපියල් බිලියන 2713.1ක් වටිනා මහ බැංකුව සතු රජයේ නොපියවූ අත්තිකාරම් සහ මහ බැංකුව විසින් ප්‍රාථමික වෙළෙඳපොළෙන් මිලදී ගෙන තිබූ නොපියවූ සුරැකුම්පත්, ක්‍රමයෙන් අඩුවන ස්ථාවර කූපන් පොලී අනුපාතික සහිත නව භාණ්ඩාගාර බැඳුම්කර 10ක් සහ එවකට වෙළෙඳපොළේ පැවති භාණ්ඩාගාර බිල්පත් 12කට 2023 සැප්තැම්බර් 21 දින පරිවර්තනය කරන ලදි.

දේශීය ණය ප්‍රශස්තකරණ වැඩසටහන, දැනට ක්‍රියාත්මක රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා ක්‍රියාවලිය සමඟ එක්ව, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීරණ ණය පහසුකම යටතේ හඳුනාගෙන ඇති අපේක්ෂිත ණය තිරසාරභාවය පිළිබඳ ඉලක්ක මධ්‍යකාලීන හා දිගුකාලීන වශයෙන් සාක්ෂාත් කර ගැනීම හරහා ණය තිරසරභාවය ප්‍රතිස්ථාපනය කිරීමට දායක වනු ඇතැයි අපේක්ෂා කෙරේ. මේ අතර රාජ්‍ය ණය තිරසාර භාවය ප්‍රතිෂ්ඨාපනය කිරීමේ ප්‍රයත්නයන් සඳහා මහ බැංකුව විසින් රජයට සහ එහි මූල්‍ය හා නීති උපදේශකයන්ට අවශ්‍ය සහයෝගය අඛණ්ඩව සපයන ලදි.

## රාජ්‍ය ණය කළමනාකරණ ආයතනයක් පිහිටුවීම

2022 වර්ෂය සඳහා වූ අතුරු අයවැය කතාවේ දක්වා ඇති පරිදි, ප්‍රධාන ආයතනික ප්‍රතිසංස්කරණවලින් එකක් ලෙස ස්වාධීන රාජ්‍ය ණය කළමනාකරණ ආයතනයක් පිහිටුවීමේ අවශ්‍යතාව රජය විසින් හඳුනාගෙන ඇත. තවද, 2023 මාර්තු මාසයේ දී ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීරණ ණය පහසුකම යටතේ රජය විසින් එකඟ වූ ආර්ථික

හා මූල්‍ය ප්‍රතිපත්ති අවබෝධතා ගිවිසුමට අනුකූලව, (i) මුදල් අමාත්‍යාංශයට වාර්තා කරන සහ වගකිව යුතු නමුත් සැලකිය යුතු මෙහෙයුම් ස්වාධීනත්වයක් සහිත; (ii) මධ්‍ය කාලීන ණය උපායමාර්ග සහ වාර්ෂික ණය සැලසුම් සකස් කිරීම මඟින් ණය කළමනාකරණය පිළිබඳ සමස්ත ප්‍රතිපත්තිමය වගකීම සම්පූර්ණයෙන් භාර ගන්නා සහ; (iii) වෙන්දේසි කඩඉම් පිළිබඳ තීරණ ගැනීම ඇතුළුව වාර්ෂික ණය සැලසුම් ක්‍රියාත්මක කිරීම සඳහා මඟ පෙන්වන රාජ්‍ය ණය කළමනාකරණ ආයතනයක් පිහිටුවීම සඳහා රජය කැප වී සිටී. රාජ්‍ය ණය කළමනාකරණ ආයතනය ස්ථාපිත කිරීමෙන් පසු, එකී රාජ්‍ය ණය කළමනාකරණ ආයතනය විසින් සියලුම දේශීය හා ජාත්‍යන්තර වෙළෙඳපොළ පදනම් කර ගත් මූල්‍ය තීරණ අධීක්ෂණය කිරීමට සහ සියලු ණය, ව්‍යුත්පන්නයන් සහ ඇපකර ඇගයීම අධීක්ෂණය කරතැයි අපේක්ෂා කෙරේ.

මීට අදාළව, රාජ්‍ය ණය කළමනාකරණ ආයතනය පිහිටුවීම සඳහා වන නීතිමය රාමුව ඇතුළුව, සමස්ත රාජ්‍ය ණය කළමනාකරණ කාර්යයන් සඳහා අදාළ වන රාජ්‍ය ණය කළමනාකරණ පනතක් ඉදිරියේ දී බලාත්මක කිරීමට අපේක්ෂා කෙරේ. රාජ්‍ය ණය කළමනාකරණ පනත කෙටුම්පත් කිරීමට අවශ්‍ය දායකත්වය මහ බැංකුව විසින් සපයා ඇති අතර, අපේක්ෂිත රාජ්‍ය ණය කළමනාකරණ ආයතනය සඳහා අවශ්‍ය කෙරෙන දැනුම, විශේෂඥතාව සහ මෙතෙක් ගොඩනඟා ගත් යටිතල පහසුකම් අවශ්‍ය පරිදි පැවරීමට අදාළව මුදල් අමාත්‍යාංශය සමඟ අඛණ්ඩව කටයුතු කරනු ඇත.

### රජයේ සුරැකුම්පත් හිමිකම් ලේඛනය පවත්වාගෙන යෑම සහ රාජ්‍ය ණය සේවාකරණය

රජයේ නිර්ලේඛිත සුරැකුම්පත් හිමිකම් ලේඛනය, මධ්‍යම තැන්පතු පද්ධතියෙහි වාර්තා වේ. ලංකාසෙක්‍යු පද්ධතිය, මධ්‍යම තැන්පතු පද්ධතියෙන් හා නිර්ලේඛිත සුරැකුම්පත් පියවීමේ පද්ධතියෙන් සමන්විත වේ. නිර්ලේඛිත සුරැකුම්පත් පියවීමේ පද්ධතිය රජයේ සුරැකුම්පත්වල ප්‍රාථමික සහ ද්විතීයික වෙළෙඳපොළ ගනුදෙනු සඳහා පියවීම් සේවා සපයයි. 2023 අවසානයේ දී නිර්ලේඛිත සුරැකුම්පත්වල මුළු හිමිකම් ප්‍රමාණයෙහි මුහුණත වටිනාකම රුපියල් බිලියන 16,136.8ක් විය. මෙය භාණ්ඩාගාර බිල්පත් රුපියල් බිලියන 4,092.5කින් සහ භාණ්ඩාගාර බැඳුම්කර රුපියල් බිලියන 12,044.4කින් සමන්විත විය. 2023 අවසානය වන විට මධ්‍යම තැන්පතු පද්ධතියෙහි ලියාපදිංචි ගිණුම් සංඛ්‍යාව 139,180ක් ලෙස සටහන් විය. 2023 වසර අවසාන වන විට ලංකාසෙක්‍යු පද්ධතිය අලෙවිකාර සෘජු සහභාගිකරුවන් තිස් දෙදෙනෙකුගෙන් (බලපත්‍රලාභී වාණිජ බැංකු 24ක්, බලපත්‍රලාභී විශේෂිත බැංකුවක් සහ ප්‍රාථමික අලෙවි සමාගම් 7ක්) සහ සෘජු සහභාගිකරුවන් තිදෙනෙකුගෙන් සමන්විත විය. ලංකාසෙක්‍යු පද්ධතිය රජයේ සුරැකුම්පත් ආයෝජනවල සුරක්ෂිතතාව උදෙසා, (i) විද්‍යුත් ප්‍රකාශන, (ii) තත්කාලීන දැනුම්දීම් සහ (iii) මාර්ගගත නිරීක්ෂණය කිරීමේ පහසුකම වැනි ආරක්ෂිත පහසුකම් කිහිපයක් සපයයි. එවැනි සියලු පහසුකම් 2023 වසර තුළ දී සාර්ථකව පවත්වාගෙන ගොස් ඇත.

2023 වසරේ දී මුළු ණය සේවාකරණ ගෙවීම් රුපියල් බිලියන 4,263.3 සඳහා පහසුකම් සලසන ලද අතර එයට දේශීය හා විදේශීය ණය සේවාකරණ ගෙවීම් පිළිවෙලින් රුපියල් බිලියන 3,792.9ක් සහ රුපියල් බිලියන 470.5ක් ඇතුළත් විය. එහි දී, 2022 අප්‍රේල් 12 දිනැති විදේශ රාජ්‍ය ණය සේවාකරණය පිළිබඳ රජයේ අන්තර්වාර ප්‍රතිපත්තියට අනුකූලව විදේශ ණය සේවාකරණය ක්‍රියාත්මක කරන ලදි. විදේශ ව්‍යවහාර මුදලින් නාමනය කරන ලද දේශීය ණය සේවාකරණය සම්බන්ධයෙන්, විකල්ප පියවීම් යාන්ත්‍රණයක් සහ මුදල් අමාත්‍යාංශය විසින් ප්‍රකාශයට පත් කරන ලද දේශීය ණය ප්‍රශස්තකරණ වැඩසටහන පිළිබඳ ප්‍රතිපත්තිය, අදාළ පරිදි අනුගමනය කරන ලදි.

### 2023 වර්ෂයේ ණය කළමනාකරණ මුලපිරීම් සහ වෙළෙඳපොළ සංවර්ධනයන්

අ) **ප්‍රාථමික වෙන්දේසිවල දී පිරිනැමූ ප්‍රමාණයන් කළමනාකරණය කිරීම සහ ප්‍රමාණවත් මුදල් ස්වාරක්ෂයක් පවත්වාගැනීමට පහසුකම් සැලසීම.** 2023 වර්ෂයේ අවසාන භාගයේ දී, ප්‍රාථමික වෙන්දේසිවල දී පිරිනමන ලද මුදල් ප්‍රමාණයන් කළමනාකරණය කිරීම සහ ප්‍රමාණවත් මුදල් ස්වාරක්ෂකයක් පවත්වා ගැනීම සම්බන්ධයෙන් මහ බැංකුව, මුදල් අමාත්‍යාංශය සමඟ ක්‍රියාකාරීව කටයුතු කරන ලදි. වැඩි දියුණු කළ රාජ්‍ය මූල්‍ය කාර්ය සාධනයන් සහ අඩු උද්ධමන අපේක්ෂාවන් සමඟ එක්ව ගත් කල මෙම ක්‍රියාමාර්ග, අවදානම්

වාරිකය සැලකිය යුතු ලෙස පහළ දැමීමට දායක වූ අතර එමගින් රජයේ සුරැකුම්පත්වල ඵලදා අනුපාතික සැලකිය යුතු පහළ යෑමක් සිදුවිය. මුදල් ස්වාරක්ෂකයක් පවත්වා ගෙන යෑම මගින් අනවශ්‍ය පොලී අනුපාතික විචලනයන් සිදුවේ නම් ඒවාට මුහුණ දීම තවදුරටත් විධිමත් කිරීමට අපේක්ෂා කරනු ලබන අතර මෙම ප්‍රයත්නයේ දී අවශ්‍ය අවස්ථාවල දී මුදල් අමාත්‍යාංශයට පහසුකම් සැලසීමට මහ බැංකුව අපේක්ෂා කරනු ලබයි.

ආ) **ලංකාසෙක්‍යු මගින් විද්‍යුත් ප්‍රකාශන පහසුකම ආරම්භ කිරීම.** සහභාගීවන්නන්ට පහසු ආකාරයට කාර්යක්ෂමව සහ බාධාවකින් තොරව ප්‍රකාශයන් ලබා දීම අරමුණු කරගනිමින් ලංකාසෙක්‍යු මගින් නිකුත් කරන කාලීන මුද්‍රිත ප්‍රකාශන, විද්‍යුත් ප්‍රකාශන බවට සම්පූර්ණයෙන් පරිවර්තනය කිරීම ආරම්භ කරන ලදි.

ඇ) **ප්‍රාථමික අලෙවිකරුවන් සමඟ වෙන් වෙන්ව සාකච්ඡා කිරීම ආරම්භ කිරීම.** මූලිකවම, දේශීය ණය ප්‍රශස්තකරණ වැඩසටහනින් පසුව ණය කළමනාකරණ උපායමාර්ග සැකසීමේ දී, වෙළෙඳපොළ අපේක්ෂා සහ ආකල්ප හඳුනා ගැනීමේ වැදගත්කම හඳුනා ගනිමින්, රාජ්‍ය ණය කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් ප්‍රාථමික අලෙවිකරුවන් සමඟ වෙන වෙනම සාකච්ඡා පැවැත්වීම ආරම්භ කරන ලදි. ගනුදෙනුකරුවන් සමඟ කටයුතු කිරීමේ දී එක් එක් ප්‍රාථමික අලෙවිකරුවන් විසින් ක්‍රියාත්මක කරනු ලබන සුවිශේෂී පද්ධති/මෙහෙයුම් සහ වෙළෙඳපොළ සංවර්ධනය සඳහා අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග මෙම රැස්වීම්වල දී සාකච්ඡාවට බඳුන් විය.

ඈ) **භාණ්ඩාගාර බිල්පත් සඳහා අන්තර්ජාලය පදනම් කරගත් භාණ්ඩාගාර බිල්පත් නිකුතු පද්ධතියක් සහ භාණ්ඩාගාර බැඳුම්කර සඳහා අන්තර්ජාලය පදනම් කරගත් ඍජු නිකුතු කවුළුවක් ක්‍රියාත්මක කිරීම.** අදාළ විධානයන් ප්‍රකාශයට පත් කිරීමත් සමඟ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 2023 ජූනි 21 වන දින සිට සහ 2023 සැප්තැම්බර් 20 වන දින සිට බලපැවැත්වෙන පරිදි පිළිවෙලින් භාණ්ඩාගාර බිල්පත් සඳහා අන්තර්ජාලය පදනම් කරගත් භාණ්ඩාගාර බිල්පත් නිකුතු පද්ධතියක් සහ භාණ්ඩාගාර බැඳුම්කර සඳහා අන්තර්ජාලය පදනම් කරගත් ඍජු නිකුතු කවුළුවක් හඳුන්වා දෙන ලදි.

## ඉදිරි දැක්ම

අපේක්ෂා කළ ආකාරයට විදේශීය ණය ප්‍රතිව්‍යුහගතකරණය කඩිනමින් අවසන් කිරීම මගින් සුබවාදී රාජ්‍ය මූල්‍ය ඉදිරි දැක්ම සහ ආයෝජකයන්ගේ ආකල්ප තව දුරටත් ශක්තිමත් කරනු ඇති අතර, එමගින් දේශීය වෙළෙඳපොළ තුළ ඇති වන හිතකර බලපෑම මගින්, ඵලදා අනුපාතිකයන් තව දුරටත් පහත වැටීමට දායක වනු ඇත. ඒ අනුව, විශේෂයෙන්ම ආදායම් රැස් කිරීමට අදාළව රාජ්‍ය මූල්‍ය අංශයේ සිදු වූ යහපත් වර්ධනයන් සැලකිල්ලට ගෙන, රජයේ මූල්‍ය අවශ්‍යතා සාපේක්ෂ වශයෙන් අඩු වනු ඇතැයි අපේක්ෂා කරනු ලබන අතර, එමගින්, භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කිරීමේ ක්‍රියාමාර්ග තවදුරටත් විධිමත් කිරීමට අපේක්ෂා කෙරේ. රජයේ සුරැකුම්පත් සඳහා ක්‍රියාකාරී ද්විතීයික වෙළෙඳපොළක් ඇති කිරීමෙහි පියවරක් ලෙස ප්‍රාථමික නිකුතුවලදී දැනට පවතින භාණ්ඩාගාර බැඳුම්කර සමඟ විචල්‍ය සහ ක්‍රමයෙන් අඩුවන පොලී අනුපාතික සහිත නව භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කිරීමේ ශක්‍යතාව සොයා බැලීමට අදාළ ක්‍රියාමාර්ග අනුගමනය කර ඇත. ණය කළමනාකරණයෙහි මෑතකාලීනව නිරීක්ෂණය වූ යහපත් වර්ධනයන් තහවුරු කර ගැනීම සහ ඉදිරියේ දී රාජ්‍ය ණයෙහි අපේක්ෂිත තිරසාරත්වය සාක්ෂාත් කර ගැනීම උදෙසා රාජ්‍ය ණය කළමනාකරණ පනත කඩිනමින් බලාත්මක කිරීම මගින් සැලකිය යුතු මෙහෙයුම් ස්වාධීනත්වයක් සහිතව, පුළුල් ණය කළමනාකරණ ප්‍රවේශයකට අනුගත වූ රාජ්‍ය ණය කළමනාකරණ ආයතනය පිහිටුවීම ඉතා වැදගත් වේ.

# සේවක අර්ථසාධක අරමුදල



1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනතේ (සේ.අ.අ. පනත) විධිවිධානවලට අනුව, සේවක අර්ථසාධක අරමුදලේ (සේ.අ.අ./අරමුදල) පරිපාලන කටයුතු කම්කරු කොමසාරිස්වරයා වෙත පැවරී ඇති අතර, අරමුදල කළමනාකරණය සඳහා අදාළ වන බලතල ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය (නව මහ බැංකු පනත අනුව ශ්‍රී ලංකා මහ බැංකුව) වෙත පැවරී ඇත. අරමුදලේ භාරකාරත්වය ශ්‍රී ලංකා මහ බැංකුව සතු වන අතර, එහි කටයුතු ඵලදායී ලෙස සිදු කිරීමට ප්‍රමුඛත්වයක් ලබාදේ.

සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව (සේ.අ.අ. දෙපාර්තමේන්තුව), සේ.අ.අ. පනත ප්‍රකාරව ශ්‍රී ලංකා මහ බැංකුව වෙත පවරන ලද බලතල සහ කාර්යයන් ක්‍රියාත්මක කිරීම සිදු කරයි. සේ. අ. අ. පනත යටතේ ගෙවන ලද සියලුම දායක මුදල්, අධිභාර සහ ගාස්තු සහ අරමුදලෙහි මුදල් යෙදවීමෙන් ලැබෙන ආදායම එක් රැස් කිරීම, මෙහි ප්‍රධාන වගකීම වන අතර අරමුදලෙහි මුදල්වල ආරක්ෂාව සහතික කිරීම, එක් එක් සාමාජිකයා වෙනුවෙන් වෙන වෙනම ගිණුම් පවත්වා ගැනීම, කම්කරු කොමසාරිස් විසින් සහතික කරනු ලැබූ තැනැත්තන්හට පනත යටතේ හිමි ප්‍රතිලාභ ගෙවීම, පනතෙහි කාර්යයන් සඳහා වහාම අවශ්‍ය නොවන මුදල් ආයෝජනය කිරීම, අරමුදලේ ගිණුම් පවත්වාගෙන යාම, අරමුදලේ මූල්‍ය ප්‍රකාශන සැකසීම, එහි පිටපතක් කම්කරු විෂය සම්බන්ධ ඇමතිතුමා වෙත ලබා දීම සහ එය විගණකාධිපතිවරයාට ඉදිරිපත් කිරීම යන කාර්යයන් සේ. අ. අ. දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලබයි.

## අරමුදලේ පොදු ගිණුම් සහ සාමාජික ගිණුම් පවත්වාගෙන යාම

2023 වසර අවසානයේ දී, අරමුදලේ මුළු වටිනාකම රුපියල් බිලියන 3,857.4ක් වූ අතර, එය 2022 වසර අවසානයේ වූ රුපියල් බිලියන 3,459.9 හා සසඳන විට සියයට 11.5ක වර්ධනයක් පෙන්නුම් කරයි. ආයෝජන තුළින් ඉපැයූ ආදායම ප්‍රධාන වශයෙන් අරමුදලේ වර්ධනයට හේතු විය. 2022 වසරේ රුපියල් බිලියන 3,380.6ක් ව පැවති අරමුදලේ සාමාජිකයන් වෙත වූ මුළු වගකීම (සාමාජික ශේෂය) 2023 අවසන් වන විට රුපියල් බිලියන 3,817.9 දක්වා සියයට 12.9කින් වර්ධනය විය.

## දායක මුදල් ලැබීම් සහ හිමිකම් ඇති අයට ප්‍රතිලාභ ගෙවීම්

2023 වසරේ දායක මුදල් ලැබීම් රුපියල් බිලියන 210.6 දක්වා පෙර වසරේ පැවති රුපියල් බිලියන 194.6 සිට සියයට 8.2කින් වැඩි වූ අතර, අරමුදලේ සාමාජිකයන් සහ ඔවුන්ගේ නෛතික උරුමකරුවන් වෙත ගෙවූ ප්‍රතිලාභ ද රුපියල් බිලියන 215.9ක් දක්වා 2022 වසරේදී ගෙවූ රුපියල් බිලියන 163ට සාපේක්ෂව සියයට 32.4කින් වැඩි විය. ඒ අනුව, 2023 වසරේ දී ශුද්ධ දායකත්වය (දායක මුදල් ලැබීම්වලින් ප්‍රතිලාභ ගෙවීම් අඩු කළ පසු), රුපියල් බිලියන සෘණ 5.3ක් වූ අතර 2022 වසරේ දී එය රුපියල් බිලියන 31.6ක් විය.

## අරමුදලේ ආයෝජන ක්‍රියාකාරකම්

2023 වසර තුළ දී, සේ.අ.අ. විසින් සාමාජිකයින්ට දිගුකාලීන ධනාත්මක මූර්ත ප්‍රතිලාභ ලබා දීම සහ සාමාජික දායක මුදල්වල ආරක්ෂාව සහතික කිරීමේ

**අරමුදල පිළිබඳ මූලික දත්ත**

| අයිතමය | 2022 | 2023 (අ) | වෙනස (%) |
|---|---|---|---|
| අරමුදලෙහි සමස්ත වටිනාකම (රු.බිලියන) | 3,459.9 | 3,857.4 | 11.5 |
| සාමාජිකයන් සඳහා වන සමස්ත වගකීම (රු.බිලියන) | 3,380.6 | 3,817.9 | 12.9 |
| මුළු දායක මුදල් ලැබීම් (රු.බිලියන) | 194.6 | 210.6 | 8.2 |
| මුළු ප්‍රතිලාභ ගෙවීම් (රු.බිලියන) | 163.0 | 215.9 | 32.4 |
| ශුද්ධ දායක මුදල් (රු.බිලියන) | 31.6 | (5.3) | (116.8) |

(අ) තාවකාලික

මූලය : සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

අරමුණින්, ස්ථාපිත පාලන රාමුව තුළ සිය අරමුදල් කළමනාකරණ ක්‍රියාකාරකම් සිදු කරන ලදි. 2023 අවසානය වන විට රුපියල් බිලියන 3,867.6ක් වූ සමස්ත ආයෝජන කළඹින් සියයට 96.2ක් රජයේ සුරැකුම්පත්වල ද, සියයට 2.7ක් කොටස් ආයෝජන මත ද සියයට 0.4ක් සාංගමික ණයකරවල සහ ඉතිරි සියයට 0.7 ප්‍රතිමිලදී ගැණුම් ගිවිසුම්වලින් ද සමන්විත විය.

## සාමාජික ශේෂ සඳහා පොලී ගෙවීම්

බෙදාහැරීම සඳහා පවතින ලාභය මත පදනම්ව, 2023 වර්ෂය අවසාන වන විට පවතින සාමාජික ගිණුම් ශේෂයන් සඳහා සාධාරණ පොලී අනුපාතයක් පාලක මණ්ඩලයේ අනුමැතිය සහිතව සහ මුදල් හා කම්කරු අමාත්‍යවරුන්ගේ එකඟත්වයට යටත්ව ගෙවීමට බලාපොරොත්තු වේ.

## සාමාජික ගිණුම් ප්‍රකාශන නිකුත් කිරීම

සේ.අ.අ. පනතට අනුකූලව, අරමුදලට දායක මුදල් ගෙවන ලද සාමාජිකයින්ගේ සාමාජික ගිණුම්වල ශේෂයන් ඇතුළත් ගිණුම් ප්‍රකාශන අදාළ සේවා යෝජකයන් හරහා බෙදා හැරීමට කටයුතු කරන ලදි. ඒ අනුව, 2022 පළමු හා දෙවන භාගයට අදාළ සාමාජික ගිණුම් ප්‍රකාශන 2023 වර්ෂය තුළ බෙදා හරින ලදි. අදාළ සාමාජික ගිණුම් ප්‍රකාශන බෙදාහැරීමෙන් පසු සේ.අ.අ. විසින් මාධ්‍ය නිවේදනයක් ප්‍රකාශයට පත් කරන ලදි.

**නිකුත් කරන ලද සාමාජික ගිණුම් ප්‍රකාශන තොරතුරු**

| කාල සීමාව | සේවා යෝජකයින් සංඛ්‍යාව | සාමාජික ගිණුම් ප්‍රකාශන සංඛ්‍යාව (දායක මුදල් ගෙවන ලද සාමාජිකයින්) |
|---|---|---|
| 2022 පළමු භාගය | 63,831 | 2,176,751 |
| 2022 දෙවන භාගය | 72,000 | 2,579,208 |

මූලය : සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා මහ බැංකුව

## අරමුදලේ වාර්ෂික මූල්‍ය ප්‍රකාශ ප්‍රකාශයට පත් කිරීම

සේවක අර්ථසාධක අරමුදලේ 2022 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, අදාළ විගණකාධිපති වාර්තාව ලැබීමෙන් අනතුරුව එහි නිල වෙබ් අඩවියේ ප්‍රකාශයට පත් කරන ලදි.

## සාමාජිකයින්ට සහ අනෙකුත් පාර්ශ්වකරුවන්ට සේවා සැපයීම

සේ.අ.අ. දෙපාර්තමේන්තුව විසින් සිය සාමාජිකයින්ගේ සහ අනෙකුත් පාර්ශ්වකරුවන්ගේ අවශ්‍යතා වඩාත් කාර්යක්ෂම හා ඵලදායී ලෙස සපුරාලීම සඳහා සිය සේවාවන් 2023 වර්ෂයේ දී ද අඛණ්ඩව ලබා දෙන ලදි.

### නිවාස ණය ලබා ගැනීම සඳහා ඇප ශේෂ සහතික නිකුත් කිරීම

සේ.අ.අ. දෙපාර්තමේන්තුව විසින් 2023 වර්ෂයේ දී අරමුදලේ සාමාජිකයින් වෙනුවෙන් නිවාස ණය ඇප ශේෂ සහතික 13,784ක් නිකුත් කර ඇති අතර සාමාජිකයින් විසින් අනුමත ණය දෙන ආයතනවලින් ලබා ගෙන ඇති ණය ප්‍රමාණය රුපියල් මිලියන 10,240කි. තවද, 2022 වර්ෂය සඳහා ගෙවීම් පැහැර හරින ලද නිවාස ණය වාරික පියවීම සඳහා අදාළ සාමාජික ගිණුම්වලින් රුපියල් මිලියන 4,236ක් අඩු කර 2023 වර්ෂයේ දී අනුමත ණය දෙන ආයතන වෙත ප්‍රේෂණය කරන ලදි.

### පූර්ව විශ්‍රාම ප්‍රතිලාභ ආපසු ගෙවීමේ යෝජනා ක්‍රමය

සාමාජික ශේෂයෙන් සියයට 30ක් ආපසු ගෙවීමේ පූර්ව විශ්‍රාම ප්‍රතිලාභ යෝජනා ක්‍රමය යටතේ 2023 වර්ෂය තුළ සාමාජිකයින් 42,603ක් සඳහා රුපියල් බිලියන 25.8ක් මුදා හැර ඇති අතර මෙම යෝජනා ක්‍රමය 2015 ජූලි 1 දින සිට ක්‍රියාත්මක විය.

### වාර්තා සංශෝධනය

2023 වර්ෂයේ දී සාමාජික ගිණුම්වලට අදාළව සේ.අ.අ. දෙපාර්තමේන්තුව වාර්තා 105,627ක් පමණ සංශෝධනය කළේය. මෙම සංශෝධන අතරින් 97,998ක් නම්/ජාතික හැඳුනුම්පත් සංශෝධනවලට සම්බන්ධ වූ අතර 7,629ක් ගිණුම් සංශෝධනවලට සම්බන්ධ වූ ඒවා වීම විශේෂත්වයකි. ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය කාර්යාල හරහා ලැබුණු සංශෝධන සඳහා ඉල්ලීම් 23,571ක් වැනි ප්‍රමාණයක් මෙයට ඇතුළත් විය.

## විමසීම් මෙහෙයවීම

සේ.අ.අ. දෙපාර්තමේන්තුවේ මහජන සම්බන්ධතා සහ විමසීම් කවුළුව වෙත පැමිණෙන සාමාජිකයින්ගේ/සේවා යෝජකයින්ගේ සේවා ඉල්ලීම් ඉටුකරමින් සහ දුරකථන, තැපැල් සහ විද්‍යුත් තැපෑල හරහා ඉදිරිපත් කරන අනෙකුත් සියලුම විමසීම් සඳහා පිළිතුරු සපයමින් සේ.අ.අ. සියලුම පාර්ශ්වකරුවන් වෙත වටිනා සේවාවක් සපයන ලදි.

## සේවක අර්ථසාධක අරමුදලේ ක්‍රියාකාරකම් පිළිබඳ පාර්ශ්වකරුවන්ගේ දැනුම්වත්භාවය වැඩි දියුණු කිරීම

සේ.අ.අ. දෙපාර්තමේන්තුව විසින් අරමුදලේ පාර්ශ්වකරුවන්හට තමන් සපයන සේවාවන් පිළිබඳ දැනුම්වත්භාවය වැඩි දියුණු කිරීම සඳහා දෙපාර්තමේන්තුව විසින් 2023 දී වැඩසටහන් මාලාවක් සංවිධානය කරන ලදි. මෙම වැඩසටහන්වලට කම්කරු දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා ඉදිකිරීම් කර්මාන්ත මණ්ඩලය සහ වෙළෙඳ වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශය වැනි ආයතන සමඟ ඒකාබද්ධව පවත්වන ලද ජංගම සේවා සහ මහජන ප්‍රදර්ශන ඇතුළත් වේ. තවද, පෝස්ටර්, පත්‍රිකා, වීඩියෝ දර්ශන සහ ඉදිරිපත් කිරීම් ඇතුළු විවිධ සන්නිවේදන මාධ්‍යයන් හරහා සේවායෝජකයින්, සාමාජිකයින් සහ අනෙකුත් පාර්ශ්වකරුවන් සඳහා දැනුම්වත් කිරීමේ ක්‍රියාකාරකම් රාශියක් වසර තුළ දී සිදු කරන ලදි.

## 2023 වර්ෂයේ දී මුහුණ දුන් අභියෝග

ස්වෛරීත්ව, ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලිය හා බැඳුණු අවිනිශ්චිතතාවන් හමුවේ අභියෝගාත්මක වෙළෙඳපොළ තත්ත්වයකට මුහුණ දෙන ලද අතර භාණ්ඩාගාර බිල්පත්වලට ප්‍රමුඛතාව දෙමින්, සේ.අ.අ. රජයේ සුරැකුම්පත්වල ආයෝජනය කරන ලදි. කොටස් වෙළෙඳපොළෙහි දක්නට ලැබුණු සැලකිය යුතු උච්චාවචනයන් හමුවේ සේ.අ.අ. කොටස් ආයෝජන සම්බන්ධයෙන් සාපේක්ෂව ආරක්ෂාකාරී පිළිවෙතක් අනුගමනය කරන ලදි. අයහපත් සාර්ව ආර්ථික තත්ත්වයන් හේතුවෙන් සාංගමික ණයකරවල ආයෝජන අවස්ථා ද සීමා විය.

මුදල් අමාත්‍යාංශය විසින් 2023 ජූලි 04 දින දේශීය ණය ප්‍රශස්තකරණ වැඩසටහන ප්‍රකාශයට පත් කළ අතර, ඒ යටතේ විශ්‍රාම අරමුදල්වලට විකල්ප දෙකක් ඉදිරිපත් කරන ලදි. පළමු විකල්පය යටතේ, සේ.අ.අ. හි දැනට පවතින භාණ්ඩාගාර බැඳුම්කර කළඹින් නිශ්චිත අවම ප්‍රමාණය 2027 සිට 2038 දක්වා කාලය තුළ කල්පිරෙන නව භාණ්ඩාගාර බැඳුම්කර 12ක් සමඟ හුවමාරු කළ හැකි විය. මෙම හුවමාරුව යටතේ සේ.අ.අ. භාණ්ඩාගාර බැඳුම්කරවල ආයෝජනයෙන් උපයන ආදායම සඳහා සියයට 14ක ආදායම් බද්දකට යටත් වනු ඇත. සේ.අ.අ. දැනට පවතින භාණ්ඩාගාර බැඳුම්කර හුවමාරු

### සේවක අර්ථසාධක අරමුදල මගින් සාමාජිකයින්ට සහ අනෙකුත් පාර්ශ්වකරුවන්ට සේවා සැපයීම - 2023



නොකිරීමට තීරණය කළේ නම්, භාණ්ඩාගාර බැඳුම්කර ආයෝජන මගින් උපයන ආදායම සියයට 30ක ස්ථිර බදු අනුපාතිකයට යටත් වේ. ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය, සේ.අ.අ. භාරකරු වශයෙන්, මෙම විකල්පයන් හොඳින් සලකා බලා, භාණ්ඩාගාර බැඳුම්කර හුවමාරුවට සහභාගී වීමට තීරණය කරන ලදි. දිගුකාලීන දැක්මක් සහිතව අරමුදලේ සාමාජිකයින්ගේ යහපත පිණිස ගනු ලැබූ මෙම තීරණයට අනුව, සේ.අ.අ. විසින් රුපියල් බිලියන 2667.5ක මුහුණත අගයක් ඇති භාණ්ඩාගාර බැඳුම්කර හුවමාරුව සඳහා ඉදිරිපත් කරන ලදි.

තවද, සේ. අ. අ. හි වත්කම් රු. ට්‍රිලියන 3.9 ට ළඟා වීමත් සමඟ, සාපේක්ෂව කුඩා හා ද්‍රවශීලත්වයෙන් අඩු දේශීය මූල්‍ය වෙළෙඳපොළ තුළ ආයෝජන ඵලදායී ලෙස විවිධාංගීකරණය කිරීම අභියෝගයක් විය. මීට අමතරව, විශේෂයෙන් සාමාජික ප්‍රතිලාභ ගෙවීම් සහ සාමාජික විමසීම්වලට අදාළ ක්‍රියාකාරකම් වැඩි වූ අතර සම්පත්වල හිඟතාව මධ්‍යයේ වුව ද අමතර උත්සාහයක් දැරීම තුළින් සේවා කාර්යක්ෂමතාව පවත්වා ගැනීමට සේ.අ.අ. දෙපාර්තමේන්තුවට හැකි විය.

## ඉදිරි දැක්ම

තාක්ෂණය භාවිතා කරමින් ඉහළ ගිය කාර්යයන් ප්‍රමාණය, සාමාජික ගිණුම් කටයුතු හා වාර්තාකරණ කාර්යයන්ට අදාළ අවශ්‍යතා ඉටුකර ගැනීම සේ. අ.අ. හි අරමුණ වේ. මෙම ප්‍රයත්නයේ එක් පියවරක් වන්නේ බාහිර උපදේශන ආයතනයක සහාය ඇතිව දැනටමත් මූලික පියවර අවසන් කර ඇති සාමාජික වගකීම් කළමනාකරණය, ගිණුම්කරණය සහ ආයෝජන ඇතුළු පුළුල් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ විසඳුමෙහි ප්‍රසම්පාදන ක්‍රියාවලිය සිදු කිරීමයි. මෙහි දී සාමාජිකයින්ගේ දායකත්ව මුදල් සහ ඔවුන්ගේ දත්ත රැස්කිරීම සඳහා ඩිජිටල්/විද්‍යුත් මාර්ග ක්‍රියාත්මක කිරීම, ජාතික හැඳුනුම්පත් දත්තවලට අනුකූලව සේ. අ.අ. හි සාමාජිකයන් නැවත ලියාපදිංචි කිරීම අවසන් කිරීම තුළින් සාමාජිකයන්ගේ අනන්‍යතාව තහවුරු කරන දත්ත පද්ධතියක් පවත්වාගෙන යාම අවධානය යොමු කරන ලද අනෙකුත් ක්ෂේත්‍ර වේ. ආයෝජන සම්බන්ධයෙන් සලකා බැලිමේ දී, ප්‍රාග්ධන වෙළෙඳපොළෙහි නව ප්‍රවණතාවන් සමඟ විවිධ ආයෝජන උපකරණ බිහිවෙතැයි බලාපොරොත්තු වන අතර, එමගින් සේ.අ.අ. හට එහි ආයෝජන කළඹ ඵලදායී ලෙස විවිධාංගීකරණය කිරීමට හැකි වෙතැයි බලාපොරොත්තු වේ.

# මූල්‍ය බුද්ධි ඒකකය

2006 අංක 06 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා වන ආයතනය වශයෙන් ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය බුද්ධි ඒකකය, මුදල් අමාත්‍යවරයා ලෙස ගරු ජනාධිපතිතුමා විසින් නිකුත් කරන ලද නියමයක් මගින් නම් කරන ලදි. සිය ව්‍යවස්ථාපිත බලතල හා කාර්යයන් කාර්යක්ෂමව ඉටු කරමින් මූල්‍ය බුද්ධි ඒකකය 2007 වසරේ සිට ශ්‍රී ලංකා මහ බැංකුවේ පරිපාලනමය ව්‍යුහය තුළ ස්වාධීන දෙපාර්තමේන්තුවක් ලෙස ක්‍රියාත්මක විය.

## තොරතුරු විශ්ලේෂණය සහ මූල්‍ය බුද්ධි කළමනාකරණය

ශ්‍රී ලංකා මූල්‍ය බුද්ධි ඒකකය වෙත වාර්තාකරණ ආයතනවලින් සහ මහජනතාවගෙන් ලැබෙන සැක කටයුතු ගනුදෙනු වාර්තා විශ්ලේෂණය කිරීමෙන් පසු, අවශ්‍ය අවස්ථාවන්හි දී, වැඩි දුර විමර්ශනය සඳහා නීතිය ක්‍රියාත්මක කරන ආයතන සහ නියාමන අධිකාරීන් වෙත යොමු කෙරේ. 2023 වසරේ දී, ශ්‍රී ලංකා මූල්‍ය බුද්ධි ඒකකය වෙත සැක කටයුතු ගනුදෙනු වාර්තා 1,369ක් ලැබුණු අතර වැඩිදුර විමර්ශනය සඳහා වාර්තා 236ක් නීතිය ක්‍රියාත්මක කරන ආයතන සහ නියාමන අධිකාරීන් වෙත යොමු කරන ලදි.

## මූල්‍ය දත්ත කළමනාකරණය

වාර්තාකරණ ආයතන විසින් නියමිත සීමාවට ඉහළ අගයන්ගෙන් සිදු කරනු ලබන ගනුදෙනු වාර්තා මූල්‍ය බුද්ධි ඒකකය වෙත වාර්තා කරනු ලබයි. 2023 වසර තුළ වාර්තාකරණ ආයතන විසින් 'goAML' වාර්තාකරණ පද්ධතිය හරහා නියමිත සීමාව ඉක්මවා කරන ලද මුදල් ගනුදෙනු වාර්තා මිලියන 5.4ක් (තාවකාලික), විද්‍යුත් අරමුදල් හුවමාරු වාර්තා මිලියන 13.4ක් (තාවකාලික) සහ ජාත්‍යන්තර අරමුදල් හුවමාරු වාර්තා මිලියන 0.5ක් (තාවකාලික) වාර්තා කරන ලදි.

## මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ ත්‍රස්තවාදයට අරමුදල් සැපයීම මැඩ පැවැත්වීම සම්බන්ධයෙන් අවදානම් මත පදනම් වූ අධීක්ෂණය

ශ්‍රී ලංකා මූල්‍ය බුද්ධි ඒකකය විසින් වාර්තාකරණ ආයතන එනම් මූල්‍ය ආයතන සහ නම් කරන ලද මූල්‍ය නොවන ව්‍යාපාර සහ වෘත්තීන් සම්බන්ධයෙන් අධීක්ෂණ සිදු කරනු ලැබේ. ශ්‍රී ලංකා මූල්‍ය බුද්ධි ඒකකය විසින් අනුකූලතාව බලාත්මක කිරීම සඳහා ක්‍රියාමාර්ග ගැනීමට සහ ශ්‍රී ලංකා මූල්‍ය බුද්ධි ඒකකය හෝ නීතිය ක්‍රියාත්මක කරන ආයතන විසින් සිදු කිරීමට අපේක්ෂා කරන විමර්ශන සඳහා පහසුකම් සලස්වනු පිණිස වාර්තාකරණ ආයතනවල නියාමන අධිකාරීන් සමග සහයෝගයෙන් කටයුතු කරයි. මූල්‍ය බුද්ධි ඒකකය විසින් 2023 වසර තුළ දී මූල්‍ය ආයතන පිළිබඳව එතැන් පරීක්ෂණ 23ක්, එතැන් ස්ථානීය පරීක්ෂණ 6ක්, විතැන් ස්ථානීය පරීක්ෂණයක් සහ තේමාත්මක සමාලෝචන 4ක් පවත්වන ලදි.

## මුදල් විශුද්ධිකරණය/ත්‍රස්තවාදයට මුදල් සැපයීම සඳහා වන ජාතික අවදානම් ඇගයීම

රටේ මුදල් විශුද්ධිකරණය/ත්‍රස්තවාදයට මුදල් සැපයීම සඳහා වන දෙවන ජාතික අවදානම් ඇගයීම 2021/2022 වර්ෂ තුළ සාර්ථකව සිදු කරන ලද අතර 2023 වසර තුළ එම කාර්යය සම්පූර්ණ කරන ලදි. එම ඇගයීම මගින් හඳුනා ගන්නා ලද ශ්‍රී ලංකාව මුහුණ දෙන ඉහළ අවධානයක් යොමු කළ යුතු මුදල් විශුද්ධිකරණ/ත්‍රස්තවාදයට මුදල් සැපයීම සම්බන්ධ තර්ජන, ඊට නතුවීමට ඇති ඉඩකඩ සහ අවදානම් ඉස්මතු කරන අතර එහි සංක්ෂිප්ත වාර්තාව ශ්‍රී ලංකා මූල්‍ය බුද්ධි ඒකකයෙහි වෙබ් අඩවියේ ප්‍රකාශයට පත් කරන ලදි. තවද, 2021/2022 ජාතික අවදානම් ඇගයීමේ ප්‍රතිඵල මත පදනම්ව 2023-2028 කාලසීමාව සඳහා සකස් කරන ලද මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩ පැවැත්වීම සඳහා වන ජාතික ප්‍රතිපත්තිය, අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදි.

## මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩ පැවැත්වීමේ ජාතික සම්බන්ධීකරණ කමිටුවේ සහ අමාත්‍ය මණ්ඩලය විසින් පත් කළ කාර්ය සාධක බලකායේ ලේකම් කාර්යාලය ලෙස කටයුතු කිරීම

ශ්‍රී ලංකාවේ මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩ පැවැත්වීමේ රාමුව සම්බන්ධයෙන් උපදේශන මණ්ඩලය ලෙස ක්‍රියා කරන

මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩ පැවැත්වීමේ ජාතික සම්බන්ධීකරණ කමිටුවේ ලේකම් කාර්යාලය ලෙස ද මූල්‍ය බුද්ධි ඒකකය කටයුතු කරනු ලැබේ. මෙම ජාතික සම්බන්ධීකරණ කමිටුව ප්‍රධාන පාර්ශ්වකරුවන්ගේ නියෝජිතයින්ගෙන් සමන්විත වේ. තවද, අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩ පැවැත්වීම සඳහා වන කාර්ය සාධක බලකායේ ලේකම් කාර්යාලය ලෙස ද ශ්‍රී ලංකා මූල්‍ය බුද්ධි ඒකකය 2023 දෙසැම්බර් මාසයේ සිට ක්‍රියා කරනු ලබයි. 2025 වර්ෂයේ දී පැවැත්වීමට නියමිත අන්‍යෝන්‍ය ඇගයීම සඳහා ශ්‍රී ලංකාවේ පෙර සුදානම සහතික කිරීම පිණිස අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද පාර්ශ්වකරුවන් 24 දෙනෙකුට අයත්වන ක්‍රියාකාරී සැලසුම්වල ප්‍රගතිය පිළිබඳ අධීක්ෂණය කිරීම මෙම කාර්ය සාධක බලකාය මගින් අපේක්ෂා කෙරේ.

## දැනුම්වත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම

ශ්‍රී ලංකා මූල්‍ය බුද්ධි ඒකකය විසින් 2023 වර්ෂයේ දී දෙවන ජාතික අවදානම් ඇගයීමෙහි ප්‍රතිඵල, මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩ පැවැත්වීම සඳහා වන ජාතික ප්‍රතිපත්තිය, මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩ පැවැත්වීම සඳහා වන අනුකූලතාව සහ නෛතික රාමුව, තහනම් යෝජනා ක්‍රම සහ වංචා, අතථ්‍ය මුදල් සම්බන්ධ විමර්ශන, goAML පද්ධතිය වෙත වාර්තා කිරීම යනාදිය සම්බන්ධයෙන් පුහුණු වැඩසටහන් අඛණ්ඩව පවත්වන ලද අතර මහජනතාව දැනුවත් කිරීමේ සැසි ද සිදු කරන ලදි.

## ඉදිරි දැක්ම

මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩ පැවැත්වීමේ රාමුව සම්බන්ධයෙන් 2025 මාර්තු මාසයේ දී ඇරඹෙන අන්‍යෝන්‍ය ඇගයීමට මුහුණ දීම සඳහා ශ්‍රී ලංකාවේ පෙර සූදානමක් ඇති කරමින්, ශ්‍රී ලංකා මූල්‍ය බුද්ධි ඒකකය පාර්ශ්වකරුවන් සඳහා වන ක්‍රියාකාරී සැලසුම් ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය කරයි. මේ අනුව, රටේ මුදල් විශුද්ධිකරණ සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම සම්බන්ධ අවදානම් පැතිකඩ පිළිබිඹු වන පරිදි ජාතික අවදානම් ඇගයීම යාවත්කාලීන කරනු ඇති අතර මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩ පැවැත්වීමේ ජාතික ප්‍රතිපත්තිය ද ක්‍රියාත්මක කෙරෙනු ඇත. 2006 අංක 5 දරන මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ පනත, 2006 අංක 6 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනත සහ 2005 අංක 25 දරන ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීම මැඩ පැවැත්වීමේ සම්මුති පනත යන මූල්‍ය බුද්ධි ඒකකයේ කාර්යයන්ට අදාළ ප්‍රධාන පනත් සඳහා යෝජිත සංශෝධන සම්පූර්ණ කිරීමට මූල්‍ය බුද්ධි ඒකකය අපේක්ෂා කරයි.

නීතිමය සංශෝධන මගින් පනවනු ලබන දණ්ඩන තන්ත්‍රය, වඩාත් සමානුපාතික වන අයුරින් සහ අනාගත අනනුකූලතාවන් වළක්වන අයුරින් ශක්තිමත් කිරීමට අපේක්ෂා කරනු ලබයි. ක්‍රමයෙන් විකාශය වන මුදල් විශුද්ධිකරණය වැළැක්වීම හා ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීම පිළිබඳ වන ජාත්‍යන්තර ප්‍රමිතීන්ට හා නිර්දේශයන්ට අනුකූල වන පරිදි, 2007 අංක 07 දරන සමාගම් පනත, 1917 අංක 09 දරන භාර ආඥා පනත, 2014 අංක 33 දරන ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනත යන පනත් සංශෝධනය කිරීමට සහ යෝජිත සූදු නියාමන අධිකාරී පනත් කෙටුම්පත සහ අපරාධමය ඉපයීම් පිළිබඳ යෝජිත නීතිය යන නව නීති ගෙන ඒමට ශ්‍රී ලංකා මූල්‍ය බුද්ධි ඒකකය සිය සහාය සලසමින් සිටියි. තවද, මූල්‍ය බුද්ධි ඒකකය විසින් ක්‍රියාමාර්ග ගත හැකි බුද්ධි තොරතුරු ජනනය සඳහා මෙහෙයුම් සහ උපායමාර්ගික විශ්ලේෂණ අඛණ්ඩව සිදු කරනු ඇත. එමෙන්ම, මූල්‍ය බුද්ධි ඒකකය විසින් වාර්තාකරණ ආයතනයන්හි මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩ පැවැත්වීමේ අනුකූලතා වගකීම් සපුරාලීම සහතික කිරීම සඳහා අවදානම් මත පදනම් වූ අධීක්ෂණ ද තවදුරටත් ක්‍රියාත්මක කරනු ඇත.

# අවදානම් කළමනාකරණය සහ අනුකූලතාව

මහ බැංකුකරණයේ ගතික වපසරිය තුළ, ඵලදායි අවදානම් කළමනාකරණය, අනුකූලතාව සහ අභ්‍යන්තර පාලනය විසින් ස්ථාවරත්වයේ සහ ප්‍රතිපත්තිමය විසඳුම්වල පදනම සකසනු ලබයි. ඒ අනුව, අවදානම් කළමනාකරණය, අනුකූලතාව සහ අභ්‍යන්තර පාලන භාවිතයන්හි ඉහළම ප්‍රමිතීන් ආරක්ෂා කිරීම මහ බැංකුවේ වගකීම වෙයි. අවදානම් හඳුනා ගැනීම, තක්සේරු කිරීම සහ අවම කිරීම සඳහා වූ ක්‍රියාකාරී ප්‍රවේශයන් මෙන්ම, අනුකූලතා ක්‍රියාමාර්ග සහ ශක්තිමත් අභ්‍යන්තර පාලන ක්‍රියාමාර්ග තුළින් පාර්ශ්වකරුවන්ගේ අවශ්‍යතා ආරක්ෂා කිරීම, විනිවිදභාවය සහතික කිරීම සහ මහජනතාවගේ විශ්වාසය පවත්වා ගැනීම සඳහා මහ බැංකුව කටයුතු කරයි. එමෙන්ම යහපාලනය, අවදානම් සහ අනුකූලතා හැකියාවන් ශක්තිමත් කිරීම ඉලක්ක කරගත් නව උපායමාර්ග සහ තාක්ෂණ ක්‍රමවේද හඳුන්වා දීම් සිදු කෙරෙමින් පවතියි.

## අවදානම් පාලන රාමුව

අවදානම් පාලන රාමුව ප්‍රධාන ස්ථර දෙකකින් සමන්විත වේ:

අවදානම් පාලන ව්‍යුහය, පාලක මණ්ඩලයේ, පාලක මණ්ඩල අවදානම් අධීක්ෂණ කමිටුවේ සහ විගණන කමිටුවේ භූමිකාවන් සහ වගකීම් ගෙන හැර දක්වයි. එය වගවීම සහ තීරණ ගැනීම සඳහා වූ විනිවිද පෙනෙන රාමුවක් ස්ථාපිත කරයි.

අවදානම් කළමනාකරණ ව්‍යුහය තුළ මහ බැංකුවේ සියලුම ක්‍රියාකාරකම් හරහා අවදානම් හඳුනා ගැනීම, තක්සේරු කිරීම, අවම කිරීම සහ අධීක්ෂණය කිරීම සඳහා නිර්මාණය කර ඇති පුළුල් මාර්ගෝපදේශ, ක්‍රියා පටිපාටි සහ මෙවලම් සමූහයක් ඇතුළත් වේ. එමෙන්ම අවදානම් කළමනාකරණ ව්‍යුහය මඟින් මූල්‍ය නොවන අවදානම් කළමනාකරණ සහ ආයෝජන අධීක්ෂණ කමිටුවල භූමිකාවන් සහ වගකීම් ගෙන හැර දක්වයි.

මහ බැංකුව සිය අවදානම් කළමනාකරණ ව්‍යුහය ශක්තිමත් කිරීම සඳහා තෙවැදෑරුම් ආකෘතියක් අනුගමනය කරයි. පළමු පෙළ ක්‍රමවේදයට අවදානම් දැරීමේ ක්‍රියාකාරකම් සඳහා වගකිව යුතු දෙපාර්තමේන්තු ඇතුළත් වන අතර, ඒවායේ ක්‍රියාකාරි ක්ෂේත්‍ර තුළ අවදානම් හඳුනා ගැනීම,

### ශ්‍රී ලංකා මහ බැංකුවේ අවදානම් පාලන රාමුව



තක්සේරු කිරීම සහ කළමනාකරණය කිරීම සඳහා වගකිව යුතු වේ. දෙවන පෙළ ක්‍රමවේදයට අනුකූලතාව සහ අවදානම් අධීක්ෂණය වැනි අවදානම් කළමනාකරණ කාර්යයන් ඇතුළත් වන අතර එමඟින් බැංකුව හරහා ඵලදායී අවදානම් කළමනාකරණ පිළිවෙත් ක්‍රියාත්මක කිරීම, සහතික කිරීම සඳහා ස්වාධීන අධීක්ෂණය සහ මග පෙන්වීම සිදු කරයි. තෙවන පෙළ ක්‍රමවේදය අභ්‍යන්තර විගණනයෙන් සමන්විත වන අතර, අවදානම් කළමනාකරණ ක්‍රියාවලීන් සහ පාලනයන් පිළිබඳ ස්වාධීන තක්සේරුවක් ලබා දීම, අවදානම් කළමනාකරණ රාමුවේ සඵලතාව පිළිබඳව කළමනාකාරීත්වයට සහතිකයක් ලබා දීම සිදු කරයි. තෙවැදෑරුම් ආකෘතියට අනුගත වෙමින්, විවිධ අවිනිශ්චිතතා සහ අභියෝග හමුවේ සිය අවදානම් කළමනාකරණ හැකියාවන් ශක්තිමත් කිරීම සහ සමස්ත ඔරොත්තු දීමේ හැකියාව වැඩි දියුණු කිරීම මහ බැංකුවේ අරමුණයි.

## අවදානම කළමනාකරණය කිරීම

දෙවන පෙළ ක්‍රමවේදය තුළ, ක්‍රියාකාරකම් හා සම්බන්ධ මූල්‍ය හා මෙහෙයුම් අවදානම් ඉලක්ක කර ගනිමින්, කේන්ද්‍රගත වූ අවදානම් කළමනාකරණ කාර්යයක් මහ බැංකුව විසින් සිදු කරයි. මහ බැංකුව සිය මෙහෙයුම්වල අඛණ්ඩතාව සහතික කිරීම, නියාමන අවශ්‍යතා සපුරාලීම සහ වගවීම, සහ විනිවිදභාවය පිළිබඳ ප්‍රමිතීන් තහවුරු කිරීම සඳහා ශක්තිමත් අවදානම් කළමනාකරණ පිළිවෙත්වලට අනුගත වේ. විවිධ මූල්‍ය අවදානම්, එනම් ණය, වෙළෙඳපොළ සහ ද්‍රවශීලතා අවදානම්, සහ මෙහෙයුම් අවදානම් වැනි අවදානම් කළමනාකරණය කිරීම සඳහා පහසුකම් සම්පාදනය කරනු ලබන්නේ අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසිනි. විනිවිද පෙනෙන සන්නිවේදනය සහ වාර්තාකරණය, දැනුම්වත් තීරණ ගැනීමට සහ ඵලදායි අවදානම් පාලනයට උපකාරී වේ. ඉදිරියේ දී, මෙහෙයුම් අවදානම් තක්සේරු කිරීමේ පද්ධතියක් හඳුන්වාදීම, අවදානම් දැරීමේ ව්‍යුහය ක්‍රියාත්මක කිරීම, අවදානම් සහ අනුකූලතා මෙහෙයවීම සඳහා ස්වයංක්‍රීය පද්ධතියක් යෙදවීම සහ මහ බැංකුවේ ශේෂ පත්‍රයේ ආතතිය නිරන්තර පරීක්ෂා කිරීම යනාදිය සඳහා මූලපිරීම් මේ වනවිටත් ගනිමින් පවතී.

## අනුකූලතාව අධීක්ෂණය සහ වාර්තා කිරීම

මහ බැංකුවේ අනුකූලතා කාර්යභාරය හරහා, නීතිමය සහ නියාමන අනුකූලතා අවශ්‍යතා සහ ඉදිරියේ දී ඇතිවිය හැකි අනුකූල නොවන අවස්ථාවන් එක් කිරීම, විශ්ලේෂණය කිරීම සහ වාර්තා කිරීම අපේක්ෂා කෙරේ. තව ද, ආයතනය පුරා නියාමන අනුකූලතා මූලධර්ම ස්ථාපනය කිරීමට සහ සෑම තරාතිරමකම වගකීම් සහිත වෙළෙඳපොළ හැසිරීම සහතික කිරීමටත් සුදුසු අනුකූලතා සංස්කෘතියක් මහ බැංකුව තුළ ප්‍රවර්ධනය කෙරේ. මේ සඳහා නියාමන බැඳීම් පිළිබඳව දැනුම්වත් කිරීම, කාර්ය මණ්ඩලය සඳහා විස්තීර්ණ අනුකූලතා පුහුණුවක් ලබා දීම සහ අඛණ්ඩතාව සහ වගවීම සඳහා දැඩි කැපවීමක් වර්ධනය කිරීම සඳහා ක්‍රියාකාරී උත්සාහයන් සිදු කෙරෙනු ඇත. මෙවැනි අනුකූලතා සංස්කෘතියක් ඇති කිරීම හරහා බැංකුව තුළ නියාමන පිළිපැදීම අනුකූල කරගත් ආයතනික පරිසරයක් නිර්මාණය කිරීම මහ බැංකුවේ අරමුණයි.

# අභ්‍යන්තර විගණනය

අවදානම් කළමනාකරණයේ සහ පාලන ක්‍රියාවලීන්ගේ කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම සහ ඇගයීම සඳහා පද්ධතිමය සහ ක්‍රමානුකූල ප්‍රවේශයක් ගැනීම තුළින් මහ බැංකුවේ වටිනාකම් වැඩි දියුණු කිරීමට සහ ආරක්ෂා කිරීමට මෙන්ම බැංකුවේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා අවදානම පදනම් කරගත් වාස්තවික තහවුරුවක්, උපදෙස් සහ දෘෂ්ටීන් අභ්‍යන්තර විගණන කාර්යය මගින් ලබා දෙනු ලැබේ. අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව, අවදානම් කළමනාකරණ රාමුවේ තෙවන පෙළ ලෙස කටයුතු කරමින් මහ බැංකුවේ මෙහෙයුම් කටයුතුවලට වටිනාකම් එකතු කිරීමට සහ ඒවා වැඩි දියුණු කිරීමට නිර්දේශ සහ ස්වාධීන සහ වාස්තවික තහවුරුවන් ලබා දෙයි. මහ බැංකුවේ අභ්‍යන්තර විගණන කාර්යයේ ස්වාධීනත්වය තහවුරු කරනු පිණිස ප්‍රධාන අභ්‍යන්තර විගණකවරයා, අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ ප්‍රධානී ලෙස කාර්යමය වශයෙන් විගණන කමිටුව හරහා පාලක මණ්ඩලයට ද, පරිපාලනමය වශයෙන් අධිපතිතුමාට ද වාර්තා කරයි.

අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ අරමුණ සහ මෙහෙවර, ප්‍රමිතීන්, කාර්යය වපසරිය, අධිකාරී බලය, වගකීම, ස්වාධීනත්වය සහ වාස්තවිකත්වය මුදල් මණ්ඩලය විසින් අනුමත කරන ලද අභ්‍යන්තර විගණන අධිකාරී පත්‍රයේ අන්තර්ගතව ඇත. එය අභ්‍යන්තර විගණන ක්‍රියාවලියේ ඵලදායිතාව සහ සුපිළිපන්නතාව තහවුරු කිරීමට ඉවහල් වේ. එය විනිවිදභාවය සහ යහපාලනයකින් යුතු බව සඳහා වන කැපවීම පෙන්නුම් කරමින් පාර්ශ්වකරුවන් අතර විශ්වාසය සහ විගණන පරිචයේ ඒකාග්‍රතාව ඉහළ නැංවීමට ද ඉවහල් වෙයි.

## 2023 අංක 16 දරන මහ බැංකු පනත යටතේ අභ්‍යන්තර විගණන කාර්ය සඳහා සිදු කළ ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ

අභ්‍යන්තර විගණන කාර්යයේ වැදගත්කම මහ බැංකු පනතේ 102 වන වගන්තියෙන් මනාව පිළිගෙන ඇත. එමගින් අන්තර්ජාතික වෘත්තිමය පරිචය රාමුවට (International Professional Practices Framework) අනුකූලව ස්ථාපිත කොට ඇති විගණන අධිකාරී පත්‍රයෙහි සඳහන් අභ්‍යන්තර විගණනයට අදාළ බලතල, රාජකාරීන් සහ කාර්යයන් ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රධාන අභ්‍යන්තර විගණකවරයා පත් කිරීමේ ප්‍රතිපාදන පාලක මණ්ඩලය වෙත ලබාදී ඇත.

## විගණනයන් සිදු කිරීම, විගණන ප්‍රගතිය වාර්තා කිරීම සහ විගණන නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ තත්ත්වය පසුවිපරම් කිරීම

පරිපූර්ණ වශයෙන් අවදානම් පදනම් කරගත් ක්‍රමවේදයක් තුළින් වාර්ෂිකව මහ බැංකුවේ විගණනය කළ හැකි ක්‍රියාකරකම් සියල්ල යාවත්කාලීන කරමින් අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව විසින් ඉදිරි වසර හතර සඳහා වන උපාය මාර්ගික විගණන සැලැස්ම සහ ඉදිරි වසර සඳහා වන වාර්ෂික විගණන සැලැස්ම සකස් කරයි.

ඒ අනුව, 2023 වසර තුළ දී, මහ බැංකුවේ ප්‍රධාන කාර්යයන් ආවරණය වීම තහවුරු කරමින් අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව එහි අවදානම් පදනම් කර ගත් වාර්ෂික විගණන සැලැස්ම ක්‍රියාත්මක කරනු ලැබූ අතර ප්‍රතිපත්ති, අනුකූලතා, මෙහෙයුම්, නෛතික සහ අනෙකුත් අවදානම් ආවරණය වන ලෙස බැංකුවේ උපායමාර්ගික අරමුණු ළඟා කර ගැනීම සඳහා බැංකුවේ මෙහෙයුම් කටයුතු වැඩි දියුණු කිරීමට විගණන නිර්දේශ ලබා දෙන ලදි. සිදු කරන ලද විගණන පැවරුම්වල ප්‍රගතිය සහ විගණන නිර්දේශවල ක්‍රියාත්මක කිරීමේ තත්ත්වය, විගණන කමිටුව හරහා මුදල් මණ්ඩලයට/පාලක මණ්ඩලයට වාර්තා කරන ලදි.

## තත්ත්ව තහවුරු කිරීමේ සහ වැඩි දියුණු කිරීමේ වැඩසටහන

ඵලදායිතාව සහ වඩා හොඳ පරිචයන්ට අනුගත වීම තහවුරු කිරීම උදෙසා බැංකුවේ අභ්‍යන්තර විගණන කාර්යයන් ගෝලීයව පිළිගත් ප්‍රමිතීන්ට සහ රාමුවලට අනුගතව සිදු කරනු ලබයි. අභ්‍යන්තර විගණකවරුන්ගේ ආයතනයේ (Institute of Internal Auditors) අන්තර්ජාතික වෘත්තිමය පරිචය රාමුව අනුගමනය කිරීම මගින් අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව එහි මෙහෙයුම් කටයුතු ක්‍රියාත්මක කිරීමේ දී ඉහළ තත්ත්වයේ වෘත්තිමයභාවයකින්, සුපිළිපන්නතාවකින් සහ සාදාචාරාත්මකව ක්‍රියා කිරීම අඛණ්ඩව සිදු කරන ලදි.

අන්තර්ජාතික වෘත්තිමය පරිචය රාමුව සමඟ වන අනුකූලතාව තහවුරු කරනු වස් අභ්‍යන්තර තක්සේරුකරණයන් සිදු කරන ලද අතර ඊට 2023 වසරේ දී සිදු කරන ලද අභ්‍යන්තර විගණන කාර්යයන්වල අඛණ්ඩ

කාර්යසාධන අධීක්ෂණයන් (Ongoing Monitoring of Performance) සහ කාලච්ඡේදමය ස්වයං තක්සේරුකරණය (Periodic Self-Assessment) ඇතුළත් වන අතර ඒවායේ ප්‍රතිඵල විගණන කමිටුව හරහා පාලක මණ්ඩලය වෙත වාර්තා කරන ලදි.

2023 වසර තුළ දී, මහ බැංකුවේ අභ්‍යන්තර විගණන කටයුතු ගැඹුරින් සිදු කරන ලද බාහිර තත්ත්ව තක්සේරුකරණයකට (External Quality Assessment) ලක් වූ අතර ඒ සඳහා ආර්මේනියාවේ සහ නෙදර්ලන්තයේ අභ්‍යන්තර විගණනය පිළිබඳ ප්‍රවීණයන් කණ්ඩායමක් සහභාගී විය.

මෙහි දී මහ බැංකුවේ අභ්‍යන්තර විගණන කටයුතු අන්තර්ජාතික වෘත්තිමය පරිචය රාමුවට අනුකූලව සිදු වනවාද යන්න පූර්ණ වශයෙන් ඇගයීමට ලක් කරන ලදි. ඒ අනුව, මහ බැංකුවේ අභ්‍යන්තර විගණන කාර්යයන් අන්තර්ජාතික වෘත්තිමය පරිචය රාමුව සමග පූර්ණ වශයෙන් අනුකූල වන බව මෙම තක්සේරුවෙන් තහවුරු කරන ලදි.

තවද, පාර්ශ්වකරුවන්ට අභ්‍යන්තර විගණන ක්‍රියාවලිය හා වන සබඳතාවන් වැඩි දියුණු කිරීමට සියලුම දෙපාර්තමේන්තුවල නියෝජිතයින් සඳහා දැනුම්වත් කිරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කරන ලදි.

## විගණන කමිටුව සඳහා පහසුකම් සැලසීම

ප්‍රධාන අභ්‍යන්තර විගණකවරයා විගණන කමිටුවේ සහකාර ලේකම් ලෙස කටයුතු කරන අතර විගණන කමිටුවේ ලේකම් කටයුතු සඳහා පහසුකම් සපයයි.

ඒ අනුව විගණන කමිටුවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම පිළිබඳ පසු විපරම් සිදු කරන අතර ඒවා වසර තුළ දී වාර්තා කරන ලදි.

# මානව ප්‍රාග්ධනය සහ පරිපාලනය

වගකිවයුතු සේවායෝජකයෙකු වශයෙන් මහ බැංකුව, කැපවීමෙන් රාජකාරි කටයුතු කරන තම කාර්ය මණ්ඩලය ආර්ථිකයට සහ මූල්‍ය පද්ධතියට සිය දායකත්වය අත්‍යවශ්‍යයෙන්ම ලබා දිය යුතු බව පිළිගනී. දෙපාර්තමේන්තු 29 ක් සහ සේවකයින් 1,226 කින් සමන්විත බැංකුවේ සාර්ථකත්වය රඳා පවතින්නේ සේවා නියුක්තිකයින්ගේ අඛණ්ඩ වෘත්තීයභාවය, තාක්ෂණික නිපුණත්වය, අවංකභාවය සහ උද්යෝගය මතය.

සේවයේ නියුතු ව සිටි කාර්ය මණ්ඩලය මත දැඩි පීඩනයක් ඇති කළ සහ මෙහෙයුම් කාර්යක්ෂමතාවට බාධා මතු කළ සේවය හැර යාමේ ඉහළ අනුපාතිකය සහ නිසි කලට පෙර විශ්‍රාම යාම ඇතුළු විශාල අභියෝග රැසකට ශ්‍රී ලංකා මහ බැංකුව 2023 වසරේ දී මුහුණ දුන්නේය. මෙම අභියෝගවලට පිළියම් යෙදීමේ දී ශ්‍රී ලංකා මහ බැංකුව සේවක තෘප්තිය ඉහළ නැංවීමට අවශ්‍ය පියවර සේම අලුතින් සේවකයින් බඳවා ගැනීම කඩිනම් කිරීම සඳහා ද අවශ්‍ය කටයුතු සම්පාදනය කළේ ය.

## කුසලතා අත්පත් කර ගැනීම

දේශීය මිල ස්ථායීතාව ළඟා කර ගැනීම හා පවත්වා ගෙන යාම, සහ මූල්‍ය පද්ධතියේ ස්ථායීතාව සුරක්ෂිත කිරීම යන මහ බැංකුවේ මූලික කාර්යභාරය ඉටු කිරීම සඳහා ඉහළ සුදුසුකම් සහිත වඩාත් යෝග්‍ය අපේක්ෂකයින් ආකර්ෂණය කර ගැනීමටත් බඳවා ගැනීමටත් අවශ්‍ය වන සුවිශේෂිත වූ කුසලතා අත්පත් කර ගැනීමේ උපායමාර්ගයක් මහ බැංකුව අනුගමනය කරයි.

ශ්‍රී ලංකා මහ බැංකුවේ කුසලතා අත්පත් කර ගැනීමේ ප්‍රයත්නයන්හි දී ඉහළ අධ්‍යාපනික සුදුසුකම් සහිත අපේක්ෂකයින් හඳුනා ගැනීමට පමණක් නොව විචාරාත්මක චින්තනයක් ඇති, ගැටලු විසඳීමේ මෙන්ම අනුවර්තනය වීමේ හැකියාව ද විදහා දක්වන අපේක්ෂකයින් හඳුනා ගැනීම සඳහා ප්‍රමුඛත්වය දෙනු ලැබේ. ආර්ථික ප්‍රතිපත්ති සම්පාදනයේ පවතින සංකීර්ණතා මඟහරවා ගැනීමට සහ මූල්‍ය පද්ධතියේ ස්ථායීතාව පවත්වා ගැනීමට මෙම සුදුසුකම් අත්‍යවශ්‍ය වේ.

2023 දී, කළමනාකරණ අභ්‍යාසලාභීන් බඳවා ගැනීමේ සහ අභ්‍යන්තර අයදුම්කරුවන් පරිවාසික මාණ්ඩලික නිලධාරීන් ලෙස උසස් කිරීමේ ක්‍රියාවලිය ද කඩිනම් කරන ලදි.

තවද, 2023 වසර තුළ දී, විවිධ සේවක උසස්වීම් යෝජනා ක්‍රම යටතේ කාර්ය මණ්ඩල සාමාජිකයින් 163 දෙනෙකුට ඔවුන්ගේ වෘත්තීය ප්‍රගතිය සහතික කරමින් ඉහළ තනතුරු සඳහා උසස්වීම් ලබා දෙන ලදි. කළමනාකාරිත්වය සහ සේවකයින් එක්ව සහයෝගයෙන් ගැටලු විසඳීම දිරිමත් කිරීමේ අරමුණින් "Townhall" සංවාද මණ්ඩපය වැනි මූලාරම්භයන් හරහා විවෘත සංවාදයක් බැංකුව තුළ ඇති කිරීමට ද පියවර ගන්නා ලදි.

## පුහුණුව හා සංවර්ධනය

මහ බැංකුව, සිය පුහුණු ආයතනය වන බැංකු විද්‍යා පියෙස හරහා 2023 දී ශ්‍රම බලකායේ කුසලතා සංවර්ධන ප්‍රයත්නයන් අඛණ්ඩ ව ක්‍රියාත්මක කරන ලදි. තවද, මානව සම්පත් දෙපාර්තමේන්තුව කාර්ය මණ්ඩලයේ කුසලතා, දැනුම සහ වෘත්තිය ප්‍රවීණත්වය ඉහළ නැංවීම සඳහා පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතුවල නියැලීමට, වෘත්තීය සුදුසුකම් අත්පත් කර ගැනීමට සහ ජාත්‍යන්තර ආයතන විසින් පවත්වනු ලබන පුහුණු සැසිවලට සහභාගි වීමෙන් මහ බැංකු සහ සම්බන්ධිත ක්ෂේත්‍රයන්ට අදාළ දැනුම යාවත්කාලීන කර ගැනීමට ඉඩ ප්‍රස්ථා සලසා දෙන ලදි.

## සේවකයින්ගේ යහපැවැත්ම සඳහා ගනු ලැබූ ක්‍රියාමාර්ග

විදේශීය වෙළෙඳපොළ තුළ තරගකාරී රැකියා සුලබ වීම සහ රටෙහි පවතින ආර්ථික තත්ත්වය හේතුවෙන් පසුගිය වසර කිහිපය තුළ සිය පළපුරුදු සහ දක්ෂ කාර්ය මණ්ඩලය රඳවා ගැනීම මහ බැංකුවට සැලකිය යුතු අභියෝගයක් විය. මෙම අභියෝගවලට ඵලදායි ලෙස මුහුණ දීම සහ එම අභියෝග නිසා බැංකුවේ ක්‍රියාකාරකම් කෙරෙහි ඇති විය හැකි බලපෑම අවම කිරීම සඳහා සේවක තෘප්තිය ඉහළ නැංවීමට, වෘත්තීය වර්ධනය සහ සංවර්ධනය සඳහා අවස්ථා ලබා දීමට සහ කාර්ය මණ්ඩලය තුළ ආයතනය වෙනුවෙන් ඇති පක්ෂපාතිත්වය සහ කැපවීම ඉහළ නැංවීමට උපකාරි වන සමස්ත ආයතනික වටපිටාව සංවර්ධනය කිරීමේ ක්‍රමෝපායන් මහ බැංකු කළමනාකාරීත්වය විසින් ක්‍රියාත්මක කළේය. සේවක තෘප්තිය ඇති කරලීම වෙනුවෙන් කළමනාකාරීත්වය දැක් වූ කැපවීමේ එක් පියවරක් ලෙස මහ බැංකුවේ විවිධ කාර්ය මණ්ඩල ප්‍රතිලාභ යෝජනා ක්‍රම යටතේ සේවා




නියුක්තිකයින්ට වෛද්‍ය පහසුකම් සහ කාර්ය මණ්ඩල ණය පහසුකම් ඇතුළු සේවක දිරිගැන්වීම් අඛණ්ඩව ලබා දෙන ලදි.

වැටුප් හා සම්බන්ධයෙන් ගත් කල, 2000 වසරේ සිට මුදල් මණ්ඩලය හා මහ බැංකුවේ ක්‍රියාත්මක වන වෘත්තීය සමිති සියල්ල අත්සන් කරනු ලබන සාමූහික ගිවිසුමක් යටතේ සෑම වසර තුනකට ම වරක් මහ බැංකු සේවා නියුක්තිකයින්ගේ වැටුප් සංශෝධනය කෙරේ. ඒ අනුව, 2024-2026 කාල පරිච්ඡේදයට අදාළ ව කාර්ය මණ්ඩලයේ වැටුප් ඉහළ නැංවීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව 2023 ජනවාරි මාසයේ දී සාමූහික එකඟතාවකට එළඹියේ ය. කෙසේ වුව ද, රාජ්‍ය මුදල් කාරක සභාවේ නිර්දේශයකට අනුව මුදල් අමාත්‍යවරයා වශයෙන් අතිගරු ජනාධිපතිතුමන් විසින් පත් කළ ස්වාධීන කමිටුවක් මගින් වර්තමානයේ දී මෙම වැටුප් සංශෝධනය සමාලෝචනය කෙරෙමින් පවතී.

## සමස්ත ආයතනික පරිපාලනය

වගවීම සහ යහපාලනයේ අනෙකුත් ප්‍රධාන මූලිකාංග එලෙසම පවතින බව සහතික කරමින්, 2023 වසර තුළ දී, අදාළ රෙගුලාසිවලට අනුකූලව සමස්ත ආයතනික පරිපාලනය සිදු කරන ලදි.

ප්‍රසම්පාදන, දේපළ හා සම්බන්ධිත සමීක්ෂණ, විස්තීර්ණ රක්ෂණ ආවරණ, තැපැල් සේවා, වැඩසටහන් සංවිධානය සහ ගිවිසුම් කළමනාකරණය යනාදිය එම ආයතනික පරිපාලනය ක්‍රියාකාරකම් වේ.

## පහසුකම් කළමනාකරණය

මෙහෙයුම් කාර්යක්ෂමතාව සහ පිරිවැය ඵලදායීතාව පවත්වා ගනිමින් කාර්ය මණ්ඩලයට සහ අදාළ පාර්ශ්වකරුවන්ට හිතකර සේවා පරිසරයක් නිර්මාණය කිරීම ඉලක්ක කර ගත් පුළුල් පරාසයක රාජකාරි කටයුතු, පහසුකම් කළමනාකරණය මගින් ආවරණය කරයි. ඒ අනුව, ඉඩකඩ කළමනාකරණය, යටිතල පහසුකම් නඩත්තු කිරීම, ප්‍රවාහනය සහ බලශක්ති කාර්යක්ෂමතාව යන ක්‍රියාකාරකම් 2023 වසරේ පහසුකම් කළමනාකරණය තුළ ඇතුළත් විය.

## පුද්ගල සහ දේපළ ආරක්ෂාව

මහ බැංකුවේ පුද්ගලයින්ගේ සහ වත්කම්වල ආරක්ෂාව සහතික කිරීම සඳහා ශක්තිමත් ආරක්ෂක ක්‍රමවේදයන් ස්ථාපිත කර ඇත. ප්‍රවේශ පාලනය, නිරීක්ෂණ පද්ධතින් ස්ථාපිත කිරීම, ආරක්ෂක නිලධාරින් නිසි පරිදි යෙදවීම සහ හදිසි අවස්ථා සඳහා ප්‍රතිචාර දැක්වීමේ පටිපාටීන් හරහා මෙම ආරක්ෂක ක්‍රමවේදයන් ක්‍රියාත්මක කරයි. මෙලෙස සුරක්ෂිත වූ පරිසරයක් තුළ ශ්‍රී ලංකා මහ බැංකුව තම මෙහෙයුම් කටයුතු පමණක් නොව මහජන විශ්වාසය ද තහවුරු කර ඇත.

## තොරතුරු තාක්ෂණ පද්ධති වැඩි දියුණු කිරීම

මෙහෙයුම් කාර්යක්ෂමතාව, නියාමන අධීක්ෂණය සහ මූල්‍ය ස්ථායිතා ඉලක්කවලට සහාය වීම සඳහා මහ බැංකුවේ තොරතුරු තාක්ෂණ පද්ධති 2023 දී සැලකිය යුතු වැඩි දියුණු කිරීම්වලට භාජනය විය.

අපනයන ආදායම සහ මූල්‍ය යෝජනා ක්‍රම සඳහා විධිමත් අධීක්ෂණ පද්ධතියක් ස්ථාපිත කිරීම සහ ස්වයංක්‍රීය අවදානම් මත පදනම් වූ අධීක්ෂණ මෙවලම් සහ වැඩි දියුණු කළ දත්ත රැස්කිරීම් සහ නියාමන වාර්තාකරණ යාන්ත්‍රණයන් මෙයට ඇතුළත් වේ. මීට අමතරව, මාර්ගගත සේවක බඳවා ගැනීමේ ක්‍රියාවලිය වැඩි දියුණු කිරීම, බාහිර ආයතන වෙත දත්ත බෙදා හැරීම වැඩි දියුණු කිරීම සහ මූල්‍ය දත්ත සම්ප්‍රේෂණය සඳහා ගෝලීය ප්‍රමිතීන් සමඟ පෙළගැස්වීම සඳහා මුලපිරීම් ද මෙම වසර තුළ දී දියත් කරන ලදි. තවද, සයිබර් ආරක්ෂණ පියවරයන් ශක්තිමත් කරමින් TIA 942-B(2017 rated 3) දත්ත මධ්‍යස්ථානයක් පිහිටුවීමත් සමඟ තොරතුරු තාක්ෂණික යටිතල පහසුකම් වැඩි දියුණු කරන ලදි.

මෙසේ, නවීන තොරතුරු තාක්ෂණික උපායමාර්ග භාවිතය හරහා මූල්‍ය ක්ෂේත්‍රයේ වඩා හොඳ පාලනයක්, විනිවිදභාවයක් සහ ඔරොත්තු දීමේ හැකියාවක් පවත්වා ගැනීමට ද මහ බැංකුව සමත් විය.

## නඩු සහ නීති ප්‍රතිසංස්කරණය

ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ එකඟ වී ඇති වැඩසටහනට අනුබද්ධිත පූර්ව ක්‍රියාකාරකම් සපුරාලීම අරමුණු කොටගෙන ශ්‍රී ලංකා මහ බැංකුව 2023 වසර තුළ දී පුළුල් වශයෙන් නීති ප්‍රතිසංස්කරණවලට සම්බන්ධව කටයුතු කරන ලදි. එම ප්‍රධාන නීති සම්පාදක පියවරයන් අතර, පිළිවෙලින් 2023 සැප්තැම්බර් මස 15 වන දින හා 2023 නොවැම්බර් මස 15 වන දින ක්‍රියාත්මක වූ 2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනත සහ 2023 අංක 17 දරන බැංකු (විශේෂ විධිවිධාන) පනත ඇතුළත් වේ.

ශ්‍රී ලංකා මහ බැංකුව වැඩිදුරටත්

- 2024 අප්‍රේල් මස පාර්ලිමේන්තුව විසින් අනුමත කරන ලද 1988 අංක 30 දරන බැංකු පනතට කරන ලද සංශෝධන
- 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනත සඳහා වන සංශෝධන
- 2000 අංක 56 දරන මූල්‍ය කල්බදු පනත සඳහා වන සංශෝධන
- 2005 අංක 28 දරන ගෙවීම් හා පියවීම් පද්ධති පිළිබඳ පනත සඳහා වන සංශෝධන
- 2017 අංක 12 දරන විදේශ විනිමය පනත සඳහා වන සංශෝධන සහ
- වෙළෙඳ නිෂ්කාශන හා පියවීම් පිළිබඳ පනත

ආදී නීති ප්‍රතිසංස්කරණ රැසක් සඳහා කටයුතු සම්පාදනය කරන ලදි.

තව ද, ශ්‍රී ලංකා මහ බැංකුව පහත සඳහන් නීති කෙටුම්පත් කිරීම සඳහා මුදල් අමාත්‍යාංශය වෙත තාක්ෂණික සහාය ලබා දෙන ලදි.

- ශ්‍රී ලංකා ක්ෂුද්‍ර මූල්‍ය හා ණය නියාමන අධිකාරිය පනත් කෙටුම්පත
- මූල්‍ය වත්කම් කළමණාකරණ සමාගම් පනත

ශ්‍රී ලංකා මහ බැංකුවේ නෛතික සුරක්ෂිතභාවය සහතික කිරීමේ අරමුණ පෙරදැරි ව ශ්‍රී ලංකා මහ බැංකුව විවිධ නෛතික කාරණා උදෙසා සිය නියෝජනය ඵලදායී ලෙස සිදුකරන ලදි. එසේම, 2023 වසර තුළ දී 2016 අංක 12 දරන තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනත යටතේ ශ්‍රී ලංකා මහ බැංකුව වෙත ඉදිරිපත් කරන ලද තොරතුරු ඉල්ලීම් 290ක්, අභියාචනා 45ක්, සහ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිසම ඉදිරියේ පැවති විමර්ශන 4ක් සම්බන්ධයෙන් ද ශ්‍රී ලංකා මහ බැංකුව කටයුතු කරන ලදි.

## ආයතනික කටයුතු ප්‍රතිනිර්මාණය කිරීමේ ක්‍රියාවලිය

2023 වසරේ දී මහ බැංකුව අදාළ දෙපාර්තමේන්තුවල ආයතනික කටයුතු ශක්තිමත් අයුරින් ප්‍රතිනිර්මාණය කිරීමේ ප්‍රයත්නයක් ගත්තා ලදි. දුර්වලතා හඳුනා ගැනීම, සංවර්ධනය කළ හැකි අංශ හඳුනා ගැනීම සහ පිරිවැය ඵලදායී, ප්‍රමාණාත්මක වශයෙන් ඉහළ මෙන්ම මෙහෙයුම් කාර්යක්ෂම ඒකාබද්ධ රාමුවක් ස්ථාපිත කිරීම හරහා මානව සම්පත් ක්‍රියාවලිය විධිමත් කිරීම කෙරෙහි මෙම ක්‍රියාවලියේ දී අවධානය යොමු වේ. මෙහි ප්‍රධාන අරමුණු වන්නේ මානව සම්පත් කළමනාකරණ කාර්යයන් සිදු කිරීමේ ක්‍රමවේදය ප්‍රතිසංස්කරණය කිරීම, සම්පත් ප්‍රශස්ත ලෙස යෙදවීම සහතික කිරීම සහ මහ බැංකුවේ අරමුණු සපුරාලීමේ දී ඉහළ කාර්යක්ෂමතාවකින් යුතු ව කටයුතු කිරීමයි.

## ඉදිරි මග

### බැංකුවේ මානව සම්පත් උපායමාර්ග ප්‍රතිසංස්කරණය කිරීම

මානව සම්පත් රාමුව සඳහා වැදගත්වන ප්‍රධාන අවශ්‍යතා කෙරෙහි අවධානය යොමු කරමින් මානව සම්පත් පරිචයන් ඉහළ නැංවීම උදෙසා වෙනත් මහ බැංකු සඳහා සමාන සේවා සපයන ලද ජාත්‍යන්තර සමාගමක විශේෂඥ දැනුම ලබා ගනිමින් මානව සම්පත් ප්‍රතිසංස්කරණ වැඩපිළිවෙලකට මහ බැංකුව අවතීර්ණ වී ඇත. කාර්ය මණ්ඩල අනුප්‍රාප්තික සැලසුම්කරණය, කඩිනමින් පිළියම් යෙදිය යුතු මානව සම්පත් ගැටලුවලට විසඳුම් ලබා දීම සහ කැපවීමෙන් රාජකාරි කටයුතු ඉටු කිරීම සඳහා පෙළඹවීම යනාදියට උපාය මාර්ගිකව නැඹුරු වීම මේ තුළ ඇතුළත් ය. මේ සඳහා නවීකරණයත්, මානව සම්පත් පරිචයන් ජාත්‍යන්තර ප්‍රමිතිවලට අනුගත කිරීමත් අරමුණු කර ගනිමින් මහ බැංකුවේ මානව සම්පත් උපාය මාර්ග යන් පරිපූර්ණ ලෙස ප්‍රතිසංස්කරණය කිරීම සිදු කරමින් පවතී. ඉතාමත් වැදගත් මෙම ක්‍රමෝපායන් තුළින් රැකියාව සඳහා නැඹුරු වූ, ප්‍රවීණ සහ කඩිසර කාර්ය මණ්ඩලයක් බිහි කිරීම මහ බැංකුවේ අරමුණයි.

# පාලක සහ මුදල් ප්‍රතිපත්ති මණ්ඩල සාමාජිකයින්

(2024 මාර්තු 31 දිනට)

**ආචාර්ය පී. නන්දලාල් වීරසිංහ**

අධිපති/ ප්‍රධාන විධායක නිලධාරි

**වර්තමානයේ ශ්‍රී ලංකා මහ බැංකුවේ දරන අනෙකුත් තනතුරු**

සභාපති - පාලක මණ්ඩලය
සභාපති - මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය

**අධ්‍යාපනික පසුබිම**

ආර්ථික විද්‍යාව පිළිබඳ ආචාර්ය උපාධිය, ඕස්ට්‍රේලියානු ජාතික විශ්ව විද්‍යාලය

ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය, ඕස්ට්‍රේලියානු ජාතික විශ්ව විද්‍යාලය

විද්‍යාවේදී උපාධිය, කැලණිය විශ්ව විද්‍යාලය, ශ්‍රී ලංකාව

**වෘත්තිය තොරතුරු සාරාංශය**

**වර්තමාන කටයුතු:**

ආචාර්ය වීරසිංහ මහතා ශ්‍රී ලංකා මහ බැංකුවේ 17 වන අධිපතිවරයා ලෙස කටයුතු කරන අතර උපායමාර්ගික නායකත්වය සපයමින් රටේ මුදල් ප්‍රතිපත්තිය, මූල්‍ය ස්ථාවරත්වය සහ ආර්ථික වර්ධනය සඳහා හඳුන්වාදෙන නව ප්‍රතිපත්ති අධීක්ෂණය කරයි.

**පළපුරුද්ද:**

ආචාර්ය වීරසිංහ මුදල් සහ විනිමය අනුපාත ප්‍රතිපත්ති පිළිබඳ පෘථුල පළපුරුද්දක් ඇති වෘත්තිමය මහ බැංකුකරුවකු වේ. මහ බැංකුවේ වෘත්තියමය කාල පරාසය තුළ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධිපති, නියෝජ්‍ය අධිපති, සහකාර අධිපති සහ ප්‍රධාන අර්ථ ශාස්ත්‍රඥ යනාදි තනතුරු ඔහු විසින් දරන ලදි. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විකල්ප විධායක අධ්‍යක්ෂ ලෙස කටයුතු කරමින් ජාත්‍යන්තර අත්දැකීම් ද ලබා ගෙන ඇත.

ඔහු අර්ථ ශාස්ත්‍රඥයෙකු ලෙස ආර්ථික කටයුතු හා සම්බන්ධ විවිධ කැබිනට් උප කමිටු නියෝජනය කරමින් ඒවාට උපදෙස් ලබා දී ඇත. ආචාර්ය වීරසිංහ කොළඹ විශ්ව විද්‍යාලයේ ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධි පාඨමාලාවේ ආරාධිත කථිකාචාර්යවරයෙකු, මැලේසියාවේ අග්නිදිග ආසියානු මහ බැංකු පර්යේෂණ සහ පුහුණු මධ්‍යස්ථානයේ ආරාධිත පර්යේෂණ අර්ථ ශාස්ත්‍රඥයෙකු හා ඕස්ට්‍රේලියානු ජාතික විශ්ව විද්‍යාලයේ ආරාධිත ජ්‍යෙෂ්ඨ පර්යේෂකයෙකු ලෙස සිය දායකත්වය ලබා දී ඇත.

මෙකී පුළුල් පසුබිමක් සහිත විවිධ අංශ සඳහා සිය දායකත්වය සැපයූ ආචාර්ය වීරසිංහ මුදල් සහ ආර්ථික ප්‍රතිපත්ති වැඩි දියුණු කිරීම උදෙසා ඉතා වැදගත් කාර්ය භාරයක් සිදු කරයි.

## නිහාල් ෆොන්සේකා මහතා

**වර්තමානයේ ශ්‍රී ලංකා මහ බැංකුවේ දරන තනතුරු**

පත් කළ සාමාජික - පාලක මණ්ඩලය
පත් කළ සාමාජික - මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය
සභාපති - පාලක මණ්ඩල අවදානම් අධීක්ෂණ කමිටුව

**අධ්‍යාපනික පසුබිම**

විද්‍යාවේදී උපාධිය, ලංකා විශ්ව විද්‍යාලය, කොළඹ, ශ්‍රී ලංකාව

ජ්‍යෙෂ්ඨ සාමාජික, බැංකුකරුවන්ගේ වරලත් ආයතනය, එක්සත් ජනපදය (FCIB)

ගරු සාමාජික, සුකුම්පත් සහ ආයෝජන පිළිබඳ වරලත් ආයතය, එක්සත් ජනපදය (FCSI)

**වෘත්තිය තොරතුරු සාරාංශය**

### වර්තමාන කටයුතු :

නිහාල් ෆොන්සේකා මහතා ප්‍රධාන පෙළේ ආයතනවල ඉහළ තනතුරු ගණනාවක් හොබවයි. ජෝන් කීල්ස් හෝල්ඩිංග්ස් පීඑල්සී හි ජ්‍යෙෂ්ඨ ස්වාධීන අධ්‍යක්ෂ සහ සමූහ විගණන කමිටුවේ සභාපතිවරයා ලෙස කටයුතු කරයි. මීට අමතරව ෆීනික්ස් ඉන්ඩස්ට්‍රීස් ලිමිටඩ් හි සභාපතිවරයා ලෙස ද, බ්‍රැන්ඩික්ස් ලංකා සමාගමේ විධායක නොවන අධ්‍යක්ෂ සහ විගණන කමිටුවේ සභාපවරයා ලෙස ද කටයුතු කරයි. තවද, ෆීනික්ස් වෙන්චර්ස් ලිමිටඩ් හි විධායක නොවන අධ්‍යක්ෂ සහ ආයෝජන කමිටුවේ සභාපති තනතුර ද දරයි.

### පළපුරුද්ද :

නිහාල් ෆොන්සේකා මහතා රාජ්‍ය හා පෞද්ගලික අංශ ද්විත්වයෙහිම වැදගත් කාර්යභාරයක් ඉටු කළ අතර මූල්‍ය පාලනයට සහ සංවර්ධනයට විශාල දායකත්වයක් ලබා දී ඇත. මූල්‍ය අංශය තුළ ඔහුගේ නායකත්වය සහ පළපුරුද්ද ෆොන්සේකා මහතාගේ වාර්තාවල මනාව දිස්වේ. ඔහු 2016 සිට 2020 දක්වා ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලයේ සාමාජිකයෙකු ලෙස කටයුතු කර ඇත. 2016 වසරේ දී, සේවා නියුක්තියන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ අධ්‍යක්ෂවරයකු ලෙස ද එම වසරේදී ම ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාවේ සාමාජිකයෙකු ලෙස ද කටයුතු කරමින් රජ්‍ය සේවයට ඇති සිය කැපවීම විදහා දැක්වුයේය. පෞද්ගලික අංශය සඳහා ඔහුගේ දායකත්වය ගත් කල, 2000 සිට 2013 දක්වා DFCC බැංකුවේ ප්‍රධාන විධායක නිලධාරි/ අධ්‍යක්ෂ ලෙස සේවය කරමින් එහි මෙහෙයුම් සහ උපායමාර්ගික දිශානතිය අධීක්ෂණය කළේය. ෆොන්සේකා මහතා 2011 සිට 2012 දක්වා මැනිලා හි ආසියානු සහ පැසිෆික් කලාපයේ සංවර්ධන මූල්‍ය ආයතන සංගමයේ සභාපති ලෙස ද 2005 සිට 2009 දක්වා කොළඹ කොටස් හුවමාරුවෙහි සභාපති ලෙස ද ප්‍රමුඛ තනතුරු හොබවා ඇත. 2000 සිට 2009 දක්වා කොමර්ෂල් බැංකුව පීඑල්සී හි අධ්‍යක්ෂවරයෙකු ලෙස කටයුතු කිරීම ඇතුළු විවිධ අධ්‍යක්ෂ මණ්ඩල සඳහා සිය විශේෂඥ දායකත්වය ද ලබා දී ඇත. මීට අමතරව, ඔහු 2009 දී බදුකරණය පිළිබඳ ජනාධිපති කොමිෂන් සභාවේ සාමාජිකයෙකු වශයෙන් සිය දායකත්වය ලබා දුන් අතර 1990 සිට 1999 දක්වා ශ්‍රී ලංකාවේ HSBCහි නියෝජ්‍ය ප්‍රධාන විධායක නිලධාරි ලෙස සේවය සපයා ඇත.

## ආචාර්ය රවී රත්නායක මහතා

**වර්තමානයේ ශ්‍රී ලංකා මහ බැංකුවේ දරන තනතුරු**

පත් කළ සාමාජික - පාලක මණ්ඩලය
පත් කළ සාමාජික - මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය
පත් කළ සාමාජික - විගණන කමිටුව

**අධ්‍යාපනික පසුබිම**

ආර්ථික විද්‍යාව පිළිබඳ ආචාර්ය උපාධිය, ලා ට්‍රෝබ් විශ්ව විද්‍යාලය, ඔස්ට්‍රේලියාව

ආර්ථික විද්‍යා සංවර්ධනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව, කොළඹ විශ්ව විද්‍යාලය, ශ්‍රී ලංකාව

පරිගණක විද්‍යාව පිළිබඳ ඩිප්ලෝමාව, ජාතික ව්‍යාපාර කළමණාකාරිත්ව ආයතනය

ආර්ථික විද්‍යාව පිළිබඳ කලාවේදී උපාධිය, පේරාදෙණිය විශ්ව විද්‍යාලය, ශ්‍රී ලංකාව

**වෘත්තිය තොරතුරු සාරාංශය:**

### වර්තමාන කටයුතු :

ආචාර්ය රත්නායක ජාත්‍යන්තර ආර්ථික සහ ව්‍යාපාර උපදේශන කටයුතුවල නිරත වේ. මීට අමතරව, ඔහු බ්‍රිජින් ද ගැප් පදනමේ (BGF) මහලේකම් ලෙස සේවය කරයි.

### පළපුරුද්ද :

ආචාර්ය රත්නායක UNESCAPහි ප්‍රධාන අර්ථ ශාස්ත්‍රඥ සහ වෙළෙඳ හා ආයෝජන අධ්‍යක්ෂ ලෙස වසර 40 කට අධික පුළුල් ජාත්‍යන්තර අත්දැකීම් සහිත වන අතර, මහාචාර්යවරයෙකු, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයෙකු සහ ජ්‍යෙෂ්ඨ ආර්ථික පර්යේෂකයෙකු ලෙස සිය දායකත්වය සපයා ඇත. ඔහු සාර්ව ආර්ථික ප්‍රතිපත්තිය පිළිබඳව සංවර්ධනය වෙමින් පවතින රටවල් 25 කට අධික ප්‍රමාණයක රජයන්ට උපදෙස් දී ඇත. පරිශීලනය කළ යුතු සඟරාවල ලිපි 100කට අධික ප්‍රකාශන ප්‍රමාණයක් නිකුත් කර ඇති ඔහු වෙළෙඳ හා ආයෝජන ප්‍රතිපත්තිය පිළිබඳ කලාපීය ව්‍යාපෘති ද සම්බන්ධීකරණය කර ඇත. ආචාර්ය රත්නායක මහතා UNESCAPහි වැදගත් මූලාරම්භයන් සඳහා මූලිකත්වය ගෙන ඇති අතර කීර්තිමත් ජාත්‍යන්තර ආයතන සඳහා උපදේශන සේවා ලබා දී ඇත. ශ්‍රී ලංකාව තුළ වෙළෙඳ ප්‍රතිපත්ති සම්පාදනයේ දී සහ ඒ පිළිබඳ සාකච්ඡාවල දී සැලකිය යුතු තනතුරු රැසක් හොබවා ඇත.

### අනුෂ්ක විජේසිංහ මහතා

**වර්තමානයේ ශ්‍රී ලංකා මහ බැංකුවේ දරන තනතුරු**

පත් කළ සාමාජික - පාලක මණ්ඩලය
පත් කළ සාමාජික - මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය
සභාපති - ආචාර ධර්ම කමිටුව

**අධ්‍යාපනික පසුබිම**

ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය, ලීඩ්ස් විශ්ව විද්‍යාලය, එක්සත් ජනපදය

ආර්ථික විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධිය, යුනිවර්සිටි කොලේජ්, ලන්ඩන්, එක්සත් ජනපදය

හාවර්ඩ් කෙනඩි පාසලෙ ආදි ශිෂ්‍ය (විධායක අධ්‍යාපන)

**වෘත්තීය තොරතුරු සාරාංශය:**

**වර්තමාන කටයුතු :**

විජේසිංහ මහතා විවිධ විෂය හා සම්බන්ධ රාජ්‍ය ප්‍රතිපත්ති හා ඒවාට අදාළ කටයුතු අධීක්ෂණය කරමින් ස්මාර්ට් ෆියුචර් සඳහා වූ මධ්‍යස්ථානයේ (CSF) සම-නිර්මාතෘ සහ අධ්‍යක්ෂ ලෙස කටයුතු කරයි. ඔහු ජනාධිපති කාර්යාලයේ අපනයන හා සෘජු විදේශ ආයෝජන පිළිබඳ අධීක්ෂණ කාරක සභාවේ ද කටයුතු කරයි. මීට අමතරව, විජේසිංහ මහතා ෆෙයාර්ෆස්ට් ඉන්ෂුවරන්ස් ලිමිටඩ් සහ ගුඩ් ලයිෆ් එක්ස් (පෞද්) සමාගමේ ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු ලෙස ද තනතුරු දරයි.

**පළපුරුද්ද :**

විජේසිංහ මහතා පුළුල් ජාත්‍යන්තර හා දේශීය අත්දැකීම් සහිත දක්ෂ වෘත්තිකයෙකි. ආසියාවේ සහ මැදපෙරදිග උපදේශන ව්‍යාපෘති පිළිබඳ ජාත්‍යන්තර උපදේශකවරයෙකු ලෙස කටයුතු කර ඇති ඔහු සෙලාන් බැංකු පීඑල්සී සහ එච් එන් බී ෆිනෑන්ස් පීඑල්සී හි ජ්‍යෙෂ්ඨ ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ ඇතුළු මූල්‍ය ක්ෂේත්‍රයේ ජ්‍යෙෂ්ඨ තනතුරු රැසක් හොබවා ඇත. ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය සහ ජාතික නවෝත්පාදන නියෝජිතායතනය වැනි විවිධ මණ්ඩල සහ සභාවල සේවය කරමින් ශ්‍රී ලංකාවේ නවෝත්පාදන හා ආර්ථික සංවර්ධනය පෝෂණය කිරීම සඳහා විජේසිංහ මහතා සක්‍රිය ව දායක වේ. ලංකා වාණිජ මණ්ඩලයේ ප්‍රධාන අර්ථ ශාස්ත්‍රඥවරයා ලෙස ද ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ පර්යේෂණ අර්ථ ශාස්ත්‍රඥවරයෙකු ලෙස ද කටයුතු කරන ඔහු සෝල් නගරයෙහි කොරියානු සංවර්ධන ආයතනයේ ආරාධිත පර්යේෂකයෙකු ලෙස ද පර්යේෂණ සඳහා දායක වී ඇත.

### විශ් ගෝවින්දසාමි මහතා

**වර්තමානයේ ශ්‍රී ලංකා මහ බැංකුවේ දරන තනතුරු**

පත් කළ සාමාජික - පාලක මණ්ඩලය
පත් කළ සාමාජික - මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය

**අධ්‍යාපනික පසුබිම**

ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය, හාර්ට්ෆර්ඩ් විශ්ව විද්‍යාලය, එක්සත් ජනපදය

විදුලි ඉංජිනේරු විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධිය, හාර්ට්ෆර්ඩ් විශ්ව විද්‍යාලය, එක්සත් ජනපදය

ජ්‍යෙෂ්ඨ සාමාජික, සහතිකලත් වෘත්තීය කළමනාකරුවන්ගේ ආයතනය, ශ්‍රී ලංකාව

**වෘත්තීය තොරතුරු සාරාංශය:**

**වර්තමාන කටයුතු :**

නියෝජ්‍ය සභාපති, සන්ෂයින් හෝල්ඩිංග්ස් පීඑල්සී

**පළපුරුද්ද :**

ලංකා වාණිජ මණ්ඩලයේ සහ ලංකා සේවායෝජකයින්ගේ සම්මේලනයේ හිටපු සභාපතිවරයා වූ ගෝවින්දසාමි මහතා ව්‍යාපාරික ක්ෂේත්‍රයට සුවිශේෂී දායකත්වයක් සපයා ඇත. සෙස්ටා, වටවල සහ රන්කහට වැනි ජනප්‍රිය තේ සන්නාම නිර්මාණය කිරීමේ ගෞරවය ඔහුට හිමි වන අතර, ඔහුගේ පරිණත ව්‍යවසායකත්ව බුද්ධිය සහ අලෙවිකරණ හැකියාව එමගින් විදහා දක්වයි. සාංගමික යහපාලන ක්ෂේත්‍රය තුළ ඔහුගේ ප්‍රවීණතාව ප්‍රකට වන අතර ඔහු ස්වාධීන අධ්‍යක්ෂවරයෙකු ලෙස බොහෝ ලැයිස්තුගත සමාගම්වල අධ්‍යක්ෂ මණ්ඩලවල සේවය කර ඇත.

## රජීව් අමරසූරිය මහතා

**වර්තමානයේ ශ්‍රී ලංකා මහ බැංකුවේ දරන තනතුරු**

පත් කළ සාමාජික - පාලක මණ්ඩලය
පත් කළ සාමාජික - මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය
පත් කළ සාමාජික - විගණන කමිටුව

**අධ්‍යාපනික පසුබිම**

නීතිවේදී ගෞරව උපාධිය, කොළඹ විශ්ව විද්‍යාලය, ශ්‍රී ලංකාව

ශ්‍රී ලංකා ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥ

ජ්‍යෙෂ්ඨ සාමාජික, වරලත් කළමනාකරණ ගණකාධිකාරිවරුන්ගේ ආයතනය, එක්සත් රාජධානිය

ජ්‍යෙෂ්ඨ සාමාජික, සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරිවරුන්ගේ ආයතනය, ශ්‍රී ලංකාව

වරලත් ගෝලීය කළමනාකරණ ගණකාධිකාරී ආයතනය

හාවඩ් කෙනඩි පාසලේ ආදි ශිෂ්‍ය (විධායක අධ්‍යාපන)

රයිසිනා සාමාජික, තරුණ AFGG

**වෘත්තිය තොරතුරු සාරාංශය:**

### වර්තමාන කටයුතු :

අමරසූරිය මහතා අභියාචනාධිකරණයේ රාජ්‍ය නීතිය සහ සිවිල් නඩු පැවරීම හා සම්බන්ධ විවිධ අංශයන්හි ප්‍රවීණ නීතිඥවරයෙකු ලෙස කටයුතු කරයි. ඔහු ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන ප්‍රමිති අධීක්ෂණ මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු ලෙසත්, කොළඹ විශ්ව විද්‍යාලයේ කවුන්සිල සාමාජිකයෙකු ලෙසත් කටයුතු කරයි. මීට අමතරව අමරසූරිය මහතා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නීති අධ්‍යයන පිළිබඳ ස්ථාවර කාරක සභාවේ සාමාජිකයෙකු වන අතර නීති අධ්‍යාපන සංගමයේ ශ්‍රී ලංකාවේ නියෝජිතයා ලෙස ද කටයුතු කරයි. ඔහු LAWASIA හි විධායක කමිටුවේ ද සාමාජිකයෙකි.

### පළපුරුද්ද :

අමරසූරිය මහතා ශ්‍රී ලංකාවේ නීති හා වෘත්තීය ආයතනවල ප්‍රධාන තනතුරු හොබවයි. ඔහු නීතිඥ සංගමයේ ලේකම්, හා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ කොමසාරිස් ලෙස සේවය කරන අතර නීති අධ්‍යයන සභාවේ ද සාමාජිකයෙකි. මීට අමතරව, අමරසූරිය මහතා ශ්‍රී ලංකා ජාතික බේරුම්කරණ මධ්‍යස්ථානයේ සාමාජිකයෙකු සහ කොළඹ විශ්ව විද්‍යාලයේ ආදි ශිෂ්‍ය සංගමයේ හිටපු සභාපතිවරයෙකු ද වේ.

## මනිල් ජයසිංහ මහතා

**වර්තමානයේ ශ්‍රී ලංකා මහ බැංකුවේ දරන තනතුරු**

පත් කළ සාමාජික - පාලක මණ්ඩලය
පත් කළ සාමාජික - මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය
සභාපති- - විගණන කමිටුව

**අධ්‍යාපනික පසුබිම**

ජ්‍යෙෂ්ඨ සාමාජික, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය

ජ්‍යෙෂ්ඨ සාමාජික, වරලත් කළමනාකරණ ගණකාධිකාරි ආයතනය (එක්සත් රාජධානිය)

ජ්‍යෙෂ්ඨ සාමාජික, ශ්‍රී ලංකා සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරි ආයතනය

සාමාජික, වරලත් රාජ්‍ය මූල්‍ය හා ගණකාධිකරණ ආයතන

**වෘත්තිය තොරතුරු සාරාංශය:**

### වර්තමාන කටයුතු :

ජයසිංහ මහතා විවිධ ආයතනවල ප්‍රධාන තනතුරු හොබවයි. ඔහු ව්‍යවස්ථාපිත ගිණුම්කරණ ප්‍රමිති කමිටුවේ සභාපතිවරයා වන අතර SAFAහි ගිණුම්කරණ ප්‍රමිති කමිටුවේ සභාපතිවරයා ද වේ. මීට අමතරව, ඔහු ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ සහ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට ඔහුගේ සේවය ලබා දෙයි. තවද ජයසිංහ මහතා ඩිමෝ සහ සිලෝන් හොස්පිටල්ස් ඇතුළු ප්‍රධාන පෙළේ සමාගම් රැසක ස්වාධීන අධ්‍යක්ෂවරයෙකු ලෙස ද කටයුතු කරයි.

### පළපුරුද්ද :

ජයසිංහ මහතාට අර්නස්ට් ඇන්ඩ් යන්ග් හි වසර 30ක කීර්තිමත් සේවා කාලයක් ඇති අතර එහි දී ඔහු ශ්‍රී ලංකාව සහ මාලදිවයින සඳහා හවුල්කරු ලෙස සහ එම රටවල නියෝජිත කළමනාකරණ හවුල්කරු ලෙස ද සේවය කර ඇත. සහතික කිරීමේ පරිච ප්‍රධානි සහ වෘත්තිය පුහුණු අධ්‍යක්ෂක ඇතුළු ප්‍රධාන නායකත්ව භූමිකාවන් සඳහා ඔහු සිය දායකත්වය සපයා ඇති අතර, ජයසිංහ මහතා ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති පිළිබඳ විශේෂඥයෙකු වන අතර ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ සභාපතිවරයා ලෙස ගිණුම්කරණ වෘත්තියට සැලකිය යුතු දායකත්වයක් ලබා දී ඇත. ජාතික වාණිජ මණ්ඩලය සහ ශ්‍රී ලංකා වරලත් කළමනාකරණ ගණකාධිකාරි සභාව වැනි වෘත්තීය සංගම්වලට ක්‍රියාකාරීව සම්බන්ධ වී ඇත.

## ආචාර්ය දුෂ්නි වීරකෝන් මිය

**වර්තමානයේ ශ්‍රී ලංකා මහ බැංකුවේ දරන තනතුරු**

පත් කළ සාමාජික - මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය

**අධ්‍යාපනික පසුබිම**

ආර්ථික විද්‍යාව පිළිබඳ ආචාර්ය උපාධිය, මැන්චෙස්ටර් විශ්ව විද්‍යාලය, එක්සත් රාජධානිය

ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය, මැන්චෙස්ටර් විශ්ව විද්‍යාලය, එක්සත් රාජධානිය

ආර්ථික විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධිය, බෙල්ෆාස්ට්හි රැජින විශ්ව විද්‍යාලය, එක්සත් රාජධානිය

**වෘත්තිය තොරතුරු සාරාංශය:**

### වර්තමාන කටයුතු :

ආචාර්ය වීරකෝන් මිය ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ විධායක අධ්‍යක්ෂවරිය ලෙස කටයුතු කරයි. මීට අමතරව, ඇය එම ආයතනයේ සාර්ව ආර්ථික ප්‍රතිපත්ති පර්යේෂණ දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා වශයෙන් සාර්ව ආර්ථික ප්‍රවණතා සහ ප්‍රතිපත්ති කෙරෙහි අවධානය යොමු කරන විවිධ පර්යේෂණ සඳහා මූලාරම්භය ගනී.

### පළපුරුද්ද :

ආචාර්ය වීරකෝන් මිය විවිධ අංශවල ප්‍රවීණත්වයක් උසුලන දක්ෂ වෘත්තිකයෙකි. ඇය ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලයේ පත් කළ සාමාජිකාවක් ලෙස කටයුතු කරන අතර කාගිල්ස් සිලෝන් පීඑල්සී සහ නේෂන්ස් ට්‍රස්ට් බැංකුවේ ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ යනාදී තනතුරු හොබවයි. ආචාර්ය වීරකෝන් මිය කොළඹ විශ්ව විද්‍යාලයේ සමාජ ප්‍රතිපත්ති විශ්ලේෂණ හා පර්යේෂණ මධ්‍යස්ථානය (SPARC) ද මෙහෙයවයි. ජාත්‍යන්තර වශයෙන්, ඇය ඕස්ට්‍රේලියාවේ මොනෑෂ් විශ්ව විද්‍යාලයේ සංවර්ධන ආර්ථික හා තිරසාරභාවය පිළිබඳ මධ්‍යස්ථානයට (CDES) උපදේශන දායකත්වය ලබා දෙන අතර ආසියානු සංවර්ධන බැංකුව, ලෝක බැංකුව සහ ලෝක වෙළෙඳ සංවිධානය වැනි සංවිධාන සඳහා ද උපදෙස් ලබා දෙයි.

## ආචාර්ය ප්‍රියංග දුනුසිංහ

**වර්තමානයේ ශ්‍රී ලංකා මහ බැංකුවේ දරන තනතුරු**

පත් කළ සාමාජික - මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය

**අධ්‍යාපනික පසුබිම**

ආර්ථික විද්‍යාව පිළිබඳ මහාචාර්ය, ආර්ථික විද්‍යා අධ්‍යනාංශය, කොළඹ විශ්ව විද්‍යාලය

**වෘත්තිය තොරතුරු සාරාංශය:**

### වර්තමාන කටයුතු :

ආචාර්ය දුනුසිංහ කොළඹ විශ්ව විද්‍යාලයේ තොරතුරු තාක්ෂණ අධ්‍යයන අංශයේ ප්‍රධානියා මෙන්ම ආර්ථික විද්‍යාව පිළිබඳ මහාචාර්යවරයෙක් ද වේ.

### පළපුරුද්ද :

ආචාර්ය දුනුසිංහ විවිධ සාර්ව ආර්ථික ප්‍රතිපත්ති සහ සංවර්ධනය පිළිබඳ විශේෂඥ පර්යේෂකයෙකි. ඔහු එක්සත් ජාතීන්ගේ සංවිධානය, ලෝක බැංකුව සහ ආසියානු සංවර්ධන බැංකුව වැනි කීර්තිමත් ආයතනවලට මෙන්ම ශ්‍රී ලංකා රජයේ විවිධ අමාත්‍යාංශවලට උපදේශන සේවා සපයා ඇත. මීට අමතරව ආචාර්ය දුනුසිංහ හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිජන පර්යේෂණ ආයතනයේ පර්යේෂණ හා පුහුණු කමිටු සාමාජිකයෙකු ලෙස කෘෂි පර්යේෂණ හා පුහුණුව සඳහා දායකත්වය සපයයි. කොළඹ විශ්ව විද්‍යාලයේ වෘත්තීය මාර්ගෝපදේශන ඒකකයේ අධ්‍යක්ෂවරයා ලෙස ද කටයුතු කර ඇති ඔහු මාධ්‍ය වාර්තාකරණයේ සක්‍රීය දායකයෙකි.

## ටී එම් ජේ වයි පී ප්‍රනාන්දු මිය

ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධිපති

**වර්තමානයේ ශ්‍රී ලංකා මහ බැංකුවේ දරන අනෙකුත් තනතුරු**

සාමාජික - මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය
සාමාජික - ආචාර ධර්ම කමිටුව

**අධ්‍යාපනික පසුබිම**

මූල්‍ය ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය, කොළඹ විශ්ව විද්‍යාලය, ශ්‍රී ලංකාව

වාණිජවේදී උපාධිය (විශේෂ), ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය, ශ්‍රී ලංකාව

**වෘත්තිය තොරතුරු සාරාංශය:**

ශ්‍රී ලංකා මහ බැංකුවේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධිපති ප්‍රනාන්දු මහත්මිය මූල්‍ය පද්ධති ස්ථායිතා අංශය මෙහෙයවන අතර බැංකු අධීක්ෂණය, බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණය, ගෙවීම් සහ පියවීම්, ව්‍යවහාර මුදල්, විදේශ විනිමය, මූල්‍ය, ප්‍රාදේශීය සංවර්ධන සහ සේවක අර්ථසාධක අරමුදල ඇතුළු විවිධ දෙපාර්තමේන්තු අධීක්ෂණය කරයි. මහ බැංකුවේ වසර 34කට අධික සේවා පළපුරුද්දක් ඇති ඇයට බැංකු සහ බැංකු නොවන මූල්‍ය ආයතන නියාමනය හා අධීක්ෂණය, විදේශ විනිමය කළමනාකරණය, ව්‍යවහාර මුදල් කළමනාකරණය, ගෙවීම් සහ පියවීම් පද්ධති යන ක්ෂේත්‍ර පිළිබඳ පුළුල් විශේෂඥ දැනුමක් ඇත.

ප්‍රනාන්දු මහත්මිය ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශයේ සභාපති, ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ සභාපති යනාදි ප්‍රධාන තනතුරු හොබවමින් විවිධ බාහිර ආයතන හා සම්බන්ධ කටයුතුවල දී මහ බැංකුව නියෝජනය කරයි. මීට අමතරව ඇය ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව, ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව සහ අපි වෙනුවෙන් අපි අරමුදල් මණ්ඩලයේ සාමාජිකාවක් ලෙස ද කටයුතු කරයි.

## කේ එම් ඒ එන් දවුලගල මිය

නියෝජ්‍ය අධිපති

**වර්තමානයේ ශ්‍රී ලංකා මහ බැංකුවේ දරන අනෙකුත් තනතුරු**

සාමාජික - පාලක මණ්ඩලය
සාමාජික - මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය
ශ්‍රී ලංකා මහ බැංකුවේ තොරතුරු නිලධාරි (2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත)
සාමාජික - ආචාර ධර්ම කමිටුව

**අධ්‍යාපනික පසුබිම**

මූල්‍ය හා ව්‍යාපාර ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය, එසෙක්ස් විශ්ව විද්‍යාලය, එක්සත් රාජධානිය

ව්‍යාපාර පරිපාලන පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය, ශ්‍රී ලංකාව

ජ්‍යෙෂ්ඨ සාමාජික, කළමනාකරණ ගණකාධිකාරී වරලත් ආයතනය, එක්සත් රාජධානිය

**වෘත්තිය තොරතුරු සාරාංශය:**

දවුලගල මහත්මිය සතුව බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණය හා නියාමනය, සාර්ව විචක්ෂණතා අධ්‍යයන, මූල්‍ය, ජාත්‍යන්තර මෙහෙයුම්, අවදානම් කළමනාකරණ, ප්‍රාදේශීය සංවර්ධනය, මානව සම්පත් කළමනාකරණය, පුහුණු හා සංවර්ධන සහ ආයතනික සේවා යන ක්ෂේත්‍රයන්හි ශ්‍රී ලංකා මහ බැංකුව තුළ වසර 31 කට අධික පළපුරුද්දක් ඇත.

ඇය මුදල් මණ්ඩලයේ ලේකම් ලෙස කටයුතු කර ඇති අතර පාලක මණ්ඩල අවදානම් අධීක්ෂණ කමිටුව සහ උපදේශක විගණන කමිටුව යන ඒවායෙහි ලේකම් ලෙස ද කටයුතු කර ඇත. තව ද, ඇය මුදල් අමාත්‍යාංශයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරිය ලෙස ද කටයුතු කර ඇත.

දවුලගල මහත්මිය ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන ප්‍රමිති අධීක්ෂණ මණ්ඩලයේ වර්තමාන සභාපතිත්වය දරයි. මීට අමතරව, ඇය ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය, ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනය සහ ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව වැනි ප්‍රධාන බාහිර ආයතන්හි මහ බැංකුව නියෝජනය කරයි.

# පාලක මණ්ඩල අනු කමිටු

| කමිටුව | කාර්යය | සාමාජිකයින් |
|---|---|---|
| විගණන කමිටුව | ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය ප්‍රකාශවල විශ්වසනීයත්වය සහ සැලකිය යුතු මූල්‍ය වාර්තාකරණ ගැටලු සම්බන්ධයෙන් උපදෙස් සැපයීම සහ විගණන ක්‍රියාවලියේ විනිවිදභාවය සහ වගවීම සහතික කිරීම සඳහා බාහිර විගණක සමඟ කටයුතු කිරීම.<br>අභ්‍යන්තර පාලන සහ අවදානම් කළමනාකරණ පද්ධතිවල ප්‍රමාණවත් බව සහ සඵලතාව පිළිබඳ සමාලෝචනය සහ උපදෙස් සැපයීම.<br>තොරතුරු හෙළිදරව් කිරීම, අනුකූල වීම සහ වංචා වාර්තා කිරීමේ යාන්ත්‍රණයට අදාළ අභ්‍යන්තර පාලනයන් තක්සේරු කිරීම.<br>සමස්ත අවදානම් කළමනාකරණ පද්ධතියේ සන්දර්භය තුළ මහ බැංකුවේ අභ්‍යන්තර විගණන කාර්යයේ සඵලතාව නිරීක්ෂණය කිරීම. | පාලක මණ්ඩලය නම් කළ සාමාජික (සභාපති)<br>නම් කරන ලද පාලක මණ්ඩල සාමාජිකයින්<br>නිරීක්ෂකවරු: මූල්‍ය දෙපාර්තමේන්තුව භාර සහකාර අධිපති, ප්‍රධාන අනුකූලතා නිලධාරි, ප්‍රධාන ගණකාධිකාරී, ප්‍රධාන අවදානම් නිලධාරි, විගණකාධිපතිවරයාගේ නියෝජිතයා ලෙස ජාතික විගණන කාර්යාලයේ විගණන අධිකාරි<br>ලේකම්: පාලක මණ්ඩල ලේකම්<br>සහකාර ලේකම්: ප්‍රධාන අභ්‍යන්තර විගණක |
